# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

(2018 සිට ක්‍රියාත්මක වේ)

## 13 ශ්‍රේණිය




සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# අ.පො.ස (උසස් පෙළ)

# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

## 13 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල: info@nie.lk

ඉතිහාසය
12 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ..............

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : nifo@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයක අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන්ගේ හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුශලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | | |
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |
| **විෂය විශේෂඥ සභාය** | : | |
| මහාචාර්ය හඟුරන්කෙත ධිරානන්ද හිමි | | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය මාලනී ඇදගම | | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ | | කොළඹ විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය යූ.බී කරුණානන්ද | | කැලණිය විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය කේ.එම්.පී කුලසේකර | | කැලණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය එම්. සෝමතිලක | | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය පත්මසිරි කන්නන්ගර | | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි | | කොළඹ විශ්ව විද්‍යාලය |
| ආචාර්ය රෝහිත දසනායක | | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| ආචාර්ය අනුත්තරා දේවි විද්‍යාලංකාර | | කොළඹ විශ්ව විද්‍යාලය |
| කථිකාචාර්ය ආර්.එස්. සතියකුමාර් | | යාපනය විශ්ව විද්‍යාලය |
| **ලේඛක මණ්ඩලය (බාහිර)** | | |
| එම්.ඩොනේටා කන්‍යා සොයුරිය | | නි. විදුහල්පති (විශ්‍රාමික) |
| ආර්.ඩබ්.එස් දැල එදිරිවීර මිය | | ගුරු සේවය I (විශ්‍රාමික) |
| ඩබ්.ඩී.කේ.ඩී පිටිගල මිය | | නි.විදුහල්පති (විශ්‍රාමික) |
| නන්දා මනම්පේරි මිය | | ගුරු සේවය I (විශ්‍රාමික) |
| යූ.එල්.එන් බසීර් මයා | | ගුරු සේවය I (විශ්‍රාමික) |
| යූ.එල්.එම් මරික්කාර් මයා | | ගුරු උපදේශක කලාප අධයාපන කාර්යාලය, වත්තේගම |
| එච්.එම් නලින් බණ්ඩාර මයා | | කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය |
| ජීවන සුරංග ගමගේ මයා | | වලල්ලාවිට මහා විද්‍යාලය |
| සමන්ත පියදාස මයා | | ශ්‍රී බුද්ධජයන්ති මධ්‍ය මහා විද්‍යාලය, බලංගොඩ |
| පී.එල්.ඒ.යූ.පී පෙරේරා මයා | | සදර්වෝදය පිරිවෙණ, දේවාලේගම |
| **ව්‍යාපෘති කමිටුව** | | |
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, |
| ඩබ්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන | | කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| **භාෂා සංස්කරණය** | | |
| ශ්‍රීනාත් ගනේවත්ත මයා | | කජුවත්ත, ගොතටුව, අංගොඩ, |

## පටුන


| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | | ii |
| විෂයමාලා කමිටුව | | iii |
| විෂය නිර්දේශය | | xi - xxxiv |
| **ශ්‍රී ලංකාවේ ඉතිහාසය** | | 01 - 68 |
| 7.0 | දහසයවෙනි සියවසේ සිට දහඅටවෙනි සියවස තෙක් ශ්‍රී ලංකාව | 02 - 23 |
| **8.0** | ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම හා ස්ථාපිත කිරීම | 24 - 33 |
| 9.0 | බ්‍රිතාන්‍යයන් යටතේ ආර්ථික සහ සමාජීය වෙනස්කම් (1948 දක්වා) | 34 - 44 |
| 10.0 | ජාතික ව්‍යාපාර හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ | 45 - 54 |
| 11.0 | නිදහසින් පසු ශ්‍රී ලංකාව | 55 - 68 |
| **ඉන්දියාවේ ඉතිහාසය** | | **69 1367** |
| 7.0 | පශ්චාද් මෞර්ය යුගය හා විදේශීය දේශපාලන බලය | 70 83 |
| 8.0 | ගුප්ත අධිරාජ්‍යයේ උදාව | 84 - 100 |
| 9.0 | පශ්චාද් ගුප්ත යුගයේ දේශපාලන ප්‍රවණතා | 101 - 107 |
| 10.0 | අරාබි තුර්කි ආක්‍රමණ හා ඉන්දියා දේශපාලන තත්ත්වය | 108 - 114 |
| 11.0 | දකුණු ඉන්දීය දේශපාලන පසුබිම | 115 - 137 |
| **යුරෝපා ඉතිහාසය** | | **138 197** |
| 8.0 | නැපෝලියන් බොනපාර්ට් සහ ඔහුගේ අධිරාජ්‍යය | 139 - 145 |
| 9.0 | වියානා සම්මේලනය | 146 - 151 |
| 10.0 | ලිබරල්වාදී හා ජාතිකවාදී සංකල්පවල වර්ධනය | 152 - 158 |
| 11.0 | පළමුවෙනි ලෝක යුද්ධය | 159 - 165 |
| 12.0 | රුසියන් විප්ලවය | 166 - 171 |
| 13.0 | දෙවෙනි ලෝක යුද්ධය | 172 - 183 |
| 14.0 | දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ලෝකය | 184 - 197 |
| **නූතන ලෝක ඉතිහාසය** | | **198 258** |
| 8.0 | නූතන ලෝකයේ උදාව | 199 - 207 |
| 9.0 | යුරෝපා බල ව්‍යාප්තිය හා අධිරාජ්‍ය ගොඩනැගීම | 208 - 219 |
| 10.0 | නූතන ලෝකය හැඩගැස්වූ විප්ලව | 220 - 234 |
| 11.0 | කාර්මික විප්ලවය | 235 - 239 |
| 12.0 | ලිබරල්වාදී සහ ජාතිකවාදී සංකල්පවල වර්ධනය | 240 - 256 |
| **ග්‍රන්ථ නාමාවලිය** | | 257- 258 |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට පාසල් විෂය මාලාවේ හර විෂයක් ලෙස ක්‍රියාත්මක වූ ඉතිහාසය 2015 වර්ෂයේ සිට එලෙස ම ක්‍රියාත්මක වන අතර 6 - 9 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද දෙකක් හා 10 - 11 ශ්‍රේණි සඳහා සතියකට කාලපරිච්ඡේද තුනක් වෙන්කර ඇත.

අ.පො.ස.(සා.පෙළ) විභාගයට 10 - 11 ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ පදනම් කරගෙන ඇගයීම සිදු කිරීමට යෝජිතය.

6 - 11 ශ්‍රේණි සඳහා නිපුණතා පාදක ප්‍රවේශයට ප්‍රධාන නිපුණතා විසිතුනක් යටතේ ඉතිහාසය විෂයමාලාව ගොඩනගා ඇත. එම විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට සකසා ඇති මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශය හා විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මගපෙන්වීම යන කොටස් දෙකකින් සමන්විත ය.

ඉතිහාසය විෂය තුළින් සිසුන් තුළ ප්‍රගුණ කිරීමට අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීමේ දී විෂය කරුණු මෙන් ම විෂය කරුණු අධ්‍යයනය කිරීමට යොදාගන්නා ක්‍රමවේදයන් ද වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගුරු කාර්ය පහසු කර ගැනීම සඳහා විෂය අන්තර්ගතයෙහි ඇතැම් කොටස් ආවරණය වන පරිදි නිදර්ශක ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් කර ඇත. ඔබගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් පන්ති කාමර අවශ්‍යතාවන් අනුව මෙම ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කිරීම හා නව ක්‍රියාකාරකම් සැකසීමට හැකිය. මෙහි දී සැළකිලිමත් විය යුත්තේ ඉතිහාසය විෂයේ අරමුණු ඉටුවන පරිදි අවම වශයෙන් 50%ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කිරීමයි.

ඒ අනුව ඉතිහාසය විෂයේ අරමුණු ඉටුකරමින් නිපුණතා සපිරි නව ලොවකට උචිත සිසු පිරිසක් බිහිකිරීමට අත්වැලක් සැපයීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ඔබගේ සංවර්ධනාත්මක අදහස් හා යෝජනා අපවෙත යොමුකරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

**විෂයමාලා කමිටුව**

# හැඳින්වීම

2017 නව විෂයමාලා සංශෝධන යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ නිභාගයට අදාළ ඉතිහාසය විෂය නිර්දේශය කොටස් සතරකින් සමන්විත වේ.

- ශ්‍රී ලංකාව් ඉතිහාසය (ඈත අතීතයේ සිට ක්‍රි.ව 1978 දක්වා)
- ඉන්දියාවේ ඉතිහාසය (ඈත අතීතයේ සිට ක්‍රි.ව 1206 දක්වා)
- යුරෝපා ඉතිහාසය (ග්‍රීක,රෝම ශිෂ්ටාචාර අවදියේ සිට 1989 දක්වා)
- නූතන ලෝක ඉතිහාසය (ක්‍රි.ව 1500 සිට ක්‍රි.ව 1989 දක්වා)

ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය දෙස බලන විට අතීතයේ සිට හුදකලාව වර්ධනය වුවක් නොව විවිධ ගෝලීය බලපෑම් මත දේශියකරණය වෙමින් පෝෂණය වී වර්ධනය වූ බව පෙනේ.එවැනි ප්‍රවණථා හා බලපෑම් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඉතිහාසය සමග ඉන්දියාවේ ඉතිහාසය, යුරෝපා ඉතිහාසය, නූතන ලෝක ඉතිහාසය යන විෂය නිර්දේශ ද අ.පො.ස (උ.පෙළ) ඉතිහාසය සඳහා එක්කර ඇත.

අ.පො.ස (උ.පෙළ) සඳහා ඉතිහාසය විෂයමාලාව තෝරා ගන්නා ශිෂ්‍යයන්ට ශ්‍රී ලංකාව් ඉතිහාසය විෂය නිර්දේශය අනිවාර්ය වේ. ඉන්දියාවේ ඉතිහාසය, යුරෝපා ඉතිහාසය, නූතන ලෝක ඉතිහාසය යන විෂය කාණ්ඩ අතුරින් එක් විෂය කාණ්ඩයක් පමණක් තම අභිමතය පරිදි තෝරා ගත යුතුය.

2017 දී ක්‍රියාත්මක වීමට නියමිත මෙම විෂය නිර්දේශයට ඉගෙනුම් ඉගැනිවීම් ක්‍රියාවලිය සහ විෂය අන්තර්ගතයේ අරමුණු කරා යාම වඩාත් පහසු කිරීම සඳහා ඉගෙනුම් පල සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමේදී ඊට අනුකූලනය වූ ගෝලීය ප්‍රවණතා අදහා ගැනීම සහ මෑත කාලයේ සිදුකළ ඉතිහාස පර්යේෂණ අනාවරණ ඇසුරින් එක් එක් විෂය නිර්දේශයන්හ අන්තර්ගතයේ සංශෝධන කිහිපයක් සිදු කර ඇත.

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඃ**

- පැරණි නිර්දේශයට වඩා වැඩි අවධානයක් ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ ව අවධානය යොමු කිරීම
- මූලාශ්‍රය වර්ග කිරීමේ දී වර්තමාන නිර්දේශ යොදා ගැනීම
- " අපේ පැරණි තාක්ෂණය" නව විෂය නිර්දේශයට එකතු කිරීම

**ඉන්දියාවේ ඉතිහාසය ඃ**

- සම්පූර්ණ ඉන්දියා ඉතිහාසයට වඩා ශ්‍රී ලංකාවට බලපෑමක් එල්ල වූ සිදුවීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම

**යුරෝපා ඉතිහාසය ඃ**

- ගෝලීය වශයෙන් බලපෑමක් වූ ගෝලීය බලවේග පිළිබඳ අවධානය යොමු කර ඇත.

**නූතන ලෝක ඉතිහාසය ඃ**

- ලෝකයේ සිදු වූ ගෝලීය ප්‍රවණතා පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කර ඇත.

මෙම විෂය නිර්දේශය 12 සහ 13 ශ්‍රේ ණි සඳහා වූවකි. ඒ අනුව විෂය අන්තර්ගතය එක් එක් ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක කිරීමට සංවිධානය කර ගත යුතු වේ.

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# ඉතිහාසය විෂයයේ අරමුණු

6 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය තෙක් වූ විෂයමාලාව අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කර ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

1. ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම
2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මඟින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමය සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම
4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම
6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම
7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම
8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම

## ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව

| විෂය අරමුණ | ජාතික පොදු අරමුණ | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 1. ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම | √ | √ | | | | | √ | |
| 2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මඟින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම | √ | √ | √ | | | √ | √ | |
| 3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමය සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම | √ | √ | √ | | | | | √ |
| 4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම | √ | √ | √ | | | | | |
| 5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම | √ | √ | √ | | | | | |
| 6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැඟෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම | | | | | √ | | | |
| 7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම | | | | | √ | | | |
| 8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම | √ | √ | √ | | | | √ | |
| 9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම | | √ | | | | | | |
| 10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම | | √ | | | | | | |

# වාර සඳහා යෝජිත නිපුණතා මට්ටම්

| ශ්‍රේණිය සහ වාරය | | ශ්‍රී ලංකාවේ ඉතිහාසය | ඉන්දියාවේ ඉතිහාසය | යුරෝපා ඉතිහාසය | නූතන ලෝක ඉතිහාසය |
|---|---|---|---|---|---|
| 12 ශ්‍රේණිය | 1 වාරය | 1.1, 1.2, 1.3, 2.1, 2.2, 3.1, 3.2 4.1, 4.2, 4.3, 5.1 | 1.1, 2.1, 2.2, 3.1 | 1.1, 2.1 | 1.1, 1.2, 1.3, 2.1 |
| | 2 වාරය | 5.2, 5.3 | 4.1, 5.1 | 2.2, 3.1, 3.2, 3.3, 4.1, 4.2 | 3.1, 3.3, 3.4, 4.1 |
| | 3 වාරය | 6.1, 6.2, 6.3 | 5.2, 6.1 | 5.1, 6.1, 6.2, 7.1 | 5.1, 6.1, 7.1 |
| 13 ශ්‍රේණිය | 1 වාරය | 7.1, 7.2, 8.1 | 7.1, 8.1, (මුල් කොටස් දෙක) | 8.1, 9.1, 9.2, 10.1 | 8.1, 9.1, 9.2 |
| | 2 වාරය | 9.1, 9.2 10.1 | 8.1(දෙවන කොටස), 9.1 | 11.1, 12.1, 13.1 | 10.1 |
| | 3 වාරය | 11.1, 11.2, 11.3 | 10.1, 11.1, 11.2 | 13.2, 14.1, 14.2 | 11.1, 12.1 |

# විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි | 7.1 අවසන් දේශීය රාජධානිය පිළිබඳ ව විමර්ශනය කරයි | 7. දහසය වන සියවසේ සිට දහඅට වන සියවස තෙක් ශ්‍රී ලංකාව<br>• මහනුවර රාජධානිය | • මහනුවර රාජධානියේ ආරම්භය හා වර්ධනය විස්තර කරයි<br>• මහනුවර රාජධානියේ ශ්‍රේෂ්ඨ පාලකයන් අගය කරයි<br>• මහනුවර රාජධානියේ ඓතිහාසික ස්ථාන සිතියමක ලකුණු කරයි | 30 |
| | 7.2 මුහුදුබඩ පළාත්වල පෘතුගීසි හා ලන්දේසි ක්‍රියාකාරීත්වය විමසා බලයි | • මුහුදුබඩ පළාත්වල පෘතුගීසි හා ලන්දේසි පාලනය | • මුහුදුබඩ පළාත් පෘතුගීසින් හා ලන්දේසීන් අල්ලාගත් ආකාරය විස්තර කරයි<br>• මුහුදුබඩ පළාත්වල පෘතුගීසි හා ලන්දේසි පාලනය විස්තර කරයි<br>• පෘතුගීසීන් හා ලන්දේසීන් යටතේ පැවති ප්‍රදේශ සිතියමක ලකුණු කරය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි | 8.1 බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ස්ථාවර වූ ආකාරය පෙන්වා දෙයි | **8. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම හා ස්ථාපිත වීම**<br>• බලය පිහිටුවීම<br>- 1796 මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීම<br>- 1815 උඩරට ප්‍රදේශ බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට නතුවීම<br>- 1818 නිදහස් සටන<br>- 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ<br>- 1848 නිදහස් සටන | • බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ස්ථාපිත වීමට හේතු පැහැදිලි කරයි<br>• ස්වදේශීය විරෝධතා හා එහි ක්‍රියාකාරිත්වය විග්‍රහ කරයි<br>• තම ස්වාධිපත්‍ය රැකගැනීමට උරදුන් දේශීය නායකයන් අගය කරයි | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජයට එක් වූ ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | 9.1 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයට එක් වූ නවාංග පෙන්වා දෙයි | 9. බ්‍රිතාන්‍යයන් යටතේ ආර්ථික, සමාජීය වෙනස්කම් (1948 දක්වා)<br>• ආර්ථික හා සමාජ<br>- වතු ආර්ථිකයේ වර්ධනය<br>- ප්‍රවාහණය හා සන්නිවේදනය<br>- දේශීය කර්මාන්ත<br>- අධ්‍යාපනය<br>- සමාජීය වෙනස් වීම් | • බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් පැහැදිලි කරයි<br>• බ්‍රිතාන්‍ය ආර්ථිකය අනුව මෙරට සමාජීය වශයෙන් සිදු වූ වෙනස පෙන්වා දෙයි<br>• බ්‍රිතාන්‍ය ආර්ථික කටයුතු හේතුවෙන් මෙරට ආර්ථික හා සමාජීය වශයෙන් සිදු වූ යහපත් වෙනස අගයයි<br>• බ්‍රිතාන්‍ය ආර්ථික කටයුතු හේතුවෙන් යටපත් වූ දේශීය අනන්‍යතාව පෙන්වා දෙයි | 30 |
| | 9.2 විදේශීය බලවේග හමුවේ ජාතික නායකයන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්වා දෙයි | • දේශීය ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය | • දේශීය ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය පැහැදිලි කරයි<br>• දේශීයත්වය රැකගැනීමට උරදුන් නායකයන් අගයයි<br>• විදේශ බලවේග හමුවේ දේශීයත්වය රැකගැනීමට කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලාකාවේ විදේශාධිපත්‍ය පිළිබඳ ව අධ්‍යයනය කර තම රටේ ස්වාධිපත්‍ය රැක ගැනීමට කටයුතු කරයි | 10.1 බ්‍රිතාන්‍ය පාලනය හා දේශීය නායකයන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විමර්ශනය කරයි | 10. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික ව්‍යාපාර<br>- 1910, 1920, 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය<br>- 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය<br>- නිදහස ලැබීම | • බ්‍රිතාන්‍යයන් යටතේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පැහැදිලි කරයි<br>• ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සමඟ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි<br>• විදේශාධිපත්‍යය හමුවේ දේශීය නායකයන් ක්‍රියා කළ ආකාරය පෙන්වා දෙයි | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි** | | **11. නිදහසින් පසු ශ්‍රී ලංකාව** | | 60 |
| | 11.1 **නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පිහිටුවාගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විමර්ශනය කරයි** | • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය<br>- 1972, 1978 | • 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විස්තර කරයි<br>• 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විවේචනාත්මක ව විග්‍රහ කරයි | |
| | 11.2 **ස්වාධීන රාජ්‍යයක් ලෙස ජාතික සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙල විමර්ශනය කරයි** | • සංවර්ධන ක්‍රියාමාර්ග<br>- ආර්ථික සංවර්ධනය<br>* රාජ්‍ය ව්‍යවසාය<br>* කෘෂිකර්මය<br>* කර්මාන්ත<br>- සමාජ සුභසාධනය<br>* අධ්‍යාපනය<br>* සෞඛ්‍යය<br>* සලාක ක්‍රමය<br>* සන්නිවේදනය | • නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ග විස්තර කරයි<br>• නිදහසින් පසු ශ්‍රී ලංකාව සංවර්ධනය සඳහා ගත් ප්‍රයත්න අගය කරයි<br>• සංවර්ධන උපායමාර්ගවල ඵලදායීතා ව විග්‍රහ කරයි | |
| | 11.3 **නිදහස් ශ්‍රී ලංකාව විදේශ රාජ්‍ය සමග කටයුතු කළ ආකාරය විමසා බලයි** | • විදේශ ප්‍රතිපත්ති | • නිදහස් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති විග්‍රහ කරයි<br>• ශ්‍රී ලංකාව සමග මිත්‍ර සම්බන්ධතා පැවැත්වූ රටවල් සිතියමක ලකුණු කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතකරයි** | 7.1 **ඉන්දීය ඉතිහාසයට බලපෑමක් කළ විදේශීය රාජ්‍ය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි** | 7. **පශ්චාත් මෞර්ය යුගය හා විදේශීය දේශපාලන බලය**<br>• ශුංග පෙළපත<br>• ඉන්දු ග්‍රීක, ශක, පහ්ලව පාලනය හා ඔවුන්ගේ සංස්කෘතිය<br>• කුෂාණ යුගය හා ඉන්දීය ඉතිහාසයේ ඔවුන්ගේ දායකත්වය<br>• සාතවහන යුගය හා සංස්කෘතිය | • ඉන්දීය ඉතිහාසයට බලපෑම් කළ විදේශීය රාජ්‍ය පිළිබඳ තොරතුරු විස්තර කරයි<br>• විදේශීය රාජ්‍යයන්හි බලපෑම පෙන්වා දෙයි<br>• පශ්චාත් මෞර්ය යුගය සිතියමක ලකුණු කරයි | 35 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි** | 8.1 **ඉන්දියා ඉතිහාසය ගොඩනැඟීමේ දී ගුප්ත අධිරාජ්‍යයේ දායකත්වය විග්‍රහ කරයි** | **8. ගුප්ත අධිරාජ්‍යයේ උදාව**<br>• ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය<br>• ගුප්ත පාලකයන්ගේ ක්‍රියාකාරිත්වය හා ඉන්දීය සමාජයට එය බලපෑ අයුරු<br>• ගුප්තයන්ගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික කටයුතු<br>• ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය හා හූණ ආක්‍රමණ | • ගුප්ත අධිරාජ්‍යයේ ආරම්භය වර්ධනය හා පරිහානිය විස්තර කරයි<br>• ගුප්තවරුන්ගේ දේශපාලන සමාජ, ආර්ථික හා සංස්කෘතික කටයුතු ඉන්දීය සමාජය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරයි<br>• ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි** | **9.1 ගුප්තයන්ගෙන් පසු ප්‍රදේශීය පාලන ඒකකවල බලය වර්ධනය වූ ආකාරය පෙන්වා දෙයි** | **9. පශ්චාද් ගුප්ත යුගයේ උතුරු ඉන්දියාවේ දේශපාලන ප්‍රවණතා**<br>• ප්‍රදේශීය බලය නැවත ස්ථාපිත වීම<br>- කනෞජයේ බල වර්ධනය<br>- හර්ෂවර්ධන රජු<br>• පාල, ගුර්ජර ප්‍රතිහාර රාෂ්ට්‍රකුට පාලන බල හා කනෞජය<br>• ප්‍රාදේශීය පාලන ඒකක යටතේ ඒ ප්‍රදේශයන්හි දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික කටයුතු | • පශ්චාද් ගුප්ත අවධියේ බලවත් වූ ප්‍රදේශීය පාලන ඒකකවල තොරතුරු ඉදිරිපත් කරයි<br>• ප්‍රදේශීය පාලන ඒකක ඉන්දීය ඉතිහාසය කෙරෙහි සිදු කළ බලපෑම් පෙන්වා දෙයි<br>• පශ්චාද් ගුප්ත යුගය ඉන්දියාව සිතියමක ලකුණු කරයි | 35 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි** | 10.1 **මුස්ලිම් ආක්‍රමණවලට පදනම් සකස් වූ අයුරු විස්තර කරයි** | **10. අරාබි තුර්කි ආක්‍රමණ හා ඉන්දියා දේශපාලන තත්ත්වය**<br>• අරාබි තුර්කි ආක්‍රමණ<br>• සමකාලීන ඉන්දියාවේ දේශපාලන තත්ත්වය | • ඉන්දියාවට එල්ල වූ අරාබි, තුර්කි ආක්‍රමණ විස්තර කරයි<br>• අරාබි, තුර්කි ආක්‍රමණ මඟින් ඉන්දියා ඉතිහාසයට වූ බලපෑම පෙන්වා දෙයි<br>• අරාබීන් හා තුර්කීන් අල්ලා ගත් ප්‍රදේශ සිතියමක ලකුණු කරයි | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | 11.1 දකුණු ඉන්දියාවේ ප්‍රදේශීය රාජ්‍ය ඉන්දීය ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරයි | 11. දකුණු ඉන්දියා දේශපාලන පසුබිම<br>• දකුණු ඉන්දියා දේශපාලනය<br>- දේශපාලන ක්‍රියාකාරිත්වයේ ආරම්භය<br>- පල්ලව පාණ්ඩ්‍ය චෝළ හා චාලුක්‍ය පාලකයන් යටතේ දකුණු ඉන්දියාවේ නව ප්‍රවණතා<br>- දකුණු ඉන්දීය සමාජ, ආර්ථික හා සංස්කෘතික ලක්ෂණ හා එහි වර්ධනය කෙරෙහි බලපෑ සාධක | • දකුණු ඉන්දියා දේශ සීමා හා ප්‍රදේශීය රාජ්‍යයන් සිතියමක ලකුණු කරයි<br>• දකුණු ඉන්දියා දේශපාලන ආර්ථික හා සමාජ සංස්කෘතික තත්ත්වය පැහැදිලි කරයි<br>• දකුණු ඉන්දීය ප්‍රවණතා ඉන්දීය ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විස්තර කරයි | 20 |
| | 11.2 දකුණු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය විග්‍රහ කරයි | • දකුණු ඉන්දියාව හා ශ්‍රී ලංකාව<br>- දකුණු ඉන්දියානු බලපෑම හා ශ්‍රී ලංකාව | • දකුණු ඉන්දියාව, ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑමට හේතු දක්වයි<br>• ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම් ඇති කළ රාජ්‍යාන් හා එහි බලපෑම විස්තර කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| පුද්ගලයන්ගේ වීරෝදාර ක්‍රියා ඉතිහාසය ගොඩනැඟීමට දායක වූ අයුරු පරීක්ෂා කරයි | 8.1 නැපෝලියන් ගේ ප්‍රතිසංස්කරණ ප්‍රංශ ජාතිකත්වය ගොඩනැඟීමට දායක වූ ආකාරය පැහැදිලි කරයි | 8. නැපෝලියන් බොනපාට් සහ ඔහු ගේ අධිරාජ්‍යය<br>• නැපෝලියන් ප්‍රංශයේ බලයට පත් වීම<br>• නැපෝලියන් ගේ ප්‍රතිසංස්කරණ<br>• නැපෝලියන් ගේ විදේශ ප්‍රතිපත්තිය හා ප්‍රංශ බල ව්‍යාප්තිය<br>• නැපෝලියන් පරාජය වීම | • නැපෝලියන් බලවත් අධිරාජ්‍යයක් ගොඩනඟාගත් ආකාරය විස්තර කරයි<br>• ශක්තිමත් අධිරාජ්‍යයකු පරාජය වීමට හේතු දක්වයි<br>• නැපෝලියන් ගේ අධිරාජ්‍යය සිතියමක ලකුණු කරයි | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| යුරෝපයේ බල සමතුලිතතාව ආරක්‍ෂා කර ගැනීම සඳහා ජාතීන් අතරසාමූහික ක්‍රියා මාර්ගයක ඇති වැදගත්කම විග්‍රහ කරයි | 9.1 යුරෝපා සාමය පවත්වා ගැනීම කෙරෙහි වියානා සම්මේලනය දායක වූ අයුරු පරීක්‍ෂා කරයි | **9. වියානා සම්මේලනය**<br>• වියානා සම්මේලනය හැඳින්වීම<br>• වියානා සම්මේලනය කැඳවීමට සිදු වූ හේතු | • යුරෝපයේ සාමය ආරක්‍ෂා කර ගැනීමට වියානා සම්මේලනය ගත් ක්‍රියා මාර්ග පැහැදිලි කරයි | 15 |
| | 9.2 විවිධ කණ්ඩායම් එකතු වී සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම විග්‍රහ කරයි | • වියානා සම්මේලනය අනුගමනය කළ ක්‍රියාමාර්ග<br>• වියානා සම්මේලනයේ ප්‍රතිඵල | • සාමය ආරක්‍ෂා කර ගැනීම සඳහා සම්මේලන ක්‍රමයේ වැදගත්කම විවේචනාත්මක ව පැහැදිලි කරයි<br>• වියානා සමුළුවෙන් පසු යුරෝපය සිතියමක ලකුණු කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| විවිධ දේශපාලන චින්තන ප්‍රායෝගික ලෙස ක්‍රියාවට පරිවර්තනය කළ ආකාරය පරීක්ෂා කරයි | 10.1 ලිබරල්වාදී හා ජාතිකවාදී චින්තනවල වර්ධනය පැහැදිලි කරයි | 10. ලිබරල්වාදී හා ජාතිකවාදී චින්තනවල වර්ධනය<br>• ලිබරල්වාදී හා ජාතිකවාදී ව්‍යාපාරවල වර්ධනය<br>- 1848 විප්ලවය<br>• බලවේග<br>- ඉතාලිය එක්සත් කිරීම<br>- ජර්මනිය එක්සත් කිරීම | • දේශපාලන චින්තනවල වර්ධනයත් සමඟ විප්ලවීය බලවේග ඉස්මතු වූ ආකාරය විස්තර කරයි<br>• ලිබරල්වාදී හා ජාතිකවාදී දේශපාලන චින්තන ප්‍රායෝගික ව භාවිත වූ ආකාරය පෙන්වා දෙයි<br>• ඉතාලිය හා ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය සිතියම් මඟින් පෙන්වා දෙයි | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| බලය සඳහා ඇතිවන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැක ගැනීමට කටයුතු කරයි | 11.1 පළමු වන ලෝක යුද්ධයේ විනාශකාරී බව පෙන්වා දෙයි | 11. පළමු වන ලෝක යුද්ධය<br>• යුද්ධය ඇති වීමට බලපෑ ඓතිහාසික පසුබිම<br>- නව අධිරාජ්‍යවාදය<br>- අප්‍රිකාව සඳහා තරගය<br>- බෝල්කන් ප්‍රශ්නය<br>- යුරෝපය දෙපිලකට බෙදීම<br>• යුද්ධයේ ප්‍රධාන අවස්ථා<br>• යුද්ධයේ ප්‍රතිඵල<br>- වර්සායි ගිවිසුම<br>- යුරෝපා සිතියම වෙනස් වීම<br>• ජාතීන්ගේ සංගමය පිහිටුවීම | • ලෝක යුද්ධය සිදු වූ ආකාරය පැහැදිලි කරයි<br>• ලෝක යුද්ධයේ ප්‍රතිඵල පෙන්වා දෙයි<br>• ලෝක යුද්ධය හා සම්බන්ධ ස්ථාන හා රටවල් සිතියමක ලකුණු කරයි | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **නූතන ලෝකයෙ හි විවිධ දේශපාලන චින්තන ප්‍රායෝගික ලෙස ක්‍රියාවට පරිවර්තනය කළ ආකාරය පරීක්ෂා කරයි** | 12.1 **රුසියාන් විප්ලවය ලෝක බලවේගයක් වූ අයුරු පැහැදිලි කරයි** | 12.රුසියන් විප්ලවය<br>• විප්ලවය හැඳින්වීම<br>• විප්ලවයට බලපෑ හේතු<br>• විප්ලවයේ ප්‍රතිඵල<br>- සමාජවාදය | • රුසියාන් විප්ලවය විස්තර කරයි<br>• විප්ලවයෙන් පසු රුසියාවේ ක්‍රියාත්මක කල සමාජවාදී සංකල්ප පැහදිලි කරයි<br>• සමාජවාදය ලෝක බලවේගයක් වූ ආකාරය පෙන්වා දෙයි | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| බලය සඳහා ඇතිවන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැකගැනීමට කටයුතු කරයි | 13.1 දෙවන ලෝක යුද්ධයේ විනාශකාරී බව පෙන්වා දෙයි | 13. දෙවන ලෝක යුද්ධය<br>• යුද්ධය<br>- යුද්ධයේ ආරම්භය<br>- යුද්ධයේ ව්‍යාප්තිය<br>- යුද්ධයේ අවසානය සහ ප්‍රතිඵල | • දෙවන ලෝක යුද්ධයේ ආරම්භය හා ව්‍යාප්තිය පැහැදිලි කරයි<br>• දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල විග්‍රහ කරයි<br>• දෙවන ලෝක යුද්ධ සමය සහ පසු කාලයේ ලෝකය සිතියමක ලකුණු කරයි | 35 |
| | 13.2 ලෝක සාමය ඇති කර ගැනීම සඳහා සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම පරීක්ෂා කරයි | • එක්සත් ජාතීන්ගේ සංවිධානය<br>- අරමුණු<br>- ව්‍යුහය<br>- ක්‍රියාකාරිත්වය | • එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු පැහැදිලි කරයි<br>• දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක සාමය රැක ගැනීමට ගත් ප්‍රයත්න පැහැදිලි කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| බලය සඳහා ඇතිවන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැකගැනීමට කටයුතු කරයි | 14.1 බල කඳවුරු ගෝලීය දේශපාලනය කෙරෙහි ඇති කළ බලපෑම පැහැදිලි කරයි | 14. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝකය<br>● බල කඳවුරු<br>● ධනවාදී - නේටෝ<br>● සමාජවාදී - වෝර්සෝ<br>● නොබැඳි ජාතීන් | ● වර්තමාන දේශපාලන තත්ත්වයට බලපෑ හේතු පෙන්වා දෙයි<br>● බල කඳවුරුවල දේශපාලන ආර්ථික හා සමාජ ප්‍රවණතා විග්‍රහ කරයි | 25 |
| | 14.2 නිරවි යුද සමයේ බල කඳවුරු අතර ගැටුම් විග්‍රහ කරයි | ● නිරවි යුද්ධය<br>- මතගැටුම් හා මත ප්‍රචාරණය<br>- බල කඳවුරු බිඳී යෑම | ● නිරවි යුද්ධය පැහැදිලි කරයි<br>● තම පිල ශක්තිමත් කර ගැනීම සඳහා බල කඳවුරුවල ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි<br>● බල කඳවුරුවලට බෙදී ගිය ආකාරය පැහැදිලි කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ගැටලුකාරී තත්ත්වයන් තුලින් නිර්මාණය වන නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | 8.1 පළමු ලෝක යුද්ධයෙන් පසු පැනනැගුණ නව ප්‍රවණතා විමර්ශනය කරයි | 8. අන්තර් ලෝක යුද්ධ සමය<br>• ලෝක ආර්ථික අර්බුදය<br>• පැසිස්ට්වාදයේ හා නාසිවාදයේ නැඟීම<br>• ජපානයේ නැඟීම<br>• ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම | • අන්තර් ලෝක යුද්ධ සමය පැහැදිළි කරයි.<br>• ගැටුම්කාරී තත්ත්ව ඔත්සේ මතුවන නව ප්‍රවනතාවල බලපෑම පෙන්වා දෙයි.<br>• ගැටුම්කාරී තත්ව ඔත්සේ මතු වූ නව ප්‍රවනතාවල බලපෑම විමර්ශනය කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| බලය සඳහා ඇතිවන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැකගැනීමට කටයුතු කරයි | 9.1 දෙවන ලෝක යුද්ධයේ විනාශකාරී බව පෙන්වා දෙයි | 9 දෙවන ලෝක යුද්ධය<br>• යුද්ධයේ ආරම්භය<br>• යුද්ධයේ ව්‍යාප්තිය<br>• යුද්ධයේ අවසානය සහ ප්‍රතිඵල | • දෙවන ලෝක යුද්ධයේ ආරම්භය හා ව්‍යාප්තිය පැහැදිලි කරයි.<br>• දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල විග්‍රහ කරයි.<br>• දෙවන ලෝක යුද්ධ සමය හා පසු කාලයේ ලෝකය සිතියමක ලකුණු කරයි. | 35 |
| | 9.2 ලෝක සාමය ඇති කර ගැනීම සඳහා සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම පරීක්ෂා කරයි | • එක්සත් ජාතීන්ගේ සංවිධානය<br>- අරමුණු<br>- ව්‍යූහය<br>- ක්‍රියාකාරිත්වය | • එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු පැහැදිලි කරයි.<br>• දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක සාමය රැක ගැනීමට ගත් ප්‍රයත්න පැහැදිලි කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ස්වාධීන ව සිටීමේ අගය වටහාගෙන ජාතික අනන්‍යතාව රැකගැනීමට කටයුතු කරයි | 10.1ස්වාධීනත්වය ලබාගැනීම සඳහා ආසියා හා අප්‍රිකා රටවල් ක්‍රියා කළ ආකාරය විමසා බලයි | 10. යටත්විජිතහරණය<br>• ආසියාවේ සහ අප්‍රිකාවේ ජාතික සටන් ව්‍යාපාර | • ආසියා හා අප්‍රිකා මහාද්වීපවල පිහිටුවා ගත් බටහිර යටත් විජිත සිතියමක ලකුණු කරයි<br>• ආසියා, අප්‍රිකා රටවල් නිදහස ලබා ගැනීම සඳහා ගෙනගිය අරගල විස්තර කරයි<br>• ස්වකීය රටවල ස්වාධීනත්වය සාක්ෂාත් කර ගැනීමට උර දුන් නායකයන්ට ගෞරව කරයි | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| වර්තමාන ලෝක ප්‍රවණතා සහ එහි බලපෑම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | 11.1 වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක දේශපාලන බලවේග පිළිබඳ ව පැහැදිලි කරයි | 11. ලෝකය බල කඳවුරුවලට බෙදීයාම<br>• තුෂ්ණී යුද්ධ<br>• නොබැඳි ජාතීහු<br>• සෝවියට් දේශය බිඳවැටීම | • ලෝකය බල කඳවුරුවලට බෙදීගිය ආකාරය පැහැදිලි කරයි<br>• සෝවියට් දේශය බිඳවැටීම සමග ඇති වූ තත්ත්වය විග්‍රහ කරයි<br>• ලෝකයේ බල කඳවුරු හා ඊට අයත් රටවල් සිතියමක ලකුණු කරයි | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **විවිධ අභියෝග හමුවේ රටවල් ප්‍රගමනය වූ ආකාරය ආදර්ශයට ගෙන අභිවෘද්ධිය සඳහා කටයුතු කරයි** | **12.1 විසිවෙනි සියවසේ ශීඝ්‍ර දියුණුවක් අත් කරගත් ආසියාතික රටවල් විග්‍රහ කරයි** | **12. ආසියාවේ නැඟීම**<br>• චීන විප්ලවය හා චීනයේ නැඟීම<br>• දෙවන ලෝක යුද්ධයෙන් පසු ජපානයේ නැඟීම | • චීනය හා ජපානය ලෝකයේ දියුණු රටවල් බවට පත් වූ ආකාරය විස්තර කරයි<br>• චීනයෙන් හා ජපානයෙන් උකහා ගත හැකි ආද්ර්ශ පෙන්වා දෙයි | 20 |

(ඇ) පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්

ඉතිහාසය විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු සාර්ථක ව හා ඵලදායී ලෙස අධ්‍යයනය කිරීම සඳහාත් එ මඟින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහාත් ශිෂ්‍ය සහභාගිත්වය වර්ධනය වන ආකාරයට පාසල් වැඩ සටහන් සම්පාදනය කර ගැනීම ඒවා අතිශයින් ම ප්‍රයෝජනවත් විය යුතුය.

මෙහි යෝජනා කොට ඇත්තේ එවැනි පාසල් වැඩ සටහන් කිහිපයක් පමණි. මේ අනුව වෙනත් නිර්මාණාත්මක වැඩ සටහන් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීමේ නිදහස ඉතිහාසය උගන්වන ගුරුවරයාට හිමි වන බව සලකන්න.

- ඉතිහාස සංගමයක් පිහිටුවීමෙන් සිසු දැනුම ප්‍රවර්ධනය සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, විවාද, ප්‍රදර්ශන පැවැත්වීමත්, සඟරා, බිත්ති පුවත්පත් නිර්මාණය කිරීමත් වැනි කාර්යයන්ට සිසුන් යොමු කළ හැකිය.

- යටත් පිරිසෙන් වසරකට වරක් වත් වැදගත්කමකින් යුතු ස්ථානයකට හෝ ප්‍රදේශයකට හෝ අධ්‍යාපන චාරිකා සංවිධානය කළ යුතු ය. පන්ති කාමරයේ දී ලබා ගත් දැනුම තහවුරු කර ගැනීමට හා වර්ධනය කර ගැනීමට හැකි වන පරිදි පෙර සැලසුමකින් යුතු ව අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම වැදගත් වේ.

- දිවයිනේ පිළිගත් ඉතිහාසඥයන් පාසලට කැඳවා ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට සම්මන්ත්‍රණ මඟින් අවස්ථා ව සැලසිය හැකි ය.

- ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්මාරක පිළිබඳ ව සොයා බැලීම හා ඒවා ආරක්ෂා කිරීම සඳහා පාසල් හා ප්‍රජා  වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පුළුවන.

- ඉතිහාස පාඩම්වලට අදාළ වන චිත්‍ර, මූර්ති, කැටයම් හා වෙනත් කෞතුක වස්තු නිරීක්ෂණය කිරීමටත්, නිරීක්ෂණ වාර්තා සැපයීමටත් හැකි වන පරිදි කෞතුකාගාර වැඩසටහන් සංවිධානය තළ හැකිය.

- ඉතිහාස පාඩමට අදාළ ව අන්තර්ජාලය භාවිත කරමින් තොරතුරු ලබා ගැනීම සඳහා සිසුන් යොමු කළ යුතු ය.

**(ඇ) ඇගයීම සහ තක්සේරුකරණය**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් අපේක්ෂිත ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගනු ලැබීම සහ තහවුරු කිරීම සඳහාත් සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩ සටහන් දෙකක් ලෙස තක්සේරුව සහ ඇගයීම හඳුන්වා දිය හැකි ය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සිසුන්ට අපේක්ෂිත නිපුණතාවලට අදාළ ආසන්න ප්‍රවීණතා ලබා ගැනීම අපහසු නොවේ. ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරුවෙහි යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙආකාරයකින් මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එ නම් ප්‍රතිපෝෂණ (Feed Back) ඉදිරි පෝෂණ (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ ප්‍රබලතා සහ දුබලතා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්ය භාරය වේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා විෂය නිපුණතා අතුරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කරගත හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගනු ලැබීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩපිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රිය නිපුණතා පාදක ක්‍රියාකාරකම් දිශාභිමුඛ කරගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ක්‍රියාවෙන් ඉගෙනුම සඳහා සිසුන් යොමු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ. සිසුන් ක්‍රියාකාරකම්වල නියැළෙන විට හා එය අවසානයේ දී තක්සේරුව හා ඇගයීම සිදු කළ හැකි වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි ඒ සඳහා පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මේ අතුරෙන් පළමු නිර්ණායක තුන නිපුණතාව ගොඩනැගීමට ඒකරාශි වී තිබෙන දැනුම,කුසලතා සහ ආකල්ප මූලික කොටගෙන සැකසිය යුතුය. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා වර්ධනයට උපකාරී වන අයුරින් සැකසිය යුතු ය. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පන්ති කාමරය තුළ දී සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු ය. තක්සේරුව යටතේ එම චර්යා ශක්තිමත් කිරීමටත් ඇගයීම යටතේ ඒවා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු ය. මීට අමතරව පන්ති කාමරය තුළ ලිඛිත පරීක්ෂණ, ව්‍යාපෘති ආදියටත් මාසික. වාර සහ වසර අවසානයේ පවත්වනු ලබන පාසල් මට්ටමේ හෝ කලාපීය මට්ටමේ හෝ ලිඛිත පරීක්ෂණවලටත් සිසුන් ඉදිරිපත් කළ හැකි ය.



# ශ්‍රී ලංකාවේ ඉතිහාසය

## 07. දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව

දහසය වැනි සියවස වන විට ශ්‍රී ලංකාව කෝට්ටේ, මහනුවර හා යාපනය යනුවෙන් පාලන ඒකක තුනකට බෙදී තිබිණි. මේවා අතුරෙන් ආරම්භයේ දී කෝට්ටේ රාජධානිය වඩාත් ප්‍රබල ලෙස ඉස්මතු වී පැවතිණි. අනතුරු ව මහනුවර රාජධානිය ද බලවත් විය. ක්‍රි.ව. 1469 දී සේනාසම්මත වික්‍රමබාහු විසින් මහනුවර ස්වාධීන රාජ්‍යයක් ආරම්භ කරන ලදී. ස්වාභාවික රැකවරණ සහිත ව පිහිටි මෙම රාජධානිය පළමු වැනි විමලධර්මසූරිය රජු යටතේ ස්ථාවර රාජ්‍යයක් බවට පත් විය. අවසන් දේශීය රාජධානිය ලෙස බටහිර ජාතීන් සමඟ මෙන් ම, දේශීය බලවේග සමඟ ගැටෙමින් සිය ස්ථාවරත්වය පවත්වාගෙන යාමට මෙහි බලයට පත් වූ පාලකයෝ ක්‍රියා කළහ. එපරිද්දෙන් මහනුවර රාජ්‍යයේ බලයට පත් වූ ශ්‍රේෂ්ඨ පාලකයන්ගේ කාර්ය සාඵල්‍යයන් මෙන් ම මහනුවර රාජධානියේ ආර්ථික හා සමාජ තත්ත්වයන් ද මෙම ඒකකයේ දී අවධානයට යොමු කෙරේ.

දහසය වැනි සියවසේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසි පාලනයට නතු වීම මෙරට ඉතිහාසය කෙරෙහි බලපෑ තීරණාත්මක සිදුවීමක් විය. ප්‍රථමයෙන් කෝට්ටේ රාජ්‍යය උපායශීලී ලෙස සිය ග්‍රහණයට නතුකරගත් පෘතුගීසීහු පසු ව යාපනය රාජ්‍යය ද යටත් කර ගත්හ. අනතුරු ව ලන්දේසීන් විසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගන්නා ලදී. පෘතුගීසින් මෙන් ම ලන්දේසීහු ද මහනුවර රාජධානිය සිය අණසකට යටත් කර ගැනීමට ප්‍රබල උත්සාහයක් දැරූහ. ඔවුන්ගේ එම උත්සාහයන් ව්‍යර්ථ කරලීමට උඩරට පාලකයන් සමත් වූ නමුත් මුහුදුබඩ ප්‍රදේශවල දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වෙනස්කම් රැසක් සිදු කිරීමට පෘතුගීසිහු මෙන් ම ලන්දේසිහු ද සමත් වූහ . එම තොරතුරු මෙම පාඩම් ඒකකයේ දී අධ්‍යනය කෙරේ.

**නිපුණතාව** : • ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 7.1. අවසන් දේශීය රාජධානි පිළිබඳ ව විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :
- මහනුවර රාජධානියේ ආරම්භය හා වර්ධනය විස්තර කරයි.
- මහනුවර රාජධානියේ ශ්‍රේෂ්ඨ පාලකයන් අගය කරයි.
- මහනුවර රාජධානියේ ඓතිහාසික ස්ථාන සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :
**පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

### 7.1 මහනුවර රාජධානිය

- **මහනුවර රාජධානියේ ආරම්භය හා ව්‍යාප්තිය**
  - ක්‍රි.ව. 1415 දී හය වැනි පරාක්‍රමබාහු කෝට්ටේ රාජත්වයට පත් වූ අවධිය වනවිට මහනුවර රාජධානියට අයත් ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් වී තිබීම
  - ක්‍රි.ව. 1469 දී සේනාසම්මත වික්‍රමබාහු කුමරු මුල් වරට මහනුවර රාජ්‍යය ස්වාධීන රාජ්‍යයක් ලෙස ආරම්භ කිරීම
  - සේනාසම්මත වික්‍රමබාහු රජු මහනුවර රාජධානිය පිහිටුවූ අවස්ථාව වන විට පහත දැක්වෙන ප්‍රදේශ එයට අයත් වී තිබීම
    - * ගම්පොළ * සිදුරුවාන * දෙනුවර (උඩුනුවර, යටිනුවර)
    - * මාතලේ * පන්සියපත්තුව * ඌව
  - මහනුවර රාජධානියේ බලයට පත් වූ පාලකයන් හැම විට ම එහි ව්‍යාප්තිය සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
  - මහනුවර රාජධානිය දුර්ග රැසකින් හා මහවැලි ගඟින් ආරක්ෂා වී තිබීම
  - සෞම්‍ය දේශගුණයක් සහ සරුසාර භූමියක් සහිත කලාපයක් මහනුවර රාජධානියට අයත් වීම


යොමුව
කෝට්ටේ රාජධානිය
1521 දී කෝට්ටේ රාජධානිය බෙදීගිය ආකාරය දක්වෙන සීමා
යාපනය රාජධානිය
වන්නියාර්වරුන් ලෙස හඳුන්වන දේශීය අර්ධ ස්වාධීන පාලකයන් යටතේ ප්‍රදේශ
මහනුවර රාජධානිය
රාජධානි මධ්‍යස්ථාන
යාපනය රාජධානිය
නල්ලූර්
ව න් නි
මන්නාරම
ත්‍රිකුණාමලය
කල්පිටිය
පුත්තලම
මඩකලපුව
හලාවත
ම හ නු ව ර
රා ජ ධා නි ය
මහනුවර
මීගමුව
සීතාවක
කොළඹ
කෝට්ටේ
සීතාවක
පානම
රයිගම
කළුතර
රයිගම
හම්බන්තොට
ගාල්ල
මාතර
N
W
E
S
0 10 20 40
කිලෝමීටර

- **මහනුවර රාජධානියේ කැපී පෙනෙන පාලකයෝ**

**පළමු වැනි විමලධර්මසූරිය රජතුමා (1592 1604)**

- **දේශපාලන සේවාව**

- සීතාවක රාජසිංහ රජු උඩරට රාජ්‍යය ආක්‍රමණය කර එය අත්පත් කරගත් අවස්ථාවේ වීරසුන්දර බණ්ඩාර නමැති ප්‍රභූවරයාගේ පුත්‍රයා වූ කොනප්පු බණ්ඩාර පෘතුගීසීන් වෙත පලායාම
- දොන් පිලිප් නමින් බෞතීස්ම ලබා පෘතුගීසින්ගේ රැකවරණ යටතේ හැදී වැඩුණ උඩරට රාජ්‍යයේ උරුමකරුවකු වූ යමසිංහ බණ්ඩාරට උඩරට සිහසුන ලබාදීම සඳහා පෘතුගීසින් දියත් කළ සටන මෙහෙයවූ කොනප්පු බණ්ඩාර දොන් පිලිප් උඩරට රජ කරවීමට සමත් වීම
- රජ වී ස්වල්ප කලකින් දොන් පිලිප් (යමසිංහ බණ්ඩාර) මියගිය අතර කොනප්පු බණ්ඩාර සිහසුන අත්පත් කර ගැනීම
- පෘතුගීසින් සමීපයේ සිටි උඩරට රාජ්‍යයේ උරුමකාරියක වූ කුසුමාසන දේවිය (හෙවත් දෝන කතිරිනා) රජ කරවීම සඳහා පෘතුගීසින් උඩරටට එල්ල කළ ආක්‍රමණය කොනප්පු පරාජය කරනු ලැබීම
- ක්‍රි.ව. 1592 දී ඔහු පළමු වැනි විමලධර්මසූරිය නමින් රාජත්වයට පත් වී කුසුමාසන දේවිය විවාහ කරගැනීමත් සමඟ උඩරට රාජ්‍යයේ සිහසුනට ඇති අයිතිය තහවුරු කරගැනීම
- උඩරට ස්වාධීන රාජ්‍යයක් බවට පත් කිරීම
- කන්ද උඩ පස් රටට සීමා වී තිබූ මහනුවර රාජ්‍යය තව දුරටත් පුළුල් කිරීම
- උඩරට රාජ්‍යයෙන් පලවා හරින ලද පෘතුගීසින් මුහුදුබඩ ප්‍රදේශවලින් ද පලවා හැරීමට උත්සාහ කළ අතර එම ප්‍රයත්නය අසාර්ථක වූ නමුත් පෘතුගීසි බලය මුහුදුබඩ ප්‍රදේශවලට සීමා කර තැබීමට සමත් වීම
- සීතාවක රාජ්‍යයේ ආධිපත්‍යයෙන් ද මහනුවර රාජ්‍යය මුදා ගැනීම

- **ආගමික සේවාව**

- රෝමානු කතෝලික ආගම අතහැර බුදු දහම වැලඳ ගැනීම
- විමලධර්මසූරිය ලෙස බෞද්ධ නමක් භාවිත කිරීම
- පෘතුගීසින්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම කරවීම
- බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම
- ලංකාතිලක විහාරය, රිදී විහාරය, ගඩලාදෙණිය ඇතුළු වෙහෙර විහාර රැසක් ප්‍රතිසංස්කරණය කිරීම
- දන්ත ධාතූන් වහන්සේ තමා සතු කරගැනීමෙන් මුළු දිවයිනේ ම පාලකයා ලෙස පිළිගැනීමක් ලැබීම

- **ආර්ථික සේවාව**

- යකඩ කර්මාන්තයේ දියුණුව - කම්හල් විශාල ප්‍රමාණයක් පිහිටුවීම
- ගොවිතැන දියුණු කිරීමට කටයුතු කිරීම
- කපු වගාව දියුණු කිරීම
- උඩරට රාජ්‍යයට අයත් ප්‍රදේශවල වෙඩිලුණු කර්මාන්තය දියුණු කිරීමට ක්‍රියා කිරීම

- **සෙනරත් රජු (1604 1635)**

  - පළමු වැනි විමලධර්මසූරිය රජුගේ ඇවෑමෙන් එතුමාගේ ඥාති සහෝදරයකු වූ සෙනරත් බලයට පත් වීම
  - සෙනරත් රජු ද සිය රාජ්‍ය උරුමය තහවුරු කරගැනීම සඳහා කුසුමාසන දේවිය විවාහ කරගැනීම
  - සිහසුනට පත් මුල් කාලයේ අභ්‍යන්තර ආරවුල් විසඳීමට සිදු වීම
  - සිය පාලන කාලය තුළ පෘතුගීසින්ගෙන් උඩරට රාජ්‍යයට එල්ල වූ තර්ජන මැඩ පැවැත්වීම
  - ශ්‍රී ලංකාවේ නැඟෙනහිර ප්‍රදේශවලට රාජ්‍යය ව්‍යාප්ත කිරීම

- **දෙවෙනි රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1635 - 1687)**

  - සෙනරත් රජුගේ ඇවෑමෙන් ඔහුගේ පුත් මහා අස්ථාන කුමරු රාජසිංහ නමින් රජ වීම
  - මොහු ලක් ඉතිහාසයේ දෙවෙනි රාජසිංහ නමින් හඳුන්වනු ලැබීම
  - පෘතුගීසින්ගෙන් එල්ල වූ තර්ජන මැඩ පැවැත්වීමට ක්‍රියා කිරීම
  - ක්‍රි.ව. 1664 දී අඹන්වෙල රාළගේ නායකත්වයෙන් ඇති වූ කැරැල්ල මර්දනය කිරීම
  - පෘතුගීසින් මෙරටින් පලවා හැරීමට ලන්දේසින්ගේ සහය ලබාගැනීම
  - ක්‍රි.ව 1638 ගිවිසුම
  - ලන්දේසින්ගේ බලපෑම් අවම වන ලෙස උපක්‍රමශීලි ව ක්‍රියා කිරීම
  - ත්‍රී සිංහලාධීශ්වර යන විරුද නාමයෙන් මෙතුමා හැඳින්වීම

- **දෙවෙනි විමලධර්මසූරිය රජතුමා (ක්‍රි.ව. 1687 - 1707)**

  - දෙවෙනි රාජසිංහ රජුගේ පුත්‍රයා වූ මොහු සාමකාමී පාලකයකු වීම
  - එතරම් කාර්යක්ෂම පාලකයකු නොවූ නිසා මෙතුමාගේ පාලන කාලයේ දී උඩරට ප්‍රභූ බලය වර්ධනය වීම
  - ලන්දේසින්ගේ තර්ජන මැඩ පවත්වමින් ඔවුන් සමඟ සාමකාමී ව ක්‍රියා කිරීම
  - බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් වැඩම කරවා උපසම්පදාව යළි නඟා සිටුවීමට උත්සාහ කිරීම
  - දෙවෙනි රාජසිංහ රජු ව්‍යාප්ත කර තිබූ මහනුවර රාජ්‍යයට අයත් ප්‍රදේශ එලෙසින් ම රැක ගැනීම

- **ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා (ක්‍රි.ව. 1707 - 1739)**

  - දෙවෙනි විමලධර්මසූරිය රජුගෙන් පසු උඩරට සිහසුනට පත් වීම
  - පරිපාලන කටයුතුවල දුර්වලතාව නිසා ප්‍රභූ බලය තව දුරටත් වර්ධනය වීම
  - සිය අගමෙහෙසිය ලෙස දකුණු ඉන්දියානු නායක්කාර් වංශික කුමරියක සරණපාවා ගැනීම
  - 1709 දී රජුට විරුද්ධ ව රදලවරුන් කුමන්ත්‍රණය කිරීම. එම උපක්‍රම සාර්ථක වූ අතර රදල ප්‍රභූ බලය වර්ධනය වීම
  - ක්‍රි.ව. 1739 නරේන්ද්‍රසිංහ රජුගේ අභාවයත් සමඟ රජුට පුතුන් නොසිටි බැවින් නායක්කර් වාංශික සම්ප්‍රදායයට අනුව බිසවගේ සොහොයුරා වූ ශ්‍රී විජය රාජසිංහ රාජත්වයට පත් වීම
  - මේ නිසා ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් පසු නායක්කර් පරපුර මහනුවර රාජධානියේ බලයට පත් වීම

**නායක්කර් රජ පෙළපත**

- **ශ්‍රී විජය රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1739 - 1747)**
  - නායක්කර් රාජ වංශයේ ආරම්භක පාලකයා වීම
  - බුද්ධාගම වැලඳගෙන දිගු කලක් තිස්සේ භික්ෂූන් වහන්සේලා ඇසුරේ හැදී වැඩුණ ඔහු රජ වීමෙන් පසු ව සැදැහැවත් බෞද්ධයකු ලෙස බුද්ධාගමේ දියුණුවට කටයුතු කිරීම
  - නායක්කර් වංශික කුමාරිකාවක විවාහ කරගත් අතර ඒ සමග පැමිණි ඥාතීන් නිසා තව දුරටත් රාජසභාවේ නායක්කර් බලය වර්ධනය වීම
  - වාණිජ කටයුතු සම්බන්ධ ව පැන නැඟුණු මතභේද නිසා ලන්දේසීන් සමග ආරවුල් ඇති වීම
  - වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒමට උත්සාහ ගත් නමුත් එම උත්සාහය ව්‍යර්ථ වීම

- **කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1747 - 1782)**
  - ශ්‍රී විජය රාජසිංහ රජුට දරුවන් නොසිටි බැවින් රජුගේ බිසවගේ සහෝදරයා වූ කීර්ති ශ්‍රී රාජසිංහ කුමරයා අවුරුදු 16 තරම් ළාබාල වයසේ දී රාජත්වයට පත් වීම
  - මේ නිසා ඔහුගේ පියා වූ නරේනප්පා රාජ්‍ය කටයුතු මෙහෙයවීම
  - පරිහානියට පත් ව තිබූ බුදු දහම නගා සිටුවීමට වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ උපදෙස් ලබා ගැනීම
  - විහාරාරාම රැසක් ප්‍රතිසංස්කරණය කිරීම
  - උඩරට ප්‍රභූවරුන්ගේ කුමන්ත්‍රණයකට මුහුණ දීම (1760)
  - ලන්දේසීන් පලවා හැරීමට ජෝන් ෆයිබස් නම් දූතයා හරහා ගත් උත්සාහය අසාර්ථක වීම

- **රාජාධිරාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1782 1798)**
  - කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සහෝදරයකු වන මොහුගේ පාලන සමයේ දී මහනුවර රාජ්‍යය පරිහානිය කරා ගමන් කිරීම
  - උඩරට ප්‍රභූවරුන් හා නායක්කර්වරුන් අතර මතභේද උග්‍ර වීම
  - එම තත්ත්වය යටතේ උඩරට රාජ්‍යයේ පරිපාලන කටයුතු දුර්වල වීම
  - ලන්දේසින් පලවාහැරීමට ඉංග්‍රීසින්ගේ හා ප්‍රංශවරුන්ගේ සහය ලබාගැනීමට උත්සාහ කිරීම
  - ක්‍රි.ව. 1796 දී රජුගේ උපකාරයකින් තොර ව ඉංග්‍රීසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීම

- **ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1798 -1815)**
  - රාජාධිරාජසිංහ රජුගේ ඇවෑමෙන් පිළිමතලාවේ මහ අදිකාරම්ගේ අවශ්‍යතාව නිසා කන්නසාමි කුමරු ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් බලයට පත් වීම
  - නායක්කර් ප්‍රධානින්ගේ උපදෙස් අනුව මෙතුමා ක්‍රියා කිරීම
  - රජු හා උඩරට රදල ප්‍රධානින් අතර මතභේද තවත් උග්‍ර වීම
  - ක්‍රි.ව. 1803 ඉංග්‍රීසින් එල්ලකළ ආක්‍රමණය පරාජය කිරීමට උඩරැටියන්ගේ සහය ලැබීම
  - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අවසන් කාලයේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා ජනතා සහය මෙන් ම රටවැසියන්ගේ රාජපාක්ෂික භාවය ඔහුට අහිමි වීම
    * රජු ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කළ බවට චෝදනා කොට පිළිමතලව්වේගේ හිස ගසා දැමීම
    * ඇහැලේපොළ පවුලේ සාමාජිකයන්ට දරුණු දඬුවම් පමුණුවා මරා දැමීම
    * දළදා මැඳුර ඉදිරිපිට දේවසංහිඳ නම් ස්ථානය දණ්ඩන භූමියක් ලෙස යොදා ගැනීම
    * රජුගේ මතයන්ට එරෙහි වූ භික්ෂූන්, රදල ප්‍රධානින් හා සාමාන්‍ය ජනතාවට මරණ දඬුවම ඇතුළු දරුණු දඬුවම් ලබා දීම
  - 1815 දී ඉංග්‍රීසින් මහනුවරට එරෙහි ව සිදු කළ ආක්‍රමණයේ දී රජුට ජනතා සහය නොලැබීම නිසා බ්‍රිතාන්‍යන් යටතට පත්වීම
  - 1815 උඩරට ගිවිසුමත් සමග ශ්‍රී ලංකාවේ රාජාණ්ඩු ක්‍රමයේ අවසානය සිදු වීම

**මහනුවර රාජධානියේ සමාජ ආර්ථික හා සංස්කෘතික රටාව**

- **පාලන තන්ත්‍රය**

  - මහනුවර රාජධානියේ පරිපාලන තන්ත්‍රයේ ඉහළ ම පුද්ගලයා ලෙස රජුට බලතල රැසක් හිමි වී තිබීම
  - මහවාසල නිලධාරීන්, රාජසභාවේ නිලධාරීන් සහ අදිකාරම්වරුන් ආදී නිලධාරීන් රැසක් පිළිබඳ ව සඳහන් වීම
  - ප්‍රදේශීය පාලනය, බද්දෙ සංවිධානය හා විහාර දේපළ පාලනය ආදී ලෙස පරිපාලන ඒකකවලට බෙදා තිබීම
  - මහනුවර රාජධානියට ආවේණික අධිකරණ පද්ධතියක් පැවතීම
  - සම්ප්‍රදායානුකූල ව පවත්වාගත් දේශීය නීති ක්‍රියාත්මක කිරීම

- ආගම

  බුදු දහම

  - ජනතාවගෙන් බහුතරයක් බෞද්ධයන් වීම
  - පළමු වැනි විමලධර්මසූරිය රජු විසින් බෞද්ධ පුනර්ජීවනය ආරම්භ කිරීම
  - වරින් වර බුරුමය හා සියමය ආදී රටවල සහයෙන් උපසම්පදා කර්මය නඟා සිටුවීම
  - වැලිවිට ශ්‍රී සරණංකර හිමියන් බෞද්ධ පුනරුදයේ නියමුවකු ලෙස ක්‍රියා කිරීම
  - පිරිවෙන් අධ්‍යාපනය දියුණුවට පත් වීම
  - බලයට පත් වූ සැම පාලකයකු ම බෞද්ධාගම පුනර්ජීවනය සඳහා ක්‍රියා කිරීම

  උදාහරණ : * පළමු වැනි විමලධර්මසූරිය රජු දළදා මාලිගයක් ඉදි කර දෙල්ගමුවේ සිට දළදා වහන්සේ මහනුවරට වැඩම වා එහි තැන්පත් කිරීම
  * කීර්ති ශ්‍රී රාජසිංහ රජු මහනුවර වාර්ෂික දළදා පෙරහර අඛණ්ඩ ව පැවැත්වීම
  * ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා දළදා මාලිගාවේ පත්තිරිප්පුව ඉදි කිරීම



*දළදා මාලිගාවේ පත්තිරිප්පුව*

*( Source: http://wonderfulwanderings.com/temple-of-the-tooth-relic-kandy-sri-lanka)*

- **හින්දු ආගම :**
  - මහනුවර රාජධානියේ නායක්කර් වංශය බලයට පත් වීමත් සමඟ හින්දු ආගම ව්‍යාප්ත වීම
  - නායක්කර් රජවරුන් චාරිත්‍රයක් ලෙස බුදුදහම වැලඳගත්ත ද හින්දු දෙවිවරුන් ඇදහීම ඇතුළු සෙසු සිරිත් විරිත් අනුගමනය කිරීම
  - පන්සල් තුළ දේවාළ ඉදි වීම හා දළදා පෙරහැරට සතර මහා දේවාල පෙරහැර එකතු වීම හිංදු ආගමික බලපෑම නිසා සිදු වීම



*මහනුවර නාථ දේවාලයය* ***(Source:http://www.theva.lk/)***

- **ක්‍රිස්තියානි ආගම :**
  - ලන්දේසින්ගේ හිරිහැරවලට ලක් වූ රෝමානු කතෝලිකයන් මුහුදුබඩ ප්‍රදේශ අතහැර උඩරට පදිංචි වීම
  - ජුසේ වාස් වැනි කතෝලික පූජකවරුන් ද ලන්දේසි තාඩනපීඩන නිසා උඩරටට පැමිණ ආගම් ප්‍රචාරයේ නියුක්ත වීම

- **ඉස්ලාම් ආගම :**
  - වෙළෙඳ කටයුතු සඳහා පැමිණි මුස්ලිම්වරුන්ගෙන් මෙන් ම පෘතුගීසි තාඩන පීඩන හමුවේ උඩරටට පැමිණි මුස්ලිම්වරුන්ගෙන් ඉස්ලාම් ආගම ව්‍යාප්ත වීම
  - ඉස්ලාම් දේවස්ථානයක් කන්දේ නුවර පිහිටි බව රොබට් නොක්ස්ගේ වාර්තාවේ සඳහන් වීම
  - පහතරටින් පලා ආ මුස්ලිම්වරුන් උඩරට රාජ්‍යයේ රැකවරණ යටතේ පදිංචි වීම නිසා මුස්ලිම් ජනගහනය වේගයෙන් වර්ධනය වී ඉස්ලාම් ආගම ව්‍යාප්ත වීම

- **ආර්ථික රටාව :**
  - පරිභෝජනය පදනම් කරගත් කෘෂිකාර්මික ආර්ථිකයක් පැවතීම
  - කඳුකර ප්‍රදේශ බහුල වූ නිසා වර්ෂා ජලය උපයෝගී කරගෙන හෙල්මළු ක්‍රමයට වී වගා කිරීම
  - හේන් වගාවට වැඩි වැදගත්කමක් හිමි වූ අතර, ධාන්‍යවර්ග ඇතුළු බෝග රැසක් ඒවායේ වගා කිරීම

- සත්ත්ව පාලනයට ද වැදගත් තැනක් හිමි වූ අතර එළ ගවයන් සහ මී ගවයන් ඇති කිරීම
- අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම පැවතීම
- අභ්‍යන්තර වෙළෙඳාමේ වැඩි ප්‍රමාණයක් භාණ්ඩ හුවමාරුව මඟින් ද සුළු වශයෙන් මුදල් භාවිතය මඟින් ද සිදු කිරීම
- උඩරට ගම් එකිනෙක සම්බන්ධ කළ අඩි පාරවල් අසල රෙදිපිළි, ලුණු, දුම්කොළ, හුනු හා වළන්, බෙහෙත් ද්‍රව්‍ය, ලෝහ භාණ්ඩ ආදිය අලෙවි කළ කුඩා කඩපිල් තිබූ බව රොබට් නොක්ස් ගේ සඳහන් කර තිබීම
- මුස්ලිම්වරුන් විදේශ වෙළඳාමේ දී අතරමැදියන් ලෙස ක්‍රියා කිරීම
- ඉන්දියාව, පෘතුගාලය, ඕලන්දය වැනි රටවල් සමඟ විදේශ වෙළෙඳාම වැඩි වශයෙන් සිදු කිරීම
- අලි - ඇතුන්, ඇත් දළ, මුතු, මැණික්, කුරුඳු, පුවක්, හා කුළුබඩු වර්ග ආදිය ප්‍රධාන අපනයන භාණ්ඩ ලෙස වැදගත් වීම
- මහනුවර රජවරුන් වෙළෙඳ කටයුතුවලට කල්පිටිය හා කොට්ටියාරාම වැනි වරායවල බහුල ව භාවිතාකිරීම

- **සමාජ සංවිධානය :**
  - රජු රටේ සියලු ඉඩම්වල උරුමකරු ලෙස පිළිගැනීම
  - අයිතිය හා භුක්තිය පදනම් කරගෙන රටේ මුළු ඉඩම් ප්‍රමාණය ගබඩාගම්, නින්දගම්, විහාරගම්, දේවාලගම්, පරවේණි ගම් ලෙස කොටස් කීපයකට බෙදී පැවතීම
  - රටවැසියා භුක්ති විඳි ඉඩම් වෙනුවෙන් කිසියම් සේවාවක් හෝ භාණ්ඩ ප්‍රමාණයක් හෝ ලබා දීම
  - පවුල සමාජයේ ප්‍රධානතම ඒකකය වීම
  - කුල ක්‍රමය අනුව පදනම් වූ ග්‍රාමීය ස්වයංපෝෂිත සමාජයක් පැවතීම
  - ඒ ඒ කුලයන්ට වෙන් වූ ආර්ථික කටයුතු දක්නට ලැබීම
  - ආවාහ විවාහ කටයුතු සමාන කුලයන් අතර පමණක් සිදු වීම
  - දීග විවාහය, බින්න විවාහය හා එකගෙයි කෑම ලෙස විවාහය ක්‍රම තුනකට ක්‍රියාත්මක වීම
  - ගොවිතැන් කටයුතු ප්‍රධාන කොටගත් එකිනෙකාගේ වැඩ කටයුතු ගමේ සියලු දෙනාගේ සහයෝගයෙන් සිදු කිරීම - අත්තම් ක්‍රමය

- **අධ්‍යාපනය :**
  - මහනුවර රාජධානියේ ඇති වී තිබූ දේශපාලන ව්‍යාකූලතා නිසා මුල් භාගයේ අධ්‍යාපනයේ පසුබෑමක් දක්නට ලැබීම
  - කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහය යටතේ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය භික්ෂූන් රාජ්‍යය පුරා අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති කිරීමට දායක වීම
  - පන්සල පදනම් කරගත් අධ්‍යාපන ආයතන රැසක් දියුණුවට පත් වීම. (අස්ගිරිය, ගංගාරාමය, සුදුහුම්පොළ, අම්පිටිය, නිත්තවෙල, පෝයමළු විහාරය, ඇම්බැක්කේ අසල නියමකන්ද පිරිවෙන)



*පැරණි අස්ගිරි විහාරය*

*( source http://amazinglanka.com/wp/asgiri-viharaya/)*

- **සාහිත්‍යය**
    - වැලිවිට සරණංකර හිමි, තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත හිමි, කරතොට ධම්මාරාම හිමි වැනි වියත් භික්ෂූන් වහන්සේලා රැසක් බිහි වීම
    - එම භික්ෂූන් වහන්සේලා වෙතින් භාෂා ශාස්ත්‍රය ප්‍රගුණ කළ රාජාධිරාජසිංහ වැනි පාලකයින් ග්‍රන්ථකරණයේ නියැළීම
    - විවිධ සාහිත්‍ය ග්‍රන්ථ රැසක් මේ යුගයේ දී රචනා වීම
      ප්‍රශස්ති කාව්‍ය : රාජසිංහ වර්ණනා, ඉංග්‍රීසි හටන, රාජසිංහ සිරිත
      කවි කතා : වෙස්සන්තර ජාතකය, දේවධර්ම ජාතකය, සුමුගුදාකව, තෙරුවන්මාලා, මුතුකුමාරි කථාව
      වෙනත් : භේසජ්ජ මංජුසා සන්නය, සතරබණවර සන්නය, සද්ධර්මාවවාද සංග්‍රහය, පත්තිනි හැල්ල, ගණදෙවි හැල්ල
    - වැලිවිට සරණංකර හිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට අයත් දික්වැල්ලේ ශ්‍රී බුද්ධරක්ඛිත හිමි, හරණ ගණිතයා, සාලි ඇලේ වනරතන හිමි වැනි උගතුන් ග්‍රන්ථකරණයේ නියැළීම
    - පසු කාලයේ දී ලංකාවේ දකුණේ (මාතර සාහිත්‍ය යුගයේ) ඇති වූ සාහිත්‍ය ප්‍රබෝධයට ද මෙම සාහිත්‍ය පුනරුත්ථාපනය හේතු වීම

- **කලා ශිල්ප**
    - ලී, ගල්, ඇත්දත්, තඹ, පිත්තල, රන්, රිදී ආදී මාධ්‍යවලින් නිම කළ විවිධ නිර්මාණ රැසක් දක්නට ලැබීම
    - මහනුවර දළදා මාලිගය, රිදී විහාරය, ඇම්බැක්කේ දේවාලයය වැනි ස්ථානවල මෙම කලා නිර්මාණ ශේෂ වී තිබීම
    - චිත්‍ර කලාවේ දියුණුවට රාජ්‍ය අනුග්‍රහය නොමඳ ව ලැබීම
    - ජාතක කථා හා බුදු සිරිත චිත්‍රයට නැඟීම වැඩි වශයෙන් සිදු වීම
    - විවිධ ශාක වර්ග, පාෂාණ වර්ග, මැලියම් වර්ග යොදා ගනිමින් සකස් කරගත් සුදු, කළු, කහ, රතු වැනි වර්ණ චිත්‍ර ඇඳීම සඳහා භාවිත කිරීම
    - දඹුල්ල ලෙන් විහාරයේ හා දළදා මාලිගාවේ ඇති චිත්‍ර මේ යුගයට අයත් විශිෂ්ට නිර්මාණ



*දළදා මාලිගාවේ සිතුවම්*

*(sourcehttp://www.descoperalocuri.ro/vacante-in-afara-tarii/destinatii-exotice-din-*asia.html)

ඇගයීම 01

- **අංක 01 සිට 02 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න**

1. (1) දන්තුරේ සටන (2) වෙල්ලස්ස සටන (3) බලන සටන
   (4) රන්දෙණිවෙල සටන (5) ගන්නෝරුව සටන (............)

2. (1) උඩුනුවර (2) යටිනුවර (3) මතුරට (4) දුම්බර (5) හේවාහැට (............)

- **අංක 3 සිට 4 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න**

3. (1) 1617 ගිවිසුම - සෙනරත් රජු සහ පෘතගීසීන්
   (2) 1638 ගිවිසුම - දෙවන රාජසිංහ රජු සහ ලන්දේසීන්
   (3) 1766 ගිවිසුම - කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ ලන්දේසීන්
   (4) 1796 ගිවිසුම - බ්‍රිතාන්‍යයන් සහ දෙවන විමලධර්මසූරිය රජු
   (5) 1815 උඩරට ගිවිසුම - උඩරට ප්‍රධානයන් සහ බ්‍රිතාන්‍යයන් (............)

4. (1) මුල්ලේරියා සටන - ලොරෙන්සෝද අල්මේදා
   (2) දන්තුරේ සටන - පේද්‍රෝ ලෝපේස්ද සූසා
   (3) ගන්නෝරුව සටන - දොන් ජෙරනිමෝද අසවේදු
   (4) රන්දෙණිවෙල සටන - කොන්ස්තන්තීනු ද සා ද නොරොඤ්ඤා
   (5) බලන සටන - දියොගු ද මේලෝ ද කැස්ත්‍රෝ (............)

- **අංක 5 සිට 6 තෙක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන දින වකවනු සමූහයක් x සහ y තීරුවල දී ඇත. y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. හ තීරුව ං තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන් තුළ ලියන්න.**

5.

| x | | y |
|---|---|---|
| (1) 1562 | A | බලන සටන |
| (2) 1594 | B | ගන්නෝරුව සටන |
| (3) 1602 | C | මුල්ලේරියා සටන |
| (4) 1630 | D | දන්තුරේ සටන |
| (5) 1638 | E | රන්දෙණිවෙල සටන |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (............)

6.

| x | | y |
|---|---|---|
| (1) කොට්ටල් බද්ද | A | අලි-ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| (2) කින්නර බද්ද | B | කුඹල් කාර්යාංශය |
| (3) කුරුවේ බද්ද | C | ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |
| (4) මඩිගේ බද්ද | D | විවීමේ කාර්යාංශය |
| (5) බඩහැල බද්ද | E | ප්‍රවාහණ කාර්යාංශය |

(1) BDEAC (2) CDAEB (3) CBDEA (4) AEDBC (5) DEBAC (............)

- **අංක 07 සිට 08 තෙක් සෑම ප්‍රශ්නයකටම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න**

7. ශ්‍රී ලංකාවේ සිංහල රජ පෙළපතේ අවසන් රජතුමා කවරෙක්ද ?

(1) රාජසිංහ රජතුමා
(2) දෙවන විමලධර්මසූරිය රජතුමා
(3) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා
(4) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
(5) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (...........)

8. උඩරට රජවරුන්ගේ නිවැරදි අනුපිළිවෙල අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?

(1) පළමුවෙනි විමලධර්මසූරිය, දෙවෙනි විමලධර්මසූරිය, දෙවෙනි රාජසිංහ, සෙනරත් , ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ
(2) පළමුවෙනි විමලධර්මසූරිය, දෙවෙනි විමලධර්මසූරිය, සෙනරත්, දෙවෙනි රාජසිංහ, ශ්‍රී වීර පරාක්‍රම නරෙන්ද්‍රසිංහ
(3) පළමුවෙනි විමලධර්මසූරිය, සෙනරත්, දෙවෙනි රාජසිංහ, දෙවෙනි විමලධර්මසූරිය, ශ්‍රී වීර පරාක්‍රම නරෙන්ද්‍රසිංහ
(4) පළමුවෙනි විමලධර්මසූරිය, දෙවෙනි රාජසිංහ, දෙවෙනි විමලධර්මසූරිය, සෙනරත්, ශ්‍රී වීර පරාක්‍රම නරෙන්ද්‍රසිංහ
(5) පළමුවෙනි විමලධර්මසූරිය, සෙනරත්, දෙවෙනි විමලධර්මසූරිය, දෙවෙනි රාජසිංහ, ශ්‍රී වීර පරාක්‍රම නරෙන්ද්‍රසිංහ (...........)

- **අංක 9 සිට 10 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න**

9. උඩරට රාජධානිය

(1) සේනාසම්මත වික්‍රමබාහු රජතුමා උඩරට රාජ්‍යය ආරම්භකළ පාලකයා ලෙස සලකනු ලබේ
(2) යමසිංහ බණ්ඩාර හා දෝන කැතරිනා කුමරිය අතර විවාහයක් ඇති කළ පෘතුගීසීහු දෝන කැතරිනා කුමරිය උඩරට රජකමට පත් කළහ
(3) 1594 දී පේද්‍රෝ ලෝපේස් ද සූසා විසින් මෙහෙයවන ලද පෘතුගීසි ආක්‍රමණය ව්‍යර්ථ කළ විමලධර්මසූරිය රජතුමා උඩරට රාජධානිය තුළ සිය බලය තහවුරු කරගත්තේය
(4) දෙවෙනි රාජසිංහ රජතුමා ලන්දේසීන්ගෙන් යුධ ආධාර ලබාගෙන පෘතුගීසීන් ලංකාවෙන් පළවා හැරීමට සමත් විය
(5) උඩරට රාජධානියේ සිංහල රාජ පරම්පරාවේ අවසාන පාලකයා ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාය (...........)

10. දෙවෙනි රාජසිංහ රජතුමා

(1) 1630 රන්දෙනිවෙල සටනේ දී උඩරට හමුදා ජයග්‍රාහී ලෙස මෙහෙය වීම
(2) 1638 දී පෘතුගීසීන් සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම
(3) උපසම්පදාව පැවැත් වීම සඳහා සියමෙන් භික්ෂූන් වහන්සේ වැඩම කරවීම
(4) ලන්දේසීන්ගේ ආධාර ඇති ව ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වලින් පෘතුගීසින් පලවා හැරීම
(5) දෙවෙනි රාජසිංහ රජතුමාගේ රාජ්‍ය සමයේ රොබට් නොක්ස් සිරකරුවෙකු ලෙස උඩරට රාජ්‍යයේ ජීවත් වීම (...........)

ඇගයීම 02

1. ''පෘතුගීසින් පලවා හැරීමට පමණක් නොව ලන්දේසි බලය මෙල්ල කිරීමටද සමත් වූ බැවින් දෙවන රාජසිංහ රජු ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකිය හැකිය'' සාකච්ඡා කරන්න

(ලකුණු 14)

2. වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගෙන් බුද්ධ ශාසනයට සිදු වූ සේවා ව පරීක්ෂා කරන්න

(ලකුණු 14)

3. i. 1594 සිට 1638 දක්වා උඩරට රාජසිංහයට එල්ලකළ ආක්‍රමණ විස්තර කරන්න
   ii. එම ආක්‍රමණ හමුවේ උඩරට රාජ්‍යයට සිය ස්වාධීනත්වය ආරක්ෂා කරගැනීමට උපකාරී වූ සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 7 x 2 = 14)

4. ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය ආරක්ෂා කරගැනීම සඳහා උඩරට රජවරුන් දැරූ උත්සාහය පහත සඳහන් මාතෘකා යටතේ විස්තර කරන්න
   i. පෘතුගීසි හා ලන්දේසි ආක්‍රමණවලින් උඩරට රාජ්‍යය ආරක්ෂා කරගැනීම
   ii. බුද්ධ ශාසනය ආරක්ෂා කරගැනීම හා පවත්වාගෙන යාම

(ලකුණු 7 x 2 = 14)

5. පහත දක්වෙන මාතෘකා සඳහා එහි ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න
   i. මහනුවර රාජධානියේ ආර්ථික රටාව
   ii. මහනුවර රාජධානියේ සමාජ සංවිධානය
   iii. මහනුවර රාජධානියේ අධ්‍යාපනය
   vi. මහනුවර රාජධානියේ සාහිත්‍යය
   v. මහනුවර රාජධානියේ කලාශිල්ප (එක් සටහනකට ලකුණු 07 බැගින්)

**නිපුණතා මට්ටම :** 7.2. මුහුදුබඩ පළාත්වල පෘතුගීසි හා ලන්දේසි ක්‍රියාකාරකම් විමසා බලයි

**ඉගෙනුම් පල :**
- මුහුදුබඩ පළාත් පෘතුගීසීන් හා ලන්දේසීන් අල්ලාගත් ආකාරය විස්තර කරයි
- මුහුදුබඩ පළාත්වල පෘතුගීසි හා ලන්දේසි පාලනය විස්තර කරයි
- පෘතුගීසීන් හා ලන්දේසීන් යටතේ පැවති ප්‍රදේශ සිතියමක ලකුණු කරයි

**කාලච්ඡේද :** 15

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**7.2 මුහුදුබඩ පළාත්වල පෘතුගීසි හා ලන්දේසි පාලනය**

- **පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීම**

  - වෙළෙඳාම හා කතෝලික ආගම ප්‍රචාරය කිරීමේ අරමුණින් පෘතුගීසීන් පෙරදිගට පැමිණීම
  - ලොරෙන්සෝ ද අල්මේදා යටතේ පැමිණි පෘතුගීසි නැව් කණ්ඩායමක් ක්‍රි.ව. 1505 දී ගාලු වරායට පැමිණීම
  - පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාවේ කෝට්ටේ, මහනුවර හා යාපනය යනුවෙන් රාජධානි තුනක් පැවතීම
  - ශ්‍රී ලංකාව කුරුඳු ඇතුළු කුළුබඩු සඳහා ලබා තිබූ ප්‍රසිද්ධිය නිසා මෙම අවස්ථාව තමන් ලද මහඟු ජයග්‍රහණයක් ලෙස සලකා පෘතුගීසීන් ක්‍රියා කිරීම

- **පෘතුගීසීන් කෝට්ටේ බලය තහවුරු කරගැනීම**

  - කෝට්ටේ අට වන වීර පරාක්‍රමබාහු රජතුමාගේ පාලන සමයේ දී පෘතුගීසීන් පැමිණීම (ක්‍රි.ව. 1490- 1509)
  - ඒ වනවිට මුස්ලිම්වරුන් සතු කරගෙන සිටි වාණිජ බලය තමන් වෙත ලබාගැනීමට පෘතුගීසීන් ක්‍රියා කිරීම
  - ක්‍රි.ව. 1521 දී සිදු වූ ''විජයබා කොල්ලය'' නම් වූ බල අරගලය නිසා පෘතුගීසීන්ට වාසිදායක තත්ත්වයක් උදා වීම
  - විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදී යාම (කෝට්ටේ, සීතාවක, රයිගම)
  - සීතාවක පාලකයා වූ මායාදුන්නේ රජු මුස්ලිම් වරුන්ගේ සහයෙන් පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යයෙන් පලවා හැරීමට ගත් උත්සාහයන් අසාර්ථක වීම
  - පෘතුගීසීන්ට කෝට්ටේ රාජ්‍යයේ රජවරුන්ට බලපෑම් කළ හැකි වීම
  - හත්වෙනි බුවනෙකබාහු රජුගෙන් පසු බලයට පත් වූ ධර්මපාල රජුගේ දුර්වලතා නිසා පෘතුගීසි බලය වර්ධනය වීම
  - අවසානයේ දී ධර්මපාල රජු විසින් තෑගි ඔප්පුවක් මඟින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට පවරා දීම

- **සීතාවක රාජ්‍යය හා පෘතුගීසීන්**

  - 1521 විජයබා කොල්ලයෙන් පසු සීතාවක බලයට පත් වූ මායාදුන්නේ රජු දැඩි පෘතුගීසි විරෝධියකු වීම
  - මායාදුන්නේට එරෙහි ව පෘතුගීසීන් අවස්ථා ගණනාවක දී ම සීතාවක රාජ්‍යය ආක්‍රමණය කිරීම
  - ක්‍රි.ව. 1562 දී පෘතුගීසීන් සීතාවකට එරෙහි ව එල්ල කළ ආක්‍රමණය මායාදුන්නේගේ පුත් ටිකිරි කුමරු (පළමු වැනි රාජසිංහ) විසින් ජරාජය කරනු ලැබීම

- මායාදුන්නේගේ අවැමෙන් ටිකිරි කුමරු රාජසිංහ නමින් රජ වීමත් සමඟ පෘතුගීසීන්ට එරෙහි තර්ජන තවත් ඉහළ යාම
- පළමු වැනි රාජසිංහ රජු ක්‍රි.ව. 1586 දී කොළඹ කොටුව වටලා පෘතුගීසීන් පලවා හැරීමට ගත් උත්සාහය ව්‍යර්ථ වීම
- පළමු වැනි රාජසිංහ රජු ගේ මිය යාමත් සමඟ සීතාවක රාජ්‍යය පළමු ව පෘතුගීසීන් හා අනතුරු ව පළමුවෙනි විමලධර්මසූරිය රජු විසින් අත්පත් කර ගැනීම

- **පෘතුගීසීන් හා මහනුවර රාජධානිය**

- පෘතුගීසින් මහනුවර රාජධානිය කෙරේ අවධානය යොමු කිරීමට බල පෑ සාධක
- ජයවීර බණ්ඩාර හා පෘතුගීසින් අතර සබඳතා
- සීතාවක රාජ්‍යයේ වර්ධනය හමුවේ පෘතුගීසින් උඩරට කෙරෙහි අවධානය යොමු කිරීම
- දන්තුරේ සටන
- පෘතුගීසින් මහනුවර නතු කර ගැනීමට අනුගමනය කළ ආක්‍රමණශීලී ප්‍රතිපත්තිය
- ජෙරනිමෝ ද අසවේදුගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීම
- සෙනරත් රජු හා පෘතුගීසි සබඳතා
- 1617 ගිවිසුම හා එහි කොන්දේසි

- **පෘතුගීසීන් හා යාපනය රාජ්‍යය**

- පෘතුගීසීන් පැමිණෙන විට ආර්ය චක්‍රවර්තී පරපුරේ පරරාජසේකරම් යාපනය පාලනය කිරීම
- මුල් අවස්ථාවේ දී පෘතුගීසීන් යාපනයේ පාලකයන්ගේ අභ්‍යන්තර අරගලවලට මැදිහත් වීම
- කතෝලික ආගම ප්‍රචාරය කිරීමට එරෙහි ව පාලකයන්ගෙන් එල්ල වූ විරෝධතා
- වාණිජ බලය ලබා ගැනීමේ අරමුණින් පෘතුගීසීන් යාපනයට එරෙහි ආක්‍රමණික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
- යාපනය රාජ්‍යයේ පැවති අභ්‍යන්තර බල අරගල නිසා පෘතුගීසි බලය තවදුරටත් තහවුරු වීම
- අවසානයේ දී ක්‍රි.ව. 1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ එල්ල කළ ආක්‍රමණයෙන් දෙවන සංකිලි නෙරපා පෘතුගීසින් එහි බලය තහවුරු කර ගැනීම



*පෘතුගීසින් විසින් ඉදිකිරීම ආරම්භ කළ යාපනය බලකොටුවේ වර්තමාන දර්ශනයක්*
*( source:https://jaffna.city/jaffna-fort-portuguese-dutch/)*

මුහුදුබඩ පළාත්වල පෘතුගීසි පාලනය

- **පරිපාලන ව්‍යූහය**
  - වෙළෙඳාම හා ආගමික පරමාර්ථ මුල්කරගෙන පාලන ක්‍රමය ගොඩනගා තිබීම
  - පාලන කටයුතුවල දී උසස් තනතුරු පෘතුගීසි ජාතිකයන්ට ලබා දීම සහ පහළ තනතුරු සඳහා දේශීය නිලධාරීන් තබා ගැනීම
  - දේශීය නිලබල ක්‍රමය ක්‍රියාත්මක කිරීම

    උදාහරණ

    * පෘතුගාලයේ රජු - ගෝවේ පෘතුගීසි ප්‍රතිරාජයා - (මුහුදුබඩ ප්‍රදේශයේ) කපිතාන් ජනරාල් ආදි පෘතුගීසි නිලධාරීන්ගෙන් සහ දිසාවේ - කෝරාළ අතුකෝරාළ - ගම්පති ආදී තනතුරු දැරූ දේශීය නිලධාරීන්ගෙන් ද පාලන වූහය සමන්විත වීම

    * කපිතාන් ජනරාල් යටතේ පෙර සිට පැවති දේශිය රාජාණ්ඩු ක්‍රමය අනුව පාලනය කිරීම

    * මුහුදුබඩ ප්‍රදේශයේ පාලන මධ්‍යස්ථානය කොළඹ පිහිටා තිබීම

- **ප්‍රදේශීය පාලනය**
  - කෝට්ටේ රාජ්‍යයේ පෙර පැවති ප්‍රදේශීය පාලනය එලෙස ම යොදා ගැනීම
  - දිසාවනි හතරකට බෙදා පාලනය කිරීම (මාතර, සබරගමුව, සත් කෝරලය, සතර කෝරලය)
  - දේශීය වශයෙන් ක්‍රියාත්මක වූ ප්‍රදේශීය පාලන ව්‍යූහය පවත්වා ගැනීම

    උදාහරණ

    * දිසාවනී- කෝරල - පත්තු - ගම්
  - දිසාවනි සඳහා පාතුගීසි ජාතික දිසාවේවරුන් පත් කිරීම
  - දේශිය බද්දේ සංවිධානය පෙර ආකාරයට ක්‍රියාත්මක කිරීම

- **පෘතුගීසීන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය**
  - යුරෝපයේ ඉහළ ඉල්ලුමක් පැවති කුළුබඩු ඇතුළු වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම ප්‍රධාන ආර්ථික අරමුණ වීම
  - ඒ සඳහා අරාබි, චීන, මලබාර් වැනි ආසියානු වෙළෙන්දන් සතු වෙළෙඳ අයිතිය ලබා ගැනීමට ක්‍රියා කිරීම
  - පෘතුගීසි දේශපාලන අධිකාරිය විසින් ආර්ථික කටයුතු මෙහෙයවීම
  - ස්වදේශීය සමාජ ආර්ථික සංස්ථා උපයෝගී කරගැනීම

    උදාහරණ

    * ඉඩම් භුක්ති ක්‍රමය, කුල ක්‍රමය, අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය, බදු ක්‍රමය
  - ඇතැම් වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒකාධිකාරයක් ක්‍රියාත්මක කිරීම (කුරුඳු, අලි ඇතුන්, මැණික්, මුතු)
  - උඩරට රාජ්‍යය සමඟ අභ්‍යන්තර වෙළෙඳාම සිදු කිරීම
  - ආනයන, අපනයන වෙළෙඳාමක් පවත්වාගෙන යාම
  - අන්තර් ආසියාතික වෙළෙඳාමට සම්බන්ධ වීම

- **පෘතුගීසීන්ගේ ආගමික ප්‍රතිපත්තිය**
  - පෘතුගීසින් සිය යටත්විජිත ප්‍රතිපත්තියේ එක් ප්‍රධාන අරමුණක් ලෙස රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීම
  - ප්‍රධාන අරමුණු දෙකක් පදනම් කරගෙන ආගමික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
    1. පෘතුගීසි ආණ්ඩුවට පක්ෂපාති රටවැසියන් පිරිසක් ඇති කර ගැනීම
    2. පෘතුගීසි ආණ්ඩුව හා කෝට්ටේ ජනතාව සම්බන්ධ කළ පුරුක වූ ප්‍රභූන් ආගම ට හරවාගෙන දේශපාලන වාසි ලබා ගැනීම

- ජේසුයිට්, ෆ්‍රැන්සිස්කන්, ඩොමිනිකන් වැනි මිෂනාරී සමාගම් විසින් ආගම් ප්‍රචාරය සිදු කිරීම
- යාපනය රාජ්‍යයේ ද කතෝලික ධර්මය ව්‍යාප්ත කිරීම
- ආගම් ප්‍රචාරය සඳහා විවිධ ක්‍රියාමාර්ග යොදා ගැනීම
    * අධ්‍යාපනය
    * දේශන පැවැත්වීම
    * තිළිණ, සම්මාන හා නිලතල ප්‍රදානය කිරීම
    * බදුවලින් නිදහස් කිරීම
    * අධිකරණ කටයුතුවල දී සහන ලබා දීම
    * ආණ්ඩුව අනුමත කළ ආගම් පමණක් ඇදහීමට අවස්ථාව ලබා දීම
- මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් ඉතා දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
- ඇතැම් බෞද්ධ සිද්ධස්ථාන කතෝලික සිද්ධස්ථාන බවට පත් කිරීම
- මෙරට පැවති ආගමික සහනශීලීත්වය හා අන්‍යාගම්වලට ගරු කිරීමේ ප්‍රතිපත්තිය බිඳවැටීම

- **පෘතුගීසීන්ගෙන් සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රවලට ලැබුණ දායාද**
    - පැරිස් පාසල් ආදී අධ්‍යාපන ආයතන පිහිටුවා අංක ගණිතය, ලතින් භාෂාව, සංගීතය වැනි විෂයයන් ඉගැන්වීම
    - 'එස් පිරිටල්' නමින් හැඳින්වූ කුඩා ආරෝග්‍යශාලා ආරම්භ කිරීම
    - දේවස්ථාන හා සම්බන්ධ වූ 'මඩම්' නැමති සමාජසේවා ආයතන හඳුන්වා දීම
    - සිංහල ජන සමාජයට පෘතුග්‍රීසි නම් එකතු වීම
      උදාහරණ :
        * සීමන්, මැන්දිස්, සිල්වා, පෙරේරා, ජුවාන්, කැතරින්, අල්මේදා, ජෝන්, ද වාස්.
    - පෘතුගීසි ඇඳුම් මෝස්තර - කමිස, කලිසම්, කබා, සාය, අත්දිග හැට්ට යනාදිය
    - පෘතුගීසි ආහාර - සම්බෝල, අච්චාරු, විනාකිරි, සලාද, පාන්, වයින්
    - වේදිකා නාට්‍ය ක්‍රමය, බයිලා, කපිරිඤ්ඤා වැනි අංග සංගීත ක්ෂෙත්‍රයට හඳුන්වා දීම
    - අන්නාසි, රටදෙල්, රඹුටන් ආදී බෝග හඳුන්වා දීම



*පෘතුගීසි ඇඳුම් මෝස්තර*
*(source: http://www.sundaytimes.lk)*

- **ලන්දේසීන් ශ්‍රී ලංකාවට පැමිණීම**
  - ලන්දේසීන් සිය යටත්විජිත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ආර්ථික අරමුණුවලට මුල් තැන ද ආගමික අරමුණු සඳහා දෙවන තැන ද ලබාදීම
  - ඕලන්දයේ රජුගේ අවසර මත පිහිටුවූ ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම මඟින් පාලන කටයුතු මෙහෙයවනු ලැබීම
  - ශ්‍රී ලංකාවේ කුරුඳු වෙළෙඳාමේ අයිතිය ලබාගැනීමට ලන්දේසීන්ගේ විශේෂ අවධානය යොමු කිරීම
  - පෘතුගීසින් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවදියේ අවස්ථා කිහිපයක උඩරට පාලකයන් සමඟ සබඳතා පවත්වා ගැනීමට උත්සාහ කිරීම

- **ලන්දේසීන්ගේ පාලන ප්‍රතිපත්ති**
  - අඩු වියදමකින් උපරිම ලාභ ලැබීමේ අරමුණින් ලන්දේසි පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම
  - හැකි සැම විට ම දේශීය පාලන ක්‍රමය යොදා ගැනීම
  - වෙළෙඳ සමාගමේ ප්‍රධානත්වයෙන් පරිපාලන රටාව ගොඩනඟා තිබීම
  - ඉහළ ම මණ්ඩලය පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වීම
    බතාවියේ අග්‍රාණ්ඩුකරු සහ ඔහුගේ උපදේශක සභාව ගාල්ලේ ආණ්ඩුකරු සහ ඔහුගේ උපදේශක සභාව
  - කොමාන්ඩරි ක්‍රමය ආරම්භ කිරීම
  - කොළඹ, ගාල්ල, යාපනය ලෙස කොමාන්ඩරි තුනකට බෙදා ඒවා කොමදෝරු වරුන් යටතේ පාලනය කිරීම
  - දේශීය අධිකරණ පද්ධතියේ ද යම් යම් අංග ප්‍රයෝජනයට ගනිමින් නව උසාවි පද්ධතියක් හඳුන්වා දීම

| | | |
|---|---|---|
| රාද් වැන් ජස්ටිට් | - | මහාධිකරණය |
| ලැන්ඩ්රාද් | - | ඉඩම් උසාවිය |
| සිවිල් රාද් | - | සිවිල් උසාවිය |

  - මුහුදුබඩ වැසියන්ට රෝම ලන්දේසි නීතියත්, යාපනේ වැසියන්ට තේසවලමේ නීතියත්, මුස්ලිම් වරුන්ට මහම්මද් නීති සංග්‍රහයත් හඳුන්වා දීම

- **ලන්දේසි ආර්ථික ප්‍රතිපත්ති**
  - කුරුඳු ඇතුළු වැඩි වටිනාකමක් තිබූ වෙළෙඳ භාණ්ඩ මෙරටින් ලබාගන්නා අතර වෙළෙඳාමේ අයිතිය ලබාගැනීම ලන්දේසින්ගේ ප්‍රධාන ආර්ථික අරමුණ වීම
  - ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් ආර්ථික කටයුතු මෙහෙයවීම
  - දේශීය ඉඩම් භුක්ති ක්‍රමය, කුලක්‍රමය පදනම් කරගත් සමාජ රටාව සහ සාම්ප්‍රදායික චාරිත්‍රවිධි ඇසුරින් අඩු වියදමකින් ලාභ ලැබීම
  - ඇතැම් වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒකාධිකාරයක් පවත්වාගෙන යාම (කුරුඳු, අලි ඇතුන් වෙළෙඳාම, මැණික් ගැරීම සහ විකිණීම, මුතු විකිණීම)
  - ප්‍රධාන ආදායම් උපයන භාණ්ඩයක් ලෙස පුවක් වැදගත් වීම
  - උඩරට රාජ්‍යය සමඟ අභ්‍යන්තර වෙළෙඳාමක් පවත්වාගෙන යාම
  - ලුණු, කරවළ වැනි දෑ උඩරටටත් එම ප්‍රදේශයෙන් ගම්මිරිස්, බුලත්, කරාබුනැටි, කරඳමුංගු, මී පැණි ඇතුළු ද්‍රව්‍ය සමුහයක් වෙරළබඩ ප්‍රදේශවලටත් තවලම් මඟින් ප්‍රවාහණය කිරීම
  - ආනයන, අපනයන වෙළෙඳ රටාවක් පවත්වාගෙන යාම
  - අන්තර් ආසියාතික වෙළෙඳාමට සම්බන්ධ වීම
  - ලන්දේසි ආණ්ඩුවේ වියදම් අඩු කරගැනීමේ අරමුණින් සීමිත වශයෙන් දේශීය කෘෂි අංශය දියුණු කිරීමට විවිධ ක්‍රියාමාර්ග ගැනීම

    උදාහරණ :
    - මුතුරාජවෙල අස්වැද්දීම
    - වැව් රැසක් ප්‍රතිසංස්කරණය කිරීම (යෝධ කණ්ඩිය, කන්තලේ කිරම සහ ඌරුබොක්ක)

- උක් , ඉන්ඩිගෝ, කපු වැනි දෑ වගාකොට සීනි නිපදවීම, රෙදි සායම් කිරීම සහ රෙදි වියීම වැනි කර්මාන්ත පුළුල් කිරීම
- බදු අය කිරීම ක්‍රමවත් කිරීමට තෝම්බු සැකසීම
- බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසි කිරීමේ ක්‍රමය ආරම්භ කිරීම
- මොරටුවේ වඩු කර්මාන්තය පුළුල් කිරීම
- උපරිම ලාභ ලැබීමේ අරමුණින් යුද වියදම් අවම කිරීම

- **ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය**
  - ප්‍රොතෙස්තන්ත හෙවත් රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීම
  - බෞද්ධ, හින්දු හා කතෝලික ජනයා රෙපරමාදු ආගමට හරවා ගැනීමට දේවගැතිවරුන් ක්‍රියා කිරීම
  - රෙපරමාදු ක්‍රිස්තියානිය වැළඳගන්නා අයට උසස් තාන්න මාන්න තෑගි බෝග හා ප්‍රශංසා ලබා දීම
  - 'ඉස්කෝල' ආරම්භ කර ඒවා ආගම් ප්‍රචාරයට ඉවහල් කරගැනීම
  - අන්‍යාගමික ළමයි බෞතීස්මයෙන් පසු පාසල්වලට ඇතුළත් කරගැනීම
  - යුරෝපීය දරුවන් සඳහා 'කොළඹ සෙමනේරිය' වැනි වෙන ම පාසල් ආරම්භ කිරීම
  - ගුරුවරුන් පුහුණු කිරීමට කොළඹ නගරයේ 'නෝමල් පාසල' ආරම්භ කිරීම
  - අධ්‍යාපන කටයුතු මණ්ඩලයක් මගින් පාලනය වීම
  - 1739 සිංහල මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දී සිංහලයෙන් බයිබලය මුද්‍රණය කර බෙදා හැරීම

- **ලන්දේසි සමාජ හා සංස්කෘතික බලපෑම්**
  - රෝම ලන්දේසි නීති ක්‍රමය හඳුන්වාදීම නිසා මෙරට පැවති බහු විවාහ ක්‍රමය වෙනුවට ඒක විවාහ ක්‍රමය නීතිගත වීම ඇතුළු සමාජ වෙනස්කම් රැසක් සිදු වීම
  - දේශීය ජනයා ස්වකීය ආගම ට බඳවාගැනීම විවිධ උපක්‍රම ඔස්සේ සිදු කිරීම නිසා කුල ක්‍රමය පදනම් කරගත් දේශීය සමාජ ක්‍රමය වෙනස් වී කුල ක්‍රමය සංචලනයක් සිදු වීම
  - පෘතුගීසි හා ලන්දේසි මිශ්‍ර විවාහ ඇති වී 'බර්ගර්'නම් වූ මිශ්‍ර ජන කොටසක් මෙරට සමාජයට එකතු වීම
  - ස්වදේශික භාෂාවලට විවිධ වචන එක් වීම හා ඔවුන්ගේ ආහාරපානවලට හා ඇඳුම්-පැලඳුම්වලට හුරුවීම මගින් දේශීය ජන සමාජයේ පුළුල් වෙනසක් සිදු වීම

    උදාහරණ :- ලන්දේසි වචන - පොල්මංකාර, අද්මිනිස්ත්‍රිකාර, ඉස්තෝප්පුව, සොල්දරය, ඔරලෝසුව

    ලන්දේසි ආහාර - කොකිස්
  - ඕලන්ද ගෘහනිර්මාණ ශිල්පය අනුව සෑදූ කුලුනු සහ උස් උළුවහු සහිත නිවාස ඉදි කිරීම

    උාදාහරණඃ

    ආදුරුප්පු වීදියේ ඇති පල්ලිය හා පාසල
  - ඕලන්ද ශිල්පීය ක්‍රමයට අනුව සෑදූ අල්මාරි පෙට්ටගම්, පුටු, ඇඳ, මේස ආදී ගෘහභාණ්ඩ හඳුන්වාදීම
  - බටහිර වෛද්‍ය සේවයක් ඇරඹීම
  - මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීම
  - ලාදුරු රෝගය නිවාරණයට ලාදුරු රෝහල් හඳුන්වා දීම



ලන්දේසීන් ගාල්ලේ ඉදි කළ රෝහල
(source :https://commons.wikimedia.org/wiki/File:Galle-Old_Dutch_Hospital_Building.jpg)





ලන්දේසීන්ගේ ගෘහ භාණ්ඩ
(source :http://www.christies.com)

ඇගයීම 01

**අංක 01 සිට 02 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.**

1. 1. පේද්‍රෝ ලෝපේස් ද සූසා 2. පේරනිමෝද අසබේදු 3. කොන්ස්තන්තීනුද නොරොඤ්ඤා 4. ලොරෙන්සෝද අල්මේදා 5. දියෝගෝ ද මේලෝ ද කැස්ත්‍රෝ (.................)

2. 1. සෙමනේරිය 2. රෝම ලන්දේසි නීතිය 3. රාද් වැන් ජස්ටිම් 4. ලැන්ඩ්රාද් (.................)

**අංක 2 සිට 3 තෙක් ප්‍රශ්නවල පද යුගල 5 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගළයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

3. 1. ධර්මපාල - දොම් ජුවන් පෙරිය බණ්ඩාර
 2. කරල්ලියැද්දේ බණ්ඩාර - දොම් ජුවන් ද කැස්ත්‍රෝ
 3. යමසිංහ බණ්ඩාර - දොම් පිලිප්
 4. කුසුමාසන දේවී - දෝන කැතරිනා
 5. කොනප්පු බණ්ඩාර - ඔස්ට්‍රියාවේ දොම් ජුවන් (.................)

4. 1. ජොරිස් ෆන් ස්පිල්බර්ජන් - පළමු වැනි විමලධර්මසූරිය රජතුමා
 2. ජෝන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
 3. හියු බොයිඩ් - දෙවන රාජසිංහ රජතුමා
 4. රොබට් ඇන්ඩෲස් - රාජාධිරාජසිංහ රජතුමා
 5. මැක්ඩෝවල් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (.................)

**අංක 05 සිට 06 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

(A) හා (B) පමණක් නිවැරදි නම් ......... 1 ද
(B) හා (C) පමණක් නිවැරදි නම් ........ 2 ද
(C) හා (D) පමණක් නිවැරදි නම් ........ 3 ද
(A) හා (C) පමණක් නිවැරදි නම් ........ 4 ද
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ......... 5 ද, වරහන් තුළ ලියන්න

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය | (B) සහ (C) පමණක් නිවැරදි ය | (C) සහ (D) පමණක් නිවැරදි ය | (A) සහ (C) පමණක් නිවැරදි ය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය |

5. දහසය වැනි සියවසේ කෝට්ටේ රාජධානිය සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) 1521 ඇති වූ විජයබා කොල්ලයේ ප්‍රතිඵලයක් ලෙස කෝට්ටේ රාජධානිය කෙටස් තුනකට බෙදිණි
   (B) රයිගම් බණ්ඩාරගේ මරණින් පසු ඔහුගේ පාලන ප්‍රදේශය හත්වන බුවනෙකබාහු රජතුමා විසින් කෝට්ටේ රාජ්‍යට ඈඳා ගනු ලැබී ය.
   (C) 1505 දී පෘතුගීසීන් ධර්මපාල රජ කොළඹට කැටුව යාමෙන් පසුව එතෙක් අගනුවර වූ කෝට්ටේ අතහැර දමනු ලැබීය
   (D) කතෝලික ආගම වැලඳගත් මුල් ම කෝට්ටේ පාලකයා හත් වන බුවනෙකබාහු විය.

(.................)

6. පෘතුගීසීන් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) ස්වකීය ආර්ථික කටයුතු සඳහා පෘතුගීසීහු සාම්ප්‍රදායික සිංහල යාන්ත්‍රණය භාවිත නොකළහ
   (B) පෘතුගීසි ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණක් වූයේ කුරුඳු ලබා ගැනීම යි
   (C) පෘතුගීසීහු තෝම්බු සකස් කළහ
   (D) පෘතුගීසීහු වාණිජ බෝගයක් ලෙස කුරුඳු වගා කළහ

(.................)

**අංක 7 සිට 10 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගළය දැයි තෝරා ඊට අදාළ ව අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය | වැරදි ය |
| 2. | නිවැරදි ය | නිවැරදි ය |
| 3. | වැරදි ය | වැරදි ය |
| 4. | වැරදි ය | නිවැරදි ය |
| 5. | නිවැරදි ය | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදා දෙයි |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 7. පෘතුගීසීහු ඇතැම් ස්වදේශීය සමාජ හා ආර්ථික ආයතන ස්වකීය ආර්ථික වාසිය සඳහා උපයෝගී කර ගත්හ. | පෘතුගීසීහු සාම්ප්‍රදායික ඉඩම් භුක්තිය, කුල ක්‍රමය හා රාජකාරී ක්‍රමය දිගට ම පවත්වාගෙන යමින් ඒවා කුරුඳු හා අනෙකුත් ද්‍රව්‍ය ලබාගැනීම සඳහා උපයෝගී කර ගත්හ. (...........) |
| 8 ශ්‍රී ලංකාව ලෞකික හා ආධ්‍යාත්මික වශයෙන් ජය ගැනීම (The Temporal and Spiritual Conquest of Ceylon) නම් ප්‍රසිද්ධ ග්‍රන්ථය පර්නාවෝ ද ක්වේරෝස් පියතුමා විසින් රචනා කරන ලදි | ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පැවති ලන්දේසි පාලනයෙන් උද්ගත වූ කැපී පෙනෙන ප්‍රතිඵලයක් වූයේ රෝමානු කතෝලික ආගම හඳුන්වා දීම යි. (...........) |
| 9. දේශීය පරිපාලන ව්‍යුහය එලෙසින්ම භාර ගත් ලන්දේසීහු එය ස්වකීය අරමුණුවලට සරිලන සේ සකස් කර ගත්හ. | ලන්දේසීහු සැම දිසාවතියක ම තිබූ කෝරල, පත්තු, ගම් යන පාරම්පරික බෙදීම් ඒවා භාර ව සිටි ප්‍රධාන පරිපාලන නිලධාරීන් වූ කෝරාලවරුන් අතුකෝරලවරුන් මුදලිවරුන් සමඟින් දිගට ම පවත්වාගෙන ගියහ. (...........) |
| 10. ලන්දේසීන් තේසවලමෙයි මඟින් දෙමළ නීති හා සිරිත් ප්‍රථම වරට සංග්‍රහ කළහ. | 1810 අධිකරණ ප්‍රඥප්තිය මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු ඇසීම සම්බන්ධයෙන් ජූරිසභා ක්‍රමය හඳුන්වාදෙනු ලැබී ය. (...........) |

**ඇගයීම 02**

1. 1. උඩරට ආක්‍රමණය කිරීමට පෘතුගීසීන් පෙලඹවූ සාධක පරීක්ෂා කරන්න (ලකුණු 06)
   2. එම ආක්‍රමණ අසාර්ථක වූයේ මන් ද? ලකුණු 08)

2. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසීන් හා ලන්දේසීන් අනුගමනය කළ පරිපාලන ප්‍රතිපත්ති පහත දැක්වෙන අංශ ඇසුරෙන් සංසන්දනාත්මක ව පරීක්ෂා කරන්න.
   1. අරමුණු
   2. මධ්‍ය පාලනය
   3. පාදේශීය පාලනය (ලකුණු 14)

3. 1594 සිට 1638 තෙක් පෘතුගීසින් උඩරට රාජ්‍යයට එල්ල කළ ආක්‍රමණ විස්තර කරන්න. (ලකුණු 14)

4. පෘතුගීසි හා ලන්දේසි පාලනය හේතු කොටගෙන ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල සංස්කෘතික වශයෙන් ඇති වූ ප්‍රතිඵල කවරේ ද? (ලකුණු 14)

5. එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පමණක් පිළිතුරු සපයන්න
   (A) පෘතුගීසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල අනුගමනය කළ ආගමික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු සහ සිය ආගම පතුරුවා හැරීම සඳහා ඔවුන් විසින් යොදාගනු ලැබූ ක්‍රියාමාර්ග පරීක්ෂා කරන්න.

(B) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල ලන්දේසීන් විසින් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

(ලකුණු 14)

## 8. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම හා ස්ථාපිත කිරීම

වෙළෙඳාම හා ආගම් ප්‍රචාරය කිරීමේ අරමුණ ඇති ව යටත් විජිත පිහිටුවා ගැනීම සඳහා බ්‍රිතාන්‍යයෝ පෙරදිගට පැමිණියහ. ඉන්දියාවේ බලය තහවුරු කරගැනීමෙන් සියවසකට පමණ පසු ඔවුහු ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කළහ. ඒ වන විට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ ලන්දේසීන් පරාජය කර ක්‍රි.ව. 1796 දී ඉංග්‍රීසි වෙළෙඳ සමාගම විසින් බලය පිහිටුවා ගන්නා ලදි. අනතුරු ව ඔවුන්ගේ අවධානය උඩරට රාජධානිය කෙරෙහි යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1815 වසරේ දී උඩරට යටත් කරගනිමින් මුළු දිවයින ම යටත්විජිතයක් බවට පත් කරගනු ලැබී ය. සිය ස්වාධීනත්වය අහිමි වූ ශ්‍රී ලාංකිකයෝ 1818 හා 1848 යන වර්ෂවල දී නිදහස උදෙසා සටන් වැදුණාහ. එහෙත් එම උත්සාහ ව්‍යර්ථ විය. පැවති පාලන රටාවේ වෙනසක් සිය ආර්ථික අරමුණු ඉටුකරගැනීමේ අපේක්ෂාවෙන් සිදු කළ ඉංග්‍රීසීහු 1833 දී කෝල්බෲක්-කැමරන් කොමිසමේ නිර්දේශ පරිදි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්හ. මේ ආකාරයට බ්‍රිතාන්‍යයන් විසින් පියවරෙන් පියවර ශ්‍රී ලංකාව තුළ සිය බලය ස්ථාවර කරගත් ආකාරය මෙම ඒකකය මඟින් විස්තර කෙරේ.

**නිපුණතාව** : • ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 8.1. බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ස්ථාවර වූ ආකාරය පෙන්වා දෙයි.

**ඉගෙනුම් පල** :
- බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ස්ථාපිත වීමට හේතු පැහැදිලි කරයි
- ස්වදේශීය විරෝධතා හා එහි ක්‍රියාකාරිත්වය විග්‍රහ කරයි
- තම ස්වාධිපත්‍යය රැකගැනීමට උර දුන් දේශීය නායකයන් අගය කරයි

**කාලච්ඡේද** : 30

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.**

8. මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

- **බ්‍රිතාන්‍යයන් පෙරදිගට පැමිණීම**
  - ක්‍රි.ව. 1600 බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම පිහිටුවීම
  - පළමුවෙනි එළිසබෙත් රැජන ආසියාවේ වෙළෙඳ කටයුතු සඳහා රාජකීය බලපත්‍රයක් වෙළෙඳ සමාගමට ලබා දීම
  - අග්නිදිග ආසියාතික ප්‍රදේශ සමඟ ප්‍රථමයෙන් වෙළෙඳ සබඳතා ගොඩනඟා ගැනීම
  - ඉන්දියාවේ ජෙහන්ගීර් නමැති මුගල් අධිරාජයා සමඟ වෙළෙඳ සබඳතා ගොඩනඟා ගැනීමට උත්සාහ කිරීම
  - 17 වැනි සියවසේ අග භාගය වනවිට බොම්බාය, මද්‍රාසිය, කල්කටාව යන ස්ථානවල වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවා ගැනීමට සමත් වීම
  - ප්‍රංශවරුන් ද පොන්ඩිචෙරි, කරිකාල්, චන්ද්‍රනගර් වැනි ස්ථානවල වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීම
  - ලන්දේසීන් මුල් අවස්ථාවේ ඉංග්‍රීසීන් සමඟ සාමයෙන් ක්‍රියා කළ නමුත් පසු ව ඇම්බායිනා දූපතේ ඇති වූ ගැටුමක් නිසා සතුරන් බවට පත් වීම
  - ඉංග්‍රීසීන් සහ, ප්‍රංශයන් අතර ඉන්දියාවේ බලය ගොඩනඟා ගැනීමට බල තරගයක් ඇති වීම

- **ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍ය අවධානය යොමු වීම**
  - ශ්‍රී ලංකාව ඉන්දියාව ආසන්නයේ පිහිටා තිබීම
  - ලොව සුවිශේෂ ස්වාභාවික වරායක් වූ ත්‍රිකුණාමලය වරාය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ

පිහිටා තිබීම
- ඉන්දියාව ඇතුළු බෙංගාල බොක්ක අවට කලාපයේ වෙළෙඳ හා නාවික කටයුතු ශ්‍රී ලංකාවේ සිට මැනවින් මෙහෙයවීමේ හැකියාව පැවතීම

- කුරුඳු ඇතුළු වටිනා වෙළෙඳ ද්‍රව්‍ය රැසක් සඳහා ශ්‍රී ලංකාව ප්‍රසිද්ධියට පත් වී තිබීම
- ප්‍රංශ ජාතිකයන්ට පෙර ශ්‍රී ලංකාවේ වාණිජ ආධිපත්‍යය හිමි කරගැනීමේ අවශ්‍යතාව

- **ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය බලය තහවුරු වීම**
  - ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ඕලන්දය ප්‍රංශයට යටත් වීමත් සමඟ ලංකාවේ ලන්දේසීන් සතු ප්‍රදේශ ප්‍රංශයට අයිති වීමේ පසුබිමක් ගොඩනැගීම
  - ප්‍රංශවරුන්ට පෙර ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන්ගෙන් අත්පත් කරගැනීමට බ්‍රිතාන්‍යයන් ක්‍රියාත්මක වීම
  - කිව් ලිපියට අනුවලන්දේසි ආණ්ඩුකාරවරයා අවනත නොවූ හෙයින් ලන්දේසීන්ට පහර දී ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගැනිම
  - 1796 වන විට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ මුළුමනින් ම ඉංග්‍රීසින් සතු වීම

- **මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යටතේ පාලනය වීම**
  - ඉංග්‍රීසි වෙළෙඳ සමාගම මඟින් ඉන්දියාවේ මදුරාසි ආණ්ඩුව ක්‍රියාත්මක කළ පාලන ක්‍රමය හා එහි නිලධාරීන් ලංකාවේ මුහුදුබඩ පාලනයට යෙදවීම
  - 1796 සිට 1798 තෙක් මදුරාසි පාලනය ක්‍රියාත්මක වීම
  - මදුරාසි පාලනය යටතේ රෙසිඩන්ට්වරයකු විසින් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම
  - රෙසිඩන්ට්වරයා යටතේ කච්චේරි පිහිටුවා ඒවා සඳහා ආදායම් එකතු කිරීමට කලෙක්ටර්වරු පත් කිරීම
  - කලෙක්ටර්වරුන්ගේ සහයට මදුරාසියෙන් ගෙන්වූ අවුමිල්දාර් ඇතුළු නිලධාරීන් පත් කිරීම
  - වෙළෙඳ සමාගම තම වියදම් පියවා ගැනීමේ අරමුණෙන් නව බදු රැසක් පැනවීම (පොල් බද්ද, ලුණු බද්ද, මාළු බද්ද, දුම්කොළ බද්ද, අරක්කු සහ රා බද්ද)
  - මෙම නව නිලධාරී ව්‍යූහයත්, නව බදු ක්‍රමයත් ජනතාවට ඉතා පීඩාකාරී වීම
  - 1797 - 1798 වෙළෙඳ සමාගමට විරුද්ධ ව කැරැල්ලක් පැනනැගීම
  - කැරැල්ල මැඬ පවත්වා කැරැල්ලට හේතු සොයාබැලීමට පත් කළ මියුරන් කොමිසම මඟින් යෝජනා රැසක් ඉදිරිපත් කිරීම

- **ද්විත්ව පාලන ක්‍රමය**
  - 1798 මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම සඳහා ආණ්ඩුකාරවරයකු පත් කිරීම
  - ප්‍රෙඩ්රික් නෝත් පළමු වැනි ආණ්ඩුකාරවරයා වීම
  - ක්‍රි.ව. 1798 සිට ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පරිපාලන කටයුතුවලට බ්‍රිතාන්‍ය රජය සම්බන්ධ වීම
  - වෙළෙඳ හා වාණිජ කටයුතු පාලනය කිරීමේ බලය වෙළෙඳ සමාගමට ලබා දීම
  - මෙලෙස හවුලේ ගෙනගිය පාලනය ද්විත්ව පාලනය ලෙස හඳුන්වනු ලැබේ.
  - මෙම පාලන ක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය රජයට මෙන් ම වෙළෙඳ සමාගමට ද වගකිවයුතු වීම
  - තීරණ ගැනීමේ දී වෙළෙඳ සමාගම සහ ආණ්ඩුකාරවරයා අතර මතභේද ඇති වීම නිසා ද්විත්ව පාලන ක්‍රමය අසාර්ථක විම

- **මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය රජය යටතට පත් වීම**
  - ක්‍රි.ව. 1802 සිට මුහුදුබඩ ප්‍රදේශවල පාලනය මුළුමනින් ම කිරීටය යටතට පත් කිරීම
  - මුහුදුබඩ ප්‍රදේශවල පරිපාලන හා ආර්ථික කටයුතු සම්බන්ධව ආණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය රජයට වගකිව යුතු වීම
    - ලංකාව සඳහා වෙන ම සිවිල් සේවයක් ඇරඹීම. ඉහළ තනතුරුවලට බ්‍රිතාන්‍ය සිවිල් සේවකයන් පත් කිරීම

- පරිපාලන කටයුතු සඳහා බ්‍රිතාන්‍යයේ පැවති දෙපාර්තමේන්තු ක්‍රමය හඳුන්වා දීම

- මදුරාසියෙන් නිලධාරීන් ගෙන්වීම අහෝසිකොට දේශීය නිළධාරීන් ඔවුන්ගේ තනතුරුවලට පත් කිරීම
- තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරයාගේ උපක්‍රමශීලී පාලන ප්‍රතිපත්තිය
- මුහුදුබඩ ප්‍රදේශවල සංචාරය කරමින් මනා අධ්‍යයනයක් සිදු කිරීමෙන් පසු පාලන කටයුතු සැලසුම් කිරීම
- ජෝන් ඩොයිලි යොදවා උඩරට රාජ්‍යයේ තොරතුරු රැස් කිරීම
- දේශීය පාලන සංවිධානය මුළුමනින් ම ප්‍රතික්ෂේප නොකර උපක්‍රමශීලී ව දේශීය නිලධාරීන්ගේ බලය බිඳ දැමීම
- නෝර්ත් ආණ්ඩුකාරවරයා අවලංගු කළ රාජකාරි ක්‍රමයේ ඉඩම් භුක්ති රාජකාරි ක්‍රමය අවලංගු කිරීම එසේ ම තිබිය දී අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යළි ස්ථාපිත කිරීම



*මන්නාරමේ අරිප්පුහි පිහිටි නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ බංගලාවෙහි නටබුන්*
*(source: https://www.youtube.com/watch?v=WLy9Is2Ngl8)*

- **උඩරට රාජ්‍යය බ්‍රිතාන්‍යයන්ට නතු වීම**
  - බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය කෙරේ අවධානය යොමු කිරීමට හේතු වූ කරුණු
    - උඩරට ස්වාධීන රාජ්‍යයක් ව පැවතීම බ්‍රිතාන්‍ය ආධිපත්‍යය පැතිරවීමට බාධාවක් වීම
    - වෙනත් යුරෝපීයයන්ගෙන් හා උඩරට රජුගෙන් මුහුදුබඩ ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට ආරක්ෂක වළලු දෙකක් යෙදිය යුතු වීම
    - මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් ද උඩරට රජු තම රජු ලෙස සැලකීම
    - මුහුදුබඩ ප්‍රදේශවල ඇති වන බ්‍රිතාන්‍ය විරෝධී කැරලිවලට උඩරට රජු උදව් කිරීම
    - උඩරට රාජ්‍යය ප්‍රංශ ජාතිකයන්ගෙන් ආධාර ලබාගැනීමට ඇති ඉඩකඩ අහුරාලීම
    - උඩරට ප්‍රදේශවල තිබූ කුරුඳු, පුවක් සහ කුළුබඩු වැනි වෙළෙඳ ද්‍රව්‍ය ලබාගැනීමේ දී මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා
    - කොළඹ ත්‍රිකුණාමලය අතර ගොඩබිම් මාර්ගයක් නොමැති වීම නිසා මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා
    - බ්‍රිතාන්‍යයන් යටතේ වූ එම ප්‍රදේශ අතර කෙටි ගොඩබිම් මාර්ගයක් ඉදි කිරීමට උඩරට ස්වාධීන රාජ්‍යය බාධාවක් වීම

- **උඩරට රාජ්‍ය බ්‍රිතාන්‍යයන් යටතට පත් කර ගැනීමට දරන ලද ප්‍රයත්න**
  - ලන්දේසි පාලන සමය තුල අවස්ථා කීපයකදී උඩරට රාජ්‍යය සමග සබඳතා ගොඩනගා ගැනීමට බ්‍රිතාන්‍යයන් උත්සාහ කිරීම
    - * ජෝන් ෆයිබස්ගේ දූත ගමන (1762)
    - * හියු බොයිඩ්ගේ දූත ගමන (1782)
  - ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා අවස්ථා කීපයක දී උඩරට රාජ්‍යය සමග සම්බන්ධතා ගොඩනගා ගැනීමට උත්සාහ කිරීම
  - ක්‍රි.ව. 1800 සෙන්පති මැක්ඩෝවල්ගේ ප්‍රධානත්වයෙන් දූත පිරිසක් යවා තමන්ට වාසිදායක ගිවිසුමක් ඇති කර ගැනීමට උත්සාහ කිරීම
  - ක්‍රි.ව. 1803 නැවත මැක්ඩෝවල් සෙන්පතියාගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කිරීම
  - තෝමස් මෙට්ලන්ඩ් උඩරට සම්බන්ධයෙන් උපක්‍රමශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
  - ජෝන් ඩොයිලි නම් කාර්යශූර නිලධාරියා යොදවා අනාගත ආක්‍රමණයකට අවශ්‍ය පසුබිම සකස් කිරීම
  - උඩරට රජු සමග සාමකාමී ව කටයුතු කිරීම



ජෝන් ඩොයිලි

*(source:https://en.wikipedia.org/wiki/Sir_John_Doyle,_1st_Baronet)*

- **උඩරට රාජ්‍ය බ්‍රිතාන්‍යයන් යටතට පත් කර ගැනීම**
  - යුරෝපා ජාතීන්ගේ තර්ජන හමුවේ දීර්ඝ කාලයක් ස්වකීය ස්වාධීනතාව ආරක්ෂා කරගත් උඩරට රාජධානිය 1815 බිඳ වැටීම
  - රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා ඉතා පහසුවෙන් උඩරට අල්ලා ගැනීම
  - උඩරට බිඳවැටීමට අභ්‍යන්තර හේතු බලපෑම
    - * ශ්‍රී වික්‍රම රාජසිංහ රාජසමයේ රජු හා රදලවරුන් අතර මතභේද උත්සන්න වීම
    - * භික්ෂූන් වහන්සේලා රජුගේ ක්‍රියාකලාපය කෙරෙහි කලකිරීමට පත් වීම
    - * ඇහැලේපොළ පවුලේ සාමාජිකයන්ට අමානුෂික දඬුවම් ලබාදීම
  - පිළිමතලව්වේ හා ඇහැලේපොළ වැනි රදල ප්‍රධානින් රජු නෙරපීමට ඉංග්‍රීසි සහය ලබාගැනීමට ක්‍රියා කිරීම
  - රජු කෙරෙහි දැඩි ලෙස කලකිරී සිටීම හේතු කොටගෙන ඉංග්‍රීසින්ගේ ආක්‍රමණයට එරෙහි ව භික්ෂූන් වහන්සේ සහ ජනතාව නැඟී නොසිටීම
  - උඩරට රාජ්‍යය බිඳවැටීමට බාහිර හේතු රැසක් ද බලපෑම
    - * තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා ජෝන් ඩොයිලි මඟින් උඩරට අභ්‍යන්තර ආරක්ෂක තොරතුරු රැසක් සොයා ගැනීම
    - * රජු හා රදලවරුන් අතර භේදභින්නතාව තව දුරටත් උත්සන්න කරවීමට ජෝන් ඩොයිලි ක්‍රියා කිරීම
    - * උඩරට පහසුවෙන් ආක්‍රමණය කළ හැකි තත්ත්වයකට පත් කිරීමෙන් පසු පහතරට වෙළෙඳුන් පිරිසකට හිරිහැර කළේ ය යන හේතුව මතු කර ඉංග්‍රීසින් උඩරට ආක්‍රමණය කිරීම
  - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බලයෙන් පහ කර 1815 උඩරට ගිවිසුම මඟින් උඩරට රාජ්‍යය අත්පත් කර ගැනීම

- **1815 උඩරට ගිවිසුම**

  1815 උඩරට රදල ප්‍රධානින් සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා අතර අස්සන් කරන ලද ගිවිසුම උඩරට ගිවිසුම යනුවෙන් හැඳින්වේ. 1815 මාර්තු 02 වෙනි දින සෙංකඩගල මඟුල් මඩුවට රැස් වූ රදල ප්‍රධානයන් ඉදිරියේ එම ගිවිසුම කියවන ලද අතර එදින පටන් 16වෙනි දින තෙක් කාලය තුළ ඔවුහු ඊට අස්සන් තැබූහ.

  - ගිවිසුමේ වගන්ති 12ක් ඇතුළත් වී තිබීම
  - රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා සහ ඇහැලේපොළ, පිළිමතලව්වේ(කනිෂ්ඨ), මොනරවිල, මොල්ලිගොඩ, රත්වත්තේ, දුල්ලෑව, මිල්ලෑව, ගලගම, ගලගොඩ වැනි ප්‍රභූවරුන් මෙයට අස්සන් කිරීම
  - 1, 2, 3 වගන්ති නායක්කාර් වංශයට උඩරට රාජ්‍යත්වය පිළිබඳ ව තිබූ සියලු අයිතිවාසිකම් අහෝසි කරන බව සහ උඩරට බ්‍රිතාන්‍යයේ කිරීටයට හිමි වන බව
  - 4 වගන්තිය :- ස්වදේශීය පරිපාලන රටාව හා සමාජ සම්ප්‍රදායයන් ආරක්ෂා කරමින් රදල ප්‍රධානයන්ගේ නිලතල හා වරප්‍රසාද ආරක්ෂා කරන බව
  - 5 වගන්තිය :- බෞද්ධාගම හා දේවාගම අනුල්ලංඝනීය බව සහ ඒවාට අදාළ පුදපූජා, වත්පිළිවෙත්, පූජ්‍ය ස්ථාන හා භික්ෂූන් වහන්සේලා බ්‍රිතාන්‍ය රජය විසින් ආරක්ෂා කරන බව
  - 6 වගන්තිය :- අංගච්ඡේදනය වැනි දරුණු දඬුවම් තහනම් කරන ලද බව
  - 7 වගන්තිය :- ආණ්ඩුකාරවරයා ලබාදෙන බලපත්‍රයක් නැති ව කිසිවකුට හෝ මරණ දඬුවම පැමිණවීමට බලයක් නොමැති බව
  - 8 වගන්තිය :- වැසියන්ගේ සිවිල් හා අපරාධ නඩු හබ විසඳීම ව්‍යවහාරයේ පවතින පරිදි රදළ ප්‍රධානයන්ට පැවරූ බව
  - 9 වගන්තිය :- හමුදා නිලධාරීන් සම්බන්ධ නඩු හමුදා නීතිය ප්‍රකාර විසඳන බව
  - 10 වගන්තිය :- සීමිත අවස්ථාවල දී හැර හමුදා මෙහෙයුම් කාලයේ ප්‍රසිද්ධ කරන ලද අඥා මෙම ගිවිසුම මඟින් අවලංගු වන බව
  - 11 වගන්තිය :- ඉංග්‍රීසි රජු වෙනුවෙන් ඒජන්තවරුන් උඩරට ආදායම් එකතු කරන බව
  - 12 වගන්තිය :- උඩරට හා පහතරට අතර වෙළෙඳාමට ඇති බාධා අහෝසි කිරීමේ හා අවශ්‍ය අවස්ථාවල දී වෙනස්කම් කිරීමේ අයිතිය ඉංග්‍රීසි ආණ්ඩුව සතු බව උඩරට ගිවිසුමෙන් ප්‍රකාශ වීම.
  - මෙම ගිවිසුමෙන් දුන් පොරොන්දු ඉංග්‍රීසි ආණ්ඩුව නොසලකා හැරීම නිසා 1818 දී බ්‍රිතාන්‍යයන්ට එරෙහි ව නිදහස් අරගලයක් පැන නැඟීම

- **1818 ප්‍රථම නිදහස් සටන**
  - 1815 සිට මුළු දිවයින ම විදේශාධිපත්‍යට නතු වී තිබූ අවස්ථාවේ දේශීය පාලනයක් පිහිටුවීමට ගත් ප්‍රථම උත්සාහය වීම
  - මෙම නිදහස් සටන පැන නැඟීමට සාධක රැසක් හේතු වීම
    - * දේශිය රාජත්වය අහෝසි කිරීම
    - * බෞද්ධාගම ඇතුළු දේශීය ආගම් ආරක්ෂා කරන බවට ගිවිසුමේ 5 වන වගන්තියෙන් ලබාදුන් පොරොන්දුව කඩ කිරීම
    - * පොරොන්දු වූ පරිදි රදළවරුන්ගේ බලතල වරප්‍රසාද සුරක්ෂිත නොකිරීම
    - * නව පරිපාලන හා අධිකරණ කටයුතු කෙරෙහි ඇති වූ විරෝධය
  - ඌව- වෙල්ලස්ස ප්‍රදේශයෙන් සටන ආරම්භ වීම
  - නායකයන් රැසක් සටනට දායක වීම

    කැප්පෙටිපොළ, ඇල්ලේපොළ, මඩුගල්ලෙ, පිළිමතලව්වේ (කනිෂ්ඨ), කිවුලේගෙදර මොහොට්ටාල, බූටෑවේ රටේ රාල, කොහුකුඹුරේ රටේ රාළ
  - ඉංග්‍රීසීන් පලවා හැරීමේ අරමුණෙන් සාමාන්‍ය ජනතාව ද රදල ප්‍රධානයන් හා එකතු වීම
  - දන්ත ධාතූන් වහන්සේ සටන් කරුවන් සතු වීමෙන් ඔවුන්ගේ උද්‍යෝගය ඉහළ යාම
  - සබරගමුවේ කොටසක්, තුන් කෝරලය හා සතර කෝරලය හැර උඩරට රාජ්‍යයට අයත් ව පැවති සෙසු සියලු ප්‍රදේශවලට සටන ව්‍යාප්ත වීම

- ගරිල්ලා සටන් ක්‍රමය, උඩරට ස්වාභාවික භූගෝලීය පිහිටීම සහ ලෙඩරෝග පැතිරීම ආදියෙන් ඉංග්‍රීසින්ට හානියක් සිදු වීම
- සටන ඉතා දරුණු වීම නිසා 1818 අප්‍රේල්, මැයි වන විට උඩරට අතහැර යාමට පවා ඉංග්‍රීසින් කල්පනා කිරීම
- එහෙත් බිම්පාළු ප්‍රතිපත්තිය, ඉන්දියාවෙන් අතිරේක සේනා ගෙන්වා ගැනීම වැනි ක්‍රියාමාර්ගවලින් නිදහස් සටන මර්දනය කිරීම

- **1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ**
  - ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය රජය අයවැය හිඟයකට මුහුණ දීම
  - මෙම තත්ත්වයට හේතු සොයා බැලීමට 1829 දී විලියම් කෝල්බෲක් හා චාල්ස් හේ කැමරන් යන කොමසාරිස්වරුන් පත් කර එවීම
  - දේශපාලන, පරිපාලන, ආර්ථික කටයුතු පිළිබඳ ව වාර්තා සැපයීම කෝලබෲක් ට පැවරුණු අතර අධිකරණ හා නෛතික තත්ත්වය පිළිබඳ ව සොයා බැලීමට කැමරන්ට පැවරී තිබීම

**යෝජිත ආර්ථික ප්‍රතිසංස්කරණ**

* මෙතෙක් අනුගමනය කළ යටත්විජිත ආර්ථික ප්‍රතිපත්තියේ මූලික වෙනසක් මෙම කොමිසම මඟින් යෝජනා කිරීම
* පෞද්ගලික ව්‍යවසාය පදනම් කරගත් රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්තියක් හඳුන්වා දීම

**යෝජිත ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ**

* ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
* ආණ්ඩුකාරවරයාගේ බලතල සීමා කිරීම
* බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට ලංකාවේ කටයුතු නිවැරදි ව ආණ්ඩුකාරවරයාට පරිබාහිර විකල්ප මාර්ගයකින් තොරතුරු ලබාගැනීමට විධිවිධාන සැපයීම
* අනාගත පාර්ලිමේන්තු ක්‍රමයේ ආරම්භක ලක්ෂණ පෙන්නුම් කිරීම

**යෝජිත පරිපාලන ප්‍රතිසංස්කරණ**

* උඩරට හා පහතරට ඒකාබද්ධ කළ පාලන ක්‍රමයක් හඳුන්වා දීම
* දිවයින පළාත් පහකට බෙදීම
* සිවිල් සේවයේ ප්‍රතිසංස්කරණ රැසක් සිදු කිරීම

- **අධිකරණ ප්‍රතිසංස්කරණ යෝජනා**

* ඒකීය අධිකරණ පද්ධතියක් ඇති කිරීමට කටයුතු කිරීම
* නීතිය ඉදිරියේ සමානාත්මතාව යන මූලධර්මය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කිරීම
* ආණ්ඩුකාරවරයා සතු අධිකරණ බලතල අහෝසි කොට ස්වාධීන අධිකරණ පද්ධතියක් පිහිටුවීම
* සිවිල් හා අපරාධ නඩු විදීමේ බලය සහිත දිස්ත්‍රික් උසාවි පිහිටුවීම
* මුළු රටට ම බලපාන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ බලය ව්‍යාප්ත කිරීම

**ආර්ථික ප්‍රතිසංස්කරණ**

* අනිවාර්යසේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
* රාජ්‍ය වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම (කුරුඳු, ලුණු, මුතු, අරක්කු, දුම්කොළ)
* ඉඩම් මිලදී ගැනිමට එරෙහි ව පනවා තිබූ නීතිරීති ලිහිල් කිරීම
* රජයේ ඉඩම් විකිණීමට අවස්ථාව සලසා දීම
* අපනයනවලින් තීරුබදු අය කිරීම
* පෞද්ගලික ව්‍යවසාය දිරිමත් කිරීම
* රජයේ වියදම් අඩු කිරීමට පියවර ගැනීම
* රජයේ වියදම් අඩුකිරීම මඟින් කෙටිකාලීන ව ආර්ථික ප්‍රශ්න විසඳීම සහ රටේ පුළුල් ආර්ථික සංවර්ධනයක් උදාකිරීම මඟින් දිගුකාලීන ව රජයේ ප්‍රශ්න විසඳාගැනීම මෙම

යෝජිත ප්‍රතිසංස්කරණවල සැලසුම වීම

1848 නිදහස් සටන

- 1848 නිදහස් අරගලය බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහි ව ආයුධ සන්නද්ධ ව සිදු කළ අවසාන අරගලය වීම
- මාතලේ හා කුරුණෑගල ප්‍රබල ලෙස ව්‍යාප්ත වූ මෙය කොළඹ ද සුළු වශයෙන් ඇති වීම
- මෙම අරගලය සඳහා බලපෑ හේතු දිගුකාලීන හා ආසන්න ලෙස හඳුනාගත හැකි වීම
- කෝල්බෘක් - කැමරන් ප්‍රතිසංස්කරණවල බලපෑම
  * උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම නිසා උඩරට සාම්ප්‍රදායික අනන්‍යතාවට හානි සිදුවීම
  * සිවිල් සේවකයන්ට වතු වගාවේ නිරත වීමට අවසර දීම නිසා පරිපාලනය බිඳ වැටීම
  * රාජකාරි ක්‍රමය අහෝසි කිරීම සහ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දීම නිසා සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමයේ වෙනසක් සිදුවීම
  * ගම්සභාව නොසලකා හැරීම නිසා ගැමි ජනතාවගේ ප්‍රශ්න උග්‍ර වීම
  * නව අධිකරණ ක්‍රමය නිසා ජනතාව ගැටලු රැසකට මුහුණ දීම
  * දේශීය කෘෂිකර්මාන්තය නොසලකා හැරීම
  * 1840 අංක 12 දරන මුඩුබිම් පනත නිසා ගොවියන්ගේ පාරම්පරික ඉඩම් අහිමි වීම
  * යුරෝපීය වැවිලි කරුවන්, දකුණු ඉන්දියානු කම්කරුවන්, පහතරට ව්‍යාපාරිකයන් වැනි ආගන්තුක කොටස් උඩරටට සංක්‍රමණය වීම නිසා උඩරට ප්‍රදේශවල සාම්ප්‍රදායික ජන ජීවිතයට අහිතකර බලපෑම් ඇති වීම
  * වතු වගාව සඳහා ඉඩම් එළි කිරීම, දේශීය කෘෂිකර්මය හා ජන ජීවිතය බිඳවැටීමට හේතු වීම
  * උඩරට සුරාසැල් විවෘත කිරීම නිසා සමාජයේ දුරාචාර වේගයෙන් පැතිරී යාම



*යුරෝපීය වැවිලි කරුවන්, දකුණු ඉන්දියානු කම්කරුවන්, පහතරට ව්‍යාපාරිකයන් වැනි උඩරටට සංක්‍රමණය කළ ආගන්තුකයෝ*

*( Source : https://www.pinterest.com/favorceylontea/history-of-ceylon-tea/?lp=true)*

**ආසන්න සාධක**

* ආණ්ඩුවේ ආදායම වැඩිකර ගැනීම සඳහා ටොරිංටන් ආණ්ඩුකාරවරයා නව බදු පැනවීම උදාහරණ: සාප්පු බද්ද, කරත්ත බද්ද, ඔරු බද්ද, තොටුපල බද්ද, තුවක්කු බද්ද, ඇඟ බද්ද, මුද්දර බද්ද, සුනඛ බද්ද
* රජය හා ආගම අතර පැවති සාම්ප්‍රදායික සමීප සබඳතාව බිඳ දමමින් දළදා වහන්සේගේ ආරක්ෂාව භික්ෂූන් වහන්සේට හා දියවඩන නිලමේට පැවරීම
* උඩරට ඉඩම් විදේශිකයන්ට විකිණීම හේතු කොටගෙන උඩරටියන් තුළ අවිශ්වාසයන් ඇති වීම

**සටනේ ආරම්භය හා ව්‍යාප්තිය**

* ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තියට විරෝධය දක්වීමට මහජනතාව ඒකරාශි වීම
* කොළඹ, වාරියපොළ, කුරුණෑගල වැනි ප්‍රදේශවලට විරෝධතා පැතිරීම
* බදුල්ලට රැස් වූ ඇතැම් ගොවීන් තුවක්කු බද්දට විරෝධය දක්වා ඒජන්තවරයා ඉදිරියේ ම තුවක්කු පොළොවේ ගසා කඩා දැමීම
* මාතලේ, වාරියපොළ, කුරුණෑගල වැනි ප්‍රදේශවල ජනයා ආයුධ සන්නද්ධ ව රජයේ ගොඩනැගිලි හා උසාවි ආදියට පහර දීම
* 1848 සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස මාතලේ වැදගත් වීම
* බ්‍රිතාන්‍ය පාලනයෙන් පීඩාවට පත් සාමාන්‍ය ජනයා අතරින් ගොංගාලේගොඩ බණ්ඩා, පුරන් අප්පු, ඩිංගිරාල, දීනිස් වැනි නායකයන් ඉස්මතු වීම
* බදු විරෝධී අරගලයක් ලෙස ආරම්භ වී ඉංග්‍රීසි පාලකයන් පලවා හැරීමේ එළවා දැමීමේ මූලික අරමුණ ලෙසින් සටන ක්‍රියාත්මක වීම

- **1848 නිදහස් සටනේ ප්‍රතිඵල**
  - ජනතා අපේක්ෂා සුන් කරමින් ඉංග්‍රීසින් දරුණු ලෙස කැරැල්ල මර්දනය කිරීම
  - සටනේ නායකයන් ඉංග්‍රීසින්ගේ අත්අඩංගුවට ගෙන දරුණු දඬුවම් නියම කිරීම
    * කුඩාහපොල හිමි වෙඩි තබා මරා දැමීම
    * ගොංගාලේගොඩ බණ්ඩාට එරෙහි ව නඩු අසා කසපහර දී රටින් පිටුවහල් කිරීම
    * පුරන් අප්පුට මරණීය දණ්ඩනය නියම කිරීම
  - සටන අවස්ථාවේ එවකට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකරු වූ ටොරිංටන් සහ රාජ්‍ය ලේකම් ටෙනන්ට් එංගලන්තයට කැඳවීම
  - සටනට හේතු සොයා බැලීමට පත් කළ කමිටුවේ නිර්දේශ අනුව ඇතැම් අලුත් බදු අහෝසි කිරීම හා ඇතැම් ඒවා සංශෝධනය කිරීම
  - 1850න් පසු බලයට පත් ඇතැම් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් ගොවි ජනයා කෙරෙහි සැලකිලිමත් වී කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීමට ක්‍රියා කිරීම
  - සටන පරාජය වීම නිසා බ්‍රිතාන්‍ය බලය තව දුරටත් තහවුරු වීම



*මාතලේ සටන සිහිකිරීම සඳහා ඉදිකර ඇති කුළුණ*

*( sourrce: http://www.wikiwand.com/en/Matale)*

ඇගයීම 01

**අංක 1 සහ 2 ප්‍රශ්න සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

1. (1) ජෝන් ඩොයිලි (2) ජෝර්ජ් ටර්නර් (3) එඩ්වඩ් බාන්ස්
   (4) හෙන්රි මාෂල් (5) ඉමර්සන් ටෙනන්ට් (.................. )

2. (1) විල්මට් හෝර්ටන් (2) වෙස්ට් රිජ්වේ (3) චාල්ස් කැමරන්
   (4) ජෝර්ජ් ඇන්ඩර්සන් (5) ඇන්ඩෘ කැල්ඩිකොට් (.................. )

**අංක 3 සිට 4 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

3. (1) රාජකාරී ක්‍රමය අහෝසි කිරීම - ෆ්‍රෙඩ්රික් නෝර්ත්
   (2) උඩරට රාජ්‍යය බිඳ වැටීම - රොබට් බ්‍රවුන්රිග්
   (3) කොළඹ - මහනුවර මාර්ගය ඉදිකිරීම - තෝමස් මේට්ලන්ඩ්
   (4) මහ නගරසභා පිහිටුවීම - හර්කියුලිස් රොබින්සන්
   (5) ධාන්‍ය බද්ද අහෝසි කිරීම - ආතර් හැව්ලොක් (.................. )

4. (1) 1997 - 98 කැරැල්ල - විලියම් ග්‍රැගරි
   (2) 1817 - 18 නැගී සිටීම - රොබට් බ්‍රවුන්රිග්
   (3) 1848 - නැගී සිටීම - ටොරිංටන්
   (4) 1883 කොටහේන කෝලාහලය - ජේම්ස් ලොංඩන්
   (5) 1915 සිංහල - මුස්ලිම් කෝලහලය - රොබට් චාමර්ස් (.................. )

**අංක 5 සිට 8 ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

5. දහනව වැනි සියවසේ මුල් භාගයේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දක්වෙන කවර වරණයේ ද?
   (1) තෝමස් මෙට්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග්, විල්මට් හෝර්ටන්, එඩ්වඩ් බාන්ස්, ස්ටුවට් මැකන්සි
   (2) රොබට් බ්‍රවුන්රිග්, තෝමස් මෙට්ලන්ඩ්, ස්ටුවට් මැකන්සි, එඩ්වඩ් බාන්ස්, විල්මට් හෝර්ටන්
   (3) තෝමස් මෙට්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග්, එඩ්වඩ් බාන්ස්, ස්ටුවට් මැකන්සි, විල්මට් හෝර්ටන්
   (4) රොබට් බ්‍රවුන්රිග්, තෝමස් මෙට්ලන්ඩ්, එඩ්වඩ් බාන්ස්, ස්ටුවට් මැකන්සි, විල්මට් හෝර්ටන්
   (5) තෝමස් මෙට්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග්, එඩ්වඩ් බාන්ස්, විල්මට් හෝර්ටන්, ස්ටුවට් මැකන්සි
   (.................. )

6. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?
   (1) කෝල්බෲක්, ඩොනමෝර්, මැනිං, මැකලම්, සෝල්බරි
   (2) කෝල්බෲක්, මැකලම්, මැනිං, ඩොනමෝර්, සෝල්බරි
   (3) මැකලම්, කෝල්බෲක්, මැනිං, සෝල්බරි, ඩොනමෝර්
   (4) මැනිං, මැකලම්, කෝල්බෲක්, ඩොනමෝර්, සෝල්බරි
   (5) කෝල්බෲක්, මැකලම්, ඩොනමෝර්, මැනිං, සෝල්බරි (.................. )

7. කොල්බෲක් කොමිසම පැමිණි අවධියේ මෙරට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවරෙක් ද?
   (1) ටොරිංටන් (2) කැම්බල් (3) ඇන්ඩර්සන් (4) වෝඩ් (5) රොබින්සන් (.................. )

8. මුහුදුබඩ පළාත්වල රාජකාරී ක්‍රමය ප්‍රථම වතාවට අවලංගු කළ ආණ්ඩුකාරවරයා කවරෙක් ද ?
   (1) ෆ්‍රෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මේට්ලන්ඩ් (3) එඩ්වඩ් බාන්ස් (4) රොබට් බ්‍රවුන්රිග්
   (5) විලියම් කෝල්බෲක් (.................. )

- අංක 9 සිට 10 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

9. 1848 බ්‍රිතාන්‍ය විරෝධී නැඟී සිටීම
   (1) මෙම ජනතා නැඟී සිටීම සිදු වූ අවදියේ ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූයේ එමර්සන් ටෙනන්ට්ය
   (2) මෙම ජනතා නැඟී සිටීම ඇති වීමට බලපෑ ආසන්න සාධකය වූයේ ආණ්ඩුව විසින් නව බදු පනවනු ලැබීම යි
   (3) මෙම ජනතා නැඟී සිටීමේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ මාතලේ සහ කුරුණෑගල ය
   (4) පුරන් අප්පු සහ ගොංගාලේගොඩ බංඩා මෙම සටනේ ප්‍රධාන නායකයෝ වූහ
   (5) මෙම ජනතා නැඟී සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1850න් පසු ශ්‍රී ලංකාවේ පොදු ජනතාව සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තියේ වෙනසක් සිදු විය (.................. )

10. කෝල්බෲක් - කැමරන් කොමිසමේ යෝජනා
   (1) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම
   (2) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
   (3) අනිවාර්ය සේවා රාජකාරිය අවලංගු කිරීම
   (4) ඒකීය අධිකරණ ක්‍රමයක් ඇති කිරීම
   (5) මුළු දිවයින ම පළාත් නවයකට බෙදීම (.................. )

**ඇගයීම 02**

1. 1848 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන සාධක විවේචනාත්මක ව පරීක්ෂා කරන්න (ලකුණු 14)

2. ''උඩරට ගිවිසුමෙන් දෙනලද පොරොන්දු ඉටු නොවීම නිසා උඩරැටියන් තුළ හටගත් බලාපොරොත්තු සුන් වීම, 1817 - 1818 බ්‍රිතාන්‍ය විරෝධී සටන ඇති වීමට තුඩුදුන් ප්‍රධාන සාධකය විය''
   (1) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට රජධානිය අල්ලාගනු ලැබීමට ආසන්න සමයේ එම රාජධානිය සමඟ සම්බන්ධකම් පවත්වාගෙන ගිය ඉංග්‍රීසි ජාතික නිලධාරියා නම් කරන්න. (ලකුණු 01)
   (2) උඩරට ගිවිසුම අස්සන් කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා සහ උඩරට ප්‍රභුවරයකු නම් කරන්න (ලකුණු 02)
   (3) උඩරට ගිවිසුමේ අන්තර්ගත කරුණු සැකෙවින් දක්වන්න (ලකුණු 04)
   (4) ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න (ලකුණු 07)

3. ''1817 - 1818 උඩරැටියන් නැඟී සිටීම, ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය විරෝධී ප්‍රථම නිදහස් අරගලය විය''. එම සටනට තුඩුදුන් හේතු ඇසුරින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න (ලකුණු 14)
4. 1848 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ඇති වීමට තුඩුදුන් ප්‍රධාන සාධක විවේචනාත්මක ව විමසන්න (ලකුණු 14)
5. එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පමණක් පිළිතුරු සපයන්න
   A. කෝල්බෲක්- කැමරන් කොමිසමේ යෝජනා පරිදි 1833 දී ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිසංස්කරණවල වැදගත්කම පිරික්ෂා කරන්න (ලකුණු 14)
   B. උඩරට රාජ්‍යයේ බිඳවැටීමට තුඩුදුන් සාධක විචාරාත්මක ව විමසන්න (ලකුණු 14)

## 9. බ්‍රිතාන්‍යයන් යටතේ ආර්ථික සහ සාමාජීය වෙනස්කම් : (1948 තෙක්)

1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගත් බ්‍රිතාන්‍යයෝ 1815 දී උඩරට ද යටත් කොට ගෙන මුළු දිවයින ම ඔවුන් සතුකොට ගත්හ. එතැන් සිට 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලබාගන්නා තෙක් කාලය තුළ බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ සිදු වූ ආර්ථික හා සමාජීය වෙනස්කම් මෙම පරිච්ඡේදයෙන් අධ්‍යයනය කෙරේ. බ්‍රිතාන්‍යයන් විසින් ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය නිසා ශ්‍රී ලංකාවේ වතු වගාව ව්‍යාප්ත වූ ආකාරය සහ එමඟින් මෙරට පැවති දේශීය කෘෂිකර්මාන්තය අඩපණ වූ ආකාරයත් වැවිලි කර්මාන්තය නිසා මෙරට සමාජය විවිධ වෙනස්කම්වලට භාජනය වූ ආකාරයත් මෙහි දී සාකච්ඡාවට භාජනය කෙරේ. එමෙන් ම බ්‍රිතාන්‍ය පාලනයේ ප්‍රතිඵලයක් වශයෙන් සිංහල, දෙමළ, මුස්ලිම් යන සියලු ජනකොටස් අතර ආගමික හා සංස්කෘතික වශයෙන් ප්‍රබෝධයක් ඇති වූ අතර ඒ පිළිබඳ වත් එහි දී නායකත්වය ගෙන කටයුතු කළ ආගමික නායකයන් පිළිබඳ වත් තව දුරටත් අධ්‍යයනය කෙරේ.

**නිපුණතාව** : 9.1 ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජයට එක් වූ ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම** :
- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලාංකික සමාජයට එක් වූ නවාංග පෙන්වා දෙයි
- විදේශීය බලවේග හමුවේ ජාතික නායකයන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්වා දෙයි

**කාලච්ඡේද** : 30

**ඉගෙනුම් පල** :
- බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට ආර්ථිකයේ සිදුවූ වෙනස්කම් පැහැදිලි කරයි.
- බ්‍රිතාන්‍ය ආර්ථිකය අනුව මෙරට සමාජීය වශයෙන් සිදු වූ වෙනස පෙන්වා දෙයි.
- බ්‍රිතාන්‍ය ආර්ථික කටයුතු හේතුවෙන් මෙරට ආර්ථික හා සමාජීය වශයෙන් සිදු වූ යහපත් වෙනස අගයයි.
- බ්‍රිතාන්‍ය ආර්ථික කටයුතු හේතුවෙන් යටපත් වූ දේශීය අනන්‍යතාව පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.**

**9.1 ආර්ථික හා සමාජීය වෙනස්කම්**

- **වතු ආර්ථිකයේ ආරම්භය හා වර්ධනය**
  කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම, අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම, රජය ප්‍රදාන මඟින් ඉඩම් ලබාදුන් ක්‍රමය අවලංගු කොට ඒ වෙනුවට ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කිරිම, යුරෝපීයයන්ට ලංකාවේ පදිංචි වීමට හා ඉඩම් අයිති කොට ගැනීමට තිබූ සීමාවන් ඉවත් කිරීම, පෞද්ගලික ආයෝජනවලට දිරිදීම රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම වැනි කරුණු වැවිලි බෝග වගාවේ ආරම්භයට හේතු වීම.

- වතු වගාවේ දියුණුව
  - කුරුඳු වගාව සහ එහි පරිහානිය
  - වතු වගාවක් ලෙස මුලින් ම කෝපි වගාව ආරම්භ වීම
  - සුළු වශයෙන් ආරම්භ වූ කෝපි වගාව 1840 පමණ වන විට උඩරට විශාල ප්‍රදේශයක පැතිරී යාම


- කෝපි වගාවේ දියුණුවට බලපෑ හේතු
  - එංගලන්තයට අපනයනය කළ කෝපිවලට අයකළ තීරු බදු අඩු කිරීම

- බටහිර ඉන්දීය දූපත්වල කෝපි වගාව පරිහානියට
- කෝපිවලින් විශාල ලෙස ලාභ ලැබීම
- සාර්ථක වැවිලි ක්‍රම අනුගමනය කිරීම
- අඩු වැටුපට දකුණු ඉන්දීය ශ්‍රමිකයන් ගෙන්වීම



- **කෝපි වගාවේ පරිහානිය**
  - හෙමීලියා වෙස්ටර්ට්‍රික්ස් (Hemilia Vastatrix) නම් කෝපි පත්‍රවලට බලපෑ දිලීර රෝගය නිසා කෝපි වගාව පරිහානියට පත් වීම

*හෙමීලියා වෙස්ටර්ට්‍රික්ස් නම් දිලීර ආසාදනයට ලක්වූ කෝපි පත්‍ර*
*(source:https://en.wikipedia.org/wiki/Hemileia_vastatrix)*




- **විවිධ වැවිලි බෝග**
  - කෝපි වගාව පරිහානියෙන් පසු සිංකෝනා හා කොකෝවා වගාවන් ආරම්භ කිරීම
  - ඵලදායීතාව අඩු වීම නිසා එම වගාවන් අඩපණ වීම

- **තේ වගාවේ ආරම්භය හා ව්‍යාප්තිය**
  - 19 සියවස දෙවන භාගයේ දී තේ වගාව ආරම්භ වීම

- **1890 වන විට තේ වගාව ව්‍යාප්ත වීමට බලපෑ හේතු**
  - ලන්ඩන් වෙළෙඳපොළේ තේ මිල ඉහළ යාම
  - රජයේ ඉඩම් ප්‍රතිපත්තිය යටතේ වතු වගාවට අවශ්‍ය ඉඩම් පහසුවෙන් ලබා ගත හැකි වීම
  - පොහොර භාවිතය වැඩිවීම
  - බ්‍රිතාන්‍ය ව්‍යවසායකයන් මෙරට ආයෝජන කිරීමට පැමිණීම
  - දුම්රිය හා වෙනත් ප්‍රවාහණ මාධ්‍යය දියුණු වීම
  - කොළඹ වරාය දියුණු වීම
  - දකුණු ඉන්දියානු ශ්‍රමිකයන් ගෙන ඒම නිසා ශ්‍රමය පහසුවෙන් ලබාගත හැකි වීම

*ලන්ඩන් වෙළෙඳපළ සඳහා සූදානම් කල ශ්‍රී ලංකාවේ තේ*
*(source: https://en.wikipedia.org/wiki/Tea_production_in_Sri_Lanka )*

- **පොල් වගාව**
  - 19 සියවස මුල්භාගයේ දී පොල් වගාව වතු වගාවක් ලෙස ආරම්භ වීම
  - පොල් වගාව සඳහා ස්වදේශිකයන් සම්බන්ධ වීම
  - පොල් නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණය දේශීය පරිභෝජනය සඳහා යොදා ගැනීම
  - පොල් නිශ්පාදන සඳහා විදේශීය ව්‍යාපාරිකයන් සම්බන්ධ වීම

- **රබර් වගාව**

  රබර් වගාවේ ආරම්භය හා ව්‍යාප්තිය
  - 19වන සියවස අවසානය වන විට රබර් වගාව හඳුන්වා දීම
  - 1890 පමණ වන විට වාණිජ බෝගයක් ලෙස රබර් වගාව ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීම

- **රබර් වගාවේ ව්‍යාප්තියට බලපෑ හේතු**
  - පළමුවෙනි ලෝක යුද්ධ සමයේ රබර් මිල ඉහළයාම
  - අමෙරිකා එක්සත් ජනපදය මෙරටින් වැඩිපුර රබර් මිලයට ගැනීම
  - බ්‍රිතාන්‍ය මෝටර් රථ කර්මාන්තය දියුණු වීම

- **රබර් වගාවේ පරිහානිය**
  - 1929 ලෝක ආර්ථික පරිහානිය නිසා රබර් මිල පහත වැටීම
  - 1929 ලෝක ආර්ථික පරිහානියත් සමග තේ, පොල් සහ රබර් අපනයනය අඩු වීම, මිල පහත බැසීම නිසා ආදායම පහළ බැසීම

- **ප්‍රවාහනය සහ සන්නිවේදනය**
  - 19 වන සියවසේ තුන් වැනි දශකයේ පමණ මහාමාර්ග ආරම්භ කිරීම
  - වතුවගාව සඳහා අවශ්‍ය ප්‍රවාහණ පහසුකම් සැලසීමේ අරමුණ ඇති ව දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය කරමින් මහාමාර්ග ආරම්භ කිරීම
  - 1831 පමණ වන විට දිවයිනේ ප්‍රධාන මාර්ග කිහිපයක් ඉදිවී තිබීම

    කොළඹ - මහනුවර - මාතලේ - දඹුල්ල මාර්ගය

    අඹේපුස්ස - කුරුණෑගල - දඹුල්ල මාර්ගය

    කුරුණෑගල -මහනුවර මාර්ගය
  - වතුවගාවේ නිෂ්පාදන පහසුවෙන් ප්‍රවාහණය කිරීම සඳහා දුම්රිය මාර්ග ආරම්භ කිරීම
  - කෝපි, තේ, සහ රබර් වතු වගා කළ ප්‍රදේශ යා කරමින් දුම්රිය මාර්ග ඉදි කිරීම

    කොළඹ - නුවර මාර්ගය - 1867

    මහනුවර - මාතලේ මාර්ගය - 1880

    පේරාදෙණිය - නාවලපිටිය - 1880

    නාවලපිටිය - නානුඔය - බණ්ඩාරවෙල - 1894
  - ඉන්දියාවේ දුම්රිය සේවය හා සම්බන්ධ කිරීම සඳහා තලෙයිමන්නාරමේ සිට ධනුෂ්කොඩි තෙක් බෝට්ටු සේවයක් ආරම්භ කොට තිබීම
  - තේ, කෝපි නිෂ්පාදන පිටරට යැවීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීමට කොළඹ වරාය කටයුතු දියුණු කිරීම. කොළඹ වරායේ දියකඩනය (1874 - 1886) ඉදි කිරීම



*කොළඹ වරාය 1880 දී ගන්නා ලද ඡායාරූපයක*

*(source: http://lankapura.com/2009/07/colombo-harbour-ceylon-1880-1890/)*

- **සන්නිවේදන කටයුතු දියුණු කිරීම**
  - තැපැල් සේවය ආරම්භ කිරීම
  - විදුලි පණිවිඩ හුවමාරු ක්‍රමය ආරම්භ කිරීම
  - 1925 දී ශ්‍රී ලංකාවට ගුවන් විදුලිය හඳුන්වාදීම

- **දේශීය කර්මාන්ත**
  - කුරුඳු
    * කුරුඳු වෙළෙඳාම රජයේ ඒකාධිකාරයක් බවට පත් කිරීම
    * කුරුඳු නිෂ්පාදනය දෙපාර්තමේන්තුවක් යටතේ සංවිධානය වීම
    * කෝල්බෲක් යෝජනා අනුව 1833 දී කුරුඳු ඒකාධිකාරය අවලංගු කිරීම

  - මුතු කිමිදීම
    * කුරුඳුවලට අමතර ව මුතු කිමිදීමෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව වැඩිම ආදායමක් ලැබීම
    * මුතු කිමිදීමේ අයිතිය වෙන්දේසි කිරීම
    * මුතුපර විනාශ වීමට යා නොදී ආරක්ෂා කිරීම සඳහා ස්ථිර නිලධාරියකු පත් කිරීම

  - ලුණු කර්මාන්තය
    * ලන්දේසින් යටතේ ලුණු ආණ්ඩුවේ ඒකාධිකාරයක් ලෙස පැවතීම
    * ආරම්භයේ දී බ්‍රිතාන්‍යයන් නිෂ්පාදනයෙන් කොටසක් රජයට දීමේ පදනම මත ලුණු එකතු කිරීම ලේවාය අවට ගම් වැසියන්ට භාර දීම
    * 1804 දී ලුණු රජයේ ඒකාධිකාරයක් බවට පත් කිරීම
    * ආරම්භයේ දී රටේ අවශ්‍යතා සඳහා ඉන්දියාවෙන් පවා ලුණු ආනයනය කළ ද පසු ව ලුණුවලින් ලද ආදායම වැඩි වී ඉන්දියාවට පවා ලුණු අපනයනය කිරිමට හැකි වීම
    * ඒකාධිකාරී නීතිරීති නිසා ලුණු නිෂ්පාදනය අඩපණ වී ගිය බැවින් කෝල්බෲක් ලුණු ඒකාධිකාරය අවලංගු කිරීමට යෝජනා කිරීම

- දුම්කොළ
  * උතුරේ වගා කෙරුණු දුම්කොළ සුමාත්‍රා දිවයිනට අපනයනය කිරිමෙන් විශාල ආදායමක් විදේශවලට ඇදී ගිය බැවින් දුම්කොළ වෙළෙඳාම රජයේ ඒකාධිකාරයක් බවට පත් කිරීම (බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා - 1812)
  * එමඟින් රජයට විශාල ආදායමක් ලැබීම

- පුවක්
  * පුවක්වලින් අය කළ තීරුබදු මඟින් විශාල අදායමක් බ්‍රිතාන්‍යයන් විසින් ලබා ගැනීම. 19 වන සියවසේ මුල් දශකයේ දී ලැබූ රේගු ආදායමෙන් 1/4ක් පමණ පුවක්වලින් ලබා ගැනීමට හැකි වීම
  * ගම්මිරිස්, කරඳමුංගු, රා, අරක්කු කර්මාන්තයෙන් මෙන් ම මිනිරන් කර්මාන්තයෙන් ද අදායම් ලබාගැනීමට බ්‍රිතාන්‍යයන්ට හැකි වීම

- **දේශීය කෘෂිකර්මය**
- බ්‍රිතාන්‍යයන් වතුවගාව කෙරෙහි තම අවධානය යොමු කළ ද අතර දේශීය කෘෂිකර්මය කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් වූ නොදක්වීම නිසා දේශීය කෘෂිකර්මාන්තය පරිහානියට පත් වීම
- ගොවිතැන් කටයුතුවලට රජයේ අනුග්‍රහය නොලැබීම
- දේශීය කෘෂිකර්මාන්තය නොසලකා හැරීම නිසා පීඩාවට පත් වූ ගොවිජනතාව 1848 දී ඇති වූ

ඉංග්‍රීසිවිරෝධී සටන් ව්‍යාපාරයට එක් වීම
- 1848 ඉංග්‍රීසි විරෝධී සටන් ව්‍යාපාරයෙන් පසු ඇතැම් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර වරුන් දේශීය කෘෂිකර්මාන්තය කෙරෙහි අවධානය යොමු කිරීම

- **පැරණි වාරිමාර්ග ප්‍රතිසංස්කරණය**
  - හෙන්රි වෝඩ්, හර්කියුලීස් රොබින්සන්, විලියම් ග්‍රෙගරි, ආතර් ගෝර්ඩන් වැනි ආණ්ඩුකාරවරුන් වාරි කටයුතු නගා සිටුවීමට කටයුතු කිරීම නිසා අඩපණ වී ගිය ගොවිතැන් කටයුතු නංවාලීමට හැකි වීම
  - වාරිමාර්ග ප්‍රතිසංසකරණ නඩත්තු කටයුතු සඳහා 1900 දී වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ පසු ව කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව පිහිටුවීම නිසා දේශීය කෘෂිකර්මය තරමක් දුරට යහපත් තත්ත්වයකට පත් වීම
  - 1911 දී සමූපකාර ණය දෙන සමිති පිහිටුවීම මඟින් ගොවි ජනතාවට සේවයක් සිදුවීම

- **අධ්‍යාපනය**
  - දේශීය අධ්‍යාපන ක්‍රමය
    * පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සහ එහි ලක්ෂණ
    * පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය පරිහානියට පත්වීම
    * පෘතුගීසින් හා ලන්දේසින් පාලනය කළ කාලවල දී මුහුදුබඩ ප්‍රදේශවල පැරිෂ් පාසල් මුල්කොටගත් අධ්‍යාපන ක්‍රමයක් පැවතීම

**බ්‍රිතාන්‍ය යුගයේ අධ්‍යාපන ක්‍රමය**
* මිෂනාරී සමාගම් මෙරට අධ්‍යාපනය කෙරෙහි යොමු වීම
* ලන්ඩන්, බැප්ටිස්ට්, වෙස්ලියන්, චර්ච් අමෙරිකන් යන මිෂනාරී සමාගම් මඟින් සිදු වූ සේවාව
* පාසල් වර්ග කීපයක් ඇති කිරීම
  පැරිෂ් පාසල්, මිෂනාරී පැසල්, පෞද්ගලික පාසැල්
* මාධ්‍ය තුනකින් අධ්‍යාපනය ලබාදීම
  සිංහල, දෙමළ, ඉංග්‍රීසි

**කෝල්බෲක් කොමිසමේ අධ්‍යාපන යෝජනා**
* පාසල් පරිපාලනය සඳහා පාසල් කොමිසම පත් කිරීම
* ඉංග්‍රීසි මාධ්‍ය පාසැල් ඇති කිරීම - ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කිරීම
* කොළඹ ඉංග්‍රීසි විද්‍යාලයයක් ඇරඹීම
* ස්වභාෂා පාසල් පරිහානියට පත්වීම

**මැකන්සි පාලන සමයේ ඇති කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ**
* පැසැල් කොමිසම වෙනුවට මධ්‍යම පාසල් කොමිසම පත් කිරීම
* අධාර ලබන පාසැල් ඇති කිරීම
* ස්වභාෂා හා ද්වි භාෂා පාසැල් ඇති කිරීම
* පාසල් පද්ධතිය පුළුල් වීම
* ප්‍රධාන නගරවල බාලිකා පාසල් පිහිටුවීම
* උසස් රැකියා සඳහා ශිෂ්‍යයන් පුහුණු කිරීම් වස් ''කොළඹ ඇකඩමිය'' නමින් පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම

**1865 මෝර්ගන් කමිටුවේ අධ්‍යාපන යෝජනා**
* අධ්‍යාපන පරිපාලනය සඳහා ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටුවීම
* අධ්‍යාපන කටයුතු පරිපාලනය රජය යටතට ගැනීම
* ප්‍රාථමික අධ්‍යාපනය මව්බසින් ලබාදීමට කටයුතු කිරීම

* මිෂනාරී පාසල්වලට රජයේ අධාර ලබාදීම
* පාසල් වර්ග කීපයක් හඳුන්වා දීම
* කර්මාන්ත පාසල්, ද්විභාෂා පාසල්, මධ්‍යම පාසල්, ගුරුපුහුණු පාසල්
* 1920 දී ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස නම් කිරීම
* 1921 දී විශ්ව විද්‍යාල කොලීජිය පිහිටුවීම

**නිදහස් අධ්‍යාපනයේ වර්ධනය**

* 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා අනුව පිහිටුවන ලද අධ්‍යාපන කටයුතු පිළිබඳ කාරක සභාවේ සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා විසින් සියළු ම දරුවන්ට බාලාංශයේ සිට විශ්ව විද්‍යාල තෙක් නොමිලේ අධ්‍යාපනය ලබාදීමට කටයුතු කරමින් නිදහස් අධ්‍යාපනයට මඟ පෑදීම
* ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබාදීම
* මධ්‍ය විද්‍යාලය ආරම්භ කිරීම
* බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය තෙක් නොමිලේ අධ්‍යාපනය ලබාදීම
* ගුරු පුහුණුව සඳහා විශේෂ ආයතන පිහිටුවීම
* ගුරුවරුන්ට රජයෙන් වැටුප් ගෙවීම
* ප්‍රායෝගික අධ්‍යාපනය කෙරෙහි නැඹුරු වීම
* පාසල් සිසුන්ට දිවා ආහාරය ලබාදීම. පාසැල් සෞඛ්‍ය සේවය ඇරඹීම. වැඩහිටි අධ්‍යාපනය සඳහා ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
* ශිෂ්‍යත්ව ක්‍රමයක් ආරම්භ කිරීම: 5 වන ශ්‍රෙණියේ දී හා 8 වන ශ්‍රේණියේ දී පවත්වනු ලබන විභාග මඟින් මෙය ක්‍රියාත්මක වීම
* ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර සහ උසස් පාඨශාලා සහතික පත්‍ර විභාග හඳුන්වා දීම
* දෙවන බස ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම
* ආගම, පාසැල තුළ අනිවාර්ය විෂයයක් බවට පත් කිරීම
* වතු පාසැල්වල ළමයින්ගේ අධ්‍යාපනය වතු පාලකවරුන් වෙත පැවරීම

**සමාජීය වෙනස්කම්**

* සමාජය පන්ති පදනම කරගෙන සකස් වීම
* පැරණි ප්‍රභූ පන්තිය අභාවයට යාම හා නව ප්‍රභූ පන්තියක් බිහි වීම
* කෝල්බෲක් යෝජනාවලින් ඉංග්‍රීසි අධ්‍යාපනය අනිවාර්ය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත වූ අතර යුරෝපා සංස්කෘතිය ගරු කරන ස්වදේශිකයන් පිරිසක් බිහි වීම
* බදු රේන්ද මිලදී ගැනීමෙන් හා වතුවගාවට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සැපයීමෙන් මෙන් ම වැවිලකරුවන් බවට පත්වීමෙන් මෙම නව දේශීය ප්‍රභූ පන්තිය ධනවතුන් බවට පත් වීම
* ඔවුන් තම දරුවන් උසස් අධ්‍යාපනය හා විදේශීය අධ්‍යාපනය කරා යොමු කිරීම
* බටහිර ක්‍රමයට හැඩගැසුනු ධනවත් නාගරික පිරිසක් බිහිවීම
* උගත් මධ්‍යම පන්තියක් බිහි වීම
* නව රැකියා බිහි වීම
* අඩු වේතනයට ශ්‍රමය ලබාගැනීම සඳහා දකුණු ඉන්දියාවෙන් ගෙන එනු ලැබූ ද්‍රවිඩ පිරිස් නිසා වතු කම්කරු පන්තියක් බිහි වීම
* නාගරික කම්කරු පන්තියක් බිහි වීම
  (භාණ්ඩ පැටවීම හා බෑම, කරත්ත දැක්කීම, රෙදි සේදීම)

* වෘත්තීය සංගම් ව්‍යාපාරය ආරම්භ වීම

**නිපුණතා මට්ටම :** • විදේශීය බලවේග හමුවේ ජාතික නායකයන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්වා දෙයි.

**ඉගෙනුම් පල :**
- දේශීය ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය පැහැදිලි කරයි.
- දේශීයත්වය රැක ගැනීමට උරදුන් නායකයන් අගයයි.
- විදේශීය බලවේග හමුවේ දේශීයත්වය රැක ගැනීමට කටයුතු කළ ආකාරය පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

9.2 **දේශීය ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය**

- **මිශනාරී ව්‍යාපාරය**
  - මිශනාරීන් විසින් ආගමික ප්‍රචාරය සඳහා ගෙනගිය ව්‍යාපාර
  - විවිධ මිශනාරී කණ්ඩායම් සහ ඔවුන් ආගම ප්‍රචාරය කළ ප්‍රදේශ
  - ආගම පැතිරවීම සඳහා මිශනාරී සංවිධාන විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග ලේඛනය, දේශනය, අධ්‍යාපනය
    - * විවිධ පුවත්පත් හා සඟරා මුද්‍රණය කොට ජනතාව අතර බෙදාහැරීම
    - * ජනතාව රැස්වන ස්ථානවලට පැමිණි විට දේශන හා සාකච්ඡා මඟින් ආගම පැතිරවීම
    - * පාසැල් ආරම්භ කොට එමගින් ආගම පැතිරවීම
  - ක්‍රිස්තු භක්තිකයන්ට හා රෝමානු කතෝලිකයන්ට විශේෂ වරප්‍රසාද දීම
  - මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගම් හා ඒ ආගම් හා සම්බන්ධ ව පැවති දේශීය සංස්කෘතීන් පරිහානියට පත් වීම
  - ක්‍රි.ව. 1860 පමණ වන විට තම ආගම් හා සංස්කෘතීන් නඟා සිටුවීම සඳහා සිංහල, හින්දු හා ඉස්ලාම් ජනකොටස් විසින් ව්‍යාපාර ආරම්භ කිරීම
  - මිශනාරි සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ලද ආගමික ප්‍රචාර විධි බොහෝ දුරට අනුගමනය කරමින් බෞද්ධ, හින්දු, ඉස්ලාම් භක්තිකයන් ලේඛනය, දේශන හා අධ්‍යාපනය මාර්ගයෙන් තම ආගම් ප්‍රචාරය සඳහා කටයුතු කිරීම

- **බෞද්ධාගමික පුනරුදය**
  - බෞද්ධ පුනරුදය හා සම්බන්ධ වූ ව්‍යාපාර හා සංවිධාන
  - බෞද්ධ පුනර්ජීවනයට පදනම දමනු ලැබුවේ වැලිවිට ශ්‍රී සරණංකර හිමියන් විසිනි.
  - බෞද්ධ පුනරුදයේ කැපී පෙනෙන භික්ෂූන් වහන්සේලා
    වලානේ සිද්ධාර්ථ හිමි
    හික්කඩුවේ සුමංගල හිමි
    බුලත්ගම ධම්මාලංකාර සුමනතිස්ස හිමි
    මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි වැනි හිමිවරුන්ගෙන් සිදු වූ ආගමික සේවා
  - විද්‍යොදය, විද්‍යාලංකාර පිරිවෙන් බිහි වීම
  - වාද විවාද පැවැත්වීම
    - * පංච මහා වාද
  - පරම විඥානාර්ථවාදීන් ශ්‍රී ලංකාවට පැමිණීම
    - * බෞද්ධ පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම
  - බෞද්ධ පුනරුදය හා සම්බන්ධ නායකයයෝ සහ ඔවුන්ගේ දායකත්වය
    - * කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කොට්, අනගාරික ධර්මපාල, බ්‍රහ්මචාරී වලිසිංහ හරිස්චන්ද්‍ර, ශ්‍රීමත් ඩී.බී. ජයතිලක, ආතර් වී දියෙස්, පියදාස සිරිසේන, එස්. මහින්ද හිමි

**බෞද්ධ පුනරුදයට දායක වූ සංවිධාන**

* පරම විඥානාර්ථ බෞද්ධ සමාගම, මහාබෝධි සමාගම, තරුණ බෞද්ධ සංගමය

- සංස්කෘතික ප්‍රබෝධය
- බෞද්ධ මුද්‍රණාලය බිහි වීම
  * ලංකාතිලක විශ්‍රුත මුද්‍රණාලය, සරසවි සඳරැස මුද්‍රණාලය, සුදර්ශන මුද්‍රණාලය, කවට කථිකයා මුද්‍රණාලය
- පුවත්පත් සඟරා හා පොත්පත් මුද්‍රණය බහුලවීම
  * ලක්මිණි පහන පුවත්පත, සරසවි සඳරැස පුවත්පත, වෙනත් පුවත්පත් හා සඟරා
- පිරිවෙන් බිහි වීම
  * පිරිවෙන් මඟින් ගිහි පැවිදි උගතුන් රැසක් බිහි වීම හා ඔවුන් බෞද්ධ පුනරුද ව්‍යාපාර කටයුතුවල නායකත්වය දැරීම
- ඉරුදින දහම් පාසල් ඇතිකිරීම
- බෞද්ධ පාසැල් පිහිටුවීම
- ආගමික උත්සව පැවැත්වීම
- බෞද්ධ පුනරුද ව්‍යාපාරය මඟින් බිහි වූ දේශාභිමාන ව්‍යාපාර
  19 වන සියවස අවසානය වන විට මිශනාරීන්ගේ කටයුතුවලට ප්‍රතිඋත්තර දෙමින් බෞද්ධ පුනරුද ව්‍යාපාරය තව දුරටත් වර්ධනය වීම
- ස්වදේශිකයන් අතර ජාත්‍යාලය දියුණු කිරීමේ ව්‍යාපාරය
- පියදාස සිරිසේන, අනගාරික ධර්මපාල තුමා, වලිසිංහ හරිශ්චන්ද්‍ර වැනි ගිහි නායකයන් මෙන් ම භික්ෂූන් වහන්සේ ද එහි පෙරමුණ ගැනීම
- බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම
  * අනගාරික ධර්මපාල ඉන්දියාවේ පූජනිය ස්ථාන රැක ගැනීමට කටයුතු කිරීම
  * වලිසිංහ හරිස්චන්ද්‍ර අනුරාධපුරයේ පූජනීය ස්ථාන රැක ගැනීමට කටයුතු කිරීම
- බ්‍රිතාන්‍ය පාලන යුගයේ මත්පැන් පානය තදින් පැතිර යාම නිසා ඇති වූ සමාජ ගැටලුවලට පිළියම් යෙදීම් වස් අමද්‍යප ව්‍යාපාරය අරම්භ කිරීම
  * අනගාරික ධර්මපාල, පියදාස සිරිසේන, ජෝන් ද සිල්වා, ඩී.බී. ජයතිලක, එෆ්.ආර්. සේනානායක, ඩී.එස්. සේනානායක වැනි අය එහි නායකත්වය ගැනීම

• **හින්දු ආගමික පුනර්ජීවනය**

- උතුරු ප්‍රදේශයේ ක්‍රිස්තියානි මිශනාරී කටයුතු සාර්ථක ලෙස ක්‍රියාත්මක වීම නිසා එම ප්‍රදේශ වල තම සංස්කෘතිය හා පාරම්පරික සිරිත් විරිත් පරිහානියට පත් වෙමින් පැවති බැවින් තම ආගම හා සංස්කෘතිය ආරක්ෂා කොට ගැනීම පිණිස හින්දු භක්තිකයන් පෙරමුණ ගැනීම
- මේ නිසා හින්දු භක්තිකයන් අතර ආගමික ප්‍රබෝධයක් ඇති වීම
- හින්දු ආගමික පුනරුද ව්‍යාපාරයේ පුරෝගාමියා ලෙස ශ්‍රී ආරුමුග නාවලර් කටයුතු කිරීම
- ශ්‍රී ආරුමුග නාවලර්ගෙන් ඉටු වූ සේවය
  * යාපනයේ වන්නාර් පොන්නෙයි හි හින්දු විද්‍යාලය ආරම්භ කිරීම
  * ශෛව ප්‍රගාශ සභා පිහිටුවීම
  * ශෛව විද්‍යා සාලෙයි නමැති ඉංග්‍රීසි මාධ්‍ය පාසල ආරම්භ කිරීම
  * හින්දු දරුවන් සඳහා තම නිවසේ පන්ති පැවැත්වීම
  * හින්දු දරුවන් සඳහා පොත්පත් රචනා කිරීම හා පොත්පත් දෙමළ බසට හා ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීම
  * හින්දු ආගමේ ප්‍රබෝධයක් ඇති කිරීම
  * පොන්නම්බලම් රාමනාදන් සහ පොන්නම්බලම් අරුණාචලම් යන දෙදෙනා ආගමික ව්‍යාපාරය තව දුරටත් ඉදිරියට ගෙනයාම

- **ඉස්ලාම් ආගමික පුනරුදය**
  - බෞද්ධ, හින්දු ආගමික පුනරුද ව්‍යාපාරයට සමගාමී ව ඉස්ලාම් ආගමේ ද පුනර්ජීවනයක් ඇති වීම
  - ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා සිද්දි ලෙබ්බේ මහතා නායකත්වය ගෙන කටයුතු කිරීම
  - කොළඹ මුස්ලිම් සංගමය පිහිටුවීම
  - සහිරා විද්‍යාලයය ආරම්භ කිරීම
  - අරාබි භාෂාව ඉගැන්වීම ව්‍යාප්ත කිරීම
  - ඉංග්‍රීසි භාෂාව හැදෑරීමට මුස්ලිම් ජනතාව පෙලඹවීම
  - මද්‍රාසා නම් මුස්ලිම් ආගමික පාසල් ආරම්භ කිරීම
  - කාන්තාවන් සඳහා පාසල් ආරම්භ කිරීම
  - මුස්ලිම් නේෂන් පුවත්පත ඇරඹීම
  - සිලෝන් ඉස්ලාම් රිවීව් සඟරාවට ලිපි සැපයීමෙන් අධ්‍යාපනයේ වැදගත්කම පැහැදිලි කිරීම
  - මෙලෙස බ්‍රිතාන්‍යන්ගේ බලපෑම්වලට එරෙහි ව දේශීය ආගම්, දේශීය සම්ප්‍රදායයන් හා දේශීය සංස්කෘතිය ආරක්ෂා කොට ගැනීම සඳහා දේශීය නායකයන් කටයුතු කිරීම



*අමෙරිකානු මිශනාරී පිරිසක් 1890 ශ්‍රී ලංකාවේ දී*
*(source:http://sangam.org/british-divide-rule-ceylon/)*

ඇගයීම් 01

**පහත සඳහන් ප්‍රශ්න සඳහා A, B,C හා D යනුවෙන් ප්‍රතිචාර 4 බැගින් දී ඇත. ඉන් එකක් හෝ කීපයක් නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාර තෝරන්න. A හා B පමණක් නිවැරදි නම් (1) ද, B, හා C පමණක් නිවැරදි නම් (2) ද" C හා D පමණක් නිවැරදි නම් (3) ද, A හා D පමණක් නිවැරදි නම් (4) ද, ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි හෝ නිවැරදි නම් (5) ද වරහන් තුළ ලියන්න.**

1. 1840 රජයේ ඉඩම් අනවසරයෙන් අත්පත් කරගැනීම වැළැක්වීමේ ආඥාපනතේ අරමුණු මොනවා ද
   A වී ගොවිතැන දියුණු කිරීම
   B ධාන්‍ය බද්ද අහෝසි කිරීම
   C රජයේ ඉඩම් ආරක්ෂා කොට ගැනීම
   D රජයේ ඉඩම් වතු වගාකරුවන්ට විකිණීම සඳහා ඒවායේ අයිතිය නිරවුල් කර ගැනීම
   (.........)

2. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ දී මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදි කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි ද?
   A මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදි කිරීම වතු ආර්ථිකයේ ව්‍යාප්තියට තුඩු දුන් ප්‍රධාන සාධකයකි
   B එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා විසින් කොළඹ-නුවර මාර්ගය ඉදි කරනු ලැබී ය
   C කොළඹ-නුවර දුම්රිය මාර්ගය ශ්‍රී ලංකාවේ ප්‍රථම දුම්රිය මාර්ගය විය
   D වතු ආර්ථිකයේ ව්‍යාප්තිය හා සමගාමී ව ඇති වූ ප්‍රවාහණ වර්ධනය ශ්‍රී ලංකාවේ ආර්ථික විපර්යාසයේ වැදගත් ම සිදු වීමය (.........)

3. කන්නන්ගර අධ්‍යාපන යෝජනා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ තෝරන්න
   A ඉගැන්වීමේ මාධ්‍යය ස්වභාෂාව වීම
   B මධ්‍ය විද්‍යාලය පිහිටුවීම
   C බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය තෙක් නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම
   D ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගය වැඩිදියුණු කිරීම
   (.........)

පහත සඳහන් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. ඒ අතරින් මාතෘකාවට නොගැලපෙන කරුණ තෝරන්න

4. කෝපි වගාවේ ව්‍යාප්තිය
   1. කෝපි වගාවේ හිමිකාරත්වය බහුල වශයෙන් ම යුරෝපීයයන් සතු විය
   2. කෝපි වගාව සඳහා අවශ්‍ය වූ ශ්‍රමිකයන් දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගන්නා ලදී
   3. කෝපි වගාව උතුරු පළාතේ ද ව්‍යාප්ත කෙරිණ
   4. හැමීලියා වෙස්ටාට්‍රික්ස් නැමති කෝපි කොළ රෝගය නිසා කෝපි වගාව විනාශ විය
   5. කෝපි වගාවේ ව්‍යාප්තිය නිසා ඉඩම් විකිණීම වර්ධනය විය (.........)

5. දහනව වන සියවසේ ඇති වූ බෞද්ධ පුනරුදය
   1. බෞද්ධ පරම විඥානාර්ථ සමාගමය ආරම්භ කිරීම
   2. උපසම්පදාව පිහිටුවීම
   3. බෞද්ධ අධ්‍යාපනය දියුණු වීම
   4. බෞද්ධ කොඩිය සකස් කිරීම
   5. වෙසක් පෝ දිනය රජයේ නිවාඩු දිනයක් බවට ප්‍රකාශ කිරීම (.........)

6. දහනව වන සියවසේ හින්දු පුනරුදයෙහි ලා ආරුමුග නාවලර්ගේ දායකත්වය
   1. හින්දු පුනරුදය ආරුමුග නාවලර් විසින් මෙහෙයවන ලදි
   2. ඔහු බෞද්ධ පරම විඥානාර්ථ සමාගම සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම
   3. ආගමික නවෝදයක් ඇති කිරීමෙ හිලා පාසල්වල හා අධ්‍යාපනයේ ඇති වටිනාකම පැහැදිලි කර දුන්නේය
   4. නාවලර් විසින් යාපනයේ විශ්වවිද්‍යාලය ආරම්භ කිරීම
   5. 1872 දී ඔහු විසින් ආරම්භ කරන ලද ශෛව විද්‍යා ශාලෙයි පසු කාලයේ දී යාපනයේ හින්දු විද්‍යාලය නමින් හැඳින්විණි. (.........)

**ඇගයීම් 02**

1. පහත දැක්වෙන මාතෘකාවන්ගෙන් දෙකක් තෝරාගෙන ඒවා බ්‍රිතාන්‍ය පාලන සමයේ වැදගත් වූ ආකාරය පැහැදිලි කරන්න.
   1. බෞද්ධ අධ්‍යාපනය
   2. කෘෂිකර්මය හා වාරිමාර්ග කටයුතු
   3. අමද්‍යප ව්‍යාපාරය
   4. 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය
   5. වාමාංශික ව්‍යාපාරය

2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය යටතේ වතු ආර්ථිකයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ වෙනස්කම් පහත සඳහන් ක්ෂේත්‍ර අතරින් කවර හෝ දෙකක් යටතේ පරීක්ෂා කරන්න
   1. ප්‍රවාහණ කටයුතු
   2. ආනයන හා අපනයන වෙළෙඳාම
   3. ඉඩම් අයිතිය හා භුක්තිය
   4. කම්කරු පන්තිය
   5. උඩරට සමාජය

3. I. 19 වන සියවස තුළ ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තයේ වර්ධනය සමාලෝචනය කරන්න
   II. වැවිලි ආර්ථිකය උඩරට ප්‍රදේශයේ ගොවිජනතාව කෙරෙහි බලපෑ ආකාරය සැකෙවින් දක්වන්න

4. ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකයේ සංවර්ධනය පහත මාතෘකා යටතේ පරීක්ෂා කරන්න
   I. කෝපි කර්මාන්තයේ සංවර්ධනයට හා පරිහානියට දායක වූ ප්‍රධාන සාධක
   II. වැවිලි ආර්ථිකය යටතේ ඇති වූ ආර්ථික හා සමාජීය වෙනස් වීම

5. ''19 වන සියවස තුළ වතුවගාවේ ව්‍යාප්තිය ආර්ථික ක්ෂේත්‍රයේ පමණක් නොව සමාජයේ ද කැපි පෙනෙන වෙනසක් සිදු කළේ ය''
   1. වතු වගාව ව්‍යාප්ත කිරීමට ඉවහල් වූ ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කළ කොමිසම නම් කරන්න
   2. වතු වගාව හා සම්බන්ධ වාණිජ බෝග 4ක් නම් කරන්න
   3. වතු වගාව සඳහා ඉඩම් ලබාගත් ආකාරය කෙටියෙන් දක්වන්න
   4. වතු වගාවෙන් උද්ගත වූ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත දැක්වෙන ප්‍රකාශය සාකච්ඡා කරන්න

6. 19 වන සියවසේ දෙවන භාගයේ ඇති වූ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයේ කැපී පෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න.

## 10. ජාතික ව්‍යාපාර හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

ක්‍රි.ව. 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් උඩරට රාජ්‍යය අල්ලා ගනු ලැබීමත් සමඟ ලංකාවේ පැවති ස්වාධීනත්වය අහෝසි වී ගොස් එතෙක් පැවති රාජාණ්ඩු ක්‍රමය ද බිඳවැටිණි. එතැන් පටන් 1948 දී නිදහස දිනා ගන්නා තුරු වසර 133ක් බ්‍රිතාන්‍යයෝ ලංකාව පාලනය කළහ. බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධ ව ලාංකිකයන් විසින් විවිධ උද්ඝෝෂණ ගෙනගිය අතර ඒවායේ ප්‍රතිඵල වශයෙන් වරින් වර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාදීමට බ්‍රිතාන්‍යයන්ට සිදු විය. එම ප්‍රතිසංස්කරණවලින් සෑහීමකට පත් නොවූ ලාංකිකයෝ නොකඩවා උද්ඝෝෂණ ගෙනගියහ. 20 වැනි සියවස ආරම්භයේ සිට ඉංග්‍රීසි උගත් දේශීය මධ්‍යම පන්තිය එම උද්ඝෝෂණ වල මූලිකත්වය ගෙන කටයුතු කළ අතර විවිධ සංගම් පිහිටුවාගෙන ඔවුහු තම ඉල්ලීම් ඉදිරිපත් කළහ. මෙම උද්ඝෝෂණ වල ප්‍රතිඵලයක් වශයෙන් 1948 දී නිදහස දිනාගැනීමට ලාංකිකයන්ට හැකි විය. බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ ඔවුන්ට එරෙහි ව ගෙනගිය උද්ඝෝෂණ ව්‍යාපාර සහ එම කාලය තුළ ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයෙන් සිදු කෙරේ.

**නිපුණතාව** : • ශ්‍රී ලංකාවේ විදේශාධිපත්‍යය පිළිබඳ ව අධ්‍යයනය කොට තම රටේ ස්වාධීනත්වය රැකගැනීමට කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 10.1 බ්‍රිතාන්‍ය පාලනය හා දේශීය නායකයන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 30

**ඉගෙනුම් පල** :
- විදේශාධිපත්‍යය හමුවේ දේශීය නායකයන් ක්‍රියාකළ ආකාරය පෙන්වා දෙයි.
- බ්‍රිතාන්‍යයන් යටතේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පැහැදිලි කරයි.
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සමඟ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**
**මධ්‍යම පන්තිය හා ජාතික ව්‍යාපාර**

- **මධ්‍යම පන්තිය බිහි වීම**
  - කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් වශයෙන් පැරණි දේශීය ප්‍රභූ පන්තිය අබිබවා ධනය හා උගත්කම පදනම් කොටගත් මධ්‍යම පන්තියක් බිහි වීම
  - කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීමේ අවස්ථා පුළුල්වීම
  - වතු වගාවට අවශ්‍ය සේවා සැපයීමෙන් හා අරක්කු රේන්ද මිල දී ගැනීමෙන් ධනය උපයා ගැනීමට අවස්ථාව ලැබීම
  - කොළඹ, හලාවත, කුරුණෑගල වැනි ප්‍රදේශවල පොල්වතු ලාංකිකයන් සතු වීම
  - යුරෝපීය සිරිත් - විරිත්වලට ඇබ්බැහිවීම
  - ධනවත් වූ දේශීය ප්‍රභූවරුන් තම දරුවන් බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලවලට යැවීම
  - එමඟින් ඉංග්‍රීසි උගත් මධ්‍යම පන්තියක් බිහි වීම
  - මේ පිරිසට දේශපාලන බලය හිමි නොවීම
  - බටහිරකරණයට නැඹුරු වූ මෙම පිරිස අලුත් සමාජ බලවේගයක් බවට පත් වීම
  - දේශපාලන බලය ලබා ගැනීමේ අරමුණින් ඔවුන් ආණ්ඩුවට එරෙහි උද්ඝෝෂණ ව්‍යාපාරවල නිරත වීම

**ජාතික ව්‍යාපාරය**

- **ජාතික ව්‍යාපාරය බිහි වීම**

  විදේශාධිපත්‍යයෙන් මිදීම සඳහා කිසියම් රටක සියලු ජනකොටස් එක් ව එක ම අරමුණකින් සංවිධානගත වී ගෙනයනු ලැබූ අරගල ජාතික ව්‍යාපාර ලෙස හඳුන්වනු ලැබේ.

  - 19 වැනි සියවසේ අග හා 20 වැනි සියවසේ මුල දී බිහිවූ ජාතික ව්‍යාපාර
  - ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා ඇති වූ උද්ඝෝෂණ ව්‍යාපාර
    * ලංකා ප්‍රතිසංස්කරණ සංගමය
    * හලාවත සංගමය
    * යාපන සංගමය
    * ලංකා කෘෂිකාර්මික සංගමය
    * අමද්‍යප ව්‍යාපාරය
    * ලංකා ජාතික සංගමය

**ජාතික ව්‍යාපාරයේ අරමුණු**

- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාගැනිම සඳහා කටයුතු කිරීම
- ජාතික ඒකාග්‍රතාව ගොඩනැගීම
- උද්ඝෝෂණ ව්‍යාපාර මෙහෙයවීම
- ආගමික හා සංස්කෘතික පුනරුදය ඇති කිරීම
- වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ලබාගැනීම සඳහා කටයුතු කිරීම
- සාමකාමී උද්ඝෝෂණ ව්‍යාපාරවලට මුල් තැන දීම
- කෙටි කාලයක් තුළ විදේශාධිපත්‍යයෙන් රට මුදා ගැනීම

**ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාගැනීමෙහි ලා ජාතික ව්‍යාපාරයේ දායකත්වය**

- ලංකා ජාතික සංගමය ප්‍රධානත්වය දැරීම
- උද්ඝෝෂණ ව්‍යාපාරය
- වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ලබාගැනීමට කටයුතු කිරීම

**ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල වැදගත් අවස්ථා**

- කෝල්බෲක් ප්‍රතිසංස්කරණ - 1833
  - එතෙක් ක්‍රියාත්මක වූ උපදේශක සභාව අහෝසි කොට ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවීම
  - ව්‍යවස්ථාදායක සභාව නිල ලත් මන්ත්‍රීන් 9 දෙනකු සහ නිල නොලත් මන්ත්‍රීන් 06 කගෙන් සමන්විත වීම

    ආණ්ඩුකාරයා සභාපති වීම
  - විධායක සභාව සාමාජිකයන් 6 දෙනෙකුගෙන් සමන්විත වීම
  - උද්ඝෝෂණ වල ප්‍රතිඵලයක් වශයෙන් 1889 දී ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් මන්ත්‍රීන් සංඛ්‍යාව 06 සිට 08 දක්වා වැඩිවීම

- **කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ (1910)**
  - ව්‍යවස්ථාදායකයේ සාමාජික සංඛ්‍යාව 21 දක්වා වැඩිවීම
  - ප්‍රථම වරට ව්‍යවස්ථාදායක මණ්ඩලයේ සාමාජිකයන් 04 දෙනෙකු සීමිතඡන්දයෙන් තෝරා ගැනීමේ මූලධර්මය හඳුන්වා දීම, ඉන් එක් අයෙකු උගත් ලාංකික නියෝජිතයෙකු වීම
  - ජනවාර්ගික නියෝජන ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කිරීම

- **මැනිං ප්‍රතිසංස්කරණ (1920)**
  - ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් වශයෙන් 1920 මැනිං ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කිරීම
  - ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් සංඛ්‍යාව 37 දක්වා වැඩි කිරීම

- නිල නොලත් මන්ත්‍රීන් බහුතරය වීම
- නිල නොලත් මන්ත්‍රී සංඛ්‍යාව 10 සිට 23 දක්වා වැඩි වීම
- පළාත්බද ඡන්ද ක්‍රමය හඳුන්වා දීම
- 1910 ප්‍රතිසංස්කරණවල දී පැවතියාට වඩා ඡන්ද බලය සුළු වශයෙන් පුළුල් වීම.

- **මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ (1924)**
  - ලංකා ජාතික සංගමයේ ඉල්ලීම් මත 1924 දී නව ප්‍රතිසංස්කරණ ඇති කිරීම
  - ව්‍යවස්ථාදායකයේ සාමාජික සංඛ්‍යාව 49 තෙක් ඉහළ යාම
  - ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් මහජන ඡන්දයෙන් තෝරාපත්කොට ගැනීම

- **ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ (1931)**
  - මැනිං ආණ්ඩුක්‍රම බලය හා වගකීම් බෙදී පැවතුණු දුර්වල ආණ්ඩුක්‍රමයක් වූ බැවින් ඊට එරෙහි ව ඇති වූ උද්ඝෝෂණ ව්‍යාපාරවල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවට සුදුසු ආණ්ඩුක්‍රමයක් යෝජනා කිරීම සඳහා ලංකාවට පැමිණීම
  - ඩොනමෝර් කොමිසම - ඩොනමෝර් සාමි, ජෙෆ්රි බට්ලර්, මැතිව් නාදන් සහ ඩ්‍රමන්ඩ් ෂීල්ඩ් යන අයගෙන් සමන්විත වීම

- **ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ**
  - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
  - විධායක කාරක සභා ක්‍රමය ආරම්භ කිරීම
  - ආණ්ඩුකාරයාගේ බලතල අඩු කිරීම
  - රාජ්‍ය නිලධාරීහු තිදෙනා
  - ජනවාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම
  - සර්වජන ඡන්ද බලය ලබාදීම
  - පළාත්බද නියෝජන ක්‍රමය පුළුල් කිරීම

- **රාජ්‍ය මන්ත්‍රණ සභාව**
  - ව්‍යවස්ථාදායක හා විධායක සභා වශයෙන් වෙන් වෙන් ව පැවති ආයතන දෙක විසුරුවා හැර ඒ වෙනුවට රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
  - සාමාජික සංඛ්‍යාව 61කි.

| | |
|---|---|
| ප්‍රදේශීය ඡන්ද කොට්ඨාස පදනම් කරගෙන ජනතා ඡන්දයෙන් | - 50 |
| ආණ්ඩුකාරයා විසින් නාමකරණයෙන් | - 08 |
| නිලබලයෙන් | - 03 |

  - සභාවේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් තෝරාගත් කථානායකවරයා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මූලාසනය ගැනීම

- **රාජ්‍ය මන්ත්‍රණ සභාවේ බලතල හා කාර්ය**
  - නීති පැනවීමේ බලය
  - වාර්ෂික අයවැය ලේඛනය සැකසීම
  - විධායකයට යෝජනා ඉදිරිපත් කිරීම
  - විධායක කාරක සභා පරීක්ෂා කිරීම

- **විධායක කාරක සභා**
  - ස්වදේශ කටයුතු පිළිබඳ කාරක සභාව

- කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ කාරක සභාව

- පළාත් පාලනය පිළිබඳ කාරක සභාව
- සෞඛ්‍යය පිළිබඳ කාරක සභාව
- අධ්‍යාපනය පිළිබඳ කාරක සභාව
- කම්කරු, කර්මාන්ත හා වාණිජ කාරක සභාව
- පණිවිඩ හුවමාරුව හා පොදුවැඩ කාරක සභාව

- රාජ්‍ය නිලධාරීන් තිදෙනා සහ කථානායකවරයා හැර ඉතිරි 57 දෙනා කාරක සභා 7ක් බෙදා වෙන් කිරීම
- කාරක සභාවල සාමාජික සංඛ්‍යාව උපරිමය 9ක් සහ අවමය 6ක් වීම
- කාරක සභාවේ වැඩි දෙනාගේ කැමැත්තෙන් එහි සභාපතිවරයා තෝරාපත් කොට ගන්නා ලද අතර ඔහු එම කාරක සභාවේ විෂය භාර ඇමතිවරයා වීම
- විධායක කාරක සභා සභාපතිවරුන් 7 දෙනාගෙන් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙන් අමාත්‍ය මණ්ඩලය සමන්විත වීම

- **ආණ්ඩුකාරවරයා**
  - රජු හෝ රැජනගේ නියෝජිත වීම
  - ආරක්ෂක කටයුතු
  - විදේශ කටයුතු
  - ආගමන කටයුතු
  - නැව් ගමනාගමන කටයුතු
  - වෙළෙඳ ගිවිසුම් හා සම්බන්ධ කටයුතු
  - මුදල් හා සේවා කටයුතු
  - අධිකරණ කටයුතු - ආණ්ඩුකාරයා සතු වීම
  - මේ කටයුතු සම්බන්ධයෙන් ආණ්ඩුකාරයා යටත් විජිත භාර ලේකම් වෙත ඍජු ව වගකිව යුතු වීම

- **රාජ්‍ය නිලධාරීහු**
  - මහ ලේකම්
  - මුදල් ලේකම්
  - නීති ලේකම්

**මහ ලේකම්**
- ආරක්ෂක, විදේශ කටයුතු සහ රාජ්‍ය සේවය පාලනය කිරීම

**මුදල් ලේකම්**
- වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීම
- රජයේ ආදායම් එකතු කිරීම හා බෙදා හැරීම
- විදේශ ණය ගනුදෙනු පාලනය
- මුදල් ප්‍රතිපත්තිය
- රාජ්‍ය භාණ්ඩාගාරයේ භාරකාරත්වය

**නීති ලේකම්**
- රාජ්‍ය මන්ත්‍රණ සභාව සම්මත කරන සෑම පනත් කෙටුම් පතක් පිළිබඳ ව ම වාර්තා රාජ්‍ය ලේකම් වෙත යැවීම
- අධිකරණ කටයුතු පාලනය කිරීම
- ආණ්ඩුවට නීති උපදෙස් දීම
- රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ පැවැත්වීම

- **සර්වජන ඡන්ද බලය**
  - සර්වජන ඡන්ද බලය යනු අවුරුදු 21 ට වැඩි සියලු දෙනාටම ඡන්ද බලය හිමි වීමයි.
  - ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ සර්වජන ඡන්ද බලය හිමි වීම
  - වාර්ගික නියෝජනය අහෝසි කිරීම
  - බ්‍රිතාන්‍ය යටත් විජිත අතුරෙන් ඡන්ද බලය හිමි වූ ප්‍රථම ආසියාතික රට ශ්‍රී ලංකාව වීම
  - දේශපාලන කටයුතුවලට සහභාගි වීමට ජනතාවට අවස්ථාව උදා වීම
  - ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නංවන විට ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයක් හරිහැටි වර්ධනය වී නොතිබුණ අතර ක්‍රමයෙන් දේශපාලන සංවිධාන බිහි වීම
  - සුභසාධන රාජ්‍ය ප්‍රතිපත්තියක් ආරම්භ වීම

- **ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ දුර්වලතා**
  - ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමේ දී ප්‍රායෝගික දුර්වලතා පැවති බවට අදහස් ප්‍රකාශ වීම
  - ආණ්ඩුකාරයා සහ රාජ්‍ය නිලධාරීන් වෙත රජයේ බලතල මෙන් ම වැදගත් අමාත්‍යාංශ පැවරී තිබීම පිළිබඳ ව ලාංකිකයන් තුළ අප්‍රසාදයක් ඇති වීම
  - කාරක සභා ක්‍රමය පාලන කටයුතු ප්‍රමාද වීමට හේතු වූ බවට චෝදනා එල්ල වීම
  - අනාගත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය පිළිබඳ ව ආකල්පය වර්ධනය වීමට බාධා ඇති වීම
  - ආණ්ඩුකාරයාගේ බලතල සීමා කරන ලෙසත් වැදගත් ම අමාත්‍යාංශ තුන දේශීය ඇමතිවරුන් වෙත පවරන ලෙසත් ඉල්ලමින් ලාංකිකයන් දිගින් දිගට ම උද්ඝෝෂණ කිරීම

- **සෝල්බරි ආණ්ඩුක්‍රමය (1942)**
  - සෝල්බරි ආණ්ඩුක්‍රමය ඇති වීමට හේතු
  - ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ දුර්වලතා
  - ලාංකිකයන්ගේ උද්ඝෝෂණ - පූර්ණ වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ඉල්ලා දිගට ම උද්ඝෝෂණය කිරීම
  - සෝල්බරි කොමිසම - සෝල්බරි සාමි, ජේ.එෆ්. රීස්, එෆ්.ජේ. බරෝස් යන පුද්ගලයන්ගෙන් සමන්විත වීම. කොමිසම 1944 දී දිවයිනට පැමිණීම

  - **සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ**
    * ආණ්ඩුකාර ධුරය වෙනුවට අග්‍රාණ්ඩුකාර ධුරයක් ස්ථාපනය කිරීම
    * එංගලන්ත කිරීටය නියෝජනය කළ ඔහු නාම මාත්‍රික විධායකය වීම
    * අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
    * පාර්ලිමේන්තුව
    * සුළු ජාතීන්ට රැකවරණය ලැබීම
    * රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

  - **අග්‍රාණ්ඩුකාර ධුරය**
    * බ්‍රිතාන්‍ය කිරීටයේ නියෝජිතයා විය
    * ලංකාවේ අගමැතිගේ උපදෙස් පිට බ්‍රිතාන්‍යයේ රැජින විසින් පත් කරනු ලැබී ය

  - **අග්‍රාණ්ඩුකාරයාගේ බලතල හා කාර්ය**
    * අගමැති හා ඇමතිවරුන් පත් කිරීම
    * අග්‍රවිනිශ්චයකාරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීම
    * අගමැතිගේ උපදෙස් මත පාර්ලිමේන්තුව කැඳවීම, කල් තැබීම හා විසුරුවා හැරීම
    * රාජාසන කථාව ඉදිරිපත් කිරීම
    * සමාජ කටයුතුවලට සහභාගි වීම

**අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය**

* නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයක විශ්වාසය දිනාගත හැකි පුද්ගලයා අගමැති ලෙස අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබීම
* කැබිනට් මණ්ඩලය අගමැතිගෙන් හා ඇමතිවරුන්ගෙන් සමන්විත වීම
* අගමැතිගේ උපදෙස් පිට අග්‍රාණ්ඩුකාරවරයා විසින් ඇමතිවරුන් පත්කිරීම
* ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති ධුර අනිවාර්යයෙන් ම අගමැතිවරයා සතු වීම



*නිදහස් චතුරස්‍රයේ දී පවත්වන ලද ලංකාවේ පළමු පාර්ලිමේන්තුව*
*(source: https://en.wikipedia.org/wiki/Sri_Lankan_independence_movement)*

**පාර්ලිමේන්තුව**

- ද්වීමාණ්ඩලික පාර්ලිමේන්තුවක් පිහිටුවීම
    * නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
    * උත්තර මන්ත්‍රී මණ්ඩලය (සෙනෙට් මණ්ඩලය)

**නියෝජිත මන්ත්‍රී මණ්ඩලය**

- පාර්ලිමේන්තුවේ වැදගත් ම ආයතනය වීම
- සාමාජික සංඛ්‍යාව 101කි.
    * පාදේශීය ඡන්ද කොට්ඨාස මඟින් - 95
    * නාමකරණයෙන් - 06
- පාර්ලිමේන්තුවේ නිල කාලය වසර 05කි.

**බලතල හා කාර්ය**

- යම් යම් සීමාවන්ට යටත් ව නීති සම්පාදන බලය හිමි වීම
- විධායකය පාලනය කිරීම

- අයවැය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හා නව ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම

**උත්තර මන්ත්‍රී (සෙනෙට්) මණ්ඩලය**

- සාමාජිකයන් 30 දෙනෙකුගෙන් සමන්විත වීම
- එයින් 15 දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සහ ඉතිරි 15 දෙනා අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලැබීම
- නිල කාලය වසර 06කි
- මන්ත්‍රීන් සංඛ්‍යාවෙන් 1/3ක් වසර දෙකකට වරක් ඉවත් ව යන අතර ඒ අය වෙනුවෙන් අලුතෙන් මන්ත්‍රීහු තෝරා පත්කරනු ලැබෙති
- දේශපාලනයට ඍජු ව සම්බන්ධ වීමට මැළි වූ බුද්ධිමතුන්ගේ හා වෘත්තිකයන්ගේ සේවය ලබා ගැනීම මෙහි අරමුණ විය
- සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- සෙනෙට් සභාවෙන් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් කැබිනට් මණ්ඩලයට තෝරාගත යුතු වූ අතර අධිකරණ අමාත්‍යාංශය අනිවාර්යයෙන් ම සෙනෙට් සභිකයෙකුට පැවරිය යුතු විය

**බලතල හා කාර්ය**

- මුදල් කෙටුම් පතක් මාස 06 ක් පමා කළ හැකි විය
- සාමාන්‍ය කෙටුම් පතක් වසරක් පමා කළ හැකි විය

**සුළු ජාතීන්ගේ රැකවරණය**

- ඇමති මණ්ඩල කෙටුම්පත හා සෝල්බරි කොමසාරිස්වරුන්ගේ යෝජනා මගින් සුළු ජාතීන්ගේ රැකවරණයට විධි විධාන යෙදීම
- බහු මන්ත්‍රී ආසන ක්‍රමය
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නාමකරණයෙන් මන්ත්‍රීන් 06 දෙනකු පත් කිරීම
- සෙනෙට් මණ්ඩලය පිහිටුවීම

**රාජ්‍ය සේවය හා අධිකරණ සේවය**

- රාජ්‍ය සේවා හා අධිකරණ සේවා කොමිසන් සභා පත් කිරීම
- රාජ්‍ය නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, සේවයෙන් ඉවත් කිරීම් ආදී පරිපාලනයට අදාළ කටයුතු රාජ්‍ය සේවා කොමිසන් සභාවෙන් සිදු කෙරිණ
- අග්‍රවිනිශ්චයකාරවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අධිකරණ සේවා කොමිසන් සභාවක් පත් කිරීම
- අධිකරණය සම්බන්ධ විනිශ්චයකාරවරුන්ගේ කටයුතු මෙහෙයවීම මේ මගින් සිදු වීම
- දිවයිනේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ අරමුදල නමින් අරමුදලක් පිහිටුවීම

**ජාතික නිදහස**

- සෝල්බරි ව්‍යවස්ථාවේ ඇතැම් විධිවිධානවලට අනුව ලංකා පාර්ලිමේන්තුවට පරමාධිපත්‍යයක් හිමි නොවීම
- එබැවින් 1948 ලැබූ නිදහස අර්ධ නිදහසක් වීම
- 1972 ජනරජ ව්‍යවස්ථාව මගින් ලංකාවට පූර්ණ ජාතික නිදහස ලැබීම

ඇගයීම 01

**එක් එක් ප්‍රශ්නය සඳහා නාම, ප්‍රකාශන, දින වකවනු සමූහයක් X තීරුවේ දී ඇත. Y තීරුවේ ඇති නාම, ප්‍රකාශන, දින වකවනු X තීරුව සමග කිසියම් හෝ ආකාරයකින් ගැළපේ. ඒවායින් නිවැරදි ව ගලපා ඇති පිළිතුර තෝරන්න.**

1.

| X | | Y |
|---|---|---|
| 1. 1833 | A | සෝල්බරි ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීම |
| 2. 1873 | B | සිංහල-මුස්ලිම් කෝලාහලය |
| 3. 1915 | C | කෝල්බෲක් ප්‍රතිසංස්කරණ |
| 4. 1924 | D | මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ |
| 5. 1947 | E | පාණදුරා වාදය |

(1) BCDEA (2) DCEAB (3) DECBA (4) CEBDA (5) ABCDE

2.

| X | | Y |
|---|---|---|
| 1. උඩ-පහත දෙරට එක් කිරීම | A. | ඩොනමෝර් ප්‍රතිසංස්කරණ |
| 2. ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථම වරට ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීම | B. | මැනිං ප්‍රතිසංස්කරණ |
| 3. පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම | C. | කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණ |
| 4. රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම | D. | සෝල්බරි ප්‍රතිසංස්කරණ |
| 5. කැබිනට් ක්‍රමය හඳුන්වාදීම | E. | කෝල්බෲක් ප්‍රතිසංස්කරණ |

(1) CBEAD (2) EDCBA (3) ECBAD (4) BCEDA (5) ABCDE

- පහත දැක්වෙන එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතරින් එකක් කුමන හේතුවක් නිසා හෝ නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.

3. 1. මෝර්ගන් 2. මැකලම් 3. මැනිං 4. ඩොනමෝර් 5. සෝල්බරි

4. 1. අනගාරික ධර්මපාල තුමා 2. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
2. රත්මලානේ ධර්මාරාම හිමි 4. ඕල්කොට් තුමා 5. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

**පහත ප්‍රශ්න සඳහා දී ඇති A B C සහ D ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ කීපයක් නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරන්න. A B පමණක් නිවැරදි නම් 1 ද, B C පමණක් නිවැරදි නම් 2 ද, C D නිවැරදි නම් 3 ද, A D පමණක් නිවැරදි නම් 4 ද, ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද වරහන් තුළ ලියන්න.**

5. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?
   A කැබිනට් ක්‍රමය හඳුන්වාදීම
   B රාජ්‍ය මණ්ත්‍රණ සභාව
   C සර්වජන ඡන්ද බලය හඳුන්වාදීම
   D රාජකාරී ක්‍රමය අවලංගු කිරීම (........)

6. 1910 සිට 1924 තෙක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශයේ ප්‍රධාන අවස්ථා සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි ද?
   A පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම
   B විධායක කාරක සභා ක්‍රමය පිහිටුවීම
   C කැබිනට් ක්‍රමය හඳුන්වාදීම
   D උගත් ලාංකිකයකු ව්‍යවස්ථාදායක සභාවට පත් කර ගැනීමට අවස්ථාව උදා වීම (.........)

**පහත ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. ඒ අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරන්න.**

7. 19 වන සියවසේ අගභාගයේ දී ඇති වූ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය
   1. බෞද්ධ පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම
   2. විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් පිහිටුවීම
   3. සූරියමල් ව්‍යාපාරය ආරම්භ කිරීම
   4. යාපනේ පුස්තකාලයය ආරම්භ කිරීම
   5. මුස්ලිම් නෙයිෂන් පුවත්පත ආරම්භ කිරීම (.........)

8. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ
   1. විධායක හා ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම
   2. මුළු රටට ම පොදු අධිකරණ ක්‍රමයක් ඇති කිරීම
   3. සිවිල් සේවක සංඛ්‍යාව අඩු කිරීම
   4. සීමිත ඡන්දයෙන් ව්‍යවවස්ථාදායකයට නියෝජිතයන් තෝරා ගැනීම
   5. මුළු දිවයින ම පළාත් නවයකට බෙදීම (.........)

ඇගයීම 02

1. 19 වෙනි සියවසේ දෙවන භාගයේ ඇති වූ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයේ කැපී පෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14)

2. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රබෝධය හා ස්වාධීනත්වය සඳහා වූ ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් පිළිබඳ ව සටහන් ලියන්න
   i. හෙන්රි ස්ටීල් ඕල්කොට්
   ii. ලංකා ජාතික සංගමය
   iii. වාමාංශික ව්‍යාපාරය
   iv. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ විධායක කාරක සභා ක්‍රමය
   v. ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් (ලකුණු 07 බැගින්)

3. 19 වෙනි සියවස අගභාගයේ ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය හා සම්බන්ධ පහත දැක්වෙන මාතෘකාවලින් ඕනෑම දෙකක් පිළිබඳ විචාරාත්මක සටහන් ලියන්න
   i. විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් පිහිටුවීම
   ii. බෞද්ධ පරම විඥානාර්ථ සමාගම
   iii. හින්දු සංස්කෘතික ප්‍රබෝධය
   iv. ඉස්ලාම් සංස්කෘතික ප්‍රබෝධය (ලකුණු07 බැගින්)

4. කෝල්බෲක්- කැමරන් කොමිසම විසින් ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම, පරිපාලන සහ අධිකරණ ප්‍රතිසංස්කරණ යෝජනා විවේචනාත්මක ව පරීක්ෂා කරන්න. (ලකුණු 14)

5. පහත දැක්වෙන මාතෘකා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න
   i. සර්වජන ඡන්දබලය
   ii. ආණ්ඩුකාරවරයාගේ බලතල
   iii. රාජ්‍ය නිලධාරීහු තිදෙනා
   iv. විධායක කාරක සභා ක්‍රමය (ලකුණු 14)

6. පහත දැක්වෙන ශීර්ෂ යටතේ සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න
   i. ආග්‍රාණ්ඩුකාරවරයා
   ii. අගමැති හා කැබිනට් මණ්ඩලය
   iii. ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකය (ලකුණු 14)

# 11. නිදහසින් පසු ශ්‍රී ලංකාව

1948 ශ්‍රී ලංකාවට නිදහස ලැබීම ලංකා ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සලකුණු කරයි. ඉන්පසු නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය යටතේ වරින් වර විවිධ ආණ්ඩු බලයට පත් වූ අතර ලාංකික නායකයන්ගේ මූලිකත්වයෙන් එම ආණ්ඩු ක්‍රියාත්මක විය. 1972 හා 1978 යන වර්ෂවල ජනරජ ව්‍යවස්ථා හඳුන්වා දීමත් සමඟ දේශපාලන ක්ෂේත්‍රයේ තවත් වෙනස්කම් රාශියක් ඇති විය. නිදහසින් පසු ගෙවුණු දසක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්වීම්, ස්වාධීන රාජ්‍යයක් ලෙස ආර්ථික සංවර්ධනය හා සමාජ සුභ සාධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩපිළිවෙළ මෙන් ම විදේශ ප්‍රතිපත්තිය ද පිළිබඳ තොරතුරු මෙම ඒකකයෙන් සාකච්ඡා කෙරේ.

**නිපුණතාව** : • ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 11.1. ස්වාධීන රාජ්‍යයක් සඳහා පිහිටුවා ගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විමර්ශනය කරයි.

**ඉගෙනුම් පල** : • නිදහසින් පසු බලයට පත් වූ ආණ්ඩු හා ඒවායේ කාර්ය සිද්ධීන් විස්තර කරයි.
• 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විවේචනාත්මක ව විග්‍රහ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**
**11. නිදහසින් පසු ශ්‍රී ලංකාව**

**1952 මහ මැතිවරණය**

- ඡන්දයෙන් තෝරා ගැනිමට නියමිත ආසන සංඛ්‍යාව 95කි. ඉන් ආසන 54ක් ලබා ගනිමින් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කිරීම. ඩඩ්ලි සේනානායක මහතා අගමැති තනතුරට පත් වීම
- 1952 - 1956 අතර කාලයේ සිදු වූ සුවිශේෂ සිදුවීම්
  - 1953 දී සහල් ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල වැඩි කිරීම නිසා රජයට විරුද්ධ ව විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ වීම
  - සමසමාජ පක්ෂය ප්‍රමුඛ වාමාංශික දේශපාලන පක්ෂවලට අනුබද්ධිත වෘත්තීය සංගම්වල නායකත්වයෙන් ක්‍රියාත්මක වුණු මෙම විරෝධතා ව්‍යාපාරය හර්තාලය ලෙස හඳුන්වනු ලැබීම හා එය රට පුරා ක්‍රියාත්මක වීම
  - පාර්ලිමේන්තුව තුළ වර්ධනය වෙමින් පැවැති ආණ්ඩු විරෝධී ව්‍යාපාරය නිසා අගමැති ඩඩ්ලි සේනානායක මහතා තනතුරෙන් ඉල්ලා අස් වීම
  - ජෝන් කොතලාවල මහතා අගමැති තනතුරට පත් වීම
- ජෝන් කොතලාවල මහතාගේ පාලන සමයේ විශේෂ සිදුවීම්
  - 1954 කොළඹ සමුළුව පැවැත්වීම
  - 1955 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම
  - ඉන්දියානු වතු කම්කරු ප්‍රශ්නය සාකච්ඡා කරමින් නේරු - කොතලාවල ගිවිසුම අස්සන් කිරීම

**1956 මහ මැතිවරණය**

- මෙම මැතිවරණය ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සැලකේ
- මෙම මැතිවරණය සඳහා එක්සත් ජාතික පක්ෂය තනි පක්ෂයක් ලෙස තරග කළ අතර එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

තවත් දේශපාලන පක්ෂ කිහිපයක් සමඟ එකතු වී මහජන එක්සත් පෙරමුණ ලෙස තරග කළේ ය.

- සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේග වැඩි සහාය ලබාගනිමින් මහජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කිරීම. බණ්ඩාරනායක මහතා අගමැති තනතුරට පත්වීම
- එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ ආණ්ඩුව අනුගමනය කළ ප්‍රතිපත්ති හා හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණ
  - සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම
  - 1947 අස්සන් කොට තිබූ ආරක්ෂක හා බාහිර සබඳතා ගිවිසුම් අහෝසි කිරීම
  - නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
  - වරාය හා බස් සේවය ජනසතු කිරීම
  - දේශීය කර්මාන්ත හා කෘෂිකර්මය දියුණු කිරීමට කටයුතු කිරීම
- 1959දී බණ්ඩාරනායක මහතා ඝාතනය කරනු ලැබීම

**1960 මාර්තු හා ජූලි මැතිවරණ**

- 1960 මැතිවරණයෙන් කිසිදු පක්ෂයකට බහුතර ආසන සංඛ්‍යාවක් ලබාගැනීමට නොහැකි විය. එක්සත් ජාතික පක්ෂය, පක්ෂ කිහිපයක් සමඟ එකතු ව ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයෙන් යුත් නව ආණ්ඩුවක් පිහිටුවීම. එහෙත් පාර්ලිමේන්තුව විවෘත කිරීම සඳහා පවත්වන ලද රාජාසන කතාව පරාජයට පත්වීම නිසා ආණ්ඩුව විසුරුවා හැරීමට සිදුවීම
- 1960 ජූලි මැතිවරණයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් යුතු වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයගැනීම
- සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමය
  - බණ්ඩාරණායක මහතාගේ ජනසතු ව්‍යාපාර තවදුරටත් ඉදිරියට ගෙනයාම
  - දේශීය ආර්ථිකය නගා සිටුවීමට යොමු වූ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
  - ඉන්දියානු වතුකම්කරුවන්ගේ පුරවැසි භාවය පිළිබඳ ව ගැටලු විසඳීම සඳහා ඉන්දියානු අගමැති ලාල් බහදූර් ශාස්ත්‍රී මහතා සමඟ 1964 දී ගිවිසුමක් අස්සන් කිරීම
  - ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය යන වාමාංශික පක්ෂ සමඟ එකතු වී 1964 දී සමඟි පෙරමුණ පිහිටුවීම

**1965 මහ මැතිවරණය**

- මෙම මැතිවරණයෙන් කිසිදු පක්ෂයකට බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගත නොහැකි විය. එහෙත් පක්ෂ කිහිපයක් සමඟ සන්ධානගත ව ආණ්ඩුවක් පිහිටුවා ගත් එක්සත් ජාතික පක්ෂයේ නායක ඩඩ්ලි සේනානායක මහතා තෙවැනිවරට ද අගමැති තනතුරට පත් වීම

**1970 මහ මැතිවරණය**

- නියමිත ආයු කාලය අවසන් වීමෙන් පසු ව පැවැත් වූ 1970 මහ මැතිවරණයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් යුත් සමඟි පෙරමුණ ජය ගැනීම. ඇය දෙවන වරට ද අගමැති තනතුරට පත් වීම. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දීම මෙම ආණ්ඩුව යටතේ වූ වැදගත් සිදු වීමකි.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය**

**1972 පළමු ජනරජ ව්‍යවස්ථාව**

- 1972 මැයි 22 දින නව ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කිරීම. එය ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ.

**1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ**

- මෙතෙක් Ceylon නමින් හැඳින් වූ රට ශ්‍රී ලංකාව නමින් හඳුන්වනු ලැබීම
- බ්‍රිතාන්‍ය රජය සමඟ පැවති ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම
- ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බව පිළිගැනීම
- ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

**1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ**

1. **ජාතික රාජ්‍ය සභාව**
   - 1972ට පෙර පාර්ලිමේන්තුව නමින් හැඳින්වූ ව්‍යවස්ථාදායකය වෙනුවට නව ව්‍යවස්ථාව මඟින් ජාතික රාජ්‍ය සභාව ස්ථාපිත කෙරිණි.
   - සෙනෙට් සභාව අහෝසි කිරීම
   - ජාතික රාජ්‍ය සභාව සතු බලතල හා කාර්ය
     - නීති සම්පාදනය
     - මූල්‍ය පාලනය
     - විධායකය පාලනය කිරීම

2. **නාමික ජනාධිපති තනතුර**
   - සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පැවැති අග්‍රාණ්ඩුකාර තනතුර වෙනුවට නාමික විධායක, ජනාධිපති තනතුරක් හඳුන්වා දීම
   - සෝල්බරි ව්‍යවස්ථාවෙන් අග්‍රාණ්ඩුකාරයාට හිමි ව තිබූ බලතල නව ආණ්ඩුක්‍රමව්‍යවස්ථාව මඟින් යටතේ ජනාධිපතිවරයාට පැවරීම

3. **අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය**
   - විධායක බලය ක්‍රියාත්මක කිරීමේ බලය අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට හිමිවීම
   - ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන්ගේ උපරිම විශ්වාසය දිනාගත් පුද්ගලයා ජනාධිපති විසින් අගමැති තනතුරට පත්කරන ලදි
   - අගමැතිගේ උපදෙස් පරිදි සෙසු ඇමතිවරු පත්කරනු ලැබූහ.
   - අමාත්‍ය මණ්ඩලයේ නායකයා අගමැති ය.

4. **අධිකරණය**
   - 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රටේ යුක්තිය පසිඳලීම සඳහා අධිකරණ පද්ධතියක් පිහිටුවීම
     - ශ්‍රේෂ්ඨාධිකරණය
     - මහාධිකරණය
     - දිසා අධිකරණය
     - මහේස්ත්‍රාත් අධිකරණය
     - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය

5. **මූලික මිනිස් අයිතිවාසිකම්**
   - 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන වගන්තියේ මූලික මිනිස් අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස ගැන සඳහන් වේ

**1978 දෙවෙනි ජනරජ ව්‍යවස්ථාව**

- 1977 පැවැත්වූ මහමැතිවරණයෙන් ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රී ආසන 168න් 140ක් ලබා ජයගැනීමට ජේ.ආර්.ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් යුත් එක්සත් ජාතික පක්ෂය සමත් විය.
- 1978 දෙවෙනි ජනරජ ව්‍යවස්ථාව සම්පාදනය කිරීම

**1978 ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ**

01. **විධායක ජනාධිපති ධුරය**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වගන්තිය අනුව ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා රජයේ ප්‍රධානයා ද, විධායකයේ ප්‍රධානයා ද, ආණ්ඩුවේ ප්‍රධානයා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ද වේ.
- ජනාධිපති තනතුර පූර්ණ විධායක බලය සහිත රජයේ ඉහළ ම තනතුර වේ.

**ජනාධිපතිවරයා සතු බලතල හා වරප්‍රසාද**

- ව්‍යවස්ථාදායකය හා සම්බන්ධ බලතල
  * පාර්ලිමේන්තුව කැඳවීම, වාරාවසාන කිරීම, විසුරුවා හැරීම
  * පාර්ලිමේන්තුවේ මංගල රැස්වීමේ මුලාසන දැරීම
  * ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
  * ඕනැම අවස්ථාවක පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වීම, පාර්ලිමේන්තුව ඇමතීම
  * අගමැති පත් කිරීම
  * ඇමතිවරුන් පත් කිරීම
  * ඇමතිවරුන්ට විෂය හා කාර්ය පැවරීම

- අධිකරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ බලතල හා වරප්‍රසාද
  * අගවිනිසුරු ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීම
  * අධිකරණයකින් වරදකරු කළ තැනැත්තකුට සමාව දීම, දඬුවම් ලිහිල් කිරීම
  * අභියාචනාධිකරණයේ සභාපති පත් කිරීම
  * අධිකරණ සේවා කොමිසම පත් කිරීම
  * ජනාධිපතිවරයාට විරුද්ධ ව අධිකරණයේ නඩු පැවැරිය නොහැකි වීම

- රාජ්‍ය නායකයා වශයෙන් ඇති බලතල
  * යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම
  * රාජ්‍ය උත්සවවල මුලසුන දැරීම
  * අන්තර්ජාතික වශයෙන් ජනරජය නියෝජනය කිරීම
  * රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීම
  * රාජ්‍ය දූතයන් පත් කිරීම හා මෙරටට පැමිණි දූතයන් පිළිගැනීම

- විධායක බලතල
  * ත්‍රිවිධ හමුදාපතිවරුන් පත් කිරීම
  * රජයේ උසස් නිලධාරීන් පත් කිරීම
  * අගමැති හා අමාත්‍ය මණ්ඩලය පත් කිරීම

02. **පාර්ලිමේන්තුව**

- 1972 ව්‍යවස්ථාවෙන් ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කෙරුණු ව්‍යවස්ථාදායකය මෙම ව්‍යවස්ථාව මඟින් පාර්ලිමේන්තුව ලෙස නම් කිරීම
- පාර්ලිමේන්තුව මන්ත්‍රීවරුන් 225 දෙනකුගෙන් සමන්විත වේ.
- පාර්ලිමේන්තුව සතු බලතල
  - නීති පැනවීම
  - මුදල් පරිපාලනය
  - අයවැය සකස් කිරීම
  - සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම

03. **අගමැති හා අමාත්‍ය මණ්ඩලය**
- ජනාධිපති විසින් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අතුරින් අගමැති හා අමාත්‍ය මණ්ඩලය පත් කරනු ලැබේ
- අමාත්‍ය මණ්ඩලය සාමූහිකව පාර්ලිමේන්තුවට වගකිව යුතු වීම
- අමාත්‍ය මණ්ඩලයට පැවැරුණු නිශ්චිත කාර්ය පැවතීම

උදාහරණ : - අමාත්‍යවරුන්ට පැවරුණු විෂය භාර ව කටයුතු කිරීම
- පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති ක්‍රියාත්මක කිරීම
- ඒ ඒ අමාත්‍යාංශවල අයවැය, ඇස්තමේන්තු හා අතුරු අයවැය සකස් කිරීම

04. **අධිකරණය**
- 1978 ව්‍යවස්ථාව අනුව ස්වාධීන අධිකරණ පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කිරීම
  - ශ්‍රේෂ්ඨාධිකරණය
  - අභියාචනාධිකරණය
  - මහාධිකරණය
  - දිසා අධිකරණය
  - පවුල් අධිකරණය
  - මහේස්ත්‍රාත් අධිකරණය
  - ප්‍රාථමික අධිකරණය

05. **මූලික මිනිස් අයිතිවාසිකම්**
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තෙවැනි පරිච්ඡේදයේ මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විස්තර වේ. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට වඩා මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ව මෙහි පුළුල් ලෙස දක්වා ඇත.
- මෙම ව්‍යවස්ථාවේ 129 වන වගන්තිය අනුව යමෙකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති විටෙක මාස තුනක් ඇතුළත නීතිඥයකු මගින් පාර්ලිමේන්තුවට පෙත්සමක් ඉදිරිපත් කළ හැකි ය.
- රජයේ හෝ සංස්ථාවක සේවය කරන්නකුට සේවය කිරීමේ දී තම අයිතිවාසිකම් කඩ වී හෝ සීමා වී හෝ ඇති විටෙක පාර්ලිමේන්තු මහ කොමසාරිස් (ඔම්බුඩ්ස්මන් - දුක්ගන්නාරාගල වෙත පෙත්සමක් ඉදිරිපත් කළ හැකි ය.

**1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් නවාංග**

1. දෝෂාභියෝගය
2. නව නියෝජන ක්‍රම
   - සමානුපාතික නියෝජන ක්‍රමය
   - ජනාධිපතිවරණය
   - ජනමත විචාරණය

ඇගයීම 01

**පහත අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නම් පහ බැගින් සපයා ඇත. ඉන් එකක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.**

01. 1. ඩී.එස්. සේනානායක 2. ජෝන් කොතලාවල 3. ඩබ්. දහනායක
4. සිරිමාවෝ බණ්ඩාරනායක 5. ඩී.බී. ජයතිලක (........)

02. 1. එක්සත් ජාතික පක්ෂය 2. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 3. ලංකා සමසමාජ පක්ෂය
4. කොමියුනිස්ට් පක්ෂය 5. ලංකා ජාතික සංගමය (........)

03. 1. ජේ.ආර්. ජයවර්ධන 2. රණසිංහ ප්‍රේමදාස 3. සිරිමාවෝ බණ්ඩාරනායක
4. ඩී.බී. විජේතුංග 5. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග (........)

04. 1. ජාතික රාජ්‍ය සභාව 2. ජනාධිපතිවරණය 3. දෝෂාභියෝගය
4. සමානුපාතික නියෝජනය 5. ජනමත විචාරණය (........)

05. 1. ඩී.එස්. සේනානායක 2. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක 3. එන්.එම්. පෙරේරා
4. පොන්නම්බලම් රාමනාදන් 5. එස්.ඒ. වික්‍රමසිංහ (........)

**අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ තෝරා ලියන්න.**

06. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට නිදහස ලබාදීම සඳහා පැනවූ පනත
1. ලංකා නිදහස් පනත 2. සෝල්බරි පනත 3. මුඩුබිම් පනත
4. පළාත් සභා පනත 4. මහනගර සභා පනත (........)

07. 1948 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කිරීටයේ නියෝජිතයා ලෙස පත් වූයේ කවරෙක් ද?
1. ආණ්ඩුකාරවරයා 2. අගමැතිවරයා 3. ඔම්බුඩ්ස්මන්වරයා
4. අග්‍රාණ්ඩුකාරවරයා 5. විරුද්ධ පක්ෂයේ නායකයා (........)

08. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිට වූ නායකයා
1. ඩඩ්ලි සේනානායක මහතා 2. ඩී.එස්. සේනානායක මහතා
3. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 4. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා (........)

09. 1955 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ශ්‍රී ලංකාවට හිමි වන විට ලංකාවේ සිටි අගමැතිවරයා වූයේ කවරෙක් ද?
1. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය 2. ජෝන් කොතලාවල මහතා
3. ඩබ්. දහනායක මහතා 4. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
5. ඩඩ්ලි සේනානයක මහතා (........)

10. විධායක ජනාධිපතිධුරය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක් ද?
1. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 2. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
3. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 4. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (........)

**අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

11. 1. එක්සත් ජාතික පක්ෂය - ඩී.එස්. සේනානායක මහතා
    2. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
    3. සමසමාජ පක්ෂය - එන්.එම්. පෙරේරා මහතා
    4. කොමියුනිස්ට් පක්ෂය - එස්.ඒ. වික්‍රමසිංහ මහතා
    5. පෙඩරල් පක්ෂය - පොන්නම්බලම් අරුණාචලම් මහතා (........)

12. 1. ව්‍යවස්ථාදායක සභාව - 1833
    2. රාජ්‍ය මන්ත්‍රණ සභාව - 1910
    3. ලංකා ජාතික සංගමය - 1919
    4. පාර්ලිමේන්තුව - 1947
    5. ජාතික රාජ්‍ය සභාව - 1972

(........)

13. 1. මන්ක් මේසන් මුවර් - පළමු වැනි අග්‍රාණ්ඩුකරවරයා
    2. විලියම් ගොපල්ලව - පළමු වැනි ජනාධිපති
    3. ජේ.ආර්. ජයවර්ධන - පළමු වැන විධායක ජනාධිපති
    4. ප්‍රැන්සිස් මොලමුරේ - පළමු වැනි විපක්ෂනායකවරයා
    5. සිරිමාවෝ බණ්ඩාරනායක - පළමු වැනි අගමැතිවරිය (........)

14. 1. ඩී.එස්. සේනානායක - ගොවිජනපද ව්‍යාපාර
    2. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක - ජනසතු ව්‍යාපාර
    3. ඩබ්. දහනායක - පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය
    4. සිරිමාවෝ බණ්ඩාරනායක - ආවෘත ආර්ථික ප්‍රතිපත්තිය
    5. ජේ.ආර්. ජයවර්ධන - විවෘත ආර්ථික ප්‍රතිපත්තිය (........)

15. 1. 1952 මහමැතිවරණය - එක්සත් ජාතික පක්ෂය
    2. 1956 මහමැතිවරණය - මහජන එක්සත් පෙරමුණ
    3. 1960 ජූලි මහමැතිවරණය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
    4. 1970 මහමැතිවරණය - සමඟි පෙරමුණ
    5. 1977 මහමැතිවරණය - සමසමාජ පක්ෂය (........)

**ඇගයීම 02**

01. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1948 සිට ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වෙනස් වූ ආකාරය සැකෙවින් සාකච්ඡා කරන්න.
02. 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පරික්ෂා කරන්න.
03. 1978 තෙක් ශ්‍රී ලංකාවේ වාමාංශික පක්ෂවල දේශපාලන ක්‍රියාකාරිත්වය සැකෙවින් සමාලෝචනය කරන්න.
04. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග පරීක්ෂා කරන්න.
05. නිදහසින් පසු 1977 තෙක් ශ්‍රී ලංකාවේ පැවැත් වූ මහමැතිවරණ හා පත්වූ ආණ්ඩුවල වැඩපිළිවෙළවල් සැකෙවින් සාකච්ඡා කරන්න.

**නිපුනතා මට්ටම :** 11.2 ස්වාධීන රාජ්‍යයක් ලෙස ජාතික සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළ විමර්ශනය කරයි.

**ඉගෙනුම් පල :**
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ග විස්තර කරයි
- නිදහසින් පසු ශ්‍රී ලංකාව සංවර්ධනය සඳහා ගත් ප්‍රයත්න අගය කරයි
- සංවර්ධනය උපාය මාර්ගවල ඵලදායීතාව විග්‍රහ කරයි

**කාලච්ඡේද සංඛ්‍යා 20**

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.**

**සංවර්ධන ක්‍රියාමාර්ග**

**ආර්ථික සංවර්ධනය**

- රාජ්‍ය ව්‍යවසාය
  - විවිධ දෙපාර්තමේන්තු හා සංස්ථා රාශියක් පිහිටුවීම
  - රාජ්‍ය කර්මාන්ත ජාලයක් ඇති කිරීම (මේ පිළිබඳ ව කර්මාන්ත යටතේ සාකච්ඡා කෙරේ)
  - වරාය සහ බස් සේවය ජනසතු කිරීම
  - ඛනිජ තෙල් බෙදාහැරීම ජනසතු කිරීම
  - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිහිටුවීම
  - ලංකා බැංකුව හා මහජන බැංකුව මුල්කරගත් රාජ්‍ය බැංකු පද්ධතියක් පිහිටු වීම

- කෘෂිකර්මාන්තය

01. වී ගොවිතැන දියුණු කිරීම
- ගොවි ජනපද පිහිටුවීම
  - ඩී.එස්. සේනානායක මහතා විසින් වියළි කලාපයේ ගොවිජනපද පිහිටුවා කෘෂිකර්මාන්තය දියුණු කිරීම ආරම්භ කිරීම
  - ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ පිහිටුවන ලද කෘෂිකර්ම විධායක කාරක සභාවේ සභාපති වූ ඩී.එස්. සේනානායක මහතාගේ මූලිකත්වයෙන් එම යුගයේ සිට ම ගොවිජනපද පිහිටුවීම ඇරඹීම උදාහරණ: මින්නේරිය, මිනිපේ, පරාක්‍රම සමුද්‍රය, නාච්චදූව, ඉරණමඩු
  - නිදහස ලැබීමෙන් පසු 1953 තෙක්, නව ගොවිජනපද රාශියක් පිහිටුවීම උදාහරණ : ගල් ඔය, කන්තලේ, සොරබොරවැව
  - නව ගොවිජනපද පිහිටුවීමත් සමඟ පැරණි වැව් අමුණු ප්‍රතිසංස්කරණය හා වාරිමාර්ග තැනවීම කෙරෙහි රට තුළ ප්‍රබල උනන්දුවක් ඇති වීම. (මෙරට පළමු බහුකාර්ය යෝජනා ක්‍රමය)

- මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය
  - මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර පොල්ගොල්ලේ දී මහවැලි ගඟ හරහා විශාල බැම්මක් තනවා රජරට වියළි කලාපයට ජලය ගෙනයාම
  - ඉතිරි අදියර සම්පූර්ණ කිරීම වසර 30කින් සිදු කිරීමට යෝජනා කිරීම
  - 1977 බලයට පත් ජේ.ආර්. ජයවර්ධන රජය විසින් එය වසර පහකින් නිම කිරීමට යෝජනා කිරීම
  - 1978 මහවැලි සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීම හා 1979 මහවැලි අධිකාරිය පිහිටුවීම
  - මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදි කළ ජලාශ
    කොත්මලේ, වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ, උල්හිටිය, රත්කිඳ හා මාදුරු ඔය

- වී වගාව දියුණු කිරීම සඳහා ගත් වෙනත් ක්‍රියාමාර්ග
  - 1958 කුඹුරු පනත පැනවීම
  - ගොවි ණය හා පොහොර සහණාධාරය
  - වී සඳහා සහතික මිල ක්‍රමයක් හඳුන්වා දීම

- වී පර්යේෂණායතනය පිහිටුවීම හා නව වී ප්‍රභේද හඳුන්වා දීම
  උදාහරණ : බතලගොඩ වී අභිජනන මධ්‍යස්ථානය
- ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම
- රජයේ බැංකු මඟින් ගොවියන්ට ණය පහසුකම් ලබා දීම



*කොත්මලේ වේල්ල*
*(Source: https://en.wikipedia.org/wiki/Kotmale_Dam)*

02. ව්‍යාපාරික කෘෂිකර්මාන්තය
  - බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් තේ, රබර් හා සම්ප්‍රදායික ව පැවැති පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදන නිදහසෙන් පසු වසර තිහක් පමණ යන තෙක් මෙරට ප්‍රධාන අපනයන ද්‍රව්‍ය ලෙස පැවතීම
  - රාජ්‍ය වැවිලි සංස්ථාව හා උඩරට වතු සංවර්ධන මණ්ඩලය වැනි ආයතන පිහිටුවීම

03. සුළු අපනයන බෝග වගාවේ දියුණුව
  - කෝපි, කොකෝවා, කරදමුංගු, කරාබු නැටි, සාදික්කා, ගම්මිරිස්, කුරුඳු වැනි බෝග වගාව දියුණු කිරීමට කටයුතු කිරීම
  - 1972 මාතලේ සුළු අපනයන පර්යේෂණායතනයක් ආරම්භ කිරීම

කර්මාන්ත
- 1952 වර්ෂයේ දී මෙරටට පැමිණි ලෝක බැංකු නියෝජිත කණ්ඩායමක් රජයේ මැදිහත් වීම මත මධ්‍යම හා සුළු පරිමාණයේ කර්මාන්ත ආරම්භ කිරීමේ වැදගත්කම පෙන්වා දීම
- කාර්මික ජනපද පිහිටුවීම
  උදාහරණ : ඒකල, රත්මලාන
- 1958 - 1968 දස අවුරුදු යෝජනා ක්‍රමය යටතේ යකඩ, වානේ, තුනී ලෑලි, සීනි ආදි මහාපරිමාණ කර්මාන්ත ශාලා ආරම්භ කිරීම
- 1970 - 1977 කාලයේ ආයත ආදේශන ප්‍රතිපත්ති අනුගමනය කිරීම
- 1977 වර්ෂයෙන් පසු, අඟලුම් කර්මාන්තයේ හා අපනයන ආශ්‍රිත කර්මාන්තවල දියුණුවක් ඇති වීම

උදාහරණ : කටුනායක, බියගම හා කොග්ගල අපනයන කලාප පිහිටුවීම

**සමාජ සංවර්ධනය**

**අධ්‍යාපනය**

- අධ්‍යාපනයේ දියුණුවට විශාල වශයෙන් මුදල් යෙදවීම නිසා රටපුරා පාසල් විශාල ලෙස වැඩිවීම
- විෂයමාලා සංවර්ධනය හා ගුරු පුහුණු කටයුතු නවීකරණය කිරීම
- විද්‍යාගාර පහසුකම් හා පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම
- දිවා ආහාර, පාසල් පොත්, වෛද්‍ය හා දන්ත වෛද්‍ය සේවා, පාසල් නිල ඇඳුම් ආදිය නොමිලයේ ලබා දීම
- වෘත්තීය අධ්‍යාපන ආයතන පිහිටුවීම
- විශ්ව විද්‍යාලය පිහිටුවීම

**සෞඛ්‍යය**

- ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම
- සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ ග්‍රාමීය ප්‍රදේශවල රෝහල් පිහිටුවීම
- වින්නඹු, මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා දියුණු කිරීම
- ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීම, වෛද්‍ය සායන පැවැත්වීම හා දේශීය වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමට කටයුතු කිරීම
- මේ නිසා උණ සන්නිපාතය, බරවා, මැලේරියා, ක්ෂය රෝගය, බාලක පක්ෂාඝාත රෝගය වැනි රෝග වැලඳෙන පිරිස සැලකිය යුතු ලෙස අඩු වීම

**සලාක ක්‍රමය**

- සහල් සහනාධාර ලබා දීම
- ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට ආහාර මුද්දර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- අඩු ආදායම් ලාභීන්ට නිවාස ආධාර ලබා දීම හා නිවාස තනා දීම

**ග්‍රාමීය ප්‍රදේශවල පහසුකම් වැඩි දියුණු කිරීම**

- ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග පහසුකම් දියුණු කිරීම හා නව බස් සේවා ආරම්භ කිරීම
- ගම්බද ප්‍රදේශවල විදුලිබල පහසුකම් ලබා දීම
- ග්‍රාමීය ජනතාවට පානීය ජලය ලබාදීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- තැපැල් හා දුරකථන සේවා ගම් මට්ටමින් දියුණු කිරීමට පියවර ගැනීම
- සමූපකාර සේවය හා බැංකු සේවය ගම් මට්ටමින් ආරම්භ කිරීම



*වර්තමාන මහා පරිමාණ ඇඟලුම් කර්මාන්ත ශාලා*
*(source:https://www.gettyimages.co.uk/photos/sri-lanka-economy-garments)*

**නිපුණතා මට්ටම :** 11.3 ස්වාධීන රාජ්‍යයක් ලෙස විදේශ රාජ්‍ය සමග කටයුතු කළ ආකාරය විමසා බලයි

**ඉගෙනුම් පල** :
- නිදහස් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති විග්‍රහ කරයි
- ශ්‍රී ලංකාව විදේශීය අවධානයට යොමු වීමට හේතු පහදයි
- ශ්‍රී ලංකාව සමඟ මිත්‍ර සම්බන්ධතා පැවැත්වූ රටවල්, සිතියමක ලකුණු කරයි

**කාලච්ඡේද** : 15

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.**

11.3. **විදේශ ප්‍රතිපත්තිය**
- ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය එක් එක් කාලවකවානු අනුව විග්‍රහයක් කළ හැකි වීම

1. 1947 සිට 1956 තෙක් බ්‍රිතාන්‍යය සමඟ බැඳීමකින් ක්‍රියා කිරීම
   - 1947 සිට ව්‍යාප්ත වූ සීතල යුද්ධ පසුබිම තුළ, බ්‍රිතාන්‍යය සමඟ ඉතා කිට්ටු සම්බන්ධතාවකින් කටයුතු කිරීම
   - ඉන්දියාව සමඟ ද දේශපාලන සම්බන්ධතා පැවැත්වීම

2. 1956 - 1965 දක්වා නොබැඳි පිළිවෙතක් කෙරෙහි අවධානය යොමු කිරීම
   - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් 1956 මහජන එක්සත් පෙරමුණ ජය ගැනීම ලංකා විදේශ ප්‍රතිපත්තියේ සන්ධිස්ථානයක් සලකුණු කිරීම
   - වෙනස් වන ලෝක බලතුලනය අනුව ලංකාව ජාත්‍යන්තර තලයට ගෙන ඒම ඔහුගේ අරමුණ වීම මෙතුමාගේ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය අංශ තුනක් ඔස්සේ විමසා බැලිය හැකි වීම
     1. ධනවාදී රටවල් සමඟ තිබූ සබැඳියාව සාමාන්‍ය මිත්‍රශීලී සම්බන්ධතාවක් දක්වා වෙනස් වීම
     2. නැගෙනහිර සමාජවාදී බලවතුන් සමඟ සම්බන්ධතා ව්‍යාප්ත කිරීම
     3. ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට තෙවන ලෝක (ආසියා - අප්‍රිකා) මුහුණුවරක් සපයා දීම
     - මෙතුමා විසින් චීනය හා සෝවියට් දේශය සමඟ පැවැත් වූ සම්බන්ධතා අංශ කිහිපයකි
       * තානාපති සම්බන්ධතා
       * වෙළෙඳ හා ගෙවීම් සම්බන්ධ ගිවිසුම්වලට එළඹීම
       * සංස්කෘතික සම්බන්ධතා
     - සමාජවාදී රටවලින් ආධාර ලැබීම
     - 1960 බලයට පත් වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ද එම ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාම

3. 1965 - 1970 බටහිර බලවතුන්ගේ ආර්ථික ආධාර ලබා ගැනීම ප්‍රමුඛ කොටගත් විදෙස් පිළිවෙත
   - මෙම අවධිය වන විට ලංකාවේ මූල්‍ය සංචිතය අවම වීම හා මෙම තත්ත්වය ලංකාවේ දේශපාලනයට බලපෑම
   - ඒ අනුව 1965 පමණ සිට අමෙරිකාව ප්‍රමුඛ බටහිර රටවල් සමඟ මිත්‍රශීලී සම්බන්ධතා පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කිරීම
   - ලංකා රාජ්‍යය, අන්තර්ජාතික මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව සමඟ පැවැත්වූ සමීප සම්බන්ධතාව මෙමඟින් ඉස්මතු වීම
   - මේ නිසා ම ඇමරිකාව ප්‍රමුඛ බටහිර බලවතුන් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා විදෙස් ප්‍රතිපත්තිය තීරණය කිරීමේ තීරක බලවේගය බවට පත් වීම
   - එසේ වුවත් 1967 මැද භාගයේ සිට බටහිරට ඇති නැඹුරුව ක්‍රමයෙන් වෙනස් කොට චීනය හා සෝවියට් දේශය සමඟ සාමාන්‍ය මිත්‍රශීලී සම්බන්ධතාවක් පවත්වාගෙන යාම

4. 1970 - 1977 කාල වකවානුව
   - 1970 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට පක්ෂය යන පක්ෂවලින් සමන්විත සමඟි පෙරමුණ රජය විසින් දැඩි රුකවල්වාදී විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
   - එහෙත් පසු ව එම පිළිවෙත වෙනස් වීම
   - මෙම අවධියේ දී, අමෙරිකාව, චීනය හා ඉන්දියාව සමඟ සබඳතා පැවැත්වීම



*චීන රජයේ අනුග්‍රහයෙන් ඉදි කරන ලද ජාත්‍යන්තර බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව*
*(source: http://www.panoramio.com/photo/2610226)*




*ජාත්‍යන්තර බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම සඳහා පළමු පස් පිඩැල්ල කැපීම*
*(source:http://www.ft.lk/article/421331/Tribute-to-a-Statesman)*

ඇගයීම 01

**අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ තෝරා ලියන්න.**

01. නව වී වර්ග හඳුන්වාදීම සඳහා 1952 දී පළමුවරට වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටු වූයේ කොහේ ද?
1. ලුණුවිල 2. බතලගොඩ 3. නුවරඑළිය 4. අගලවත්ත 5. තලවකැලේ (........)

02. මුලදී තිස් වසරකින් නිම කිරීමට අපේක්ෂා කළ මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය සය වසරකින් නිම කිරීමට උපදෙස් දුන් රාජ්‍ය නායකයා කවු ද?
1. ඩී.එස්. සේනානායක මහතා 2. ජේ.ආර්. ජයවර්ධන මහතා
3. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා 4. ජෝන් කොතලාවල මහතා
5. සිරිමාවෝ බණ්ඩාරනායක මැතනිය (........)

03. විදේශවලින් ආනයනය කරන ලද භාණ්ඩ වෙනුවට ඊට සමාන ආදේශක දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම කුමන නමින් හඳුන්වන්නේද ?
1. විවෘත ආර්ථික ප්‍රත්පත්තිය 2. ආනයන ආදේශන ප්‍රතිපත්තිය 3. ආයාත ප්‍රතිපත්තිය
4. කාර්මීකරණ ප්‍රතිපත්තිය 5. නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය (........)

04. මහවැලි සංවර්ධන ව්‍යාපාර යටතේ පළමු ව ඉදි වූ අමුණ කුමක් ද?
1. ඇළහැර අමුණ 2. මිණිපේ අමුණ 3. පොල්ගොල්ල අමුණ 4. තේක්කම අමුණ (........)

05. විදුලිබල ජනනය ප්‍රධාන අරමුණ කරගනිමින් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදි වූ ජලාශය කුමක්'ද?
1. කොත්මලේ 2. රන්දෙනිගල 3. වික්ටෝරියා 4. රන්ටැඹේ 5. උල්හිටිය
(........)

06. විද්‍යෝදය විශ්ව විද්‍යාලය වර්තමානයේ හැඳින්වෙන්නේ කුමන නමින් ද?
1. කැලණිය විශ්වවිද්‍යාලය 2. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 3. කොළඹ විශ්වවිද්‍යාලය
4. පේරාදෙනිය විශ්වවිද්‍යාලය 5. රුහුණු විශ්වවිද්‍යාලය (........)

07. ශ්‍රී ලංකාවේ පිහිටු වූ පළමුවන විශ්වවිද්‍යාලය කුමක් ද?
1. කැලණිය විශ්වවිද්‍යාලය 2. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 3. ලංකා විශ්වවිද්‍යාලය
4. රජරට විශ්වවිද්‍යාලය 5. පේරාදෙණිය විශ්ව විද්‍යාලය (........)

08. ශ්‍රී ලංකාවේ පිහිට වූ පළමු කාර්මික ජනපදය කුමක්ද ?
1. රත්මලාන 2. ඒකල 3. බියගම 4. කටුනායක 5. ඇවරිවත්ත (........)

09. මෙරට ආරම්භ කළ පළමු වැනි බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක් ද ?
1. මහවැලි ව්‍යාපාරය 2. ගල්ඔය ව්‍යාපාරය 3. මින්නේරිය ව්‍යාපාරය
4. මිනිපේ ව්‍යාපාරය 5. ඉඟිනිමිටිය ව්‍යාපාරය (........)

10. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ රජය මඟින් කරන ලද මහා පරිමාණ කර්මාන්තයක් වන්නේ මින් කුමක් ද?
1. ඇසිටික් ඇසිඩ් 2. සබන් 3. සුවඳ විලවුන් 4. සීනි
5. පිඟන් භාණ්ඩ (........)

**ඇගයීම 02**

01. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බලයට පත් වූ ආණ්ඩු දේශීය කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ගත් ක්‍රියා මාර්ග සාකච්ඡා කරන්න.

02. පහත සඳහන් මාතෘකා පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   1. නිදහස් ශ්‍රී ලංකාවේ කාර්මීකරණ ප්‍රතිපත්තිය
   2. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රියාත්මක කළ සමාජ සංවර්ධන වැඩපිළිවෙළ

03. නිදහසින් පසු 1978 දක්වා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ස්වරූපය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

04. නිදහසින් පසු මුල් අවදියේ බටහිරට නැඹුරුවූ විදේශ ප්‍රතිපත්තිය 1970-77 වන විට ක්‍රමයෙන් වෙනස් වූ ආකාරය පරීක්ෂා කරන්න.

# ඉන්දියාවේ ඉතිහාසය



## 7. පශ්චාත් මෞර්ය යුගය හා විදේශීය දේශපාලන බලය

මෞර්ය අධිරාජ්‍යය බිඳ වැටීමෙන් පසු ගුප්ත අධිරාජ්‍යයේ ආරම්භය තෙක් සියවස් තුනක් පමණ කාල වකවානුව තුළ ඉන්දියාවේ දේශීය මෙන් ම විදේශීය රාජවංශ ගණනාවක් එකිනෙකා පරයා බලය අත්පත් කරගන්නා ආකාරය දැකගත හැකි ය. එබැවින් මෙම කාලසීමාව එතෙක් පැවත ආ කේන්ද්‍රාභිසාරී බලවේග වෙනුවට කේන්ද්‍රාපසාරී බලවේග ගොඩනැගුණු කාලපරිච්ඡේදයක් ලෙස ඉතිහාසඥයෝ හඳුන්වති. එහෙත් මින් එක් රාජවංශයකට වත් මුළු ඉන්දියාව ම හෝ ඉන් කොටසක් හෝ එක්සත් කිරීමට නොහැකි වීම විශේෂත්වයකි. සියවස් තුනක පමණ මෙම කාලය තුළ ඉන්දියාවේ බලවත් වූ ශුංග, ඉන්දු ග්‍රීක, ශක, කුෂාණ, ක්ෂහාරාත ක්ෂත්‍රප හා සාතවාහන යන දේශීය හා විදේශීය රාජවංශ පිළිබඳ ව මෙම ඒකකයෙන් අවධානය යොමු කෙරේ.

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | • | ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. |
| **නිපුණතා මට්ටම** විග්‍රහ | : | 7.1 | ඉන්දීය ඉතිහාසයට බලපෑමක් කළ විදේශීය රාජවංශ පිළිබඳ තොරතුරු කරයි. |
| **ඉගෙනුම් පල** | : | • | ඉන්දීය ඉතිහාසයට බලපෑම් කළ විදේශීය රාජවංශ පිළිබඳ තොරතුරු විස්තර කරයි. |
| | | • | විදේශීය රාජවංශ බලපෑම පෙන්වා දෙයි. |
| | | • | පශ්චාත් මෞර්ය යුගය ප්‍රදේශ සිතියමක ලකුණු කරයි. |
| **කාලච්ඡේද ගණන** | : | | 30 |

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

**ශුංග පෙළපත (ක්‍රි.පු 185-ක්‍රි.පු 72)**

- මෞර්ය අධිරාජ්‍යයේ අවසන් පාලකයා වූ බෘහද්රථ රජු ඝාතනය කොට මගධයේ බලය අත් කරගෙන නව රාජවංශයක් පිහිටවූ පුෂ්‍යමිත්‍ර (ක්‍රි.පු 185-151), ශුංග වංශිකයකු බව පුරාණ ග්‍රන්ථවල සඳහන් වේ.
- ශුංගවරුන් දේශීය පෙළපතකට අයත් වේ. මෙම පෙළපතේ ප්‍රභවය පිළිබඳ ව විවිධ මතවාද පවතී. මොවුන් භාරද්වාජ නම් බ්‍රාහ්මණ ගෝත්‍රයට අයත් යැයි පාණිනි සඳහන් කරයි.
- ශුංග රජවරුන්ගේ නම්වල අගට මිත්‍ර යන නම යොදා ඇති බැවින් මොවුන් මිත්‍ර දෙවියා පිදූ ඉරාණීය රාජවංශයක් ලෙසද ඇතැම් උගත්තු පවසති.
- පුෂ්‍යමිත්‍ර ශුංගගේ බලය මගධයේ සිට බටහිරදිගින් නර්මදා නදිය තෙක් විහිදී පැවති බව මූලාශ්‍රය අනුව පැහැදිලි වේ.
- පාටලීපුත්‍රය අගනගරය කරගෙන අයෝධ්‍යා, විදිසා වැනි ප්‍රදේශ පාලනය කර ඇත.
- පුෂ්‍යමිත්‍ර ශුංගගේ කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් කිහිපයකි.
  - වයඹදිග ජලන්දර් හා සියල්කෝට් ප්‍රදේශ අත් කර ගැනීම

- ඩෙකෑන් ප්‍රදේශය මගධයට ඈඳා ගැනීම
- ග්‍රීක ආක්‍රමණිකයකු පලවා හැරීම
- අශ්වමේධ යාග දෙකක් පැවැත්වීම

- මොවුන් බුදුදහමටත් අනුග්‍රහ දැක්වූ බව සාංචි, භාර්හුත්, බුද්ධගයා ආදී ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමෙන් පැහැදිලි වේ.

භාර්හුත් කැටයම්





සාතවාහන අවධියේ සාංචි ස්තූපයේ පියගැට පෙළ සහ ගරාදි වැට නිර්මාණය කිරීම





*( Source : https://www.commons.wikimedia.org)*

- පුෂ්‍යමිත්‍රගෙන් පසු අග්නිමිත්‍ර බලයට පත් වේ. කාලිදාසගේ මාලවිකාග්නිමිත්‍ර කෘතියේ ප්‍රධාන චරිතය ඔහුය.
- ඉන් පසු සුජ්‍යෙෂ්ඨ, භාගභද්‍ර ආදීන් බලයට පත් වූ අතර අවසන් පාලකයා වන්නේ දේවභූති ය.

**ඉන්දු - ග්‍රීක (ක්‍රි.පු 212- ක්‍රි.ව 30)**

- පශ්චාත් මෞර්ය අවධියට පෙර ඉන්දු ග්‍රීක සම්බන්ධතා
- මෞර්ය අධිරාජ්‍ය අවසාන කාලයේ සිට ග්‍රීකයන් වයඹදිග ඉන්දියාවට වරින් වර පැමිණීම.
- මෞර්ය යුගයෙන් පසු උතුරු ඉන්දියාවේ පැවැති අස්ථාවර දේශපලන තත්ත්වය ග්‍රීකයන්ට ඉන්දියාව ආක්‍රමණය කිරීමට සුදුසු පරිසරයක් සකස් කිරීමට හේතු වීම.
- මිනැන්ඩර් ශුංගයන්ගේ ප්‍රදේශ ආක්‍රමණය කිරීම.
- පර්සියානු අධිරාජ්‍යයේ ඩේරියස් රජුගෙන් පසු ඉන්දියාවට එල්ල වූ ග්‍රීක ආක්‍රමණ

  උදාහරණඃ ඇලෙක්සැන්ඩර් ආක්‍රමණය (ක්‍රි.පූ 4වන සියවස), සෙලියුකස් නිකේටර් ආක්‍රමණය

- මෞර්ය බලය බිඳවැටීමෙන් පසු බැක්ට්‍රියානු ග්‍රීකයන් අනාරක්ෂිත වූ වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කිරීම.

- ක්‍රි.පූ 250 අවසන් භාගයේ දී බැක්ට්‍රියාවේ I ඩිමිට්‍රියස් විසින් ඉන්දියාවට ආක්‍රමණයක් එල්ල කරමින් සිය බලය (පංචාල සහ සාගල අල්ලා ගැනීම, ඉන්දු ග්‍රීකයන්ගේ ග්‍රහණයට ඉන්දියාව නතුවීමේ ආරම්භක පියවරය.

- යුක්‍රාටිඩීස් විසින් තක්ෂිලා ප්‍රදේශය අල්ලාගනු ලැබීම.

- II ඩිමිට්‍රියස් සාගල නැතහොත් සියල්කෝට් සිය අගනගරය කරගනිමින් වයඹදිග ඉන්දීය ප්‍රදේශවල පාලන කටයුතු මෙහෙයවීම.

**මිනැන්ඩර් රජතුමා**

- ඉන්දු ග්‍රීකයන්ගේ ශ්‍රේෂ්ඨතම පාලකයා වන්නේ මිනැන්ඩර් හෙවත් මිලින්ද (මිලිඳු) රජු ය.

- ගංගා නිම්නයේ සිට බැක්ට්‍රියාවේ ඔක්සස් නදිය තෙක් හිමාලයේ සිට නර්මදා නදිය තෙක් ග්‍රීක බලය ව්‍යාප්ත කිරීම.

- පාටලීපුත්‍රය, උජ්ජේනිය, මධ්‍යම ඇෆ්ගනිස්තානිය, පංජාබය, සින්ධ්, රාජස්ථාන්, උත්තර ප්‍රදේශය ඔහුගේ පාලනය යටතේ පැවතීම.



මිනැන්ඩර් රජුට අයත් කාසි

- අගනගරය සාගල හෙවත් වර්තමාන සියල්කෝට් වීම.

- තක්ෂිලා, පෙෂාවෝර්, කාබුල්, පංජාබ් යන ප්‍රදේශ යන ප්‍රදේශය බ්‍රෝච් වර ... ත් විය.

  මේ රජුට අයත් කාසි සොයාගෙන තිබේ. වැඩි ම කාසි ප්‍රමාණයක්

  නිකුත් කළ ඉන්දීය රජු ලෙස ද ඔහු සැලකේ.

*( Source : https://www.wikipedia.org/wiki/History_of_the_Indo-Greek_Kingdo)*

- සියල්කෝට් ලිපියට අනුව වයඹදිග, පන්ජාබ්, සින්ඩ්, රාජ්පුතානා, කතියවාර් ඇතුළු විශාල ප්‍රදේශයක ආධිපත්‍යය පැවති බව.

- මිලින්ද රජු බෞද්ධාගමටත් අනුග්‍රහ දැක්වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ. මිලින්දපඤ්හ නම් කෘතියට පදනම් වී ඇත්තේ මිලින්ද රජු හා නාගසේන නම් බෞද්ධ භික්ෂුවක් අතර ඇති වූ අභිධර්මය වැනි ගැඹුරු බෞද්ධ දාර්ශනික තේමා ය.

- බිජාපූර් අභිලේඛනයේ මොහු බුදුදහමට කළ සේවය පිළිබඳ ව සඳහන් වේ.
- හර්මයියෝස් ග්‍රීක පෙළපතේ අවසන් පාලකයා වීම.

**ශකවරු (සිතියානුවරු)**

- මොවුන් පිළිබඳ ව ග්‍රීක ස්ට්‍රාබෝ, චීන ෂි-චි හාන්නාන් ෂු, තියෙන්හාන් ෂු යන ග්‍රන්ථ තොරතුරු සපයයි.

- ශක පාලකයන් බලය ඉන්දියාවේ අභ්‍යන්තර ප්‍රදේශවලට ව්‍යාප්ත වූයේ සහ ප්‍රසිද්ධියට මෙන් ම ආර්ථික අතින් ශක්තිමත් පිරිසක් බවට ඔවුන් පත් වූයේ ඔවුන්ගේ ප්‍රදේශීය පාලකයන් වූ ක්ෂහාරත ක්ෂත්‍රපවරුන් මඟිනි.

- ශකවරු මධ්‍යම ආසියානු ගෝත්‍රික පිරිසක් වන අතර ක්‍රි.පූ 1-2 සියවස්වල දී බෝලාන් දුර්ගය හරහා ඉන්දියාවට පැමිණ ඇත.

- ග්‍රීකයන් සතු උතුරු , වයඹදිග හා බටහිර ඉන්දියානු ප්‍රදේශ අත්කර ගැනීම.
- පෙළපත් කිහිපයක් යටතේ ඉන්දියාවට පැමිණ අල්ලාගත් ප්‍රදේශ ක්‍ෂත්‍රපවලට බෙදා පාලනය කිරීම. එහි පාලකයා ක්‍ෂත්‍රප හෙවත් මහාක්‍ෂත්‍රප ලෙසින් හැඳින්විණි.
- තක්ෂිලාව මුල් කොටගෙන පාලනය ගෙනගිය මුල් ම වැදගත් පාලකයා මෝහ හෙවත් මාවුස් ය.
- කතියවාරයේ බලය ව්‍යාප්ත කරගත් ශක පාලකයා නහපාන ය.
- නහපානගෙන් පසු කාර්දමක නම් තවත් ශක වාංශික පිරිසක් කතියවාරයේ බලය සියතට ගෙන ඇත. එහි ආරම්භක පාලකයා චෂ්ටන ය.
- මෙම පෙළපතේ ශ්‍රේෂ්ඨතම පාලකයා මහාක්‍ෂත්‍රප රුද්‍රදාමන් රජුය. ජුනාගාඩ් ලිපිය ඔහුට අයත් වේ. සාතවාහන රජු මොහු විසින් පරාජය කරන ලද බව මෙහි දැක්වේ. ඉන්දියාවේ පළමු සංස්කෘත අභිලේඛනය වන ජුනාගාඩ් ලේඛනයට අනුව බටහිර ඉන්දියාවේ ඔහුගේ බලය පැතිර පැවතිණි.



*( Source : https://www.wikipedia.org/wiki/Junagadh_rock_inscription_of_Rudradaman)*
ජුනාගාඩ් ලිපිය

- ඉන්දියාවේ බලය අල්ලාගත් ශකවරුන්ගේ ප්‍රධාන මධ්‍යස්ථාන 4කි.
  (තක්ෂිලා, මථුරා, උජ්ජයිනී, මහාරාෂ්ට්‍ර)
- ශක වර්ෂ ක්‍රමය ආරම්භ කිරීම.
- මේ කාලයේ බටහිර ලෝකය සමඟ වාණිජ සබඳතා ඉතා ම දියුණුව පැවැති යුගයකි.
- නහපානගේ බෑනා වූ උසවන්දාත බටහිර වෙරළ ආශ්‍රිත ව පාලනය ගෙන ගියේ මේ සබඳතා වර්ධනය කර ගැනීම පිණිසය.
- ආර්ථිකය සාධකය කොටගෙන දේශපාලන ආධිපත්‍යය හැසිරවූ රාජ්‍යයකි.


- මෙම සාධකය ක්ෂත්‍රප-සාතවාහන ගැටුමට හේතු විය.

**පාර්තියානු (පහ්ලව)**

- ක්‍රි.ව පළමු වන සියවස වන විට ඉන්දියාවේ වයඹදිග ප්‍රදේශයේ බලවත් ව සිටි ශකවරුන්ට පසු ව තක්ෂිලාව පාලන මධ්‍යස්ථානය කොට රාජධානියක් පිහිටුවා ගැනීමට පාර්තියන්වරුට හැක විය.
- ගොණ්ඩොපර්නීස් වයඹදිග ප්‍රදේශවල පාර්තියානු බලය ව්‍යාප්ත කළ මුල් ම පාලකයා ලෙස සැලකේ.
- මේ රජුගෙන් පසු ව රාජ්‍ය කොටස්වලට බෙදීගිය අතර ක්‍රමයෙන් ඉන්දියාවට ඇතුළු වුණු කුෂාණයෝ පහ්ලව බලය පැවති ප්‍රදේශවල බලය තහවුරු කර ගත්හ.

**කුෂාණ යුගය හා ඉන්දීය ඉතිහාසයේ ලා ඔවුන්ගේ දායකත්වය**

- මොවුන්ගේ මුල් නිජබිම චීන තුර්කිස්ථාන් ප්‍රදේශය යි. ඔවුහු යූ-ඒ-චී නම් එඬේර ගෝත්‍රයෙන් බිඳී ආ පිරිසකි.
- මුල් ම පාලකයා කුජුල කැඩ්පයිසීස් ය. ඔහුගේ පුත් හීම කැඩ්පයිසීස් කුෂාණ බලය ඉන්දියාවේ විශාල ප්‍රදේශයක ව්‍යාප්ත කළ පාලකයා විය. මොහු සර්වලෝක ඊශ්වර, මහේශ්වර වැනි විරුදයන් භාවිත කොට ඇත.



රබාතක් අභිලේඛනය

*( Source : https://www.wikipedia.org/wiki/Rabatak_inscription)*

- මෑතක දී ඇෆ්ගනිස්ථානයේ රබතක් නම් ස්ථානයේ හමුවූ අභිලේඛනය මගින් අනුව කණිෂ්ක රජුගේ තොරතුරු රැසක් හෙළි වී ඇත
- කණිෂ්ක රජු කුෂාණ රජුන් අතර ශ්‍රේෂ්ඨතමයා විය.

**කණිෂ්ක රජු ( ක්‍රි.ව 78101 )**

මූලාශ්‍රය ඃ - සංස්කෘත බසින් රචිත පසු ව ටිබෙට් හා චීන බසට පරිවර්තනය කරන ලද බෞද්ධ කෘතීන් වන සූත්‍රාලංකාර, සංයුක්ත රත්න පිටක, ශ්‍රී ධර්ම පිටක, නිධාන සූත්‍ර

- කල්පනාමණ්ඩිතිකාව, රබකත්, සූයි විහාර් තඹ තහඩුව, සීඩා හා මාණික්‍යාලා අභිලේඛන ද වැදගත් වේ.

- පාහියන් හා හියුං සාං වාර්තා, නාණක, අභිලේඛන,

**දේශපාලන බල ව්‍යාප්තිය**

- උත්තර ප්‍රදේශයේ සිට මාල්වා හරහා කතියවාර් තෙක් ඔහුගේ බලය ව්‍යාප්ත ව පැවතුණි.
- පුරුෂපුරය (පෙෂාවෝර්) අගනගරය කරගෙන අධිරාජ්‍යයක් පිහිටුවීම
- කණිෂ්කගේ නැගෙනහිර ඉන්දීය බල ව්‍යාප්තිය පිළිබඳ ව සැලකීමේ දී ටිබෙට් හා චීන ලේඛන වැදගත් වේ. ඒ අනුව පාටලීපුත්‍රය, බෙංගාලය, ඔරිස්සා, බිහාරය, නේපාලය තෙක් ඔහු සිය බලය ව්‍යාප්ත කළ බව පිළිගැනේ.
- පෙරිප්ලස් ඔප් ද එරිත්‍රියන් සීනම් ග්‍රන්ථයේ දක්වන ආකාරයට සන්දනේස් නම් රජකු ටහිර ඉන්දියානු ප්‍රදේශ ජය ගෙන ඇත. සන්දනේස් ලෙස දක්වා ඇත්තේ කණිෂ්ක රජු බව අනුමාන කෙරේ බටහිර ඉන්දියාවේ භාරුකච්ඡ හා කතියවාරය යන ප්‍රදේශවල බලය ව්‍යාප්ත කොට ඇත.

- මධ්‍ය ආසියානු ප්‍රදේශවල බලය ව්‍යාප්තිය

  * කණිෂ්ක රජු ඉන්දියාවෙන් ඔබ්බෙහි මධ්‍ය ආසියානු ප්‍රදේශවල ද සිය බලය ව්‍යාප්ත කිරීමට දැරූ උත්සහයන් පිළිබඳ ව ඇතැම් චීන මූලාශ්‍රයවල දක්නට ලැබීම.

  * මධ්‍ය ආසියාවේ යාර්කාන්ඩ්, ඛෝටාන්, සිතියාන්, කැස්ගර් තෙක් බලය ව්‍යාප්ත කළ බව ශිලා …ාහවුරු වීම.



*කෝටාන්වලින් හමුවූ කණිෂ්කට අයත් තඹ කාසියක්*

*( Source : https://www.wikipedia.org/kanishka)*

**සංස්කෘතික වැදගත්කම**

- කුෂාණයන් විදේශීය ප්‍රභවය ලැබූ රාජවංශයක් වුවත් ඉන්දීය සංස්කෘතියට විශාල අනුග්‍රහයක් දැක්වීම.
- කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේදී

  හෝ පංජාබ්හි ජලන්දර්වල දී සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීම
- මෙම සංගායනාවේ වැදගත් ප්‍රතිඵල රැසක් ඇති විය.

  - සූත්‍ර විභාෂ, විනය විභාෂ, අභිධර්ම විභාෂ ලෙස මහායාන ත්‍රිපිටකයක් නිර්මාණය වීම.



- මහායාන බුදු දහමේ වර්ධනය හා ව්‍යාප්තිය.
- බෝධිසත්ත්ව සංකල්පය ප්‍රචලිත වීම.
- බුද්ධ ප්‍රතිමා නිර්මාණකරණය ආරම්භ වීම,
- බෞද්ධ ගොඩනැඟිලි, විහාරාරාම හා ස්තූප ඉදි වීම

*කණිෂ්ක රජු මහායාන බුදු දහම වැලඳ ගැනීම*

*( Source : https://www.wikipedia.org/kanishka)*



*බුද්ධ චරිතයේ එක් එක් අවස්ථා නිරූපණය කිරීම (මථුරා සම්ප්‍රදාය)*

*( Source : https://www.wikipedia.org)*



*මථුරා සම්ප්‍රදායයට අයත් බෝධිසත්ත්ව ප්‍රතිමාවක්*

*( Source : https://www.wikipedia.org/wiki/Bodhisattva)*



පෙෂාවෝරයේ පිහිටි කණිෂ්ක ස්තූපය

*( Source : https://www.historyatoz.blogspot.com/2015/07/kanishka-great.html)*

- සංස්කෘත භාෂාවට විශේෂ තැනක් හිමි වීම හා සංස්කෘත භාෂාවෙන් කෘති ලිවීම.

  * බුද්ධ චරිතය, සූත්‍රාලංකාරය, ශාරිපුත්‍ර ප්‍රකරණය, සෞන්දරානන්ද කාව්‍යය, නිකාය සිද්ධාන්ත

- මෙම යුගයේ සිටි ගත්කතුවරු කිහිප දෙනෙක්
  * අශ්වඝෝෂ, නාගාර්ජුන, වසුබන්ධු, පාර්ශ්ව

- ගන්ධාර, මථුරා යන කලා සම්ප්‍රදායන් දියුණු වීම
- වෙළෙඳාමේ දියුණුවත් සමඟ මධ්‍යම ආසියාවේ වෙළෙඳ නගර සමඟ වාණිජ සබඳතා පැවැත්වීම හා ඉන්දීය සංස්කෘතිය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත කරවීම

**සාතවාහන යුගය හා සංස්කෘතිය**
**දේශපාලන වැදගත්කම**

- දකුණු ඉන්දියාවේ ගෝධාවරී හා ක්‍රිෂ්ණ තුංගභද්‍ර ගංගා අතර ප්‍රදේශය සාතවාහන හෙවත් ආන්ද්‍ර බල ව්‍යාප්තිය පැවැති ප්‍රදේශය යි.
  ශාතකර්ණී, ශ්වාතකර්ණී, ආන්ද්‍රජාතී, ආන්ද්‍රභෘත්‍ය, සාලිවාහන, ශාන්තිවර්ණ ආදි නම්වලින් ද මොවුන් හඳුන්වා ඇත.

- ප්‍රතිෂ්ඨානය මධ්‍යස්ථානය කොට මොවුහු පාලනය මෙහෙය වූය. මෙම රාජධානිය වින්ධ්‍යා කඳුවැටියෙන් ඔබ්බෙහි දකුණු ඉන්දියාවේ ඉහළ ඩෙකාන් ප්‍රදේශයේ බිහි වූ විශාලතම හා පළමු අධිරාජ්‍යය යි.

- ශුංග හා කාන්ව රාජවංශ යටපත් කොට ඩෙකානයේ නව රාජවංශයක් ගොඩනැගූ පළමු වන පාලකයා වූයේ සීමුක ය.

- මෙම පෙළපතේ වැදගත් රජවරු

  - **පළමු වැනි සාතකර්ණී රජු**

    * වසර 56ක් රජ කළ අතර මාල්වා ප්‍රදේශය, අනූප දේශය හා විදර්භය අල්ලා ගනිමින් මධ්‍යම, බටහිර හා උතුරු ඩෙකානයේ බලය ව්‍යාප්ත කිරීම.

    * අශ්වමේධ යාග දෙකක් පැවැත්වීම හා දක්ෂිණාපථපති යන නාමය භාවිත කිරීම.

  - **ගෞතමීපුත්‍ර සාතකර්ණී රජු**

    * ශක,යවන හා පාර්තියන් බලය විනාශ කිරීමට සමත් වීම.
    * නහපාන නම් ශක රජු පරාජයට පත් කරමින් ඔහු යටතේ පැවැති  අවන්ති, මාල්වා, කතියවාර්, අපරාන්ත යන ප්‍රදේශ අත්පත් කර ගැනීම
    * මේ අනුව උතුරින් මාල්වා හා කතියවාර් තෙක් නැගෙනහිරින් බෙරාර් සිට කොන්කාන් තෙක් දකුණින් ක්‍රිෂ්ණ සිට ගෝධාවරී තෙක් බලය ව්‍යාප්ත කිරීම.

  - **ශිව සාතකර්ණී රජු**

    * ශක බලය ඩෙකානයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම

  - **යඥ ශ්‍රී සාතකර්ණී රජු**

  * බටහිර ඉන්දියාවේ වෙරළබඩ ප්‍රදේශයේ ද නර්මදා නදී නිම්නයේ ද ඩෙකැනයේ ද මධ්‍ය හා නැගෙනහිර ප්‍රදේශවල ද බලය ගොඩනැගීම

  * මොහුගෙන් පසු සාතවාහන රාජ්‍ය කොටස්වලට බෙදී යාම

**සංස්කෘතික වැදගත්කම**

- ඉන්දියාවේ  දක්ෂිණාපථයේ සංස්කෘතික අභිවර්ධනයක් ඇති කළ සුවිශේෂ රාජවංශය සාතවාහන ය.

- **ගෘහනිර්මාණ ශිල්පය**

  * පිහිටිගල ඇතුළට හාරා චෛත්‍යය ශාලා (බුදුගෙය) හා විහාර (ආවාස ගෙය) ඉදිකිරීම.

  * ඩෙකානයේ ඇති විශිෂ්ට වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙන්නුම් කරන ලෙන් කිහිපයක්



බෙද්සා ලෙන

*(source:  http://www.choiceglobal.in/lonavala-and-khandala/)*

භාජා, බෙද්සා, කාර්ලේ, ජුන්නාර්, නාසික්, කන්හේරි, අජන්තා (අංක 8,9,10,12,13 ලෙන්)



*භාජා ලෙන*

(source: http://www.wondermondo.com)



*කාර්ලේ ලෙන*

(source:*https://www.commons.wikimedia.org)*

* මෙම ලෙන් බොහෝ විට බෞද්ධ භික්ෂූන්ට පූජා කර ඇත. එමෙන් ම බ්‍රාහ්මණයන් හා ජෛනයන් සඳහා ද ලෙන් පූජා කර ඇත.

* විහාර (ආවාස ගෙවල්) බොහෝ විට මධ්‍ය ශාලාවකින් ද දාන ශාලාවකින් හා කුඩා කුටි කිහිපයකින් ද සමන්විත ය. ඇතැම් ගුහාවල දානශාලාවල දන් වැළඳීම සඳහා දිග ගල් මේස නෙළා ඇත. උල්පත්වලින් ජලය ලැබෙන ගල් පොකුණු සකස් කර තිබේ. විහාර ඇතුළට ආලෝකය ලබා ගැනීමට ඇතුළු වන දොරටුවට කවුළුවක් තබා තිබීම.

* කාර්ලේ ලෙන මොවුන්ගේ විශිෂ්ටතම නිර්මාණය වීම. මෙහි විහාර බිත්ති පවා සියුම් කැටයමින් අලංකාර කොට ඇත. විහාරය ඇතුළට වන්නට පර්වතය හාරා කුඩා ස්තූපයක් නිමවා තිබේ.

- **ස්තූප ඉදිකිරීම**

* අමරාවතී ස්තූපයට නව අංග එකතු කරමින් විශාල කිරීම රාශියක් ඉදි කිරීම
* සාංචි ස්ථූපයේ වාහල්කඩ කැටයමින් නිර්මාණය කිරීම
* අලුතෙන් ස්තූප රාශියක් ඉදි කිරීම



*අමරාවතී ස්තූපය*

*(source:https://www.tourmyindia.com)*

**මූර්ති හා චිත්‍ර කලාව**

* ලෙන් විහාරවල විවිධ චිත්‍ර හා මූර්ති දක්නට තිබීම
* බුද්ධ රූප චිත්‍රයට නැඟීම : අජන්තා අංක 10 ලෙන් විහාරය, නාගාර්ජුනකොණ්ඩ



*අජන්තා අංක 10 ලෙන් විහාර චිත්‍ර*

*(source:https://www.pinterest.com)*



නාගාර්ජුනකොණ්ඩ

*(source:https://www.wikipedia.org/wiki/Nagarjunakonda)*

- අජන්තා ලෙන්වල ඇති චිත්‍රවල බෞද්ධ කතාවස්තු හා බුද්ධ චරිතයේ ඇතැම් අවස්ථාවන් නිරූපණය කොට තිබීම. (විජය කුමාරයා ලංකාවට පැමිණීම චිත්‍රය)

* මෙම චිත්‍රවල රාජකීයයන්, කාන්තාවන්, තාපසයන්, කම්කරුවන්, යාචකයන්, ගොවියන්, විවිධ සතුන් හා වෘක්ෂලතා ආදිය නිරූපණය කොට තිබීම.
* නානාගාට්හි ලෙන්වල රජ පවුලේ සාමාජිකයන්ගේ පිළිම නෙලා තිබීම.
  උදාහරණ - සිමුඛ රජුගේ පිළිරුව, පළමු සාතකර්ණී රජුගේ පිළිරුව, නාගනිකා දේවියගේ පිළිරුව, පළමු සාතකර්ණී රජුගේ පුතුන් තිදෙනාගේ පිළිරූ



නානාගාට්හි ලෙන්

*(source:http://www.vanraivillage.com)*

- සාතාවාහන පාලකයන් නිකුත් කළ කාසි මඟින් ද කලාත්මක වර්ධනය පෙන්නුම් කිරිම.



*(source:http://ancienttamilkinglist.blogspot.com)*

ඇගයීම -01

**අංක 01 හා 02 ප්‍රශ්නවල නොගැළපෙන නාම යුගලය තෝරන්න.**

01. 1සීමුඛ- සාතවාහන 2. ගොන්ඩෝපනීස්-පාර්තියන් 3. ඩෙමිට්‍රියස්-යවන

4. නහපාන-බැක්ට්‍රියානු 5.චෂ්ටන-සක (.........)

**අංක 02 සිට 04 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශය හා නොගැළපෙන කරුණ තෝරන්න.**

**02. ශුංග පාලනයේ ප්‍රතිඵල**

1. බ්‍රාහ්මණ ඇදහිලිවල පුනර්ජීවනයක් ඇති වීම
2. භාගවත ඇදහීම ව්‍යාප්ත වීම
3. සංස්කෘත භාෂාවේ උද්දීපනයක් ඇති වීම
4. භාර්හුත් බෞද්ධ ස්තූප විනාශ කිරීම
5. ස්මෘති ග්‍රන්ථ රචනා වීම (.........)

**03. ගෞතමීපුත්‍ර සාතකර්ණී රජු**

1. හර්යංක වංසයට අයත් වේ
2. පහ්ලවයන්ගේ ඝාතකයා ලෙස වර්ණනා කොට ඇත
3. සාතවාහන බලය නැගී ආවේ ඔහුගේ රාජ්‍ය කාලයේදී .ය
4. ගෞතමීපුත්‍ර බාලශ්‍රීගේ නාසික් ලිපයේ මොහු ගැන විස්තරයක් එයි.
5. මෙම තොරතුරු ජුනාගාද් ලිපියෙන් ද තහවුරු වේ. (.........)

**04. කණිෂ්ක රජු**

1. හීමා කැඩ්පයිසීස් රජුගෙන් පසු ව රජ විය.
2. කුෂාණ රජුන් අතර ශ්‍රේෂ්ඨතම පාලකයා ය.
3. ඔහු බලයට පත් වූයේ ක්‍රි.ව 78 දී ය.
4. මෙම වර්ෂය ශක රාජ වර්ෂ ක්‍රමයේ ආරම්භක වර්ෂය ලෙස සැලකේ.
5. කනෞජය අගනගරය කර ගැනීම. (.........)

**අංක 05 හා 06 තෙක් එක් එක් ප්‍රශ්නයකට දක්වා ඇති A,B,C,D අතරින් දක්වා ඇති ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා A හා B පමණක් නිවැරදි නම් 1 ද B හා C පමණක් නිවැරදි නම් 2 ද C හා D පමණක් නිවැරදි නම් 3 A හා C පමණක් නිවැරදි නම් 4 ද ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද වරහන් තුළ තෝරා ලියන්න.**

**05. ශුංගයෝ**

A. ශුංගයෝ ක්ෂත්‍රිය වංශයට අයත් වූහ.

B. ශුංග වංසයේ ආරම්භකයා පුෂ්‍යමිත්‍ර ශුංග රජු ය .

C. ශුංගයන් විසින් ග්‍රීකයන් තව දුරටත් ඉන්දියාවට කඩා වැදීම වළක්වන ලදි.

D. බුදු රජාණන් වහන්සේ පිළිබඳ දැක්වෙන කැටයම් අමරාවතීහි කොටවන ලද්දේ ශුංග පාලන සමයේ දී ය.

(.........)

**06.ශකවරු**

A. ශකවරුන් ඉන්දියාවට ඇතුළු වූයේ ඛයිබර් දුර්ගය හරහා ය.

B. බෙංගාලය තෙක් ආධිපත්‍යය වර්ධනය කිරීමට සමත් වූහ.

C. ඉන්දියාවට පැමිණි ශකවරුන්ගේ කණ්ඩායම් හතරක් තක්ෂිලා, මථුරා, උජ්ජේනි හා මහාරාෂ්ට්‍ර කේන්ද්‍ර කොටගෙන පදිංචි වූහ.

D. ශකවරුන්ගේ ප්‍රාන්තභාර ආණ්ඩුකාරවරුන් හඳුන්වන ලද්දේ ක්ෂත්‍රප නමිනි. (.........)

**අංක 07 සිට 12 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරන්න.**

07 . කණිෂ්කගේ රාජධානියට අයත් වූ වැදගත් සංස්කෘතික මධ්‍යස්ථානය කුමක් ද ?

1. පාටලීපුත්‍ර 2. කෞශම්භි 3. පෙෂාවෝර් 4. තාම්‍රලිප්ති 5. කපිලවස්තු (.........)

08. පහත දැක්වෙන පාලකයන් අතරින් විදේශ සම්භවයකින් පැවත එන රජු කවුරෙක් ද?

1. කණිෂ්ක 2. බෘහද්රථ 3. භාගභද්‍ර 4. පළමුවන රාජේන්ද්‍ර 5. පළමුවන නාගභට (.........)

09. තුන් වන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ කුමන රජුගේ පාලන සමයේ ද ?

1. අජාතශත්‍රු 2. කාලාසෝක 3. අසෝක 4. දසරථ 5. කුණාල (.........)

10. කුෂාණ රාජධානියට අයත් මධ්‍යම ආසියාවේ මධ්‍යස්ථානය කුමක් ද?

1. සියල්කෝට් 2. කැෂ්ගාර් 3. ජලන්ධාර් 4. සූයිවිහාර් 5. පෙෂාවෝර් (.........)

11.මිලින්ද පඤ්හ කෘතියේ කතුවරයා කවුරෙක් ද ?

1. නාගාර්ජුන 2. බුද්ධඝෝෂ 3. නාගසේන 4. වසුබන්ධු 5. අශ්වඝෝෂ (.........)

12.හතර වන බෞද්ධ සංගායනාවෙන් පසු මහායාන ග්‍රන්ථ රචනා කරන ලද්දේ කුමන භාෂාවෙන් ද ?

1. බ්‍රාහ්මී 2. මාගධී 3. ප්‍රාකෘත 4. පාලි 5. සංස්කෘත (.........)

**ඇගයීම -02**

01. i. ශුංග වංශයේ ආගමික ප්‍රතිපත්ති

ii. සාතවාහනයන්ගේ සංස්කෘතික කටයුතු

iii. පළමු කණිෂ්ක අධිරාජයාගේ පාලන කාලය

ඉහත සඳහන් ක්ෂෙත්‍ර දෙකක් ඉන්දියානු සංස්කෘතික ඉතිහාසයෙහි ලා වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 14)

02. ශුංග බල ව්‍යාප්තිය යෙහිලා පුෂ්‍යමිත්‍ර ශුංග රජුගේ වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු 14)

03. "කුෂාණ රජුන් අතර ශ්‍රේෂ්ඨත ම පාලකයා කණිෂ්ක රජු ය" විමසන්න.

(ලකුණු 14)

04. පහත දැක්වෙන මාතෘකා පිළිබඳ ඓතිහාසික රචනා ලියන්න.

1. සාතවාහන සමයේ ඩෙකානයේ කලාව හා ගෘහනිර්මාණ ශිල්පය
2. කුෂාණයන් යටතේ බෞද්ධ සංස්කෘතික අභිවර්ධනය (ලකුණු 14)

05. ඩෙකානයේ මුල් ම අධිරාජ්‍යය පිහිටුවන ලද්දේ සාතවාහනයන් විසිනි.

i. සාතාවාහන රාජවංසයේ ආරම්භක පාලකයා කවුරෙක් ද ? (ලකුණු 01)

ii. සාතවාහනයන් විසින් පරාජය කරන ලද උතුරු ඉන්දියාවේ රාජවංස දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

iii. සාතවාහනයන්ගේ කලාව හා ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ ව කෙටි විස්තරයක් කරන්න.(ලකුණු 04)

iv. "ඩෙකානයේ මුල් ම අධිරාජ්‍යය පිහිටුවන ලද්දේ සාතවාහනයෝ ය." යන ප්‍රකාශයට පක්‍ෂ ව හෝ විපක්‍ෂ ව හේතු දක්වන්න. (ලකුණු 07)

ඇගයීම -03

**06. පහත සඳහන් ස්ථාන ඉන්දියවේ සිතියමක ලකුණු කර ඉන් දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.**

(සියල්කොට්, සාංචි, පංජාබය, තක්ෂිලා, උත්තර ප්‍රදේශය, නර්මදා නදිය, කතියවාර්, ඔරිස්සා)

## 08. ගුප්ත අධිරාජ්‍යයේ උදාව

ගුප්ත අධිරාජ්‍ය සමය ඉන්දියානු දේශපාලන ඉතිහාසයේ වැදගත් කාලපරිච්ඡේදයක් ලෙස සැලකිය හැකි ය. ඉන්දු-ග්‍රීක, ශක, කුෂාණ, සාතවාහන යන බලවතුන්ගේ පාලන කාලපරිච්ඡේදයෙන් පසු උතුරු ඉන්දියාවේ මෙන් ම ඩෙකානයේ ද බලය ව්‍යාප්ත කරගෙන විශාල අධිරාජ්‍යයක් ගොඩනැගීමට ගුප්තයෝ සමත් වූහ. මොවුහු සියවස් දෙකකට වැඩි කාලයක් ඉන්දීය ඉතිහාසයේ ගමන් මඟ තීරණය කිරීමෙහි ලා දැඩි බලපෑමක් සිදු කළහ. මෙම අවධිය ගුප්ත දේශපාලන ක්ෂේත්‍රය පමණක් නොව සමාජ, ආර්ථික, සංස්කෘතික ක්ෂේත්‍ර තුළ ද ඇති වූ අභිවර්ධයන් පිළිබඳ ව මෙම ඒකකයේ දී අවධානය යොමු කෙරේ.

**නිපුණතාව** ඃ • ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** ඃ 8.1 ඉන්දීය ඉතිහාසය ගොඩනැගීමේ දී ගුප්ත අධිරාජ්‍යයේ දායකත්වය විග්‍රහ කරයි.

**ඉගෙනුම් පල** ඃ

- ගුප්ත අධිරාජ්‍යයේ ආරම්භය, වර්ධනය හා පරිහානිය විස්තර කරයි.
- ගුප්තවරුන්ගේ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික කටයුතු ඉන්දීය සමාජයට බලපෑ ආකාරය පැහැදිලි කරයි
- ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.

**කාලච්ඡේද ගණන** ඃ 40

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

ගුප්ත අධිරාජ්‍යය පිළිබඳ ව හැදෑරීමට ඇති මූලාශ්‍රය

- **සාහිත්‍ය මූලාශ්‍රය**
  - පාහියන් වාර්තාව, හියුංසාං වාර්තාව, ඉත්සිං වාර්තාව, දේවී චන්ද්‍රගුප්ත නාට්‍ය බ්‍රහ්මාණ්ඩ පුරාණය, වායු පුරාණය, විෂ්ණු පුරාණය
  - කාලිදාසගේ රඝුවංශය, ශාකුන්තලය
  - ශූද්‍රකගේ මෘච්ඡකටිකා නාට්‍යය, කෞමදී මහෝත්සව නාට්‍යය
  - වාත්ස්‍යායනගේ කාමසූත්‍රය
  - පරමාර්ථගේ වසුබන්දු චරිතය
  - අල්බිරූනිගේ වාර්තාව

- **පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය**
  - කැයටම්, මූර්ති, චිත්‍ර හා මුද්‍රා
  - නාණක
  - අභිලේඛන
    * හරිසේනගේ අලහබාද් ප්‍රශස්තිය, සණකානිත රජුගේ භිල්සා ලිපිය, අමර්කාර්දවගේ සාංචි ලිපිය

**ගුප්ත පෙළපතේ ආරම්භය**

- ගුප්ත අභිලේඛනවලට අනුව එහි මුල් පාලකයන් තිදෙනා වූයේ මහාරාජ ශ්‍රී ගුප්ත, මහාරාජ ශ්‍රී සටෝත්කච ගුප්ත, මහාරාජ ශ්‍රී චන්ද්‍ර ගුප්ත යන පාලකයෝ තිදෙනා ය.
- ප්‍රභාවතී ගුප්තා බිසවගේ ලිපි දෙකක හා රේවා නම් ස්ථානයෙන් සොයාගත් ලිපියක සටෝත්කච ගුප්ත එම රාජවංසයේ ආරම්භක පාලකයා ලෙසින් ද දක්වයි.
- ඉත්සිංගේ වාර්තා අනුව මුල් ම පාලකයා ශ්‍රී ගුප්ත ය.
- උතුරු ඉන්දියාවේ හා ඩෙකානයේ බලය පිහිටුවාගත් මුල් පාලකයා වන්නේ සටෝත්කච ගුප්ත ය.
- මහාරාජාධිරාජ යන විරුදය දැරූ පළමු චන්ද්‍ර ගුප්ත රජු නිසැක ලෙස ම ස්වාධීන පාලකයකු ලෙස සැලකේ.
- පළමු වන චන්ද්‍රගුප්ත ක්‍රි.ව 320 දී බලයට පත් වීම
- ආරම්භයේ දී ගුප්ත රාජවංශයට බෙංගාලය හා ඒ අවට ප්‍රදේශ කිහිපයක් පමණක් අයත් වීම. පළමු වනචන්ද්‍රගුප්ත රජුගේ විවාහ සබඳතා හේතු කොට ගුප්ත අධිරාජ්‍යයට පදනම වැටීම.

**සමුද්‍රගුප්ත රජු ( ක්‍රි.ව 335- 376)**

- මොහු පිළිබඳ ව හැදෑරීමට ඇති ප්‍රධානතම ලේඛනය හරිසේනගේ අලහබාද් ප්‍රශස්තිය යි. මීට අමතර ව එරාන සහ ගයා යන ස්ථාන දෙකේ, ප්‍රධාන සෙල්ලිපි දෙකක් පිහිටුවා ඇත.
- අලහබාද් ප්‍රශස්තියට අනුව චන්ද්‍රගුප්ත රජු විසින් සිය පුත්‍ර සමුද්‍රගුප්තයන්ට රාජ්‍ය භාර දීම
- සමුද්‍ර ගුප්ත රජුගේ බල ව්‍යාප්තිය අදියර හතරක් යටතේ සිදු විය.

  * ආර්යාවර්තය ජය ගැනීම
  * අටවික රාජ්‍ය ජය ගැනීම
  * දක්ෂිණාපථය ජය ගැනීම
  * දේශසීමාබද රාජ්‍ය ජය ගැනීම

- අලහබාද් ප්‍රශස්තියට අනුව පැහැදිලි වන්නේ සමුද්‍රගුප්ත රජ වන විට ගුප්ත රාජ්‍ය ප්‍රදේශීය බලයක් පමණක් හිමි කරගෙන සිටි බව ය.
- පාටලීපුත්‍රය අගනගරය කරගනිමින් දිග් විජය ප්‍රතිපත්තියක් අනුගමනය කළ සමුද්‍රගුප්ත රජු ඇසෑමය, බෙංගාලය, පංජාබය, ඩෙකානය පසු කරමින් කාංචිය තෙක් මාල්වා, කතියවාර් දක්වා ද සිය බලය ව්‍යාප්ත කළේ ය.
- නිශ්චිත ප්‍රදේශයක් පමණක් පාටලීපුත්‍රයේ සිට පාලනය කරමින් සෙසු අසල්වැසි රාජ්‍යයන් පුද පඬුරු හා දූත ගමන් මඟින් අවනත කරවා ගත්තේ ය.

**සමුද්‍රගුප්ත අධිරාජයාගේ දිග් විජය ප්‍රතිපත්තිය**

- ආර්යාවර්තයේ රජවරුන් 9 දෙනෙකු යටත් කිරීම
- වින්ධ්‍යාවෙන් හා නර්මදා නදියෙන් දකුණේ දක්ෂිණාපථයට ආක්‍රමණ දියත් කොට පාලකයන් දොළොස් දෙනෙකු යටත් කොටගෙන ඇත. එම ප්‍රදේශ හා පාලකයන් මෙසේ දැක්විය හැකි ය.
- ප්‍රත්‍යන්ත රාජ්‍ය නවයක් යටත් කර ගැනීම
- මෙම රාජ්‍ය කුඩා ගෝත්‍රික රාජ්‍ය ලෙස සැලකේ. ගණ රාජ්‍ය 09ක් යටත් කර ගැනීම මාලව, අර්ජුනායන, යෞදේය, මාද්‍රක, ආභීර, ප්‍රාර්ජුන, ගණකාහික, කාක, කරපරික

  - අලහබාද් ප්‍රශස්තියට අනුව දැක්වෙන ආකාරයට බටහිර ඉන්දියාවේ හා දකුණු ඉන්දියාවේ සමුද්‍රගුප්ත රජුට සේවය කළ ස්වාධීන රාජ්‍යය කිහිපයක් පැවතීම.
  - සමුද්‍රගුප්තගේ ප්‍රධාන ලේඛන 3 කි. (ප්‍රයාග, ඒරණ, ගයා)



(source:http://whatisindia.com)
ගයා තඹ තහඩුව



(source:http://www.columbia.edu)
අශ්වමේධ යාගය පවත්වන කාසි

  - අශ්වමේධ යාග දෙකක් පැවැත්වූ බව සඳහන් වීම ප්‍රශස්තිකරුවා රජුට සටන් සියයක වීරයා යන අභිධානය ලබා දී තිබීම
  - අධිරාජයා නිකුත් කළ විවිධ කාසි ඔහුගේ රණකාමීත්වය, ඔහු ගොඩනැගූ දේශපාලන ආධිපත්‍යය පමණක් නොව එවක පැවැති ආර්ථික සමෘද්ධිය විදහා දක්වයි.
  - සමුද්‍රගුප්ත ශාස්ත්‍රයෙහි මනා නිපුණයෙක් විය. ප්‍රශස්තිකරුවා කවිරාජ් යන විරුදයෙන් මොහු හඳුන්වා ඇත්තේ එනිසා ය.
  - රජුගේ එක් කාසියක රජු වීණාවක් අතින් ගෙන සිටින ආකාරය දක්වා ඇත.



*(source:http://coinindia.com/galleries-samudragupta.html)*

**දෙවන චන්ද්‍රගුප්ත රජු (ක්‍රි.ව.376 -415)**

- **මෙතුමා පිළිබඳ ව හැදෑරීමට ඇති මූලාශ්‍රය**

  - මථුරා ටැම් ලිපිය, උදයගිරි ගුහා ලිපිය, ගඩවා ශිලා ලිපිය, සාංචි ලේඛනය, මෙහරවුලී ටැම් ලිපිය



උදයගිරි ගුහා ලිපිය

*(source:http://www.cpreecenvis.nic.in/Database/UdayagiriCave)*

- **රාජ්‍යත්වයට පත් වීම**

  - දේවී චන්ද්‍රගුප්ත නාට්‍යයට අනුව සමුද්‍රගුප්තගෙන් පසු රාමගුප්ත නැමැත්තකු රජ වූ බව දක්වා ඇත. එහෙත් කාසි, සංජන තඹ තහඩුව හා අභිලේඛන මඟින් දෙවන චන්ද්‍රගුප්ත නායකත්වයට පත් වූ බව තහවුරු වේ.

  - දේවගුප්ත, වික්‍රමාදිත්‍ය, දේව ශ්‍රී, පරමභට්ටාරක යන විරුදයන් භාවිත කළ අතර ධ්‍රැව දේවිය හා කුවේරනාගා යන බිසෝවරු වූහ.

  - මෙතුමාගේ කාලයේදී චීන දේශාටක පාහියන් භික්ෂුව ඉන්දියාවට පැමිණ වසර 10ක් පමණ ඉන්දියාවේ ජීවත් වීම (ක්‍රි.ව 400-411)

  - රන්, රිදී හා තඹ කාසි නිකුත් කරමින් සිය බලය වඩාත් ඉස්මතු කිරීම

- **ගුප්ත අධිරාජ්‍ය ව්‍යාප්ත කිරීම සඳහා මෙතුමා ප්‍රධාන ක්‍රියාමාර්ග දෙකක් අනුගමනය කිරීම**

  - **දිග් විජය ප්‍රතිපත්තිය**

    1. බටහිර ඉන්දියාවේ ශක ශත්‍රප බලය බිඳ දැමීම

       * දෙවන චන්ද්‍රගුප්තයන්ගේ පළමු හා වැදගත් ම යුධ ව්‍යාපාරය මෙය යි. තුන් වන රුද්‍රසේන නම් ශක පාලකයා ව පරාජයට පත් කොට ඇත.

       * මෙම සටන පිළබඳ ව උදයගිරි ලෙන් ලිපිය (රජුගේ යුද්ධය හා සාමය කටයුතු භාර ඇමති වීරසේනශාබ විසින් පිහිටුවනු ලැබ ඇත), හිල්සා ලිපිය මඟින් තහවුරු වේ.

2. වයඹදිග ජයග්‍රහණ

* සින්දු නදිය මුවදොර තරණය කොට වාහ්ලිකයන් පරාජය කිරීම
* පංජාබයට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල පාලකයන් යටත් කිරීම
* බැක්ට්‍රියාව දක්වා ආක්‍රමණයක් එල්ල කිරීම

3. බෙංගාලයේ වංග පාලකයන්ගේ සන්ධානයක් පරාජයට පත් කිරීම සම්බන්ධ ව මෙහෙරවුලි ලිපියේ සඳහන් වීම. මෙහි සදහන් වංග දේශය නැගෙනහිර බෙංගාලය යි.

4. හින්දුකුෂ් කඳු වැටියෙන් ඔබ්බෙහි වූ වාහ්ලික නම් කණ්ඩායමක් පරාජයට පත් කළ බවට මතයක් පැවතීම (දිල්ලි කුතුබ් මිනාර් ස්තම්භ ලිපිය)

* චන්ද්‍රගුප්ත අධිරාජයාගේ අමාත්‍යවරයකු වූ වීරසේනශාබගේ අභිලේඛනයක රජු මුළු ලොව දිනීම සඳහා ගමන් කළ බව දැක්වේ.
* රජුගේ දණ්ඩනායකයකු වූ අම්රකාර්දවගේ අභිලේඛනයක දැක්වෙන්නේ ඔහු සටන් රාශියක් දිනීමෙන් මහත් කීර්තියක් අත්කරගත් බව ය.

- **විවාහ සම්බන්ධතා**

* නාග වංශික කුබේරනාගා කුමරිය විවාහ කර ගැනීම
* ඇගෙන් ලැබුණු ප්‍රභාවතී ගුප්තා නම් දුවක් වාකාටක රජකු වූ දෙවන රුද්‍රසේනට විවාහ කරදුන් බව පූනා තඹ සන්නසේ සදහන් වීම - වාකාටක රාජ්‍ය ඩෙකෑන් ප්‍රදේශයේ වූ නිසා සකවරුන් පරාජය කිරීමට මෙය පහසුවක් විය.
* කදම්භ වාංශික පාලක කාකුස්ථිවර්මන් රජුගේ දුවක ගුප්ත පාලකයන්ට විවාහ කරදුන් බව ඔහුගේ සෙල්ලිපියක සදහන් වීම. එම ගුප්ත රජු දෙවන චන්ද්‍රගුප්ත බව අනුමාන කෙරේ.
* දෙවන චන්ද්‍රගුප්තයන් නිකුත් කළ කාසි මගින් ද ඔහුගේ දේශපාලන බල ව්‍යාප්තිය පැහැදිලි වීම.
* දෙවන චන්ද්‍රගුප්ත රාජ්‍ය සමය අධ්‍යාපන හා සාහිත්‍ය කටයුතුවල ද විශාල දියුණුවක් ඇති වීම.රාජසභාවේ නවරත්න කවින් සිටි බව සඳහන් වීම මෙම උගතුන් විසින් සාහිත්‍ය ක්ෂෙත්‍රයේ විශාල වර්ධනයක් ඇති කොට තිබීම.

**දෙවන චන්ද්‍රගුප්තගෙන් පසු රාජ්‍ය අවධිය**

**පළමු කුමාරගුප්ත රජු (ක්‍රි.ව 415-455)**

- අශ්වමේධ යාගය පැවැත්වූ අතර මහේන්ද්‍රාදිත්‍ය යන විරුදය භාවිත කිරීම
- ගුප්ත පාලනයට එරෙහි වූ පුෂ්‍යාමිත්‍ර නම් ගෝත්‍රික පිරිසගෙන් (නර්මදා නදී තීරයේ විසූ) එල්ල වූ තර්ජනයෙන් රාජ්‍ය මුදා ගැනීමට ස්කන්දගුප්ත, යුව රජු ලෙස කටයුතු කිරීම

**ස්කන්දගුප්ත රජු (ක්‍රි.ව 455-467)**

- බෙංගාලයේ සිට කතියවාරය තෙක් උතුරු ඉන්දියානු ප්‍රදේශ මොහුගේ රාජ්‍යයට අයත් වන්නට ඇතැයි අනුමාන කෙරේ.
- ගෝත්‍රික පිරිස් සමඟ යුද වැදීමට සිදු වීම
- ගන්ධාර ප්‍රදේශයට එල්ල වන හූණ ආක්‍රමණ පළමුවෙන් මර්දනය කරන ලද්දේ ස්කන්දගුප්ත රජු ය.
- ස්කන්දගුප්තගෙන් පසු ව පුරුගුප්ත, දෙවන කුමාරගුප්ත, බුධගුප්ත, වෛනය ගුප්ත, භානු ගුප්ත ආදීන් පිළිබඳ ව සඳහන් වීම

**සුභසාධන කටයුතු**

උදාහරණ: ගිර්නාර් කඳු ශිඛරයේ පිහිටි ජලාශයක් පර්නදත්ත නම් ප්‍රාදේශය පාලකයා ලවා පිළිසකර කරවීම

**ගුප්ත පාලනය**

- පාලනය පිළිබඳ ව හැදෑරීමට පුරාණ ග්‍රන්ථ, ධර්මශාස්ත්‍ර ග්‍රන්ථ, සාහිත්‍යමය කෘති හා අලහබාද් ප්‍රශස්තිය වැනි ලේඛන උපයෝගී කරගත හැකි වීම
- පාලනයේ ප්‍රධානයා රජු ය. පාලකයන් මහාරාජාධිරාජ, පරම රාජාධිරාජ, රාජරාජාධිරාජ වැනි විරුදයන් දැරීම
- සාම්ප්‍රදායික තිල තන්ත්‍රය අනුව ගෙනගිය පරිපාලනයක් පැවතීම

  මන්ත්‍රීවරු, මහාබලාධිකෘත (යුද්ධ නායක), මහා දණ්ඩනායක, මහාප්‍රාතිහාර, අංගාරක්සක, සන්ධි විග්‍රහක (සාමය හා යුද්ධය පිළිබඳ ඇමති)

- රාජ්‍ය පාලනය ප්‍රධාන කොටස් 4 බෙදා ඇත.

  1. මධ්‍යම පාලනය - මධ්‍යම පාලනයේ හා ප්‍රදේශීය පාලනයේ සම්බන්ධීකාරකයන් වූයේ කුමාරමාත්‍ය හා ආයුක්ත නම් නිලධාරීහු ය.
  2. භුක්ති (ප්‍රාන්ත) - පාදේශීය පාලන ඒකක භුක්ති නමින් හැඳින් විණි. පාලකයෝ උපරික නමින් හැඳින් වූහ.
  3. විෂය (දිස්ත්‍රික්කය) - භුක්ති නැවත විෂය පාලන ඒකකවලට බෙදුණු අතර විෂය පති, කුමාරමාත්‍ය යන නිළධාරීන් යටතේ පාලනය විය.
  4. ග්‍රාම - ගුප්ත අධිරාජ්‍යයට යටත් වූ රාජ්‍යවල අර්ධ ස්වතන්ත්‍ර බවක් පැවතීම

**නීතිය හා අධිකරණය**

- යුක්තිය පසිඳලීමේ දී ප්‍රධාන අධිකරණය වූයේ ධර්මාධිකරණය යි. සභා නමින් හැඳින්වූ එයට රජු සහභාගි විය. විනිශ්චයකරු, අමාත්‍යවරු හා පුරෝහිතවරු ද ඊට සම්බන්ධ වූහ.

- අධිකරණ කටයුතුවල දී,
  - ධර්ම (ආචාර ධර්ම)
  - ව්‍යවහාර (පාරම්පරික නිගමන)
  - චාරිත්‍ර (සමාජ සම්මත)
  - රාජශාසන (රජුගේ නියෝග) ක්‍රියාත්මක විය.
- **දඬුවම් ක්‍රම**

**ගුප්ත සංස්කෘතිය**

ගුප්ත යුගය ඉන්දීය සංස්කෘතික ඉතිහාසයේ ඉතා වැදගත් අවධියකි. අධිරාජ්‍යයේ පැවැති දේශපාලන ඒකීයත්වයත්, එහි පැවැති කාර්යක්ෂම පාලනය මෙන් ම වාණිජ වශයෙන් ඇති වූ දියුණුව සංස්කෘතික කටයුතුවල විශාල දියුණුවක් ඇති වීමට හේතු විය. එනිසාම ගුප්ත යුගය ඉන්දියා ඉතිහාසයේ ස්වර්ණමය යුගය, සම්භාව්‍ය යුගය ලෙස උගත්හු හඳුන්වති.

- ගුප්ත යුගයේ සංස්කෘතික නවෝදය පහත තේමා යටතේ විග්‍රහ කළ හැකිය.
  * ආගමික ප්‍රබෝධය
  * වාස්තුවිද්‍යාව
  * මූර්ති කලාව හා චිත්‍ර කලාව
  * අධ්‍යාපනය හා සාහිත්‍යය

**ආගමික ප්‍රබෝධය**

- හින්දු ආගමේ විශාල දියුණුවක් ඇති වීම. හින්දු ආගම ක්‍රමවත් ව සංවිධානය වූයේ මෙම යුගයේදී ය.
- වේද සාහිත්‍යය වෙනුවට පුරාණ නමින් හැඳින්වූ ග්‍රන්ථ ප්‍රධාන ආගමික සාහිත්‍යය බවට පත් වීම. පුරාණ ග්‍රන්ථ අතුරින් භාගවත, ස්කන්ද, ශිව, මත්ස්‍ය, වායු හා බ්‍රහ්මාණ්ඩ පුරාණ මෙම අවධියේ දී සකස් වූ බව විශ්වාස කෙරේ.
- විෂ්ණු හා ශිව දෙවියන් මුල් කරගෙන ප්‍රධාන ආගමික නිකාය දෙකක් බිහිවීම.
- වෛෂ්ණව නිකාය දියුණු වීම, විෂ්ණු දෙවියන්ගේ දස අවතාර ක්‍රමය වර්ධනය වීම, එනම් විෂ්ණු දෙවියන් විවිධ වේශයන්ගෙන් පෙනී සිටින ආකාරය දැක්වීමය.
- බ්‍රහ්ම, විෂ්ණු, ශිව දෙව්වරුන් මූලික කොටගත් ත්‍රිමූර්තිය ප්‍රධාන තැනට පත් වීම.

  උදාහරණ - කුමාරගුප්ත රජු ස්කන්ද වන්දනාව අනුගමනය කළ රජකු බව ඔහුගේ කාසිවලින් පැහැදිලි වීම.

  සමුද්‍රගුප්ත රජු ගරුඬ ධජය යොදාගැනීමෙන් වෛෂ්ණව භක්තිකයකු බව පෙනේ.

- මහාකවි කාලිදාස ශිව භක්තිකයකු වීම. ඔහු ස්කන්දදේව උත්පත්තිය අලළා කුමාරසම්භවය නම් මහා කාව්‍ය ග්‍රන්ථයක් ද සම්පාදනය කිරීම
- ශිව දෙවියන්ගේ ප්‍රතිමා හා ශිව කෝවිල් නිර්මාණය කිරීම
- මහායාන දර්ශනය ප්‍රචලිත වීම

  වසුබන්ධු, දින්නාග, කුමාරජීව යන ආචාර්යවරුන් මහායාන දර්ශනය ප්‍රචලිත කිරීමට ක්‍රියා කිරීම

  උදාහරණ - සාරානාත්වලින් හමු වූ බුදු පිළිම
- දෙවන චන්ද්‍රගුප්තගේ සාංචි ටැම් ලිපිය - භික්ෂූන් 10 දෙනෙකුට ලබාදුන් වරප්‍රසාද
- පළමු කුමාරගුප්තගේ මංකුවාර් ලිපිය - බුදු පිළිමයක් තැනීම පිළිබඳ ව
- නාලන්දා විශ්වවිද්‍යාලය ට අනුග්‍රහ දැක්වීම
- පළමු කුමාරගුප්තගේ හා ස්කන්දගුප්තගේ රාජ්‍ය කාලයට අයත් සෙල්ලිපි කිහිපයක ජෛන මුනිවරයන්ගේ ප්‍රතිමා තනා පූජා කිරීම සම්බන්ධ ව සඳහන් වේ.
- ජෛන දහමේ ශ්වේතාම්බර හා දිගම්බර යන නිකාය දෙක ස්ථිර පදනමකින් ගොඩනැගුණේ මෙම යුගයේදී ය.

**වාස්තු විද්‍යාත්මක නිර්මාණ**

- පර්වත ඇතුළට කැණ ඒවායේ ලෙන් විහාර හා දේවාලය ඉදි කිරීමේ සම්ප්‍රදයේ දියුණුවීමක් සිදු වීම
- මෙම ලෙන් විහාර දක්නට ලැබෙන ස්ථාන කිහිපයක්

  උදාහරණ -අජන්තා, එල්ලෝරා, භාග්, අවුරංගාබාද්, උදයගිරි, දියෝගීර්, බිතර්ගෝන්




*අවුරංගාබාද් විහාර ලෙන්*

*(source:http://www.wondermondo.com)*

- ලෙන් විහාර සම්ප්‍රදායයේ ප්‍රධාන ඉදි කිරීම් දෙකක් දක්නට ලැබේ.
    - චෛත්‍ය ශාලා ක්‍රමය
    - විහාර ශාලා ක්‍රමය - ආරාම හෙවත් විහාර ක්‍රමයට ලෙන ඉදි කිරීම

**චෛත්‍ය ශාලා ක්‍රමය**

- අජන්තාවේ ඇති ලෙන් 28න් 23ක් ම අයත් වන්නේ ගුප්ත යුගයටයි. මේවායින් අංක 19 හා 26 ලෙන් චෙත්‍යය ශාලා ය.
- ඍජුකෝණාස්‍රාකාර කුඩා ලෙන් වන මේවා චෛත්‍යයක් සහිත මධ්‍ය ශාලාවකින්ද දෙපස සක්මන් කරන ශාලා දෙකකින් ද යුතු වේ.
- විශ්වකර්ම ගුහා ලෙස හැඳින්වෙන එල්ලෝරාවේ ඇති චෛත්‍යය ශාලාවක කුඩා චෛත්‍ය වෙනුවට දක්නට ලැබෙන්නේ චෛත්‍ය ආසනය කොටගත් බුද්ධ ප්‍රතිමාවක
- බ්‍රාහ්මණයන් සඳහා කළ පැරණි ම ලෙන් වන්නේ උදයගිරි ලෙන් ය.



*උදයගිරි ලෙන්*

*(source:https://commons.wikimedia.org)*

**විහාර ශාලා ක්‍රමය**

- මේවා භික්ෂූන් වහන්සේලා වාසය කළ ආවාස ගෙවල් ය. අජන්තාවේ ඇති ලෙන් විහාර 21ක් අයත් වන්නේ මෙම වර්ගයට ය.
- මධ්‍ය ශාලාවක් හා දෙපස ආරාම කුටි සහිත ව මේවා නිමවා ඇත.
- ගුප්ත ගෘහනිර්මාණ ශිල්පය ආකාර දෙකකින් වර්ධනය වී ඇත.

1. පැරණි ක්‍රම හා සැලසුම් අනුකරණය නොකොට සෞන්දර්යයට මුල් තැන දෙමින් නවතාවකින් යුතු ගොඩනැගිලි ඉදි කිරීම

2. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මෙතෙක් උපයෝගී කරගත් දැව වෙනුවට ගඩොළු හෝ ඔපමට්ටම් කළ කළුගල් හෝ යොදා ගැනීම

- පිහිටි ගලෙහි කළ ලෙන් විහාරවලට අමතරව දේවරූප තැන්පත් කිරීම සඳහා වෙන් ම විශේෂ ගොඩනැගිලි ඉදි කිරීම

- ගොඩනැගිලි සැලැස්ම හා හැඩය අනුව දළ වශයෙන් වර්ග 5කට බෙදා දැක්විය හැකි වීම

1. චතුරශ්‍රාකාර කුඩා ගර්භ ගෘහයක් තනා ඉදිරියට නෙරා සිටින පරිදි ද්වාර මණ්ඩපයක් ඉදි කළ ගොඩනැගිලි
2. සතරැස් ගර්භ ගෘහය වටා ප්‍රදක්ෂිණ පථයක් ඉදි කිරීම
3. ඉහත සතරැස් කුඩා මන්දිරය මත කුඩා ශිඛරයක් ඉදි කිරීම
4. ආයතාකාර මන්දිර
5. සතරපසින් ද්වාර මණ්ඩප ඇති කවාකාර ව තැනූ ගොඩනැගිලි

- නාගර හා ද්‍රාවිඩ යන ශෛලිය දෙකෙන්ම හින්දු දේවාලය නිර්මාණය වී තිබීම

  උදාහරණ - දියෝගීර්හි දස අවතාර දේවාලය

- බෞද්ධ ස්තූප නිර්මාණය හා ආරාම සංකීර්ණ නිර්මාණය ද මෙම යුගයේ දියුණුවක් ලැබී ය.

  උදාහරණ - ආරාම සංකීර්ණ- බුද්ධගයා, නාලන්දා,

  ස්තූප - සාරානාත් ධාමෙක්ස් ස්තූපය



ධාමෙක්ස් ස්තූපය

*(source:http://heritage-traveller.blogspot.com)*

**කලාව**

- ඉන්දීය ඉතිහාසයේ විශිෂ්ටතම කලා නිර්මාණ හමු වන යුගයකි
- මූර්ති කලාව,කැටයම් කලාව,සිතුවම් කලාව ලෙස වර්ගීකරණයක් දක්නට ලැබීම.
- අජන්තා, එල්ලෝරා, භාග්, සාරානාත් ආදි ස්ථාන හා දියෝගීර් දේවාලයය කලාත්මක නිර්මාණ දක්නට ලැබෙන ස්ථාන කිහිපයකි.

**මූර්ති**

- සාරානාත් ධර්මචක්‍ර මුද්‍රාවෙන් යුතු හිඳි පිළිමය හා මථුරාවේ හිටි බුදු පිළිමය අග්‍රගණ්‍ය මූර්ති වීම
- රාම,සීතා, අගස්ත්‍ය, විෂ්ණු, ශිව, සත්ත්ව රූප ආදි මූර්ති විශාල ප්‍රමාණයක් හමු වීම
- කාසි, බුද්ධගයා, සාරානාත් ආදි ප්‍රදේශවලින් හමුවූ බෝධිසත්ත්ව ප්‍රතිමා හා දේව ප්‍රතිමා
- උපශාන්ත බව, ස්ථායි බව, හා සියුම් බව යන ලක්ෂණවලට මුල් තැන දෙමින් මූර්ති නිමකොට තිබීම

**සිතුවම්**

- අජන්තා ලෙන් විහාර තුළ ඇති සිතුවම් මෙම යුගයේ සිතුවම් කලාවේ විශිෂ්ටත්වය පිළිබිඹු කෙරේ.
- කාලිදාසගේ කෘතිවල දැක්වෙන ලාලිත්‍යය, සෞම්‍ය භාවය, රිද්මය, ශෝභනත්වය, සුන්දරත්වය වැනි ගුණාංග මෙම චිත්‍රවල අන්තර්ගත වී තිබේ.

  උදාහරණ- පද්මපාණී බෝසතුන්ගේ සිතුවම, සද්දන්ත ජාතකය, යසෝදරාව හා රාහුල කුමරු බුදුන් වහන්සේ හමු වීම දැක්වෙන සිතුවම

**කැටයම්**

- ශිව, පාර්වතී, නිරූපිත කැටයම්
- රාජ්පුතානාවේ මණ්ඩෝර්හි ක්‍රිෂ්ණ, ගෝවර්ධන, ධාරණ හා නාගගිරි දොර කැටයම්
- භිල්සා අසල උදයගිරි ලෙන්දොරෙහි නෙළා ඇති කැටයම්

**අධ්‍යාපනය හා සාහිත්‍යය**

- ගුප්ත යුගයේ අධ්‍යාපනය පිළිබඳ ව බොහෝ විස්තර පාහියන්, හියුංසාං හා ඉත්සිං යන හිමිවරුන්ගේ සංචාරක වාර්තාවලින් පැහැදිලි වේ.
- බ්‍රාහ්මණ අධ්‍යාපන ක්‍රමය පිළිබද ව ස්මෘති ග්‍රන්ථ (රජ කුමාරවරුන්ගේ අධ්‍යාපනයට ඇතුළත් විය යුතු විවිධ විෂයයන් පිළිබඳ ව ලියා ඇති කෘති) වැනි සාහිත්‍ය මූලාශ්‍රයවල වැඩි තොරතුරු සඳහන් වේ.
- බෞද්ධ අධ්‍යාපන ක්‍රමය ආරම්භ වූයේ ආචාර්ය හා සද්ධි විහාරික පදනම යටතේ ය.

- ඉත්සිං වාර්තාවට අනුව භික්ෂූන් හැර ගණ දෙකක ගිහි ශිෂ්‍යයෝ මෙම බෞද්ධ ආරාමවල අධ්‍යාපනය ලැබූහ.

  * ළාබාල ගිහි ශිෂ්‍යයෝ - පැවිදි බව අපේක්ෂාවෙන් බණ දහම් උගත් අය

  * බ්‍රහ්මචාරී - බණ දහම් හා ලෞකික විෂයයන් හදාළ ගිහියෝ

- නාලන්දා, වික්‍රමශිලා, වලභි, ජගද්දලා ආදි විශ්වවිද්‍යාල රැසක් මෙම අවධියේ දී දියුණුවට පත් වීම.



වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ නෂ්ටාවශේෂ

*(source:http://dasdriftwood.com/vikramshila-university.php)*



නාලන්දා විශ්වවිද්‍යාලයේ නෂ්ටාවශේෂ

*(source:https://www.yahoo.com)*

- අසංග, වසුබන්ධු, දින්නාග වැනි පඬිවරුන් මෙම විශ්වවිද්‍යාලවල ඉගැන්වීමේ කටයුතුවල නියැළීම.
- චතුර්වේදය, ඉතිහාසය, භාෂාව, සාහිත්‍යය, ආගම යන ක්ෂෙත්‍ර යටතේ විෂයමාලාව සකස් වීම.
- අධ්‍යාපනයේ දියුණුවත් සමඟ උසස් පඬිවරුන් හා සාහිත්‍ය ග්‍රන්ථ බිහි වීම.
- සංස්කෘත භාෂාවේ විශාල නවෝදයක් ඇති වීම.
- මෙම යුගයේ ලියවුණ සාහිත්‍ය කෘති

  * පුරාණ ග්‍රන්ථඃ
  * ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථ
    උදාහරණ - කාත්‍යායන ධර්ම සූත්‍රය, දේවාල ධර්ම ශාස්ත්‍රය, ව්‍යාස ධර්ම ශාස්ත්‍රය
  * ආගමික දර්ශනයඃ උදාහරණ - ඊශ්වර කෘෂ්ණගේ සංඛ්‍යාකාරිකා, පතංජලීගේ යෝග දර්ශනය, ධර්මකීර්තිගේ න්‍යාය බින්දුව, ජෛමිනගේ වීමංස සූත්‍ර
  * ලෞකික ග්‍රන්ථ

    නාට්‍ය ග්‍රන්ථ - මාලවිකාග්නිමිත්‍රය, වික්‍රමෝර්වශිය, ශාකුන්තලය

    කාව්‍ය ග්‍රන්ථ - රඝුවංශය, කුමාරසම්භවය, මේඝදූතය, ඍතුසංහාරය, කිරාතාර්ජුනිය, ශිශුපාලවධය

    ඡන්දස්, අලංකාර, ජ්‍යොතිර්විද්‍යා, ගණිත, තර්ක න්‍යාය, ආදි විවිධ ක්ෂෙත්‍රවලට අයත් ග්‍රන්ථ මෙම යුගයේ දී රචනා වීම

- ගුප්ත යුගයේ සිටි ගත්කතුවරුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ

  * කාලිදාස - ශාකුන්තලය, මාලවිකාග්නිමිත්‍රය, රඝුවංශය, ශාතුසංහාරය, වික්‍රමෝවශිය, මේඝදූතය, කුමාරසම්භවය
  * භාරවී - කිරාතාර්ජුනිය, ශිශුපාලවධය
  * විශාකදත්ත - මුද්‍රාරාක්ෂස, දේවීචන්ද්‍රගුප්ත
  * අමරසිංහ - අමරකෝෂය
  * භට්ටි - දසමුඛවධ භට්ටී කාව්‍යය
  * ශුද්‍රක - මෘච්ඡකටිකා
  * භාස - නාට්‍ය ග්‍රන්ථ 13ක්
  * වරාහමිහිර - බෘහද්සංහිතාව (ගණිතය,තාරකා විද්‍යාව,උද්භිද විද්‍යාව හා භූගෝල විද්‍යාව යන විෂයයන් විස්තර කරයි.
  * ආර්යභට - ආර්යභට්ටිය හා සූර්ය සිද්ධාන්ත

- දෙවන චන්ද්‍රගුප්ත රජුගේ රාජසභාවේ නවරත්න කවීන් සිටීම

  * ධන්වන්තරී, ක්ෂපණික, අමරසිංහ, ශංකු, වේතාලභට්ට, ඝටකර්පරකාලිදාස, වරාමිහිර වරරුචි

**ආර්ථික තත්ත්වය**

- කෘෂිකර්මාන්තය ප්‍රධාන ආර්ථික මාධ්‍යය වීම
  - වාරිමාර්ග ඉදි කිරීම
  - වී, තිරිඟු, බාර්ලි, මුං, කවුපි වගා කිරීම
  - කුළු බඩු ද්‍රව්‍ය අධිරාජ්‍යයෙහි දකුණු පළාත්වල නිෂ්පාදනය කිරීම
  - ඉඩම් භුක්ති ක්‍රමය, අඳ ගොවි ක්‍රමය ක්‍රියාත්මක වීම
- වෙළෙඳාම
  - ගුප්ත අධිරාජ්‍යයේ ආර්ථිකය ශක්තිය වෙළෙඳාම මත පදනම් වීම.
  - වෙනත් රටවල් සමඟ පැවැති වෙළෙඳාම

    රෝමය - රෙදි පිළී, සුවඳ විළවුන් හා සුඛෝපභෝගී භාණ්ඩ අපනයනය කිරීම

    අග්නිදිග ආසියානු රාජ්‍ය සමඟ සබඳතා - ෆූනාන්, චෙන්ලා, චම්පා
  - නිෂ්පාදනය, බෙදාහැරීම ශ්‍රේණි වශයෙන් සංවිධානය වී තිබීම.
  - වෙළෙඳ ශ්‍රේණි ප්‍රධානයා ජේතක නැතහොත් ප්‍රධාන අත්කම් ශිල්පියා ලෙස හැඳින්වූ අතර මෙය ප්‍රධාන තනතුරක් සේ සැලකීම

**කර්මාන්ත**

රෙදි පිළී නිෂ්පාදනය

- උතුරු ඉන්දියාවේ පුළුල් ලෙස වර්ධනය වීම. සේද, කපු, ලෝම ආදි අමුද්‍රව්‍ය යොදාගනිමින් රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳ තොරතුරු හර්ෂ චරිතයේ, හියුංසාං, ඉත්සිංගේ වාර්තාවල සඳහන් වේ.
- ලෝම කර්මාන්තය
- නැව් කර්මාන්තය

**ගුප්ත පෙළපතේ පරිහානිය**

- ස්කන්දගුප්ත රජුගෙන් පසු ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය උදා වීම.
- ගුප්ත අධිරාජ්‍යයේ පරිහානියට හා බිඳ වැටීමට තුඩුදුන් හේතු සාධක රාශියක් ඇත.
  - * දුර්වල පාලකයන් බලයට පත් වීම
  - * රාජ්‍යය සඳහා ඇති වූ අභ්‍යන්තර අරගල
  - * ප්‍රදේශීය පාලකයන් හා සාමන්තයන් බලවත් වීම
  - * ආර්ථික වශයෙන් ඇති වූ පරිහානිය
  - * විදේශ ආක්‍රමණ

ඇගයීම-01

**අංක 01 සිට 08 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය කුමක් දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න**

01 1. සාරානාත් 2. අජන්තා 3. එල්ලෝරා 4. කාර්ලේ 5. නාසික් (........)

02 1. සාකුන්තල 2. රාජතරංගනී 3. මේඝදූත 4. ඍතුසංහාර 5. රඝුවංශ (........)

03 1. උජ්ජයිනි 2. නාලන්දා 3. වික්‍රමශිලා 4. ඕදන්තපුරී 5. ජගන්දලා (........)

04 1. මාලවිකාග්නිමිත්‍ර 2. මහාභාරත 3. ඍතුසංහාර 4. ශාකුන්තල 5. රඝුවංශ (........)

05 1. රුද්‍රදේව 2. මතිල 3. විෂ්ණුගෝප 4. නාගදත්ත 5. චන්ද්‍රවර්මන් (........)

06 1. බාණභට්ට 2. කාලිදාස 3. භවභූති 4. ආර්යභට 5.විශාඛදත්ත (........)

07 1. රුද්‍රදේව 2. මතිල 3. විෂ්ණුගෝප 4. නාගදත්ත 5. චන්ද්‍රවර්මන් (........)

08 1. මේඝදූත 2. ඍතුසංහාර 3. ශාකුන්තල 4. මෘච්ඡකටිකා 5. රඝුවංශය (........)

**අංක 09 සිට 11 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකවට නොගැළපේ. එම කරුණ තෝරා එහි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

09. දෙවන චන්ද්‍රගුප්ත රජු

1. දෙවන චන්ද්‍රගුප්ත රජු ගුප්ත වංශයේ පළමු පාලකයා වේ.
2. ඔහු සමුද්‍රගුප්ත රජුගේ පුත්‍රයෙකි
3. ඔහු දේවගුප්ත නමින් ද හඳුන්වනු ලැබී ය.
4. ඔහු බටහිර ඉන්දියාවේ ශක පාලකයන් තීරණාත්මක ලෙස පරාජය කළේ ය.
5. රජු වික්‍රමාදිත්‍ය විරුදය ඉසිලී ය.

(........)

10. හූණ ආක්‍රමණ

1.හූණයන් ම්ලේච්ඡයින් ලෙස සමකාලීන ශිලා ලිපි දක්වයි

2.පළමු ආක්‍රමණය ක්‍රි.ව 458 දී පමණ සිදු විය.

3.හූණයන්ට විරුද්ධ ව ඇති වූ යුද්ධයේ දී ස්කන්දගුප්ත මිය ගියේ ය.

4.ඉන්දියාවේ පළමු හූණ පාලකයා වූයේ තෝරමාන ය.

5.තෝරමාන මහාරාජාධිරාජ විරුදාවලියෙන් හැඳින්විණ.

(........)

ඇගයීම -02

01. පහත මාතෘකා කෙරෙහි අවධානය යොමු කරමින් සමුද්‍ර ගුප්ත රජුගේ කාර්ය සාධනය ප්‍රමාණය කරන්න.

1. දිග්විජය ප්‍රතිපත්තිය

2. පාලන ක්‍රමය

(ලකුණු 14)

02. දෙවන චන්ද්‍රගුප්ත රජුගේ ක්‍රියාකලාපය හා කාර්ය සංසිද්ධිය පිළිබඳ ව ඇගයීමක් කරන්න.

(ලකුණු 14)

03. ගුප්ත අධිරාජ්‍යය බලය ආරක්‍ෂා කර ගැනීමෙහි ලා ස්කන්ද ගුප්ත රජුගේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

ඇගයීම -03

04. පහත දක්වා ඇති ස්ථාන ඉන්දියාවේ සිතියමක ලකුණු කර ඉන් දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

සාංචි, නාලන්දා, පාටලීපුත්‍ර, අජන්තා, හින්දුකුෂ්, බෙංගාලය, කතිවාරය, සාංචිය, සාරානාත්, ශ්‍රාවස්ති

(ලකුණු 18)

## 09.පශ්චාද් ගුප්ත යුගයේ උතුරු ඉන්දියාවේ දේශපාලන ප්‍රවණතා

ගුප්ත අධිරාජ්‍යයේ බිඳ වැටීමත් සමඟ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය ව්‍යාකූල විය. අධිරාජ්‍යය බලවත් ව පැවැති සමයේ යටපත් වී තිබූ ප්‍රදේශීය රාජ්‍ය ගණනාවක් යළි බලවත් වන ආකාරය දැකගත හැකි ය. එම රාජ්‍යයන් අතුරින් වඩාත් කැපී පෙනෙන රාජ්‍යයන් වූයේ ථාන්ශ්වරයේ පුෂ්‍යභූති රාජ වංශය හා ගංගා නදිය අසබඩ කනෞජයේ මෞඛරී යන රාජවංශය යි. මෙම රාජ්‍ය දෙක එකතු වීම නිසා කනෞජය කේන්ද්‍ර කරගනිමින් බලවත් මෙන් ම ස්ථාවර අධිරාජ්‍යයක් ගොඩනැඟීමට පුෂ්‍යභූති රාජවංශයේ හර්ෂවර්ධන රජුට හැකි විය. මෙලෙස බල කේන්ද්‍රස්ථානයක් ලෙස ඉස්මතු වූ කනෞජයේ වැදගත්කම හර්ෂවර්ධනගෙන් පසු ව ද අඩු වූ බවක් නොපෙනේ. කනෞජයේ බලය අත්කර ගැනීමට පාලවරුන්, ගුර්ජර-ප්‍රතිහාරයන් හා රාෂ්ට්‍රකූටයන් අතර තරගයක් ඇති විය. එයින් පාලවරුන්ගේ බලය ඉස්මතු විය. මෙම පාඩම් ඒකකයෙන් වැඩි අවධානයක් යොමු කරන්නේ පුෂ්‍යභූති රාජවංශය හා එහි හර්ෂවර්ධන රජුගේ කාර්ය සාඵල්‍යය පිළිබඳ ව යි. එසේම පාල යුගයේ සංස්කෘතික වැදගත්කම සාකච්ඡා කෙරෙන අතර සෙසු රාජවංශ පිළිබඳ ව අවබෝධයක් ලබා දීම අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** ඃ
- ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** ඃ 9.1 ගුප්තයන්ගෙන් පසු ප්‍රදේශීය පාලන ඒකකවල බලය වර්ධනය වූ ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද ගණනඃ** 35 යි

**ඉගෙනුම් පල** ඃ
- පශ්චාද් ගුප්ත අවධියේ බලවත් වූ ප්‍රාදේශීය පාලන ඒකකවල තොරතුරු ඉදිරිපත් කරයි.
- ප්‍රදේශීය පාලන ඒකක ඉන්දීය ඉතිහාසය කෙරෙහි සිදු කළ බලපෑම් පෙන්වා දෙයි.
- පශ්චාද් ගුප්ත ප්‍රදේශීය රාජ්‍යයන් උතුරු ඉන්දියා සිතියමක ලකුණු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

- **පශ්චාත් ගුප්ත යුගයේ බලවත් වූ ප්‍රදේශීය රාජ්‍ය**
  - වලභියේ මෛත්‍රිකයෝ
  - කනෞජයේ මෞඛරීවරු
  - ථානේශ්වරයේ පුෂ්‍යභූතිවරු
- **කනෞජය බලවත් වීම**
  - පුෂ්‍යභූති පරපුරේ ප්‍රභාකරවර්ධන කනෞජය බලවත් කිරීමට පදනම දැමීම
  - ඔහු මාල්වා දේශය ජය ගෙන පරම භට්ටාරක මහාරාජාධිරාජ විරුදය ලබා ගැනීම
  - මිහිරකුල නම් හූණ ආක්‍රමණිකයා හා ගෞඩදේශය සමඟ සටන් කිරීම

- මෞඛරී වාංශික ග්‍රහවර්මන්ට සිය දියණි වන රාජ ශ්‍රී විවාහ කර දීම
- මෙමගින් ථානේශ්වරය හා කනෞජය එක්සත් වීම
- ථානේශ්වරය කේන්ද්‍ර කර පුෂ්‍යභූති රාජවංශය බලවත් වීම

- **හර්ෂවර්ධන රජු**

**මූලාශ්‍රය** - බානභට්ටගේ හර්ෂ චරිතය, හියුංසාං වාර්තාව

**දේශපාලන කටයුතු**

* වලභි හා ගුර්ජර පාලකයන් සමඟ සටන් කිරීම
* වාතාපියේ බටහිර චාලුක්‍යයන් සමඟ සටන් කිරීම
* සින්දු ප්‍රදේශය සමඟ සටන් කිරීම
* නැඟෙනහිර ඉන්දියාවේ අවුද්, කොංගෝද රාජ්‍ය සමඟ සටන් කිරීම
* ගුප්ත යුගයෙන් පසු උතුරු ඉන්දියාව එක්සත් කළ අවසන් පාලකයා වීම
* කනෞජය මුල් කොට පාලනය මෙහෙයවීම
* **සකල උත්තරාපතනාථ** යන නාමයෙන් හර්ෂ රජු, සිය සතුරා වන දෙවන පුලකේශීන් සිය අයිහෝල් අභිලේඛනයේ හඳුන්වා ඇත.
* සංවිධානාත්මක රාජ්‍ය පරිපාලන තන්ත්‍රයක් ගොඩනැගීම
* චීනයත් සමග සම්බන්ධතා පැවැත්වීම

- විශාල වැඩ කොටසක් කළ පාලකයකු වුවත් මූලාශ්‍රය හිඟකම නිසා ඉතිහාසය තුළ ඔහුට නිවැරදි තක්සෙරුවක් ලැබී නැත.

**ආගමික, සාහිත්‍යය හා අධ්‍යාපන සේවා**

* ආගමික සහනශීලී ප්‍රතිපත්තිය
* කනෞජ් හා ප්‍රයාග ආගමික සම්මේලන පැවැත්වීම
* පංච වාර්ෂික මහා දානයක් පිරිනැමීම
* ස්තූප හා විහාර ගොඩනැංවීම
* බුද්ධිමතුන්ට අනුග්‍රහ දැක්වීම
* රාජ්‍ය ආදායමෙන් 1/4ක් ලේඛකයන්ට පිරිනැමීම
* නාලන්දා, තක්ෂිලා, වලභි වැනි අධ්‍යාපන මධ්‍යස්ථානවලට අනුග්‍රහ දැක්විම
* රජුද ග්‍රන්ථකරණයේ නියැළීම (රත්නාවලී, ප්‍රියදර්ශිකා, නාගානන්ද)
* රජුගේ අනුග්‍රහය නිසා විද්වතුන් විසින් සාහිත්‍යය කෘති රචනා කිරීම

උදාහරණ : බාණ - හර්ෂ චරිතය, කාදම්බරී, චණ්ඩි හතකය, පාර්වතී පරිණය, මයුර - සූර්ය ශතක
- හර්ෂ චරිතයේ හර්ෂ රජ වීම තෙක් විස්තර ඇති හර්ෂ රජ වීමෙන් කෘතිය අවසන් වේ. (මෙනිසා හර්ෂ චරිතයේ හර්ෂ පිළිබඳ තොරතුරු අඩු ය.)

- **පාල රාජ්‍ය සමයේ සංස්කෘතික වැදගත්කම**

  - ඉන්දියාවේ අවසන් බෞද්ධ අධිරාජ්‍යය වේ.
  - සසංක රජුගේ ඇවෑමෙන් දුර්වල වූ බෙංගාලයේ පාල වාංශික ගෝපාල බලය පිහිටුවීම
  - ධර්මපාල රජු විසින් පාල වංශය යටතේ උතුරු ඉන්දියාවේ රාජ්‍යයක් ගොඩනැඟීම
  - ධර්මපාල රජු පරමේශ්වර, පරම භට්ටාරක, හා මහා රාජාධිරාජ යන විරුදාවලින් හැඳින්වීම
  - දේවපාල රජු යටතේ තව දුරටත් අධිරාජ්‍යය ව්‍යාප්ත වීම
  - පළමු වන මහීපාල, රාජේන්ද්‍ර චෝල හමුවේ පරාජයට පත් වීමත් සමඟ පාල රාජ්‍යයේ අවසානය සිදු වීම
  - කෙසේ වෙතත් මෙම පාලකයන් විසින් සංස්කෘතික සේවාවාන් රැසක් සිදු කිරීම
  - පාල රජවරුන් බුදු දහමට ප්‍රබල අනුග්‍රහයක් දැක්වීම
  - ගෝපාල රජු නාලන්දාවේ විහාරයක් ඉදි කිරීම
  - වික්‍රමශිලා, ඕදන්තපූරී ඇතුළු බෞද්ධ අධ්‍යාපන ආයතන 50කට වැඩි සංඛ්‍යාවක් පිහිටුවීම



**ඕදන්තපූරී**

*(source:http://www.letsseeindia.com)*

  - අටිස නම් භික්ෂුව ටිබෙටයට ධර්ම දූත මෙහෙවරට යැවීම
  - අග්නිදිග ආසියාවේ ශ්‍රීවිජය අධිරාජ්‍යය සමඟ බෞද්ධ සම්බන්ධතා පැවැත්වීම
  - මෙලෙස මහායාන බුදු දහමේ ප්‍රබෝධය ටිබෙටයේ හා ගිනිකොනදිග ආසියාවේ ප්‍රචලිත වීම
  - ධර්මපාල රජු නාලන්දා විහාරයට ගම්වර පූජා කිරීම

- කලා ශිල්පයන්හි වර්ධනය
- පාලයන්ගේ කැටයම් හා මූර්ති ශිල්පය ශ්‍රී ලංකාව, නේපාලය, තිබ්බතය, බුරුමය, ඉන්දු චීනය හා ඉන්දුනිසියා යන රටවල කලා ශිල්ප කෙරෙහි බලපෑම
- සංස්කෘත සාහිත්‍යයේ දියුණුව
- බෙංගාලි භාෂාවේ සම්භවය
- භාවදේවභට්ට, මුතවාහන වැනි පඬිවරුන් බිහි වීම
- හින්දු ආගමට අනුග්‍රහ දක්වමින් දේවාලය ඉදි කිරීම

**ගුර්ජර ප්‍රතිහාර**

- බටහිර ඉන්දියාවේ ගුජරාටය හා රාජ්පුතානා ප්‍රදේශවල බලය ව්‍යාප්ත කිරීම
- හරිශ්චන්ද්‍ර බ්‍රාහ්මණ මෙහි ආරම්භක පාලකයා වීම
- අනතුරු ව බලයට පත් වූවන්ගෙන් පළමු වන නාගභට, වත්සරාජ, දෙවන නාගභට, පළමු වන භෝජ, මහේන්ද්‍රපාල, ත්‍රිලෝචනපාල යන පාලකයන් වැදගත් වීම.
- කනෞජයේ ආධිපත්‍යය සඳහා මොවුන් පාල හා රාෂ්ට්‍රකූට යන රාජවංශ සමග අරගල කිරීම
- මෙහි සඳහන් භෝජ රජු ඉන්දීය සාහිත්‍යයට විශාල සේවාවක් කළ රජකු වීම.
- සියවසකට වැඩි කාලයක් උතුරු ඉන්දියාවේ දේශපාලන ඒකාග්‍රතාවක් ඇති කිරීමට මෙම පාලකයන් දායක වීම
- දහ වන සියවස අගභාගයේ දී එල්ල වූ මුස්ලිම් ආක්‍රමණවලින් උතුරු ඉන්දියාව ආරක්‍ෂා කිරීම
- සස්නි මහමුද්ගේ ආක්‍රමණ නිසා ත්‍රිලෝචනපාල, රාජ්‍ය සමයේ දී ප්‍රතිහාර බලය බිඳ වැටීම

**රාෂ්ටකූටවරු**

- දන්තිදුර්ග රාජවංශය ආරම්භ වීම
- දන්තිදුර්ග, ධ්‍රැව, තුන් වන ගෝවින්ද, තුන්වන ඉන්ද්‍ර, තුන් වන ක්‍රිෂ්ණ, පස් වන අමෝඝවර්ෂ යන පාලකයන් මෙම රාජවංසයේ වඩාත් ම වැදගත් පාලකයන් වීම
- කනෞජයේ ආධිපත්‍යය උදෙසා මෙම පාලකයන් ද පාල හා ගුර්ජර ප්‍රතිහාරවරුන් සමඟ අරගලයට සම්බන්ධ වීම
- පස් වන අමෝඝවර්ෂගෙන් පසු රාෂ්ට්‍රකූට බලය අවසන් වීම
- කනෞජයේ ආධිපත්‍යය උදෙසා ගුර්ජර-ප්‍රතිහාරයන්, රාෂ්ට්‍රකූට සහ පාලයන් අතර පැවැති අරගලය

ඇගයීම -01

**අංක 01 හා 02 ප්‍රශ්නයන්හි දී ඇති නම් පහ අතුරින් නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන වරහන තුළ ලියන්න.**

1. 1. වත්සරාජ 2. ධ්‍රැව 3. නාගභට 4. හර්ෂවර්ධන 5. ධර්මපාල (..........)

2. 1. නාලන්දා 2. වික්‍රමශිලා 3. ජගද්දලා 4. සෝමනාත් 5. ඕදන්තපූරි (..........)

**අංක 03 සිට 06 තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ තෝරා ලියන්න.**

3. රාෂ්ටකූටයන්ගේ අගනගරය කුමක් ද ?

1. මාන්‍යකේත 2. මදුරෙයි 3. වාතාපි 4. තංජෝර් 5. කාවේරි (..........)

4.හර්ෂවර්ධන රාජ්‍ය සමය පිළිබඳ ව හැදෑරීමේ දී ඉවහල් කරගත හැකි මූලාශ්‍රය කුමක් ද ?

1. සූර්ය සිද්ධාන්ත 2. මත්ත විලාස ප්‍රහසන 3. මුද්‍රාරාක්ෂස 4. හර්ෂචරිතය 5. විභාෂ සූත්‍ර (..........)

5.ගුර්ජර ප්‍රතිහාරයන්ගේ ආරම්භක පාලකයා කවරෙක් ද ?

1. පළමු නාගභට 2. හරිශ්චන්ද්‍ර බ්‍රාහ්මණ 3. මහේන්ද්‍රපාල 4. මහීපාල 5. ත්‍රිලෝචනපාල (..........)

6. පාල යුගයේ මූර්ති ශිල්පයේ බලපෑම ශ්‍රී ලංකාවට ලැබුණු බව තහවුරු වන නිර්මාණය මින් කුමක් ද ?

1. අවුකන ප්‍රතිමාව 2. අභයගිරියේ සමාධි ප්‍රතිමාව 3. මිනිසා හා අශ්ව හිස 4. බුදුරුවගල අවලෝකිතේශ්වර පිළිමය 5. ගල් විහාරයේ හිඳි පිළිමය

(..........)

**අංක 7 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A),(B),(C) හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

(A) හා (B) පමණක් නිවැරදි නම්.......... 1 ද

(B) හා (C) පමණක් නිවැරදි නම්.............2 ද

(A) හා (D) පමණක් නිවැරදි නම්............. 3 ද

(A) හා (C) පමණක් නිවැරදි නම්........... 4 ද

**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න.**

07. පූෂ්‍යභූති රාජවංසය

(A) ආරම්භක පාලකයා රාජ්‍ය වර්ධන රජු ය

(A) බලවත් ම පාලකයා හර්ෂවර්ධන රජු ය

(C) මුල් යුගයේ පාලන මධ්‍යස්ථානය ථානේශ්වරය යි

(D) අවසන් පාලකයා ප්‍රභාකරවර්ධන යි

(..........)

08. ගුර්ජර ප්‍රතිහාරවරු

(A) දහ වන සියවස අග දී උතුරු ඉන්දියාව මුස්ලිම් ආක්‍රමණවලින් ආරක්ෂා කරගැනීම

(B) ත්‍රිලෝචනපාල මෙම වංශයේ අවසන් පාලකයා විය

(C) බෞද්ධ අධ්‍යාපන ආයතන රැසක් ගොඩනැගූහ

(D) සංස්කෘත සාහිත්‍යයේ දියුණුවට කටයුතු කළහ

(..........)

09. පාල රජ පෙළපත

(A) ගෝපාල ආරම්භක පාලකයා විය.

(B) බෞද්ධ අධ්‍යාපන ආයතන විනාශ කරන ලදී.

(C) බලවත් ම පාලකයා ධර්මපාල රජු යි.

(D) පස් වන අමෝඝවර්ෂගෙන් පසු මෙම පෙළපත අවසන් විය.

(..........)

10. පාල රාජධානි සමයේ සංස්කෘතික වැදගත්කම

(A) වික්‍රමශිලා අධ්‍යාපන මධ්‍යස්ථානය මෙකල ආරම්භ විය.

(B) මහායාන බුදු දහමේ ප්‍රබල වර්ධනයක් සිදු විය.

(C) ප්‍රයාගයේ ආගමික සම්මේලනයක් පවත්වන ලදි.

(D) බෙංගාලි භාෂාවේ සම්භවය සිදු විය.

(..........)

**ඇගයීම -02**

1. පශ්චාද් ගුප්ත යුගයේ උතුරු ඉන්දියාවේ පැවැති දේශපාලන තත්ත්වයේ කැපී පෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න.

2. හර්ෂවර්ධන රජු යුද්ධය හා සාමය යන දෙඅංශයේ ම ශ්‍රේෂ්ඨයෙක් විය.

(i) හර්ෂවර්ධන රජු අයත් වූ රාජවංශය නම් කරන්න.

(ලකුණු 01යි)

(ii) හර්ෂවර්ධන රජුගේ අනුප්‍රාප්තිකයා නම් කරන්න. (ලකුණු 01යි)

(iii) හර්ෂවර්ධන රජු පිළිබඳ ව තොරතුරු හැදෑරීමට ඉවහල් වන මූලාශ්‍රය දෙකක් නම් කරන්න.

(ලකුණු 02යි)

(iv) ඉහත සඳහන් ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් හර්ෂවර්ධන රාජ්‍ය සමයේ ඇති දේශපාලන හා සංස්කෘතික වැදගත්කම ප්‍රමාණ කරන්න.
(ලකුණු 10යි)

3. පුෂ්‍යභූති රජපරපුර යටතේ කනෞජයේ බල වර්ධනයේ ප්‍රධාන අවස්ථා පරික්ෂා කරන්න.

(ලකුණු 14යි)

4. හර්ෂවර්ධන රාජ්‍ය සමයෙන් පසු උතුරු ඉන්දියාවේ බලවත් වූ රාජවංශ පිළිබඳ ව විමසීමක් කරන්න.

(ලකුණු 14 යි)

5. පාල රාජවංශයේ ඇති සංස්කෘතික වැදගත්කම පහත දැක්වෙන මාතෘකා යටතේ පරික්ෂා කරන්න.

i. මහායාන ධර්මයේ ව්‍යාප්තිය

ii. අධ්‍යාපන හා සාහිත්‍ය ප්‍රබෝධය

iii. ගෘහ නිර්මාණ කලාශිල්පයන්හි වර්ධනය

**ඇගයීම -03**

පහත සඳහන් ස්ථාන ඉන්දීය සිතියමක ලකුණු කර නම් කර එයින් දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටයන් ලියන්න.

කනෞජය, පුරුෂපුරය, අයිහෝලේ, නර්මදා නදිය, ඉන්ද්‍රප්‍රස්ථ, ථානේශ්වරය, උජ්ජයිනී, මාල්වා, ප්‍රයාග භාරුකච්ඡ

(ලකුණු 18යි)

## 10. අරාබි තුර්කි ආක්‍රමණ හා ඉන්දියා දේශපාලන තත්ත්වය

ක්‍රි.ව අට වන සියවස වන තෙක් අරාබිවරුන් අතරමැදි වෙළෙඳ ප්‍රජාවක් ලෙස ඉන්දියාවත් සමඟ සාමකාමී සම්බන්ධතා ගොඩනඟාගෙන තිබිණි. එහෙත් මහම්මත්තුමාගෙන් පසු ඉස්ලාම් දහමේ හා මුස්ලිම් අධිරාජ්‍යයේ ආරක්ෂකයන් වූ කාලිප්වරුන් විසින් සිරියාව, ඉරාකය, මිසරය, පර්සියාව,කොරාසන් හා ඇනටෝලියාව තෙක් සිය බලය ව්‍යාප්ත කරන ලදි. ක්‍රි.ව අටවන සියවස වන විට තව දුරටත් ඔවුන්ගේ බලය ව්‍යාප්ත වී උතුරු අප්‍රිකාව, ස්පාඤ්ඤය හා තුර්කිය තෙක් මුස්ලිම් බලය ව්‍යාප්ත වී එය විශාල අධිරාජ්‍යයක් බවට පත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස අරාබින් විසින් ඉන්දියාවට ආක්‍රමණ එල්ල කරන ලදි. මදිනාවේ කාලීෆ් වංශයේ දෙවැන්නා වූ ඔමාර් කාලීෆ් දවස පළමු ඉන්දීය ආක්‍රමණය සිදු විය.

**නිපුණතාව** : • ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවනතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 10.1. මුස්ලිම් ආක්‍රමණවලට පදනම සකස් වූ අයුරු විස්තර කරයි.

**කාලච්ඡේද ගණන** : 20

**ඉගෙනුම් පල** :
- ඉන්දියාවට එල්ල වූ අරාබි, තුර්කි, ආක්‍රමණ විස්තර කරයි.
- අරාබි, තුර්කි ආක්‍රමණ මඟින් ඉන්දියා ඉතිහාසයට වූ බලපෑම පෙන්වා දෙයි.
- අරාබීන් හා තුර්කීන් අල්ලාගත් ප්‍රදේශ සිතියමක ලකුණු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

- **ඉන්දියාවට එල්ල වූ අරාබි, තුර්කි ආක්‍රමණවලට හේතු**
  - මුල් කාලයේ දී අරාබීන් පෙර අපර දෙදිග වෙළෙඳාමේ අතරමැදියන් ලෙස ක්‍රියා කිරීම
  - ඉස්ලාම් ධර්මය බිහි වීමෙන් පසු එහි ව්‍යාප්තිය සඳහා ක්‍රියා කරමින් දේශපාලන බල ව්‍යාප්තියක නිරත වීම
  - ආසන්න ම හේතු වූයේ ලංකාවේ සිටි අරාබි වෙළෙන්දෙකුගේ දූවරුන් ඉරාකයට යවන අතරමඟ දී වර්තමාන කරච්චියේ හෙවත් දෙබාල්වල දී දූවරුන් සමඟ ශ්‍රී ලංකාවේ නැව කොල්ල කෑම
  - මදිනාවේ කාලීෆ් වංසයේ දෙවැන්නා වූ ඔමාර් කාලීෆ් දවස ආරම්භ වී දිගින් දිගට ම ඉන්දියාවට එල්ල කළ ආක්‍රමණවලට ප්‍රධාන හේතු කිහිපයක් මුල් වීම.
    - * දෙබාල් පාලකයා යටත් කිරීම
    - * වෙළෙඳ කටයුතුවල අවශ්‍යතාව
    - * කාලීෆ්වරුන්ගේ දේශපාලන එළඹුම
    - * ඉන්දියාවේ ධනය ලබා ගැනීම
  - තත්කාලීන ඉන්දියාවේ පැවැති දුර්වල දේශපාලන තත්ත්වය අරාබි ආක්‍රමණවලට පිටුබලයක් වීම

- **සමකාලීන ඉන්දියාවේ දේශපාලන තත්ත්වය**

  - 11වන සියවස වන විට උතුරු ඉන්දියාව කුඩා රාජ්‍ය ගණනාවකට බෙදී පැවැතිණ.

    (කාබුල්, පෙෂාවෝර්, කාශ්මීර්, ලාහෝර්, මුල්ටාන්, දිල්ලිය, කනෞජය, උජ්ජයිනි, බුද්ධෙල්ඛාන්ඩ් බෙංගාලය, ගුජරාටය, සින්ද්)

  - ක්‍රි.ව අට වන සියවසේ දී ඉරාකයේ පාලකයා වූ අල්-හජ්ජාජ්ගේ මෙහෙයවීම යටතේ මහමුද්-ඉබන් -කාසිම් සින්ද් හා මුල්ටාන් ආක්‍රමණය කරන විට එම ප්‍රදේශ දාහීර් නම් බ්‍රාහ්මණ වංශික රජකු විසින් පාලනය කරනු ලැබීම

  - ගංගා මිටියාවතේ කනෞජය කේන්ද්‍ර කොට ගුර්ජර-ප්‍රතිහාරවරුන් බලය වර්ධනය කිරීම

  - ඉන්දු ගංගාධාරයේ ඉහත්තාව ෂාහි නැමැති හින්දු රාජවංසය විසින් පාලනය කරනු ලැබීම

  - මුස්ලිම්වරුන්ගේ බලය ඛයිබර් දුර්ගය හරහා පැතිරීම වැළැක්වීමට ෂාහිවරුන් බලකොටු ඉදි කරමින් ප්‍රබල උත්සාහයක් දැරීම

  - ෂාහි වංසයේ ජයපාල උතුරු ඉන්දියාවේ සෙසු මුස්ලිම් විරෝධී රජවරුන්ගේ සහායයෙන් මුස්ලිම් විරෝධී දේශපාලන සංසදයක් ගොඩනැඟීම

  - ෂාහිවරුන්ගේ රාජ්‍යයට උතුරින් පිහිටි කාශ්මීරයේ ලෝහරි නම් රජවරුන් ඇතැම් අවස්ථාවලදී අරාබින්ට පක්ෂ ව ක්‍රියා කිරීම

  - සමකාලීන උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය තුළ කැපී පෙනෙන බලවේගයක් ලෙස සිටි රාජ්පුත් වාංශිකයන් අතර ද සමගියක් නොවීම නිසා ඇතැම් අවස්ථාවල අරාබීන්ට සහාය වීම

- **ඉන්දියාවට එල්ල වූ අරාබි හා තුර්කි ආක්‍රමණ**

  - ක්‍රි.ව 7 වෙනි සියවසේ දී අරාබිවරුන් ඉන්දියාවට එල්ල කළ ආක්‍රමණ අසාර්ථක වීම

    * ක්‍රි.ව 637 දී අරාබි කොල්ලකරුවන් බොම්බායේ තානාවලටද ඉන් පසු බ්‍රෝච් හා දෙබාල් වලටද එල්ල කළ ආක්‍රමණ පරාජය වීම

    * එම අපකීර්තිය මකා ගැනීමට ගොඩබිමින් එල්ලකළ ආක්‍රමණ පරාජය වීම
    * ක්‍රි.ව 660-750 අතර කාලයේ කාබුල් ධනය කොල්ලකෑමට එල්ල කළ ආක්‍රමණ අසාර්ථක වීම
  - ක්‍රි.ව 8 වන සියවසේ එල්ල කළ ආක්‍රමණ අසාර්ථක වීම

  - ඩැමස්කාස් අගනුවර කරගත් උමයියාද් කාලීෆ්වරුන් ඉන්දියාවට ආක්‍රමණ රැසක් එල්ල කිරීම

  - ශ්‍රී ලංකාවේ රජු අරාබි පාලකයා වෙත යවන ලද දූත පිරිසක්හි පුදපඬුරු මුහුදේ දී කොල්ලකෑම

  - එම කොල්ලකරුවන්ට සින්ධ් පාලක දහීර් දඩුවම් නොකිරීම නිසා මහුමද් බින් කාසිම් සින්ධ් ප්‍රදේශය ආක්‍රමණය කිරීම

- මුලින්ම දෙබාල් නගරය අල්ලාගත් අතර පසු ව දාහීර් රජු මරණයට පත් ඔහුගේ බිසව හි පුතුන් පරදවා සින්ද් අල්ලා ගැනීම.

- ක්‍රි.ව 10 වන සියවසේ දී සස්නියේ සබුක්තිජිත් යටතේ නැවත ආක්‍රමණයක් එල්ල කිරීම.

- අනතුරු ව නායකත්වයට පත් ඝස්නියේ මහමුද් (තුර්කි)අවුරුදු 25ක් තුළ 17 වතාවක් ඉන්දියාව ආක්‍රමණය කිරීම.
- මෙම ආක්‍රමණවල අරමුණ ඉන්දියාව යටතේ කිරීම නොව ධනය කොල්ල කමින් හින්දු දේවාලය විනාශ කරමින් ඉස්ලාම් ආගම ව්‍යාප්ත කිරීම.
- ක්‍රි.ව 1000 දී හා 1001 දී පෙෂාවෝරයට ආක්‍රමණ දෙකක් එල්ල කරමින් ෂාහි පාලකයන්ගේ අගනුවර වූ වාහින්ඩ් ආක්‍රමණය කරමින් ඔවුන්ගේ බලය පෙන්වීම.
- ක්‍රි.ව 1011 දී ථානේශ්වරය අල්ලා ගනිමින් පංජාබය ද යටත් කර මුස්ලිම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.
- ක්‍රි.ව 1025 දී සෝමනාථ දේවාලය කොල්ලකෑම හා 1027 දී මුල්තානය ආක්‍රමණය කරමින් මුස්ලිම් බලය ඉන්දියානු භූමියට සමීප කරලීම.
- ඝස්නි මහමුද්ගේ ආක්‍රමණයෙන් පසු ඝෝර්හි මහමුද් ගංගා නදිය තෙක් ආක්‍රමණ එල්ල කිරීම
- ක්‍රි.ව 1192 දී දෙවෙනි තාරායින් සටනින් පෘථිවිරාජ පරාජය කරමින් අජ්මේර් හා දිල්ලි අල්ලා ගනිමින් උතුරු ඉන්දියාවේ බලව්‍යාප්තිය ආරම්භ කිරීම.
- අනතුරු ව කනෞජය, ගුජරාටය, බුන්දෙල්ඛාන්ඩ් හා බිහාරය අල්ලා ගැනීම.
- ඝෝර්හි මහමුද් විසින් මධ්‍ය ආසියාවට එල්ල කරන ලද ආක්‍රමණයක දී පරාජයට පත් වීම නිසා 1206 දී ඔහු මරා දැමීම.
- ක්‍රි.ව 1206 දී කුතුබ් උද්දීන් අයිබෙක් විසින් වහල් රාජවංශය දිල්ලිය කේන්ද්‍ර කොටගෙන ගොඩනැගීම.



***කුතුබ් උද්දීන් අයිබෙක්***

*(suorce:http://www.vivacepanorama.com)*

- පසු ව බැග්ඩෑඩයේ කාලීෆ් පාලනයෙන් නිදහස් ව ඉන්දියානු මුස්ලිම් පාලනය ආරම්භ වීම. එය දිල්ලි සුල්තාන් රාජ්‍යය ලෙස හැඳින්වීම.

- **අරාබි හා තුර්කි ආක්‍රමණ මගින් ඉන්දියා ඉතිහාසයට එල්ල වූ බලපෑම්**
  - ඉස්ලාම් ආගම ව්‍යාප්ත වීම
  - අරාබි දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික අංශයන්හි බලපෑම ඉන්දියාවට ලැබීම
  - ඉන්දීය සංස්කෘතිය අරාබි ප්‍රදේශවල ව්‍යාප්ත වීම
  - ඛයිබර් කපොල්ල විවෘත වීම
  - ඉන්දියාවේ විශාල හින්දු ජනතාවක් විනාශයට පත් වීම
  - ඉන්දියාවේ ආර්ථික පරිහානියක් සිදු වීම

ඇගයීම -01

**අංක 1 ප්‍රශ්නය සඳහා ඇති නම් පහ අතුරින් නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන වරහන තුළ ලියන්න.**

01. 1. මහමුද් බින් කාසිම් 2. සබුක්තිජිත් 3. අල්බිරූනි 4. සස්නි මහමුද් 5. සෝර් මහමුද්

**අංක 02 හා 03 ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරණය තුළ ලියන්න**

02. ක්‍රි.ව712 දී සින්ධ් ප්‍රදේශයට ආක්‍රමණ මෙහෙයවූ පළමු වන අරාබි ආක්‍රමණිකයා නම් කරන්න.

1. හජ්ජි බින් යුසුෆ් 2. මහමුද් බින් කාසිම් 3. සස්නි මහමුද් 4. ශිහාබ් උද්දීන් 5. කුටුබ්දීන් අයිබැක්

(.........)

03.බැග්ඩෑඩ් පාලනයෙන් නිදහස් ව ඉන්දීය මුස්ලිම් පාලනයට පදනම වැටුනේ කිනම් වර්ෂයේද?

1. ක්‍රි.ව 712 2. ක්‍රි.ව 997 3. ක්‍රි.ව 1176 4. ක්‍රි.ව 1206 5. ක්‍රි.ව 1208

(.........)

**අංක 04, 05 ප්‍රශ්නවල එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත.එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ තෝරා ලියන්න.**

04. ඉන්දියාවට එල්ල වූ අරාබි ආක්‍රමණ

1. පළමු අරාබි ආක්‍රමණය ක්‍රි.ව 637 දී එල්ල කෙරිණි.
2. ඔවුන්ගේ පළමු උත්සාහය වූයේ කාබුල් හා සින්ද් දිනා ගැනීම යි.
3. ආක්‍රමණයන්හි අරමුණ වූයේ ධනය කොල්ලකෑම යි.
4. ඔවුන් මුලින් ම අත්පත් කරගත්තේ සින්ධ් දේශය යි.
5. ඉන්දියානුවන් පරාජයට පත් වූයේ චෝල ආධාර නොලැබීම නිසයි.

(.........)

05. සෝර් මහමුද්ගේ ආක්‍රමණ

1. සස්නි මහමුද්ගේ අභාවයෙන් පසු ඔහු සෝර්හි පාලකයා බවට පත් විය.
2. ක්‍රි.ව 1182 වනවිට සින්ධ්හි පාලකයා බවට පත් විය.
3. ජයග්‍රහණවලට චහමානයන්ගේ ආධාර උපකාර ලැබිණ.
4. ඔහුගේ ආක්‍රමණවල මුඛ්‍ය පරමාර්ථය වූයේ ධනය කොල්ල කෑම හා ප්‍රදේශ අල්ලා ගැනීම යි.
5. ඔහුගේ ආක්‍රමණ දිල්ලියේ ස්වාධීන මුස්ලිම් රාජ්‍යයක් බිහි වීමට මඟ පෑදීය.

(.........)

**අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් සපයා ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්යෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා අදාල වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය | නිවැරදි ය |
| 2. | නිවැරදි ය | වැරදි ය |
| 3. | වැරදි ය | වැරදි ය |
| 4. | වැරදි ය | නිවැරදි ය |
| 5. | නිවැරදි ය | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදා දෙයි |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 06. සින්ධ් හි අරාබි පාලන සමයේ දී හින්දු ආගම තහනම් වූ අතර හින්දූහු බලහත්කාරයෙන් ඉස්ලාම් ආගමට හරවා ගන්නා ලදහ. | අරාබීහු ඉන්දියාවේ තාරකා ශාස්ත්‍රය මෙන් ම ගණිතය ද ඉගෙනගත් අතර සමහර හින්දු ග්‍රන්ථ අරාබි භාෂාවට පරිවර්තනය කළහ. (..................) |
| 07.ක්‍රි.ව 8 වැනි සියවස මුල දී මොහොමඩ් බින් ක්වාසිම් යටතේ පැමිණි අරාබීහු සින්ධ් හා මුල්තාන් අල්ලා ගත්හ. | අරාබි පාලනය හේතු කොටගෙන අරාබි රටවල් සමග වෙළෙඳාම ශක්තිමත් වීම, අරාබීන්ට ඉන්දියානු ප්‍රදේශවල පදිංචි වීමට ධෛර්ය දීම සහ වෛද්‍ය විද්‍යාව හා ජ්‍යොතිෂ්‍ය පිළිබඳ ඉන්දීය ග්‍රන්ථ අරාබි භාෂාවලට පරිවර්තනය වීම (..................) |
| 08.සින්ධ් ප්‍රදේශයට අරාබි ආක්‍රමණ එල්ල වූයේ බෝලාන් දුර්ගය හරහා ය. | මුල් ම තුර්කි ආක්‍රමණය ඉන්දියාවට එල්ල කරන ලද්දේ මොහමඩ් ඉබන් කාසිම් විසිනි (..................) |
| 09.සින්ධ් මහමුද් බෝලාන් දුර්ගය දිනා ගැනීම මුස්ලිම් ලෝකයට ඉන්දියාවේ දොරටු විවර කිරීමකි. | කුටුබ්-උද්-දින් අයිබෙක් බැග්ඩැඩ් පාලනයෙන් නිදහස් ව ඉන්දියාවේ මුස්ලිම් පාලනයට පදනම දැමීය (..................) |
| 10.දහවැනි සියවසේ සිට එකොළොස් වන සියවස තෙක් ඩෙකානය චාලුක්‍ය ආධිපත්‍යය යටතේ විය. | ඔවුහු අරාබීන්ගේ ඉන්දියානු ආක්‍රමණ පසු බැස්ස වූහ. (..................) |

**ඇගයීම -02**

01. ක්‍රි.ව 1206ට පෙර ඉන්දියාවට එල්ල වූ තුර්කි - ඇෆ්ගන් ආක්‍රමණ පරීක්ෂා කරන්න.

02. ගස්නි මහමුද්ගේ සහ ගෝර්හි මහමුද්ගේ ආක්‍රමණ සාර්ථක වීමට බලපෑ සාධක පරීක්ෂා කරන්න.

03. සින්ධ් ප්‍රදේශයට එල්ල වූ අරාබි ආක්‍රමණ පිළිබඳ ව තොරතුරු පරීක්ෂා කරන්න.

04. ගස්නි මහමුද්ගේ ආක්‍රමණවලට ආසන්න කාලයේ උතුරු ඉන්දියාවේ පැවැති දේශපාලන තත්ත්වය පිළිබඳ තොරතුරු විමසන්න.

05. දිල්ලි සුල්තාන් අධිරාජ්‍යය පිහිටුවීම තෙක් උතුරු ඉන්දියාවට එල්ල වූ මුස්ලිම් ආක්‍රමණ පිළිබඳ ව කෙටි විග්‍රහයක් කරන්න.

**ඇගයීම -03**

ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඉන් දෙකක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

මුල්තාන්, ගස්නි, ඛයිබර්, දිල්ලිය, සෝම්නාත්, පෙෂාවෝර්, සුලෙයිමාන් කඳු, හේරාත්

## 11. දකුණු ඉන්දිය දේශපාලන පසුබිම

ගුප්ත අධිරාජ්‍යයේ පරිහානියත් සමඟ ක්‍රි.ව හයවන සියවසේ මැද භාගයේ දී ඩෙකෑනය හා එයින් දකුණෙහි වූ ප්‍රදේශවල ස්වාධීන රාජ්‍ය කිහිපයක් ම බිහි විය. ඒවා අතුරින් කාංචිය අගනුවර කරගත් පල්ලව, බාදාමිය අගනුවර කරගත් චාලුක්‍ය, මධුරා අගනුවර කරගත් පාණ්ඩ්‍ය යන රාජ්‍ය තුනට වැදගත් තැනක් හිමි වේ. පසු කාලයේදී එනම් ක්‍රි.ව 820 දී පමණ පාණ්ඩ්‍යයන්ට අවනත ව තිබූ තංජෝරය පල්ලව සාමන්තයෙකු වූ විජයාලය විසින් අල්ලා ගැනීමත් සමඟ චෝල අධිරාජ්‍යය ආරම්භ විය.

මෙම රාජවංස අතුරින් පල්ලවයන් දක්ෂිණ පථයේ බලය ව්‍යාප්ත කිරීම උදෙසා චාලුක්‍ය හා පාණ්ඩ්‍ය රාජ්‍ය සමඟ සටන් වැදුණ හ. පල්ලව සංස්කෘතිය ඉන්දියානු ඉතිහාසයේ විශිෂ්ට ස්ථානයක් හිමි කරගෙන තිබේ. මේ ආකාරයට පල්ලවයන් ආගමික හා සංස්කෘතික වශයෙන් ඇති කළ ප්‍රබෝධය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම මෙම පාඩම් ඒකකයේ දී සිදු වේ.

දක්ෂිණ පථයේ වාකාටකයින්ගේ බල පරිහානියත් සමඟ චාලුක්‍ය නම් නව රාජවංශයේ නැගී ඒම සිදු විය. චාලුක්‍යවරු නැගෙනහිර සහ බටහිර වශයෙන් වංශ දෙකක් යටතේ ව්‍යාප්ත වූහ. වාතාපි හෙවත් බදාමි අගනුවර කරගත් බටහිර චාලුක්‍යයන් හා වෙංගිය අගනුවර කරගත් නැගෙනහිර චාලුක්‍යයන් එක් එක් රජවරුන් යටතේ බලවත් වී ඇත. පසු කාලයේ දී බටහිර චාලුක්‍යයන්ගෙන් වෙන් වූ තෛල නැමැත්තා කල්‍යාණිය මුල් කරගෙන කල්‍යාණි රාජවංශය ආරම්භ කළේ ය. මෙලෙස බලවත් ව සිටි චාලුක්‍ය රාජ්‍යය චෝලයින්ගේ නැගී ඒමත් සමඟ පරිහානියට පත් විය. මෙම පාඩම් ඒකකයෙන් එම තොරතුරු ද අධ්‍යයනය කෙරේ.

පාණ්ඩ්‍යයන්ගේ ඉතිහාසය ඉතා ඈත අතීතයකට දිව ගියත් දකුණු ඉන්දියාවේ ප්‍රබල රාජ්‍යයක් ලෙස ඔවුන් ඉස්මතු වූයේ ක්‍රි.ව හයවන සියවස අග භාගයේ දී ය. ඔවුන්ගේ දේශපාලන ඉතිහාසය එය ප්‍රධාන අවධි දෙකක් යටතේ වර්ධනය විය. එනම් ක්‍රි.ව 670 - 920 වකවනුවට අයත් ප්‍රථම පාණ්ඩ්‍ය අධිරාජ්‍යය හා ක්‍රි.ව 1216 - 1310 වකවානුවට අයත් දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යය වශයෙනි. චෝලයන් දකුණු ඉන්දියාවේ බලවත් වීමත් සමඟ ප්‍රථම පාණ්ඩ්‍ය රාජ්‍යය දුර්වල විය.

විජයාලය රජුගෙන් ආරම්භ වූ චෝල රාජවංශය බලවත් රාජ්‍යයක් බවට පත් කරන ලද්දේ පළමුවන ආදිත්‍ය විසිනි. පසු ව පළමුවන පරන්තක හා දෙවන පරන්තක බලයට පත් වූහ. චෝල බලය ඉන්දියාවෙන් බැහැරට පවා ව්‍යාප්ත වූ විශාල අධිරාජ්‍යයක් බවට පත්වන්නේ පළමුවන රාජ රාජ හා පළමුවන රාජේන්ද්‍ර යන රජවරුන්ගේ කාලයන්හි දී ය. මෙලෙස ගොඩනැගූ බලවත් අධිරාජ්‍යය තුළ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් ද විශේෂ ලක්ෂණ රැසක් දක්නට ලැබේ. මෙම පාඩම් ඒකකයේ දී දකුණු ඉන්දියාවේ බලයට පත් ඉහත දැක් වූ රාජවංශ හතර පිළිබඳ තොරතුරු විමසා බැලීම සිදු කෙරේ.

**නිපුණතාව** : • ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම්** : 11.1 දකුණු ඉන්දියාවේ ප්‍රදේශීය රාජ්‍යය ඉන්දීය ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද ගණන** : 14

**ඉගෙනුම් පල** :
- දකුණු ඉන්දිය දේශසීමා හා ප්‍රාදේශීය රාජ්‍යයන් සිතියමක ලකුණු කරයි.
- දකුණු ඉන්දිය දේශපාලන, ආර්ථික හා සමාජ සංස්කෘතික තත්ත්වය පැහැදිලි කරයි.
- දකුණු ඉන්දීය ප්‍රවණතා ඉන්දීය ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

- **පල්ලවයන්ගේ දේශපාලන කටයුතු**
- **පල්ලව වංශයේ කැපී පෙනෙන පාලකයෝ**

**ශිව ස්කන්දවර්මන්**

- භාරද්වාජ ගෝත්‍රයෙහි උපන් මොහු මහාරාජාධිරාජ විරුදය දැරූ පළමු වැන්නා වීම.
- කෘෂිකර්මය නගා සිටුවීමට වනගත ප්‍රදේශ එළිපෙහෙළි කර නව ජනාවාස ඇති කිරීම
- වාජපේය හා අශ්වමේධ වැනි වෛදික යාගයෝම පැවැත්වීම.
- අභිලේඛනවල දක්වෙන පරිදි මොහුගේ රාජ්‍යය උතුරින් කෘෂ්ණ නදිය හා බටහිරින් අරාබි මුහුද තෙක් පුළුල් ප්‍රදේශයක පැතිරීම.

**විෂ්ණුගෝප**

- සමුද්‍රගුප්තයන් අලහාබාද් ලිපියේ ඔහු විසින් පරාජය කරණ ලද පාලකයකු ලෙස කාංචියේ විෂ්ණුගෝප සඳහන් කිරීම.
- සමුද්‍රගුප්තයන්ගේ දක්ෂිණා පථ දිග්විජය වැළැක්වීමට මොහු ප්‍රබල දායකත්වයක් ලබාදීම.

**සිංහවිෂ්ණු**

- පල්ලව ඉතිහාසය ආරම්භයේ විශිෂ්ටතම අවධිය ලෙස සැලකිය හැකි වීම.
- කාවේරි නදිය අවට ප්‍රදේශය සහ චෝල, පාණ්ඩ්‍ය, කේරළ යන රාජ්‍යයන්ට අයත් ප්‍රදේශ අල්ලා ගැනීම.
- දැඩි විෂ්ණු භක්තිකයකු වූ ඔහු සතුරන්ට එරෙහි ව ලැබූ ජයග්‍රහණ නිසා අවනිසිංහ ' හෙවත් පොළොවට අධිපති සිංහයා යන විරුදයෙන් හැඳින්වීම.

**පළමුවෙනි මහේන්ද්‍රවර්මන් ( 600 630 )**

- මත්තවිලාස, විචිත්‍රචිත් හා ගුණභාර යන විරුදාවලීන්ගෙන් හැඳින්වීම
- චාලුක්‍යයින් සමඟ පැවති සටන්.
- මහේන්ද්‍රවර්මන් රජුගේ රාජ්‍ය සමයේ සමෘද්ධිමත් යුගයක් බව හමු වූ රන් කාසිවලින් තහවුරු වීම.
- පල්ලව ගෘහනිර්මාණ ශිල්පයේ ප්‍රථම විශිෂ්ට අවධිය වූ මෙකල පර්වත හාරා දේවාල ගැනීමේ සම්ප්‍රදාව දකුණු ඉන්දියාවට හඳුන්වා දීම.

**නරසිංහවර්මන් ( 630 668 )**

- මහාමල්ල යනුවෙන්ද හඳුන්වන මොහු මෙම වංශයේ ශ්‍රේෂ්ඨතමයා වීම.
- චාලුක්‍යයින්ට එරෙහි සටන්
    * පුලකේශීන් සමඟ සටන්
    * බදාමිය අල්ලා ගැනීම
    * දෙවෙනි පුලකේශීන් පරාජය කිරීම
- පාණ්ඩ්‍ය හා චේර රාජ්‍ය යටත් කිරීම
- ඔහු විසින් මාමල්ලපුරම් හෙවත් මහාබලිපුරම් නම් සුවිශාල නගරය පිහිටුවීම.
- එහි විශාල වරායක් ඉදිකර ප්‍රබල නාවික හමුදාවක් ගොඩනැගීම.

- ඩෙකානයෙන් පහළ ප්‍රදේශයේ පල්ලව බලය ව්‍යාප්ත කිරීම
- දෙවෙනි මහේන්ද්‍රවර්මන් ( 668 - 670 ) සහ පළමුවන පරමේශ්වර්මන් (670 - 680 ) රාජ්‍ය කාලවල දී චාලුක්‍ය තර්ජන ඉදිරියේ පල්ලව බලය බෙහෙවින් දුර්වල වීම

**දෙවෙනි නරසිංහවර්මන්**

- කොංජිවරම් වරාය පෙර අපරදිග මුහුදු මාර්ගයේ ආකර්ශනීය වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීම
- පල්ලව සංස්කෘතික හා වෙළෙඳ කටයුතු ශ්‍රී ලංකාව, බුරුමය, සියමය, ජාවා, සුමාත්‍රා හා කාම්බෝජය වැනි රටවලට පැතිරී යාම
- ශ්‍රී ලංකාව සමඟ පැවති සබඳතා
- දෙවෙනි නරසිංහවර්මන් රජුගෙන් පසු පල්ලව පරිහානිය ආරම්භ වීම
- අවසානයේ චෝල බලය නැඟී ඒමත් සමඟ පල්ලව බලය බිඳී යාම

- **පල්ලව සංස්කෘතිය**

**ගෘහ නිර්මාණ ශිල්පය**

- දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පයේ ශ්‍රේෂ්ඨ අවධියක් වන මේ යුගයේ ප්‍රධාන වර්ධනීය අවස්ථා දෙකකින් සමන්විත වීම

01. පිහිටි ගලෙහි කරන ලද නිර්මාණ ( පර්වතහාරා )

උදාහරණ - පළමුවෙනි මහේන්ද්‍රවර්මන් රජු දවස මෙම සම්ප්‍රදාය යටතේ කුළුණු සහිත ලෙන් දේවාලය ඉදි කිරීම, දෙවෙනි නරසිංහවර්මන් රජු දවස විසිතුරු මණ්ඩප හා රථ ඉදි කිරීම

02. ගල් යොදගෙන කරන ලද නිර්මාණ ( කළුගල් )

උදාහරණ - මාරවර්මන් රාජසිංහ ශෛලිය - කෛලාශාථ දේවාලය, වෛකුණ්ඨාපෙරුමාල් දේවාලය



කෛලාශනාථ දේවාලය

*(source:https://commons.wikimedia.org)*

නන්දිවර්මන් ශෛලිය - කාංචිපුරයේ මාතාංගේශ්වර දේවාලය, තිරුක්තන්හී වීරට්ඨානේශ්වර දේවාලය



මාතාංගේශ්වර දේවාලය
*(source:https://www.templepurohit.com)*

**ආගම**

- වෛෂ්ණව ආල්වාරයෝ හා ශෛව නගිනාර්වරුන් ආගමික කටයුතුවල නිරත වීම.
- හියුංසියාංගේ වාර්තා අනුව බෞද්ධ හා ජෛන ආගමික මධ්‍යස්ථාන ද දියුණු තත්ත්වයක පැවතීම

**සාහිත්‍යය**

- කාංචිය ඉන්දියාවේ ප්‍රමුඛ අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් වීම
- සාහිත්‍ය කටයුතුවලට හා සාහිත්‍යකරුවන්ට රාජ අනුග්‍රහය ලැබීම ( භාරවී, දණ්ඩින් )
- රාජ්‍ය පාලකයින්ද සාහිත්‍යකරණයේ නියැලීම ( මත්තවිලාස ප්‍රහසන - පළමුවන මහේන්ද්‍රවර්මන් )

**පල්ලව විදේශ සබඳතා**

- ශ්‍රී ලංකාව, බුරුමය, සියම, ජාවා, සුමාත්‍රා, කාම්බෝජය, චීනය වැනි රටවල් සමග වාණිජ හා සංස්කෘතික සබඳතා පැවැත්වීම
- මාමල්ලපුරම් හා කොන්ජිවරම් විදේශ වෙළෙඳ කටයුතුවල දී විශාල වැදගත්කමක් හිමි වූ වරායවල් වීම

**චාලුක්‍යයෝ**

- මෞර්යයන්ගෙන් අනතුරුව ඩෙකෑනයේ පැවති රාජධානි
- වාකාටකයින්ට පසු චාලුක්‍යයින් බලයට පත්වීම
- බටහිර රාජවංශය හා නැගෙනහිර රාජවංශය යනුවෙන් චාලුක්‍යයන් ප්‍රධාන වංශ දෙකක් යටතේ ව්‍යාප්ත වීම
- පසු කාලයේ දී බටහිර චාලුක්‍ය පරපුරෙන් පැවත ආ දෙවන තෛල නැමැත්තා කල්‍යාණි ප්‍රදේශය මුල් කර කල්‍යාණි රාජධානිය ගොඩනැගීම

**බටහිර චාලුක්‍යයෝ**

- බටහිර චාලුක්‍යයන් අවස්ථා දෙකක දී බටහිර ඩෙකානයේ බලයට පත් වීම
- වාතාපිය ( බදාමිය ) මුල් කරගෙන ගොඩනැගුණු පළමුවන චාලුක්‍ය රාජ්‍යය පළමුවන ජයසිංහ විසින් ආරම්භ කරනු ලැබීය.
- මෙම පරපුරේ දෙවෙනි පුලකේශීන් පළමුවනේ කීර්තිවර්මන් හා දෙවෙනි පුලකේශීන් වැදගත් පාලකයන් වීම

**දෙවෙනි පුලකේශීන්**

- චාලුක්‍ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා වීම
- අභ්‍යන්තර කැරලි මර්දනය කිරීම
- චාලුක්‍ය බල ව්‍යාප්තිය
- පල්ලවයන් සමඟ පැවති සටන්
- වනවාහිනියෙහි කදම්බා දකුණු කානර ප්‍රදේශයේ ආලුපා සහ ගංගයන් සතුව තිබුණු මයිසූර් ප්‍රදේශය ද අල්ලා ගැනීම
- උතුරු දෙසට අවධානය යොමු කර පුරි දිවයින අත්පත් කර ගැනීම
- මේ ජයග්‍රහණ නිසා අයිහෝල් සෙල්ලිපියේ '' පරමේශ්වර '' විරුදයෙන් මොහු හැඳින්වීම.
- අනතුරුව නැගෙනහිර ඩෙකානයේ කාලිංගය, දකුණු නේපාලය වර්තමාන ගන්ජම් විශාකපට්ටනම්, විෂ්ටපුරය හා වෙංගිය යටත් කර ගැනීම
- බටහිර ආසියාව හා පර්සියාව සමඟ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීම
- දෙවන පුලකේශීන් මරණයට පත් වීමෙන් පසු රාජ්‍ය අරාජික වීම

**වික්‍රමාදිත්‍ය ( 654 - 681 )**

- පල්ලවයන් සමඟ පැවති සටන්
- පියාගේ රාජ්‍යයේ එක්සත්බව සුරැකීම
- පාණ්ඩයින්ගේත් වික්‍රමාදිත්‍යගේත් පුත් විනයාදිත්‍ය හා මුණුබුරු විජයාදිත්‍යගේත් සහයෙන් දෙවන පුලකේශින්ගෙන් පසු අහිමි වූ ප්‍රදේශ රැසක් අත්පත් කරගැනීම

**විනයාදිත්‍ය**

- පල්ලවයන්, චෝලයන්, පාණ්ඩ්‍යයන්, කේරලයන්, උතුරේ හෛහයන් හා මාලවයන් ද පරාජය කිරිම

**විජයාදිත්‍ය**

- වාතාපි රාජ්‍ය පාලන කාලසීමා අතුරින් දීර්ඝතම රාජ්‍ය කාලය වීම
- සාමකාමී හා සමෘද්ධිමත් කාල සීමාවක් වීම
- පත්තදකාල්හි සංගමේශ්ර දේවාලය වැනි නිර්මාණ මඟින් මෙකල ඇති වූ ගෘහනිර්මාණ දියුණුව පෙන්නුම් කිරීම

**දෙවෙනි වික්‍රමාදිත්‍ය**

- පල්ලව අක්‍රමණ මැඬ පැවැත්වීම
- අරාබි ආක්‍රමණ මැඬ පැවැත්වීම

**දෙවෙනි කීර්තිවර්මන්**

- වාතාපියේ අවසන් බලවත් චාලුක්‍ය පාලකයා වීම
- පාණ්ඩ්‍යයන්ට එරෙහි ව සිදු කළ සටන්

**නැගෙනහිර චාලුක්‍යයෝ**

- පළමුවෙනි විෂ්ණුවර්මන් ආරම්භක පාලකයා වීම
- අනතුරු ව නරේන්ද්‍ර මෘගරාජ බලයට පත් වීම
- වෙංගි ප්‍රදේශ මුල් කොට නැගෙනහිර චාලුක්‍ය රාජවංශය ගොඩනැඟීම

**භීම**

- රාෂ්ට්‍රකූටයන් සමඟ ගැටුම් ඇති කර ගැනීම
- භීමගෙන් පසු රජකම සඳහා අරගල ඇතිවීම
- දොළොස්වන සියවස මැද භාගයේ වන විට නැගෙනහිර චාලුක්‍ය රාජධානිය චෝල බලයට යටත් වීම

**කල්‍යාණියේ චාලුක්‍යයෝ**

- දහවෙනි සියවස අවසාන භාගයේ දී බටහිර චාලුක්‍ය පරපුරට අයත් තෛල නැමැත්තෙක් විසින් කල්‍යාණිය මුල් කොට කල්‍යාණි චාලුක්‍ය රාජ්‍ය ගොඩනැඟීම
- පළමුවෙනි තෛල දෙවෙනි තෛල, පළමුවෙනි සෝමේශ්වර හා වික්‍රමාදිත්‍ය පාලකයින් මෙම වංශයට අයත් වීම
- දෙළොස්වෙනි සියවසේ අවසාන භාගය වන විට කල්‍යාණි චාලුක්‍ය රාජවංශය අභාවයට යාම

**පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ දේශපාලන කටයුතු**

- පාණ්ඩ්‍ය රාජ්‍යයේ ඉතිහාසය ප්‍රධාන අවධි දෙකකින් යුක්ත වීම
  * පළමුවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍ය ( ක්‍රි.ව 670 - 920 )
  * දෙවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍ය ( ක්‍රි.ව 1210 - 1310 )

**පළමුවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍යය**

- වර්තමාන මධුරෙයි, රාමනදි හා තින්නවේලි දිස්ත්‍රික්ක ද, ට්‍රවැන්කෝර් ප්‍රදේශයේ දකුණු කොටස ද අයත් වීම
- අගනුවර මධුරාපුරය වීම
- ආරම්භක පාලකයා කඩුන්ගෝන් නැමැත්තකු වීම
- අනතුරු ව මාරවර්මන් අවනිශූලාමනී, ශෙන්දන්, අරිකේශරි මාරවර්මන් කොච්චඩයියන් ( රණධීර) පළමුවෙනි රාජසිංහ මාරවර්මන් යන පාලකයන් බලයට පත් වීම

**පළමුවෙනි වරගුණ මහාරාජ ( ජටිල පරාන්තක )**

- පාණ්ඩ්‍ය රාජ්‍යය අධිරාජ්‍ය තත්ත්වයට ගෙන ඒමට පදනම දැමීම
- රාජ්‍යය තංජෝර් හා කොයිම්බතෝර් ප්‍රදේශවලට පැතිරීම

**ශ්‍රී මාර ශ්‍රී වල්ලභ**

- ගංගා, පල්ලව, චෝල කාලිංග යන පාණ්ඩ්‍ය රාජ්‍යය අවට පිහිටි රාජ්‍යයන් හතරක් ජය ගැනීම
- පරචක්‍ර කෝලහාල ( සතුරු පිරිස් වික්ෂිප්තියට පමුණුවන්නා ) යන විරුදාවලිය භාවිත කරමින් ගෙනගිය යුද්ධය නිසා සමීප රාජ්‍යයන් සතුරු වීම
- ඔහුට එරෙහි ව පැමිණි ගංග, පල්ලව චෝල හා කාලිංග යන රටවල පාලකයින්ගෙන් සැදුම්ලත් සතුරු සන්ධානයක් ' කුම්බකෝණම් ' හි දී පරාජයට පත් කිරීම
- දකුණු ඉන්දියාවෙන් බැහැරට බලය ව්‍යාප්ත කරමින් පළමුවෙනි සේන රාජ්‍ය සමයේ දි ලංකාව ආක්‍රමණය කිරීම
- ක්‍රි.ව 850 දී නෘපතුංග නම් පල්ලව රජු අරිශිල් නදිය අසල කළ සටනේ දී ශ්‍රී මාර පරාජයට පත් කිරීම
- අරිශිල් සටන පැවතිය ද ලංකාවේ දෙවෙනි සේන රජු වෙනත් පාණ්ඩ්‍ය කුමරයකුගේ සහයට යැවූ සේනාවන් මදුරාපුරය විනාශ කර ශ්‍රී වල්ලභ රජුට මරණීය තුවාල සිදු කිරීම

**දෙවෙනි වරගුණවර්මන්**

- රාජ්‍යය ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ දෙවන සේන රජුගේ සහාය ලබාගැනීම
- නැවත පාණ්ඩ්‍ය බලය ගොඩනැගීමට උත්සාහ ගත්තත් පල්ලව, චෝල හා ගංග රාජ්‍යයන් ඒකාබද්ධ ව එල්ල කළ ශ්‍රී පුරුම්බියම් සටනෙන් බලය බිඳ වැටීම

**දෙවෙනි රාජසිංහ මාරවර්මන්**

- නැගී එන චෝල බලය වර්ධනයට ශ්‍රී ලංකාවේ පාලකයන්ගෙන් සහාය ලබා ගැනීම
- පස්වෙනි කාශ්‍යප රජු ඔහු පුත් සක්ක සේනාපති යටතේ සිංහල සේනාවක් ලබා දීම
- සිංහල, පාණ්ඩ්‍ය ඒකාබද්ද හමුදා පළමුවන පරන්තක චෝල අධිරාජයා අතින් පරාජයට පත්වීම
- පාණ්ඩ්‍ය රජු රාජ කකුධ භාණ්ඩ රැගෙන ජීවිතාරක්ෂාව පතා ලංකාවට පළා යාම
- පාණ්ඩ්‍ය දේශය 10 වන සියවස අවසානයේදි චෝල ආධිපත්‍යයට නතු වීම
- මින් පසු සියවස් දෙකක් පමණ යන තෙක් පාණ්ඩ්‍ය රාජ්‍යය චෝල අධිරාජ්‍යයේ ප්‍රාන්තයක් ලෙස පැවතීම

**දෙවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍යය**

- දොළොස්වන සියවසේදි චෝල සිහසුන උදෙසා ඇති වූ සිවිල් අරගල හේතුවෙන් යළි පාණ්ඩයින්ට බලය හිමි වීම
- ජටාවර්මන් කුලසේකර පාණ්ඩ්‍ය බලය යළි නැංවීමට මුල් වීම
- අනතුරු ව බලයට පත් මාරවර්මන් සුන්දර පාණ්ඩ්‍ය චෝල රාජ්‍යය ආක්‍රමණය කොට තංජෝර් හා උරයිඋගර් නගර කොල්ල කා එහිම අභිෂේක වීම

**ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය**

- ක්‍රි.ව 1251 බලයට පත් මොහු දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨමයා වීම
- පාණ්ඩ්‍ය රාජ්‍යය වෙනත් ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීම

උදාහරණ:
* හොයිසාලවරුන් මයිසූර් ප්‍රදේශය සීමා කර කේරල හා චෝල පාලකයන් තමාට අවනත කර ගැනීම

* ශ්‍රී ලංකාවේ චන්ද්‍රභානු රජු පන්නා දැමීමට සිංහල පාලකයන්ට උදවු කිරීම
* සේන්ඩ මංගලම් නැමති බලකොටුවට පහරදීම
* පල්ලවයන්ගේ කාංචිය ආක්‍රමණ කර නගරය අත්පත් කර ගැනීම
* ආක්‍රමණවලින් ලබාගත් ධනය අගමික සිද්ධස්ථාන ගොඩනැගීමට හා නඩත්තුවට ලබා දීම

**පළමුවෙනි මාරවර්මන් කුලශේකර**

- දිග්විජය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
- ඔහුගෙන් පසු සිවිල් අරගල ඇති වීම නිසා රාජ්‍යය දුර්වල වීම
- දිල්ලි සුල්තාන් රාජ්‍යයේ නැගී ඒම සහ විජයනගර් රාජ්‍යයේ බලවත් වීම නිසා දෙවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍යය බිඳවැටීම

**චෝල අධිරාජ්‍යයේ ප්‍රභවය හා වර්ධනය**

- පල්ලව රාජ්‍යයේ සමාන්තයෙකු වූ විජයාලය (ක්‍රි.ව 846 - 781) විසින් චෝල රාජවංශය ආරම්භ කිරීම
- චෝල අධිරාජ්‍යය වර්ධනය හා ව්‍යාප්තිය සඳහා පාලකයින් රැසක් දායක වීම
- පළමුවෙනි ආදිත්‍ය, පළමුවෙනි පරන්තක, පළමුවෙනි රාජරාජ, පළමුවෙනි රාජේන්ද්‍ර, පළමුවෙනි රාජාධිරාජ දෙවෙනිරාජේන්ද්‍ර, පළමුවෙනි කුලෝත්තුංග

**පළමුවෙනි ආදිත්‍ය**

- පාණ්ඩ්‍යයන් හා පල්ලවයන් අතර සිදු වූ ශ්‍රී පුරම්බියම් සටනේ දී පල්ලව ජයග්‍රහණයට සහාය වූ පළමුවෙනි ආදිත්‍ය රජුට පල්ලවයන් විසින් තංජෝරය අසල ප්‍රදේශ පැවරීම
- පසු ව තම ස්වාමියා වූ පල්ලව රජු පරදවා තොණ්ඩෙයි මණ්ලය අල්ලා ගැනීම
- අනතුරු ව කොංගු දේශය හා බටහිර ගංගයින්ගේ අගනුවර වූ තලකාඩ් නගරය ද අල්ලා ගැනීම
- චෝල රාජ්‍යය බලවත් රාජ්‍යයක් බවට පත් කිරීමේ ගෞරවය ආදිත්‍ය රජුට හිමි වීම

**පළමුවෙනි පරන්තක (ක්‍රි.ව 907 - 953)**

- මොහු බටහිර ගංග, කේරල, කොයිම්බටෝර් නායකයින්ගේ ආචාර ලබා ගනිමින් චෝල රාජ්‍ය ස්ථාවර කිරීම
- පාණ්ඩයයින්ගේ අගනුවර වූ මධුරාව ජයගැනීම මොහු ලබාගත් වැදගත් විජයග්‍රහණයක් වීම
- මේ ජයග්‍රහණයත් සමඟ මධුරෙයිකොණ්ඩ විරුදය ලැබීම
- ක්‍රි.ව 920 දී පමණ තුන්වන වරට පාණ්ඩ්‍ය රාජ්‍යයට එල්ල කළ ආක්‍රමණයෙන් දෙවෙනි රාජසිංහම් නම් පාණ්ඩ්‍ය රජු නෙරපීම
- පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ රැගෙන දෙවෙනි රාජසිංහම් රජු ලංකාවට පළා ගිය නිසා හතරවන උදය සමයේ ලක්දිව ආක්‍රමණය කිරීම
- වල්ලාල නම් ස්ථානයේ දී කළ සටනින් පල්ලවයන් පැරද වූ පළමුවෙනි පරන්තක විසින් උතුරෙන් වෙල්ලෝරය දක්වා චෝල රාජ්‍යය ව්‍යාප්ත කිරීම

**පළමුවෙනි රාජ රාජ (ක්‍රි.ව 985 -1014)**

- ත්‍රිවෙන්ද්‍රාම් සටනින් භාස්කරවර්මන් යටතේ පැවති කේරලයේ නාවික හමුදාව විනාශ කිරීම
- මදුරාව ජයගෙන අමරභුජංග නම් පාණ්ඩ්‍ය රජු අල්ලා ගැනීම
- පාණ්ඩ්‍ය සහ කේරල බලය මර්දනය කිරීමේ අරමුණෙන් උදගෙයි බලකොටුව අල්ලා ගැනීම
- ලංකාව ආක්‍රමණය කර අනුරාධපුරය අල්ලා ගැනීම
- ගංග රාජ්‍යයේ ගංගවාඩි, තංගවාඩි, කෝලම්බ වාඩි යන ප්‍රදේශ අල්ලා ගැනීම
- ක්‍රි.ව. 1007 දී පමණ බටහිර චාලුක්‍ය රාජ්‍යය ආක්‍රමණය කොට ධනය කොල්ලකෑම
- නැගෙනහිර චාලුක්‍ය රජුට සිහසුන ලබාගැනීමට උපකාර කර ඔවුන් හා මිතුරු වීම
- කාලිංගය හා මාලදිවයින් තම බලයට යටත් කර ගැනීම
- මුම්මුඩිචෝල, පාණ්ඩ්‍ය කුලාශනී, කේරලාන්තක, තෙළිගු, කලිකාල යන නම්වලින් ඔහු හැඳින්වීම

**පළමුවෙනි රාජේන්ද්‍ර රජු (ක්‍රි.ව 1014 - 1024)**

- තිරුවාලංගාඩු තඹ සන්නස හා තිරුමලෙහි ගිරිලිපිය යන මූලාශ්‍රයවලින් මොහු ලත් ජයග්‍රහණ හෙළි වීම
- කුඩා කල සිට ම තම පියා යටතේ පාලනයට සම්බන්ධ වී අත්දැකීම් හා පුහුණුව ලබා ගැනීම
- පල්ලව රාජ්‍යය යටත් කොට දකුණේ චෝල රාජ්‍යය වර්ධනය කිරීම
- කාලිංගය, ලකදිව් හා මාලදිවයින යටත් කර ගැනීම
- ක්‍රි.ව 1017 දී ශ්‍රී ලංකාවේ කඳුකරයෙන් උතුරට වූ ප්‍රදේශ යටතේ කර ගැනීම
- තුංගභද්‍රාවලින් උතුරේ තිබූ බෙංගාල, බිහාර ඔරිස්සා ප්‍රදේශ ජය ගත් නමුත් අධිරාජ්‍යයට ඈඳා නොගැනීම
- එම ජයග්‍රහණ සිහි වීමට ගංගෙයිකොණ්ඩ චෝල පුරම් ඉදි කිරීම
- මෙකල වර්ධනය කොට තිබූ නාවික හමුදාව විසින් අග්නිදිග ආසියාවේ සමුද්‍රාසන්න රාජ්‍ය රැසක් ජය ගැනීම (ජාවා, සුමාත්‍රා, මැලේ අර්ධද්වීපය, නිකොබාර්, ඉස්මුස්)
- ක්‍රි.ව 1021 දී බටහිර චාලුක්‍ය පාලක ජයසිංහ පරාජය කිරීම

රාජේන්ද්‍ර චෝළ රජුගේ සටන් අවස්ථාවක් නිරූපණය කෙරෙන කොලාරම්මා දේවාලයේ කැටයමක්



*(source: https://en.wikipedia.org/wiki/Rajendra_Chola_I)*

**පළමුවෙනි රාජාධිරාජ (ක්‍රි.ව 1044 - 1052)**

- මේ කාලපරිච්ඡේදයේ ලංකාවේ චෝල පාලනය පැවති ප්‍රදේශවල පැන නැඟුණු නිදහස් සටන් ව්‍යාපාර වර්ධනය කිරීම
- චෝල චාලුක්‍ය සටන් දිගින් දිගට ම පැවතීම නිසා චෝල බලය දුර්වල වීම

**චෝල අධිරාජ්‍යයේ පසුකාලීන පාලකයෝ**

- දෙවෙනි රාජේන්ද්‍ර රජු චාලුක්‍ය සෝමේශ්වරට විරුද්ධ ව සටන් කර ඔහු පරාජයට පත් කිරීම
- අනතුරු ව බලයට පත් පළමුවෙනි වීර රාජේන්ද්‍ර රජු බටහිර චාලුක්‍ය පළමුවෙනි සෝමේශ්වර හා දෙවෙනි සෝමේශ්වර සමඟ ගැටුම් ඇති කර ගැනීම
- ශ්‍රී ලංකාවේ චෝල පාලනයට එරෙහි ව පැන නැඟුණු කැරැල්ලක් වීර රාජේන්ද්‍ර විසින් මර්දනය කිරීම
- අධිරාජේන්ද්‍ර රජුගෙන් විජයාලය රාජවංශය අවසන් වීම
- අනතුරු ව බලයට පත් පළමුවෙනි කුලෝත්තුංග විසින් චෝල අධිරාජ්‍යයට එරෙහි බලවේග මැඩ පැවැත්වීමට ක්‍රියා කිරීම
- එහෙත් පළමුවෙනි තුලෝත්තුංගගේ කාලයේ දී සමුද්‍රාසන්න රාජ්‍යය චෝල අධිරාජ්‍යයට අහිමි වීම
- ශ්‍රී ලංකාවේ චෝල පාලන ප්‍රදේශ පළමුවෙනි විජයබාහු රජු විසින් නිදහස් කර ගැනීම

**චෝල පාලන තන්ත්‍රය**

- චෝල පරිපාලනය පිළිබඳ තොරතුරු තත්කාලීන අභිලේඛනවලින් හා ආඥාවලින් හෙළි වීම
- වසර 400ක පමණ කාලයක් තිස්සේ දකුණු ඉන්දියාවේ සංවිධානාත්මක රාජාණ්ඩුවක් ලෙස වර්ධනය වීම
- මධ්‍ය පාලනය, ප්‍රදේශීය පාලනය හා ග්‍රාම පාලනය ලෙස කොටස් තුනකින් ක්‍රියාත්මක වීම

- **මධ්‍ය පාලනය**

    - රජු වටා සංවිධානය වූ රාජාණ්ඩු පාලන රටාවක් පැවතීම
    - සාමාන්‍ය සම්ප්‍රදායය අනුව රජුගේ අනුප්‍රාප්තිකයා මෙන් ම ප්‍රධාන සහායකයා වූ යුවරජ තනතුරට රජුගේ වැඩිමහල් පුතු පත් කර ගැනීම
    - රජ දේවත්වයෙන් සැලකූ බව රාජකීයයන්ගේ මළ සිරුරු තැන්පත් කර දේවාල ඉදිකර පුද පූජා පැවැත්වීමෙන් තහවුරු වීම
    - රජු සතු ව පැවති බලතල ඒකාධිපති ස්වරූපයක් ගත්තත් පාලන රටාව තුළ ඒකාධිපතියකු ලෙස ක්‍රියා කළ නොහැකි වීම
    - උදන්කූට්ටම් නැමති නිලධාරි මණ්ඩලයේ උපදෙස් අනුව රජු විසින් නීති පැනවීම සිදු කිරීම
    - රජුගේ සහායට රාජ සභාවක් හෙවත් අමාත්‍ය මණ්ඩලයක් පැවති බව ඇතැම් මූලාශ්‍රයවල සඳහන් වීම
    - එහෙත් ස්ථිර ඇමති මණ්ඩලයක් නොවූ බව රොමිලා තාපර් පෙන්වා දීම
    - පෙරුන්දනම් - ඉහළ පෙළේ නිලධාරින්
    - සිරුදනම් - පහළ මට්ටමේ නිලධාරීන් ලෙස
    - චෝල පාලනයට සම්බන්ධ නිලධාරීන් බෙදිය හැකි වීම

- **ප්‍රදේශීය පාලනය**

    - ප්‍රදේශීය පාලනයේ දී චෝල අධිරාජ්‍ය මණ්ඩලම්වලට බෙදා පාලනය කිරීම ( චෝල, පාණ්ඩ්‍ය, ගංගා, වෙංගි, කේරළ, මුම්මුඩි චෝල)
    - චෝල ප්‍රතිරාජයකු යටතේ මෙම ප්‍රදේශීය මණ්ඩල පාලනය වීම

- වරායන් නිලධාරියා යටතේ යුද හා සිවිල් කටයුතුත්, අධිගාරිගල් නිලධාරියා යටතේ හමුදා කටයුතුත් පවත්වාගෙන යාම
- මුම්මුඩි චෝල මණ්ඩලයෙන් ( ශ්‍රී ලංකාවේ චෝල ප්‍රදේශවලින් ) ගෙනගිය බදු මුදල් පිළිබඳ ව තංජෝරයේ මහා ශිව දේවාලය ලිපියේ සඳහන් වීම

- ග්‍රාම පාලනය

  - ඌර්, වලනාඩු, නාඩු, කුරම් යනුවෙන් පාලන සහා බෙදී පැවතීම
  - ග්‍රාම පාලනයේ දී ඌර් සහ නාඩු යන ආයතන වඩාත් වැදගත් වීම
  - ඌර් සභාව තුළ ආලුන්ගනම් නම් වැඩිහිටි කණ්ඩායම ක්‍රියාකාරී පිරිස ලෙස වැදගත් වීම
  - ඌර් සභාවේ නියෝජිතයන්ගෙන් වාරියම් සභා, ධර්ම සභා නමින් කමිටු පිහිටුවා තිබීම
  - වාරියම් කමිටුවලට ඇළවේලි සැකසීම, අලුතින් ගෙවතු අස්වැද්දීම, හා බදු අය කිරීම වැනි කටයුතු භාර වීම
  - ධර්ම සභා කමිටුව මඟින් දේවාල හා කෝවිල් නඩත්තුව, අධ්‍යාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා ග්‍රාමීය සුහසාධන කටයුතු දියුණු කිරීම ආදිය සිදු කිරීම
  - අධිකරණ කමිටු මඟින් ගමේ නඩු විසඳීම සිදු කරන ලද අතර ඒ සඳහා වර්තමාන ජූරි ක්‍රමයට සමාන පංචායත් ක්‍රමය ක්‍රියාත්මක කිරීම
  - චෝල ග්‍රාමීය පාලනයේ කුඩා ම ඒකකය කුරම් වු අතර කුරම් ගණනාවක් එකතු වී නාඩු නම් ඒකකය ද, නාඩු කීපයක් එකතු වී වලනාඩු නම් ඒකකය ද ගොඩනැඟී තිබීම
  - චෝල ග්‍රාම පාලනය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ලක්‍ෂණවලින් සමන්විත වීම

**චෝල යුගයේ ආර්ථික සමාජීය හා සංස්කෘතික කටයුතු**

- සමාජ තත්ත්වය

  - චෝල සමාජය පාරම්පරික රැකියා පදනම් කරගත් කුල ක්‍රමයක් ලෙස සංවිධානය වී තිබීම
  - ගොවිතැන ප්‍රධාන ජීවන වෘත්තිය වීම
  - සමාජයේ ඉහළ ම ස්ථානයේ සිටි ඇතැම් බ්‍රාහ්මණයන් අධ්‍යාපනය, ආගම හා සාහිත්‍ය යන අංශවලින් බැහැර වී වෙළෙඳාම, යුද සේවය හා වෙනත් උසස් රාජ්‍ය සේවාවල නිරත වීම
  - මෙකල දකුණු ඉන්දියානු කුල ක්‍රමය උතුරු ඉන්දියානු චතුර්වර්ණ ක්‍රමයට වඩා බෙහෙවින් සංකීර්ණ ස්වරූපයක් ගැනීම
  - සමාජයේ නායකත්වය පුරුෂයාට ලැබුණ ද කාන්තාව ද සමාජයේ ඉහළ පිළිගැනීමටකට ලක් වූ බව ඉඩම්හිමි කාන්තාවන් ද සිටියායැයි සඳහන් වීමෙන් තහවුරු වීම
  - දකුණු ඉන්දියාවේ දැසි දසුන් ක්‍රමය ක්‍රියාත්මක වීම

- ආර්ථික තත්ත්වය

  - ග්‍රාමීය කෘෂි ආර්ථිකයක් ක්‍රියාත්මක වීම
  - වෙළෙඳ හා විවිධ භාණ්ඩ නිෂ්පාදනය කළ ශිල්ප ශ්‍රේණි පිළිබඳ ව සඳහන් වීම
    - * මෙකල අයියාවොලේ නම් වෙළෙඳ ශ්‍රේණිය චෝලයන්ගේ ආර්ථික කටයුතුවලට සහාය දීම
    - * මෙම වෙළෙඳ ශ්‍රේණිය චෝල ධජය රැගෙන ගිය බව රොමිලා ථාපර් පෙන්වා දෙයි.
  - ගමේ පාලන අයිතිය ඉඩම් අයිතිය පදනම්කර හිමි වීම
  - පෞද්ගලික ඉඩම් අයිතිය පිළිගැනුණු අතර ඉඩම් හිමියන්ට තමන් කැමති පරිදි තම ඉඩම් අන් සතු කළ හැකි වීම
  - මේ යුගයේ මූලික වශයෙන් ත්‍රිවිධාකාර ඉඩම් භුක්ති ක්‍රමයක් ක්‍රියාත්මක වීම එනම්,

1. ගැමියන්ගේ පෞද්ගලික ඉඩම්
2. විවිධ සේවා මත පදනම් වූ ඉඩම්
3. විවිධ පූජ්‍යස්ථානවලට ප්‍රදානය කළ ඉඩම්

- කෘෂිකර්මාන්තයට ජලය සැපයීම සඳහා වාරි කටයුතු සංවිධානාත්මක ව ක්‍රියාත්මක වීම
- සත්ව පාලනයට ද ආර්ථිකයේ වැදගත් තැනක් ලැබුණු අතර ගව පාලනය ප්‍රධාන වීම
- ඈත අතීතයේ සිට ම ඉන්දියන් සාගරයේ නැගෙනහිර හා බටහිර ප්‍රදේශ සමග වෙළෙඳාම පවත්වාගෙන යාම
  * බොහෝ නූතන විද්වතුන් චෝල අධිරාජ්‍යය සාමුද්‍රික අධිරාජ්‍යයක් ලෙස හඳුන්වා තිබීම
  * විදේශ ප්‍රතිපත්තියේ මූලික ඒකකය වූයේ නාවික හමුදාවයි.
- අභ්‍යන්තර මෙන් ම විදේශීය වෙළෙඳාමේ දී ද හොඳින් සංවිධානය වූ වෙළෙඳ ශ්‍රේණි ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- දේශීය අවශ්‍යතා පදනම් කරගෙන විවිධ ගෘහ කර්මාන්ත රැසක් දියුණු වීම (රෙදි විවීම, ලෝහ භාණ්ඩ සැකසීම, රන්, රිදී හා මැණික්වලින් ආභරණ තැනීම)
- කෝවිල සංස්කෘතික මෙන් ම ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීම
- තීරු බදු, උත්සව බදු, තොටුපල බදු, කඩවත් බදු, ආකර බදු, ලුණු ලේවා ආදියෙන් හා විවිධ වෘත්තීවලින් රජයට ආදායම් ලැබීම

**ආගමික තත්ත්වය**

- චෝල රජවරුන් සියලු දෙනා ම ශිව භක්තිකයන් වීම
- එහෙත් චෝල පාලනයේ මුල් අවධියේ දී අන්‍යාගම් ඉවසීම හා අන්‍යාගමික නිකායන්ට සැලකීම සිදු කිරීම
- පළමුවෙනි රාජ රාජ රජුගේ නැගණිය වූ කුන්දවා කුමරිය එක ම ස්ථානයක ශිව හා විෂ්ණු දේවාල දෙකක් හා ජෛන ආරාමයක් ඉදි කරවීම
- චෝල අධිරාජයට අයත් ඉන්දියාව තුළ හා ඉන් බාහිර ප්‍රදේශවල ශිව දේවාල ඉදි කිරීම
- පළවෙනි රාජ රාජ රජු විසින් තංජෝර්හි ඉදිකළ බෘහදේශ්වර හෙවත් රාජ රාජේශ්වර ශිව දේවාලය විශිෂ්ට නිර්මාණයක් වීම
- පළමුවෙනි රාජේන්ද්‍ර රජු ගෘහාධිකොණ්ඩ චෝලපුරම්හි ඉදිකළ ශිව දේවාලයද උසස් නිර්මාණයක් වීම
- පළමුවෙනි රාජ රාජ ලංකාවේ ගමක ආදායම තංජෝරයේ දේවාලයක නඩත්තුවට ලබා දීම
- දේවාල ඉදිකිරීමට අමතර ව ශිව - පාර්වතී පිළිම නෙළීම ද බෞද්ධ පිළිම නෙළීම ද මෙකල බහුල ව සිදු කිරීම
- ශ්‍රී විජය අධිරාජ්‍යයේ වෙළෙඳුන්ට විහාරයක් නාගපට්ටම්හි ඉදි කර ගමක් පූජා කිරීම

**භාෂාව හා සාහිත්‍යය**

- පල්ලවයන් හා පාණ්ඩ්‍යයන් යටතේ වර්ධනය වෙමින් පැවති දෙමළ සංස්කෘතික සාහිත්‍යය මෙකල තව දුරටත් වර්ධනය වීම
- කණ්ණඩ, දෙමළ හා තෙළිගු භාෂා දකුණු ඉන්දියාවේ ප්‍රධාන භාෂා ලෙස වර්ධනය වීම
- බෞද්ධ භික්ෂූන් රචනා කළ පාලි බෞද්ධ ග්‍රන්ථ කීපයක් ගැනද තොරතුරු ලැබීම
- මහාභාරතය හා රාමායණය වැනි සංස්කෘත මහා කාව්‍ය මෙකල තෙළිගු බසට පරිවර්තනය කිරීම
- දේවාල ආශ්‍රිත උසස් අධ්‍යාපන ආයතනවල සංස්කෘත භාෂාව භාවිත වීම
- පළමුවෙනි කුලෝත්තුංග වැනි පාලකයින් සංස්කෘත සාහිත්‍යයේ වර්ධනයට උදව් කිරීම
- ශංකරාචාර්යවරයා විසින් සංස්කෘත ධර්මග්‍රන්ථ ඉගෙනීමට ආශ්‍රම පිහිටු වීම
- වෙන්කත මාධව විසින් වේදය පහදා දීමට ඍග්වර්ථප්‍රදීපිකාව නම් ග්‍රන්ථය රචනා කිරීම
- භාගවත් පුරණය නම් ආගමික ග්‍රන්ථය දහවන ශතවර්ෂය මුල දී රචනා වීම
- මෙකල තිරත්තක්කදේවර්, ජයන් කොඩ්ඩාර්, කම්බන්, ඔට්ටන් කුට්ටන් නම්බි ආණ්ඩර්, ශේක්කිලර් හා නාථමුනි වැන්නන් ප්‍රසිද්ධ දෙමළ සාහිත්‍යධරයන් ලෙස වැදගත් වීම
- කාණ්ඩ එකොළහකින් යුතු ශෛව භක්ති ගීත අඩංගු ග්‍රන්ථයක් නම්බි ආණ්ඩර් කවියා විසින් රචනා කිරීම

**ගෘහ නිර්මාණ ශිල්පය**

- පල්ලව යුගයේ සිට විකාශනය වෙමින් ආ ද්‍රවිඩ ගෘහ නිර්මාණ ශිල්පය මෙකල උච්චත ම අවස්ථාවට පත් වීම
- ක්‍රි.ව 10 වන ශතවර්ෂය තෙක් කුඩා ප්‍රමාණයේ දේවාල ඉදි වුවත් අනතුරු ව සියුම් නිර්මාණ සහිත දැවැන්ත දේවාල ඉදි වීම
- මෙලෙස චෝල සම්ප්‍රදායය අනුව ඉදි කළ දේවාල රැසක් අධිරාජ්‍යය පුරා දක්නට ලැබීම බෘහදේශ්වර දේවාලය ( රාජ රාජේශ්වරි දේවාලය )
  * ගංගෙයිකොණ්ඩ චෝලපුරම් දේවාලය ( මහා හින්දු කෝවිල)



*ගංගෙයිකොණ්ඩ චෝලපුරම් දේවාලය*

*(source: https://www.wikipedia.org)*



*බෘහදේශ්වර හෙවත් රාජ රාජේශ්වරී ශිව දේවාලය*

*(source:http://indiaopines.com)*



කෝරංගනාථ දේවාලය
*(source:http://tamilnadu-favtourism.blogspot.com)*

* කෝරංගනාථ දේවාලය
    * උත්තර කෛලාස දේවාලය
- චෝල දේවාල ඉදි කිරීම ගල් කුට්ටි හා ගල් කුලුනු භාවිත කිරීම
- චතුරස්‍රාකාර ව දේවාලය වට කර තිබීම
- ප්‍රධාන දේවාලයේ වැදගත් ම අංගය ගර්භගෘහය වූ අතර අන්තරාලය නමැති ශාලාව ඔස්සේ ගර්භ ගෘහයට ඇතුල් විය යුතු වීම
- ගර්භගෘහය මතුපිට එකිනෙකට කුඩාවෙමින් ඉහළට නඟින මහල් ගණනාවකින් යුතු පිරමීඩාකාර විමානයක් පිහිටා තිබීම
- දේවාල ඇතුළත මෙන් ම පිටත ද චිත්‍ර, මූර්ති, කැටයම්වලින් අලංකාර කර තිබීම
- දේවාල භූමිය වටා ඉදිකර ඇති පවුරෙහි දේවාලයට ඇතුළු වීම සඳහා වූ ද්වාරය (ගෝපුර) චෝල ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ ලක්‍ෂණයක් වීම

**මූර්ති කලාව**

- දේවාල ආශ්‍රිත විවිධ රූප නෙළා තිබීම
- පළමුවෙනි පරන්තක රජු කරවූ ශ්‍රී නිවාස නල්ලූරයේ කෝරංගනම් දේවාලයේ සිංහ වැනි සතුන් පිරිවරාගත් විෂ්ණු, බ්‍රහ්ම ආදි දේව ප්‍රතිමා රැසක් හමු වීම
- ශිව, විෂ්ණු, බ්‍රහ්ම, පාර්වතී, ලක්ෂ්මී, ශෛව හා වෛෂ්ණව නිකායික මුනිවරුන්, රාම සහ සීතා ආදීන්ගේ ලෝකඩ ප්‍රතිමා රැසක් දක්නට ලැබීම

**චිත්‍ර කලාව**

- නාර්තමලෙයිහි විජයාලය චෝලේශ්වර දේවාලයයේ ශිව, නටරාජා, මහාකුල ආදීන්ගේ විශාල චිත්‍ර ඇඳ තිබීම
- මෙහි කුඩා ප්‍රමාණයේ පුද්ගල චිත්‍ර ද රැසක් හමුවන අතර, එහි සඳහන් දේවී චිත්‍රයෙන් සමකාලීන හිසකෙස් සැකසීම හා විවිධ ඇඳුම් පැළඳුම් ගැන තොරතුරු ලැබීම

- තංජෝරයේ බෘහදේශ්වර දේවාලයයේ බිත්තිවල ශිව දෙවියන් කෛලාශ පුරයෙන් බසින ආකාරයේ චිත්‍ර ඇඳ තිබීම



*බෘහදේශ්වර දේවාලයේ චිත්‍ර*
*(source:http://tamilnation.com)*

**චෝල අධිරාජ්‍යයේ පරිහානිය**

- ඉන්දියාව තුළ මෙන් ම ඉන්දියාවෙන් බැහැර ප්‍රදේශවල කරන ලද දීර්ඝකාලීන සටන් සඳහා දැරීමට සිදු වූ අධික වියදම් නිසා චෝල ආර්ථිකය දුර්වල වීම
- චෝලයන්ට විරුද්ධ ව පාණ්ඩ්‍ය, චාලුක්‍ය, කේරල, කාලිංග හා පල්ලවයන් නැඟී සිටීම
- දුර්වල පාලකයන් බලයට පත් වීම(දෙවෙනි කුලෝත්තුංග, දෙවෙනි රාජරාජ, දෙවෙනි රාජාධිරාජ)
- මෙම දුර්වල පාලකයන් හින්දු ආගමේ එක් නිකායයක් වූ වෛෂ්ණව නිකායිකයින් වර්ධනයට ක්‍රියා කිරීම නිසා ඇති වූ විරෝධය
- පාණ්ඩ්‍ය සිංහාසනය උදෙසා චෝලයන් සහ සිංහල පාලකයන් අතර ඇති වූ ගැටුම් පාණ්ඩ්‍ය බලය වර්ධනය වීමට හේතු වීම
- චෝල පාලන තන්ත්‍රය මඟින් ප්‍රදේශීය පාලන ඒකකවලට ස්වාධීන ව ක්‍රියාකිරීමට ලබා දී තිබූ බලය නිසා ප්‍රදේශීය රාජ්‍ය බලවත් වීම

**නිපුණතා මට්ටම :** 11.2 දකුණු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද ගණන :** 06

**ඉගෙනුම් පල :**
- දකුණු ඉන්දියාව ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑමට හේතු දක්වයි.
- ශ්‍රී ලංකා කෙරෙහි බලපෑම් ඇති කළ රාජ්‍යයන් හා ඒවායේ බලපෑම් විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.**

- **ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම් ඇති කළ දකුණු ඉන්දීය රාජ්‍ය**
  - පල්ලව, පාණ්ඩ්‍ය, චෝල, චාලුක්‍ය
- **ශ්‍රී ලංකාව කෙරෙහි දකුණු ඉන්දීය බලපෑම්වලට හේතු**
  - භූගෝලීය හේතු සාධක
  - දේශපාලන හේතු සාධක
  - ආර්ථික බලපෑම්
  - සමාජ හා සංස්කෘතික බලපෑම්
- **ශ්‍රී ලංකාවට සිදු වූ දකුණු ඉන්දීය බලපෑම්**
  **දේශපාලන බලපෑම්**

**වරින්වර ආක්‍රමණ එල්ල කිරීම**

| | |
|---|---|
| - ක්‍රි.පූ 3 වන සියවසේ සේන-ගුත්තික ආක්‍රමණය | - සුරතිස්ස රාජ්‍ය |
| - ක්‍රි.පූ 205 එළාරගේ ආක්‍රමණය | - අසේල රාජ්‍ය සමය |
| - ක්‍රි.පූ 103 සත් ද්‍රවිඩ ආක්‍රමණය | - වළගම්බා රාජ්‍ය සමය |
| - ක්‍රි.ව 432 සය ද්‍රවිඩ ආක්‍රමණය | - මිත්සෙන් රාජ්‍ය සමය |
| - ශ්‍රී මාර ශ්‍රී වල්ලභ | - පළමු වැනි සේන රාජ්‍ය සමය |
| - පළමු වැනි රාජරාජ හා දෙවෙනි රාජේන්ද්‍ර | - පස්වැනි මිහිඳු රාජ්‍ය සමය |

**ආධාරක සේනා ලබා ගැනීම**

- වරගුණවර්මන් පාණ්ඩ්‍ය රජු දෙවෙනි සේන රජුගෙන් ආධාර ඉල්ලා සිටීම
- දෙවෙනි රාජසිංහ මාරවර්මන් පාණ්ඩ්‍ය රජු පස්වන කාශ්‍යප රජුගෙන් ආධාර ඉල්ලා සිටීම
- රාජසිංහ හා පරාක්‍රම පාණ්ඩ්‍ය යන රජවරුන් පළමු වැනි පරාක්‍රමබාහු රජුගෙන් ආධාර ඉල්ලා සිටීම

**දේශපාලන අරමුණු මත විවාහ සබඳතා ගොඩනගාගැනීම**

- මහානාම හා චන්ද මුඛසීව රජවරුන් දකුණු ඉන්දීය කුමාරිකාවන් සරණපාවා ගැනීම

- පාණ්ඩ්‍ය කුමාරයකු විසින් පළමු වැනි විජයබාහු රජුගේ නැගණි මිත්තා කුමරිය විවාහ කර ගැනීම

**රාජ්‍ය පාලනතන්ත්‍රයට සිදු වු බලපෑම**

- විවිධ දකුණු ඉන්දිය නිලනාම භාවිතය (මෙයික්කාප්පර්, උල්වාඩු, කණක්කර්, වනුඩීන්, මෙලාට්සි, පෙරනාට්ටියම්, කෝල්පාට්ටි)

**ආර්ථික බලපෑම්**

- නානාදේශී, වලඤ්ජියාර්, අයිනූර්වර් වැනි දකුණු ඉන්දීය වෙළෙඳ ශ්‍රේණි පිළිබඳ ව ලංකාවේ මූලාශ්‍රයවල සඳහන් වීම

- වෙළෙන්දන්ගෙන් ලබාගත් තොරතුරු අනුව දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් ලංකාව ආක්‍රමණය කිරීම (1 රාජරාජ)

**සමාජ හා සංස්කෘතික බලපෑම්**

- හින්දු ආගමික සංකල්පවල බලපෑම
- දකුණු ඉන්දියාවේ පැවති කුල ක්‍රමය සහ හින්දු චාරිත්‍ර විධි ශ්‍රී ලංකාවේ සමාජයට එකතු වීම
- පල්ලව, පාණ්ඩ්‍ය, චෝල ගෘහනිර්මාණ සහ කලා සම්ප්‍රදායවල බලපෑම සිදු වීම
  උදාහරණඃ පොළොන්නරුවේ අංක 01 හා අංක 02 ශිව දේවාලය

**චෝල ගෘහනිර්මාණ ශිල්පය**

නාලන්දා ගෙඩිගෙය - පල්ලව ගෘහ නිර්මාණ ශිල්පය
ගඩලාදෙණි විහාරය - විජයනගර් ගෘහ නිර්මාණ ශිල්පය

**ශ්‍රී ලංකාට එල්ල වූ දකුණු ඉන්දීය බලපෑම්වල ප්‍රතිඵල**

- ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ද්‍රවිඩ රාජධානියක් ගොඩනැඟී තිබීම
- ද්‍රවිඩ භාෂාව හා හින්දු සංස්කෘතිය ලාංකික සමාජයට එකතු වීම
- ධාතුසේන රජුගෙන් පසු ව ලංකාවට පැමිණි දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් ධන සම්පත් කොල්ලකෑම, වැව් අමුණු විනාශ කිරීම ආදි විනාශකාරී ක්‍රියාවන් සිදු කිරීම නිසා රටේ පිරිහිමක් ඇති වීම
- සිංහල හා හින්දු (ද්‍රවිඩ) සංස්කෘතිය මිශ්‍ර වීම
- හින්දු ආගමේ දේව වන්දනාව බෞද්ධ ඇදහිලි සමඟ මිශ්‍ර වීම (විහාරස්ථානවල දේවාලය ඉදි කිරීම)
- පැරණි හින්දු දේවාලය රැසක් වර්තමානය තෙක්ම ශේෂ වීම
  (කෝණේශ්වරම් දේවාලයය, මුන්නේශ්වරම් දේවාලයය, තිරුකේතීශ්වරම් දේවාලයය )

ඇගයීම - 01

**අංක 01 සිට 02 තෙක් එක් එක් ප්‍රශ්න සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. චෝල 2. චේර 3. පාණ්ඩ්‍ය 4. වාකාටක 5. පල්ලව (..................)

02. 1. රාෂ්ට්‍ර 2. වලනාඩු 3. මණ්ඩලම් 4. නාඩු 5. කුරම් (..................)

**අංක (03) සිට (04) තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නම/ප්‍රකාශන/දින වකවනු සමූහයක් x සහ y තීරුවල දී ඇත. y තීරුවේ දී ඇති නම/ප්‍රකාශන/දින වකවනු x තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. y තීරුව x තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

03.

| | | x | | y |
|---|---|---|---|---|
| i | කඩුන්ගෝන් | A - | පල්ලව |
| ii | පළමු වැනි පුලකේශීන් | B - | රාෂ්ට්‍රකූට |
| iii | තුන් වැනි ගෝවින්ද | C - | චාලුක්‍ය |
| iv | සිංහවිෂ්ණු | D - | චෝල |
| v | විජයාලය | E - | පාණ්ඩ්‍ය |

1. ADCBE 2. BEDCA 3. CAEDB 4. DBAEC 5. ECBAD (..................)

04.

| | x | | y |
|---|---|---|---|
| i | තංජෝරයේ බෘහදීශ්වර දේවාලයය | A - | හොයිසාල |
| ii | එල්ලෝරයේ කෛලසනාථ දේවාලයය | B - | චාලුක්‍ය |
| iii | බදාමියේ විෂ්ණු මහා දේවාලයය | C - | රාෂ්ට්‍රකූට |
| iv | බෙලුර්හි චෙන්නකේශව දේවාලයය | D - | පල්ලව |
| v | මහා බලිපුරම්හි වෙරළේ දේවාලයය | E - | චෝල |

1. ADCBE 2. BEDCA 3. CAEDB 4. DBAEC 5. ECBAD (..................)

**අංක (05) සිට (07) තෙක් ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

05. මදුරෙයි කොණ්ඩෙයි විරුදය ලත් චෝල පාලකයා නම් කරන්න.

1. විජයාලය 2. පළමු වැනි රාජරාජ 3. පළමු වැනි රාජේන්ද්‍ර 4. පළමු වැනි ආදිත්‍ය
5. පළමු වැනි පරන්තක (..................)

06. දකුණු ඉන්දියාවට ආර්ය සභ්‍යත්වය ගෙනගිය මුනිවරයා කවරෙක් ද?

1. වාල්මිකි 2. විශ්වමිත්‍ර 3. වසුබන්ධු 4. භරත 5. අගස්ත්‍ය
(..................)

07. මුම්මුඩි චෝල යන විරුදය භාවිත කළ රජතුමා කවරෙක් ද?

1. පළමු වැනි ආදිත්‍ය 2. පළමු වැනි පරන්තක 3. පළමු වැනි රාජරාජ
4. පළමු වැනි රාජේන්ද්‍ර 5. පළමු වැනි කුලෝත්තුංග (..................)

**අංක (08) සිට (10) තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

08. චෝල පාලනය

1. චෝල පාලනයේ වැදගත් ම ලක්‍ෂණය වූයේ පළාත් පාලන ක්‍රමය යි.
2. චෝල නාගරික පාලනය පිළිබඳ අගනා විස්තර සංගම් සාහිත්‍යයෙන් හමු වේ.
3. චෝල පාලනයේ ප්‍රධානත්වය දරන ලද්දේ රජු ය.
4. රජුගේ පාලනය යටතේ වූ ප්‍රදේශ මණ්ඩලම් නම් වූ පළාත්වලට බෙදා තිබිණි.

**අංක (10) සිට (13) තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C), සහ (D)ල යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කීහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා, A හා B පමණක් නිවැරදි නම් 1 ද B හා C පමණක් නිවැරදි නම් 2 ද C හා D පමණක් නිවැරදි නම් 3 A හා C පමණක් නිවැරදි නම් 4 ද ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් 5 ද වරහන් තුළ තෝරා ලියන්න.**

10. පළමුවෙනි රාජරාජ

A. ඔහු විසින් ශ්‍රී ලංකාව යටත් කරගන්නා ලදි.

B. දකුණු ඉන්දියාවි ශක්තිමත් නාවික බලයක් වර්ධනය කරගත් ඔහු විසින් කේරළ රාජ්‍යයේ නාවික බලය විනාශ කරන ලදි.

C. මධුරෙයි ජය ගත් ඔහු විසින් පාණ්ඩ්‍ය රාජ්‍යය ද අල්ලා ගත්තේ ය.

D. තම බෙංගාල ජයග්‍රහණය සැමරීම සඳහා ඔහු විසින් නව අගනගරයක් ඉදි කරන ලදි.

(..................)

11. චාලුක්‍යයෝ

A.චාලුක්‍ය වංශයේ ආරම්භකයා පළමු කීර්තිවර්මන් ය

B.වාතාපියේ චාලුක්‍යයන්, කළ්‍යාණියේ චාලුක්‍යයන්, වෙංගි චාලුක්‍යයන් ලෙස මොවුහු කණ්ඩායම් තුනකට බෙදති.

C.මධුරෙයි ජයගත් කීර්තිවර්මන් විසින් පාණ්ඩ්‍ය රාජ්‍යය ද අල්ලා ගන්නා ලදි.

D.සිය බෙංගාල ජයග්‍රහණය සැමරීම සඳහා ඔහු විසින් නව අගනගරයක් ඉදි කරවන ලදි.

(..................)

12. චෝල පරිපාලනය

A.රාජධානියේ ඇතැම් ප්‍රදේශ සෘජුව ම රජු විසින් පාලනය කරන ලදි

B.රාජධානියේ ඇතැම් ප්‍රදේශ පාලනය කරන ලද්දේ චෝල පාලනය පිළිගත් යටත් පාලකයන් විසිනි

C.රජුට පාලනයේ දී සහාය වූයේ මන්ත්‍රී පර්ෂද් නැමැති උපදේශක සභාව යි

E.ශිව දෙවියන් ඇදහූවන් වූ චෝලයෝ තම රාජ්‍යය තුළ වෙනත් ආගම් ඇදහීමට අවසර නොදුන්හ

(..................)

**ඇගයීම -02**

01. චෝල පරිපාලනයේ දක්නට ලැබෙන මුඛ්‍ය ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14)

02. පළමු වැනි රාජේන්ද්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් චෝලයන්ගේ යුද්ධ ජයග්‍රහණ සාකච්ඡා කරන්න. (ලකුණු 14)

03. චෝලයන් යටතේ දකුණු ඉන්දියාවේ සිදු වූ සංස්කෘතික ප්‍රබෝධය පහත දැක්වෙන තේමා යටතේ විස්තර කරන්න.

i. ආගම ii. ගෘහනිර්මාණ ශිල්පය (ලකුණු 14)

04 .එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පිළිතුරු සපයන්න.

A- චෝල ප්‍රදේශීය පාලනයේ හා ග්‍රාම පාලනයේ මුඛ්‍ය ලක්ෂණ පරීක්ෂා කරන්න.

B- බෙංගාල යේ පාලවරුන්ගේ දේශපාලන හා සංස්කෘතික කාර්ය සංසිද්ධිය විභාග කරන්න.

(ලකුණු 14)

05. දකුණු ඉන්දීය සංස්කෘතියේ වර්ධනීය අවස්ථාවක් පල්ලව යුගය සටහන් කරයි.

I.පල්ලව ගෘහනිර්මාණ ශිල්පය හා සම්බන්ධ ප්‍රධාන මධ්‍යස්ථානවලින් එකක් නම් කරන්න.

(ලකුණු 01)

II.පල්ලව සංස්කෘතියේ අභිවර්ධනයට දායකත්වය සැපයූ පාලකයන් දෙදෙනෙකු නම් කරන්න.

(ලකුණු 02)

III.පල්ලව කලා හා ගෘහනිර්මාණ ශිල්පයේ ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

IV.ඉහත සඳහන් ප්‍රකාශය පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරෙන් පරීක්ෂා කරන්න.


(ලකුණු 07)

**ඇගයීම -03**

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න. ඉන් දෙකක් පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.

කාංචි, බදාමිය, මහාබලිපුරම්, තංජෝර්, කාවේරි නදිය, මදුරා,ගංගෙයිකොණ්ඩ චෝලපුරම්, මාමල්ලපුරම්

(ලකුණු 18)


යුරෝපා ඉතිහාසය

# 8. නැපෝලියන් බොනපාට් සහ ඔහුගේ අධිරාජ්‍යය

වසර ගණනාවක් පැවති අවුල් සහගත තත්ත්වයෙන් ප්‍රංශය මුදවාගෙන නැවත යථා තත්ත්වයට පත්කළ, ප්‍රංශ විප්ලවයේ දරුවා හෙවත් නැපෝලියන් බොනපාට් ප්‍රංශය ශක්තිමත් රාජ්‍යයක් බවට පත්කිරීම සඳහා ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කළේය. එමඟින් ප්‍රංශය ආර්ථික හා පරිපාලන අංශයන්ගෙන් සංවර්ධිත රටක් බවට පත් වූ අතර සංස්කෘතික අංශයෙන් ද දියුණුවක් ලැබී ය. ප්‍රංශය නැවත ගොඩනැගූ නැපෝලියන් බොනපාට් අනෙකුත් යුරෝපා රටවල් යටත් කරගෙන විශාල අධිරාජ්‍යයක් ගොඩනැංවී ය. නැපෝලියන්ගේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය නිසා අවසානයේ යුරෝපයේ නැපෝලියන් විරෝධී රටවල් ඒකරාශී වී 1815 දියත් කළ වෝටර්ලූ සටනින් නැපෝලියන් බොනපාට් පරාජය කරනු ලැබීය. මෙසේ නැපෝලියන් අධිරාජ්‍යයක් ගොඩනැගූ ආකාරයත්, ප්‍රංශය ප්‍රබල රාජ්‍යයක් බවට පත්කිරීම සඳහා අනුගමනය කළ දේශීය ප්‍රතිසංස්කරණ පිළිබඳ වත්, එම රාජ්‍යය බිඳ වැටීමට හේතු වූ කරුණු පිළිබඳ වත් සාකච්ඡා කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • ප්‍රබල පුද්ගලයන්ගේ වීරෝදාර ක්‍රියා ඉතිහාසය ගොඩනැඟීමට දායක වූ අයුරු පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 නැපෝලියන්ගේ ප්‍රතිසංස්කරණ ප්‍රංශ ජාතිකත්වය ගොඩනැඟීමට දායක වූ ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 20 යි.

**ඉගෙනුම් පල** :
- නැපෝලියන් බලවත් අධිරාජ්‍යයක් ගොඩනඟාගත් ආකාරය විස්තර කරයි.
- ශක්තිමත් අධිරාජයකු පරාජය වීමට හේතු දක්වයි.
- නැපෝලියන්ගේ අධිරාජ්‍යය සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

- **නැපෝලියන් බලවත් වීමට බලපෑ හේතු**
  - ප්‍රංශ විප්ලවයෙන් පසු රට තුළ ඇති වූ දේශපාලන අස්ථාවරභාවය නිසා ශක්තිමත් පාලනයක අවශ්‍යතාව ඉස්මතු වීම
  - නැපෝලියන්ට සහජයෙන් ම උරුම ව පැවති ධෛර්යය, කාර්ය ශූරත්වය හා අධිෂ්ඨාන ශක්තිය
  - ජනතාව නායකයකු වශයෙන් නැපෝලියන් පිළිගැනීම

- **නැපෝලියන්ගේ නැඟීම**
  - 1769 දී කෝර්සිකා දූපතේ ඇජැසියෝහි උපත ලද නැපෝලියන් පැරිසියට පැමිණ එහි අධ්‍යාපනය ලබා කාලතුවක්කු භටයෙකු වශයෙන් ප්‍රංශ යුධ හමුදාවට එක්වීම
  - 1793 දී එංගලන්ත හමුදාවට පහර දී ටූලෝං වරාය නිදහස් කොට ගැනීම. මෙය නැපෝලියන්ගේ නැඟීමේ ආරම්භය විය.
  - 1795 දී අධ්‍යක්ෂ මණ්ඩලයට විරුද්ධ ව පැන නැඟුණු මහජන කැරැල්ල මර්දනය කිරීම
  - 1796 දී ඉතාලියට විරුද්ධ ව මෙහෙයවන ලද හමුදාවේ නායකත්වය ගැනීම ඉතාලිය ආක්‍රමණය කිරීම, ඔස්ට්‍රියාව පරාජය කොට ඔස්ට්‍රියාව යටතේ තිබූ ඉතාලි රාජ්‍ය නිදහස්කොට ගැනීම
  - ඔස්ට්‍රියාව සමඟ කැම්පෝෆෝමියෝ ගිවිසුම අත්සන් තැබීම, උතුරු ඉතාලිය යටත් කොට ගැනීම.

- මෝල්ටාව අල්ලා ගැනීම
- ඊජිප්තුව ආක්‍රමණය කිරීම
- 1799දී අධ්‍යක්ෂ මණ්ඩලය බලයෙන් පහකොට කොන්සල් ක්‍රමයක් ඇති කිරීම, තිදෙනෙකුගෙන් සමන්විත වූ කොන්සල් මණ්ඩලයේ එක් කොන්සල්වරයෙකු බවට නැපෝලියන් පත්වීම
- 1799 දී පළමු වැනි කොන්සල් බවට පත්වීම
- 1802 දී යාවජීව කොන්සල් බවට පත්වීම
- 1804 දී ප්‍රංශ අධිරාජයා ලෙස ඔටුනු පැළඳීම
- ජනමත විචාරණයකින් අධිරාජ තනතුර තහවුරු කොට ගැනීම



*නැපෝලියන් බොනපාට් (source:http://deadliestfiction.wikia.com/wiki/Napoleon_Bonaparte)*

- **නැපෝලියන්ගේ දේශීය ප්‍රතිසංස්කරණ**
  - ප්‍රංශයේ බොනපාට් වාදය තහවුරු කිරීම
  - ප්‍රජාතන්ත්‍රවාදයට තරමක් දුරට ඉඩ ලැබීම
  - ඒකාධිපති පාලකයෙකු වුවත් මැතිවරණ පැවැත් වීම
  - දක්ෂතා අනුව තනතුරුවලට පත්වීමේ හැකියාව ලැබීම
  - පරිපාලනමය ප්‍රතිසංස්කරණ ඇති කිරීම
  - සංකේන්ද්‍රගත පාලන ක්‍රමයක් ඇති කිරීම
  - ප්‍රදේශීය පාලන කටයුතු සඳහා ප්‍රිෆෙක්ට්වරුන් පත් කිරීම
  - අධිරාජයා යටතේ විශ්වවිද්‍යාල පාලනය කිරීම

* අධ්‍යාපනය
- ද්විතීයික අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා ලයිසීස් (Lycees) නම් අධ්‍යාපන ආයතන පිහිටුවීම
- අධිරාජ්‍ය පාලනය තහවුරු කරගැනීමට අධ්‍යාපනය ආයුධයක් කොට ගැනීම
- ස්වභාවික විද්‍යා හැදෑරීම ධෛර්යමත් කිරීම
- විද්‍යාව, ගණිතය යන විෂයය පාසල්වල ඉගැන්වීම අවධාරණය කිරීම

* **ආගම**
- ආගමික සංවිධානය රාජ්‍යය යටතට ගැනීම
- 1801 දී පාප් තුමා සමඟ කොන්කෝඩාට් ගිවිසුම ඇති කොට ගැනීම
- රෝමානු කාතෝලික ආගම රාජ්‍යාගම ලෙස පිළිගැනීම
- පල්ලිය සතු ඉඩම් මහජනයා අතර බෙදා දීමට කටයුතු කිරීම

* **අධිකරණ කටයුතු**
- මුළු රටට ම පොදු අධිකරණ ක්‍රමයක් ඇති කිරීම
- නැපෝලියානු නීති සංග්‍රහය නමින් පොදු නීති සංග්‍රහයක් ඇති කිරීම
- ප්‍රධාන කොන්සල්වරයා විසින් විනිශ්චයකාරවරුන් පත් කරනු ලැබීම
- රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පරිපාලන උසාවි පිහිටු වීම
- ''ලෙත්‍රෙ දි කැචේ'' නම් වරෙන්තු ක්‍රමය නැවත ඇති කිරීම
- පෞද්ගලික නිදහස සීමා වීම
- පොත්පත්, පුවත්පත් නිදහස සීමා වීම

* **ආර්ථික ප්‍රතිපත්ති**
- ඒකීය මුදල් ක්‍රමයක් සහ බැංකු ක්‍රමයක් පිහිටුවීම
- ආනයන භාණ්ඩ සඳහා අධික තීරු ගාස්තු අය කිරීම
- ප්‍රංශයේ ගොවිතැන හා කර්මාන්ත දියුණු කිරීම, බීට් වගාව සහ සීනි නිශ්පාදනය වැනි කර්මාන්ත ඇරඹීම
- ආහාර මිල පාලනය කිරීම
- 1800 දී ප්‍රංශ මහ බැංකුව පිහිටුවීම
- ගොවීන්ට නිත්‍යානුකූලව ඉඩම් පවරා දීම
- කාර්යක්ෂම බදු ක්‍රමයක් ඇති කිරීම
- ප්‍රංශයේ කර්මාන්තවල දියුණුවක් ඇති වීම




*නැපෝලියන් විසින් නිකුත්කරන ලද රන් කාසි*
*(source:https://en.wikipedia.org/wiki/Napol%C3%A9on_(coin))*

* **පොදු ජන සේවා**
- ලූවර් කෞතුකාගාරය ඉදි කිරීම
- මංමාවත් හා ඇළමාර්ග දියුණු කිරීම
- මහජන උද්‍යාන ඇති කිරීම
- ප්‍රංශ ජනතාව තුළ ජාතිමාමකත්වය වර්ධනය කිරීම

- යුරෝපය පුරා ප්‍රංශයේ කීර්තිය පැතිරවීම



*ලූවර් කෞතුකාගාරය*

*(source:https://www.britannica.com/topic/Louvre-Museum)*





*නැපෝලියන් විසින් ගොඩනඟන ලද මංමාවත්*

*(source:https://www.france-voyage.com/tourism/napoleon-road-1451.htm)*

* **නැපෝලියන්ගේ විදේශ ප්‍රතිපත්තිය**

- ඔස්ට්‍රියන් හමුදා පරාජය කොට ඔස්ට්‍රියාව සමඟ කැම්පෝෆෝමියෝ ගිවිසුම අස්සන් කිරීම
- 1801 දී ඔස්ට්‍රියාව සමඟ ලුනෙවිල් ගිවිසුම අස්සන් තැබීම, ඒ අනුව සිසැල්පයින්, ලිගුරියන්, හෙල්වැටික් හා බතාවියානු සමූහාණ්ඩුවලට ප්‍රංශ ආධිපත්‍යය පිළිගැනීමට සිදු වීම
- ප්‍රංශයට එරෙහි ව ඔස්ට්‍රියාව, රුසියාව හා එංගලන්තය එක් ව සන්ධානයක් ගොඩනැංවීම
- 1802 දී එංගලන්තය සමඟ ඒමියන්ස් ගිවිසුම අස්සන් තැබීම

- 1805 ට්‍රැෆල්ගාර් සටනේ දී ඉංග්‍රීසීන් අතින් නැපෝලියන් පරාජයට පත් වීම
- 1805 ඔස්ටලිට්ස් සටනින් ඔස්ට්‍රියානු හා රුසියානු ඒකාබද්ධ හමුදා පරාජයට පත් කිරීම. ඔස්ට්‍රියාව සමඟ ප්‍රෙස්බර්ග් ගිවිසුම අස්සන් කිරීම
- ඔස්ට්‍රියානු ප්‍රදේශ රාශියක් එකතු කොට රයින් සංගමය පිහිටුවීම, මේ සමඟින් මෙතෙක් පැවති ශුද්ධ රෝම අධිරාජ්‍යය අවසාන වීම
- 1806 ජෙනා (ජිනා) සටනින් ප්‍රශියාව පරාජය කිරීම
- 1806 දී බර්ලින් හා මිලාන් ආඥා මඟින් මහාද්වීපික ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- 1807 ෆ්‍රීඩ්ලන්ඩ් සටනින් රුසියාව පරාජයට පත් කොට රුසියාව සමඟ ටිල්සිට් ගිවිසුම අස්සන් කිරීම
- ප්‍රෂියානු ප්‍රදේශ කීපයක් එකතු කොට වෙස්ට්ෆේලියා රාජ්‍යය පිහිටුවීම
- පෝලන්තයේ විශාල ප්‍රදේශයක් එක් කොට වෝර්සෝ ආදිපාද වසම පිහිටුවීම
- තමන් අල්ලාගත් ප්‍රදේශවල සමූහාණ්ඩු පිහිටුවා ඒවායේ පාලන කටයුතු සඳහා තම ඥාතීන් පත් කිරීම



*ඔස්ට්‍රියානු හා රුසියානු ඒකාබද්ධ හමුදා පරාජයට පත් කිරීම දැක්වෙන සිතුවමක්*
*(source: https://en.wikipedia.org/wiki/Napoleonic_Wars)*

- **නැපෝලියන්ගේ පරාජයට හේතු**

  - මහාද්වීපික ක්‍රමය ක්‍රියාත්මක කිරීම නිසා යුරෝපා රටවල් ප්‍රංශය සමඟ සතුරු වීම
  - නැපෝලියන් විසින් බිහි කරන ලද ජාතිකවාදී අදහස් නැපෝලියන්ගේ නැඟීමට මෙන් ම පරිහානියට ද බලපෑම
  - නැපෝලියන් යටතේ පැවති අධිරාජයේ විශාලත්වය නිසා පරිපාලන ගැටලු ඇති වීම
  - ඥාති සංග්‍රහය, තමන් යටත් කොටගත් ප්‍රදේශ පාලනය කිරීම සඳහා තම ඥාතීන් පත් කිරීම
  - පසු කාලය වන විට යුද සෙනෙවියන්ගේ කැප වීම හා උද්යෝගය අඩු වීම සහ ඔවුනොවුන් අතර ගැටුම් ඇති වීම
  - අර්ධද්වීපික යුද්ධය, ස්පාඤ්ඤය සමඟ ගෙනගිය සටන, ස්පාඤ්ඤයට ඉංග්‍රීසි ආධාර ලැබීම නිසා ශක්තිමත් වූ ස්පාඤ්ඤ හමුදා අතින් ප්‍රංශය පරාජයට පත් වීම
  - යුරෝපය පුරා ලිබරල්වාදී අදහස් පැතිරී යාම

- බ්‍රිතාන්‍ය නාවික බලයට මුහුණ දීමට තරම් ශක්තියක් ප්‍රංශ නාවික හමුදාවට නොතිබීම
- රුසියානු ආක්‍රමණයෙන් නැපෝලියන් අන්ත පරාජයට පත් වීම
- යුරෝපා බලවතුන් එක් වී නැපෝලියන්ට විරුද්ධ ව එක්සත් විමුක්ති ව්‍යාපාරයක් ආරම්භ කිරීම
- මිත්‍රජාතීන් එක් වී ලිප්සිග් සටනින් නැපෝලියන් පරාජය කිරීම
- නැපෝලියන් අධිරජ තනතුරෙන් පහ කොට සහ එල්බා දූපතට පිටුවහල් කිරීම
- නැපෝලියන් නැවත ප්‍රංශයට ගොඩබැසීම සහ ප්‍රංශ වැසියා ඔහු ආදරයෙන් පිළිගැනීම
- මිත්‍ර ජාතීන් එක් වී කළ සටනින් නැපෝලියන් පරාජයට පත් වීම
- ශාන්ත හෙලේනා දූපතට පිටුවහල් කිරීම
- ශාන්ත හෙලේනා දූපතේ දී (1812 දී) නැපෝලියන් මරණයට පත් වීම



*නැපෝලියන්ගේ රුසියානු ආක්‍රමණය*

*(source:https://en.wikipedia.org/wiki/French_invasion_of_Russia)*



ශාන්ත හෙලේනා දූපතෙහි වර්තමාන දර්ශනයක්

*(source: http://www.cruisemapper.com/ports/saint-helena-island-port-588)*

ඇගයීම 01

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරා වරහන් තුළ ලියන්න.**

1. 1. නයිල් සටන 2. ට්‍රැෆල්ගාර් සටන 3. සෙඩෑන් සටන 4. වෝටර්ලූ සටන 5. ඔස්ටර්ලිට්ස් සටන (.........)

2. 1. ජෝශප් බොනපාට් 2. ලුවී බොනපාට් 3. එලිසේ බොනපාට් 4. ජෝකීම් මුරාට් 5. ලුවී නැපෝලියන් (.........)

3. 1. තිමෝත් ගිවිසුම 2. ඒමියන්ස් ගිවිසුම 3. ලුනෙවිල් ගිවිසුම 4. ටිල්සිට් ගිවිසුම 5. කැම්පෝ ෆෝමියෝ ගිවිසුම (.........)

4. 1. ඔස්ට්‍රියාව 2. ප්‍රශියාව 3. ස්වීඩනය 4. රුසියාව 5. ස්පාඤ්ඤය (.........)

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු පහක් දක්වා ඇත. ඉන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරන්න.**

5. 1. ප්‍රදේශීය පරිපාලනය විධිමත් කිරීම
   2. ඒකාබද්ධ නීති සංග්‍රහය
   3. පුවත්පත් නිදහස ලබා දීම
   4. පාප් තුමා සමඟ ආගමික සමථයකට එළඹීම
   5. ප්‍රංශ මහා බැංකුව පිහිටුවීම (.........)

6. නැපෝලියන්ගේ විදේශ සම්බන්ධතා
   1. 1802 දී ඒමියන්ස් ගිවිසුම මගින් එංගලන්තය යටත් කිරීම
   2. රුසියාව සමග ටිල්සිට් ගිවිසුම අස්සන් කිරීම
   3. බර්ලින් ආඥා මගින් මහාද්වීපික ක්‍රමය ආරම්භ කිරීම
   4. 1812 මොස්කව් ආක්‍රමණය
   5. ප්‍රශියාව සමඟ ජෙනාහි දී සටන් වැදීම (.........)

ඇගයීම 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. ''නැපෝලියන් බොනපාට් ප්‍රංශ සමාජය කෙරෙහි චිරස්ථායී බලපෑමක් ඇති කළේ ය''
   i. නැපෝලියන් බොනපාට් උපන් ස්ථානය නම් කරන්න (ලකුණු 01)
   ii. ප්‍රංශ හමුදා විසින් ප්‍රථම වරට නැපෝලියන්ගේ නායකත්වය යටතේ ආක්‍රමණ කරන ලද රට නම් කරන්න (ලකුණු 01)
   iii. නැපෝලියන් ප්‍රංශයේ බලයට පත් වූ අයුරු සැකෙවින් දක්වන්න (ලකුණු 04)
   iv. ඔහුගේ දේශීය ප්‍රතිපත්ති විග්‍රහ කරමින් ඉහත ප්‍රකාශය විචාරාත්මක ව විමසන්න (ලකුණු 08)

2. නැපෝලියන් අනුගමනය කළ දේශීය ප්‍රතිපත්තිය පරීක්ෂා කරන්න (ලකුණු 14)

3." නැපෝලියන් බොනපාට් යුරෝපයේ සිටි ශ්‍රේෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රිකයකු ලෙස සැලකේ " පහත සඳහන් අංශ ඇසුරෙන් ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය අගය කරන්න
   i. දේශීය ප්‍රතිසංස්කරණ
   ii. යුරෝපය කෙරෙහි ඇති කළ බලපෑම (ලකුණු 14)

# 9. වියානා සම්මේලනය

1799 දී ප්‍රංශයේ ප්‍රධාන කොන්සල් තනතුරට පත් වූ නැපෝලියන් බොනපාට් 1807 පමණ වන විට යුරෝපයේ අතිවිශාල ප්‍රදේශයක තම අධිරාජ්‍ය ව්‍යාප්ත කොටගෙන තිබිණි. 1815 දී එංගලන්තය ප්‍රමුඛ යුරෝපා ජාතීන් විසින් ප්‍රංශයට එරෙහි ව කරන ලද වෝටර්ලූ සටනින් නැපෝලියන් පරාජයට පත් කොට ශාන්ත හෙලේනා දූපතට පිටුවහල් කිරීමත් සමඟ යුරෝපයේ නැපෝලියානු යුගය අවසන් විය. දශක එකහමාරක් පමණ කාලයක් තිස්සේ නැපෝලියන් ගෙනගිය ආක්‍රමණකාරී ක්‍රියා කලාපය නිසා අවුල් වී තිබූ යුරෝපා සිතියම නැවත සකස් කිරීමත්, යුරෝපා සාමය ආරක්ෂා කිරීමත් අරමුණු කොටගෙන බලවත් යුරෝපා රටවල නායකයෝ 1814 - 15 දී ඔස්ට්‍රියාවේ අගනුවර වූ වියානා නගරයට රැස් වූහ.

වියානා සම්මේලනය රැස්කිරිමට තුඩුදුන් හේතු , වියානා සම්මේලනයට සහභාගි වූ රටවල්, යුරෝපා සාමය රැකීම සඳහා සම්මේලන කරුවන් අනුගමනය කළ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සහ වියානා සම්මේලනය කෙතෙක් දුරට සාර්ථක වී ද යන්න විමසා බැලීම මෙම ඒකකයේ අරමුණ යි.

**නිපුණතාව** : • යුරෝපයේ ආරක්ෂාව සඳහා සියලු ජාතීන් අතර සාමූහික ක්‍රියා කිරීමේ ඇති වැදගත්කම පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 9.1. විවිධ කණ්ඩායම් එකතු වී සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :
- යුරෝපයේ සාමය ආරක්ෂා කර ගැනීම සඳහා වියනා සම්මේලනය ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.
- සාමය ආරක්ෂා කර ගැනීම සඳහා සම්මේලන ක්‍රමයේ ඇති වැදගත්කම විවේචනාත්මක ව පැහැදිලි කරයි
- වියනා සමුළුවෙන් පසු යුරෝපය සිතියමක ලකුණු කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

## 9.1 වියානා සම්මේලනය

ප්‍රංශ විප්ලවයෙන් හා නැපෝලියානු යුද්ධවලින් අවුල් වී ගිය යුරෝපය නැවත යථා තත්ත්වයට පත් කොට සාමය උදා කර දීමටත්, උදා කොට ගත් එම සාමය ආරක්ෂා කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා 1814 - 1815 දී බලවත් යුරෝපා රටවල නායකයන් ඔස්ට්‍රියාවේ අගනුවර වූ වියානා නගරයට එක් රැස් වී පැවැත්වූ සම්මේලනය වියානා සම්මේලනය නමින් හැඳින්වේ.

- **වියානා සම්මේලනයට සහභාගි වූ රටවල් සහ ඒවායේ නායකයෝ**

  - බ්‍රිතාන්‍යය - කාසල්රී
  - ඔස්ට්‍රියාව - මෙටර්නික්
  - රුසියාව - සාර් ඇලෙක්සැන්ඩර්
  - ප්‍රශියාව - තුන්වැනි ෆ්‍රෙඩ්රික් විලියම්
  - ප්‍රංශය - චාල්ස් ටැලිරැන්ඩ්
  - මෙටර්නික් සමුළුවේ සභාපතිවරයා ලෙස කටයුතු කිරීම

- **වියානා සම්මේලනය රැස් කිරීමට හේතු**
  - යුරෝපයේ යුද්ධ අවසන් කිරීම
  - සාමය උදා කිරීම හා උදා කොටගත් සාමය ආරක්ෂා කර ගැනීම
  - ප්‍රංශ විප්ලවය හා නැපෝලියානු යුද්ධ නිසා අවුල් වී තිබූ යුරෝපා සිතියම නැවත සකස් කිරීම
  - ප්‍රංශය තුළ අභ්‍යන්තර වශයෙන් වෙනස්කම් ඇති කිරීම
    * ප්‍රංශයේ ඇති කළ යුතු ආණ්ඩු ක්‍රමය කුමක් ද ?
    * ප්‍රංශයේ දේශසීමා කෙසේ සකස් කළ යුතු ද ?
    * නැවත ප්‍රංශය බලවත් වීම වැළැක්විය හැක්කේ කෙසේ ද ?
    * ප්‍රංශය ආක්‍රමණිකයා වශයෙන් සලකා ප්‍රංශයට දිය යුතු දඬුවම කුමක් ද යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට උත්සාහ කිරීම

- **සම්මේලන කරුවන් මුහුණ දුන් ගැටලු**
  - නැපෝලියන්ගේ ක්‍රියාකලාපය නිසා අවුල් වූ යුරෝපය නැවත පෙර තිබූ තත්ත්වයට ගෙන ඒම
  - ප්‍රංශය නැවත බලවත් වීම වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග තීරණය කිරීම
  - ප්‍රංශ විප්ලයේ අදහස් අනාගතයේ දී සෙසු යුරෝපා රටවල පැතිර යාමට තිබූ ඉඩකඩ ඇහිරීම
  - යුරෝපයේ සියලු ම රටවල ස්ථාවර ආණ්ඩු පිහිටුවීම

- **වියානා සම්මේලනය අනුගමනය කළ ක්‍රියාමාර්ග**
  - නීත්‍යානුකූලවාදය පිළිගැනීම (පැරණි රජ පෙළපත්වල හා අධිරාජ්‍යවල අයිතිවාසිකම් පිළිගැනීම)
  - ප්‍රංශය තුළ පැරණි රාජාණ්ඩුව යළි ස්ථාපිත කිරීම, ඒ අනුව බූර්බෝන් පෙළපතේ දහඅට වැනි ලුවී ප්‍රංශ රජු ලෙස පත් කිරීම
  - ප්‍රංශය, 1792 වන විට පැවති දේශ සීමාවලට සීමා කිරීම
  - ප්‍රංශය සතුව පැවති ඇතැම් ප්‍රදේශ අනෙකුත් රටවලට පවරා දීම. පාර්මා, මොඩෙනා, ටස්කනි ප්‍රදේශ හැප්ස්බර්ග් පාලකයන් වෙත පැවරීම
  - මෝල්ටා දිවයින, කේප් තුඩුව ආදිය බ්‍රිතාන්‍යන්ට පවරා දීම
  - ප්‍රංශය වටා බාධක රාජ්‍ය පිහිටුවීම


    උදා : - බෙල්ජියම ඔස්ට්‍රියාවෙන් ඉවත් කොට ඕලන්දය හා බෙල්ජියම ඒකාබද්ධ කිරීම
    - වෙනීෂිය, ලොම්බාර්ඩි යන ඉතාලි ප්‍රදේශ ඔස්ට්‍රියාවට ලබා දීම
    - පීඩ්මොන්ට් - සාර්ඩිනියා රාජ්‍යය ශක්තිමත් කිරීම
  - ප්‍රෂියාව බලවත් කිරීම සඳහා ප්‍රශියාවට අලුත් ප්‍රදේශ පවරා දීම

    ජර්මනියේ රයින් ගඟ අසල කුඩා රාජ්‍ය කිපයක්, සැක්සනියේ කොටසක් , වෙස්ට්ෆේලියා පොමරේනියා යන ප්‍රදේශ ප්‍රශියාවට ලබා දීම
  - නෝර්වේ ස්වීඩන් ඒකාබද්ධ කිරීම
  - ස්විට්සර්ලන්තය නිදහස් ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීම
  - ෆින්ලන්තය රුසියාවට පැවරීම
  - ප්‍රංශයට දඬුවම් නියම කිරීම

    ෆ්‍රෑන්ක් දශ ලක්ෂ 500ක යුද වන්දියක් ගෙවීමට නියම කිරීම

    වසර පහක කාලයක් තුළ ජයග්‍රාහී රටවල හමුදා ප්‍රංශය තුළ රඳවා තැබීම, ප්‍රංශය විසින් එම හමුදා වල වියදම් දැරිය යුතු වීම, ප්‍රංශය පැහැරගෙන තිබූ කලා කෘති ආපසු එම රටවලට දිය යුතු වීම


# වියානා සමුළුවෙන් පසු යුරෝපය



- **වියානා සම්මේලනයේ ප්‍රතිඵල**
  - යුරෝපයේ රටවල් අතර ඇති වන ප්‍රශ්න සාකච්ඡා මඟින් විසඳීම සඳහා සම්මේලන ක්‍රමය යොදා ගැනීම
    - * 1818 - අයිලා ෂැපෙල් සම්මේලනය
    - * 1820 - ට්‍රොපෝව් සම්මේලනය
    - * 1821 - ලයිබැක් සම්මේනය
    - * 1822 - වෙරෝනා සම්මේලනය
  - පරාජිත පක්ෂයට තදබල දඬුවම් නොපැමිණවීම
  - ප්‍රෂියාව බලවත් වීම
  - ප්‍රංශ ආක්‍රමණියකින් යුරෝපය ආරක්ෂා කිරීම සඳහා ප්‍රශියාවට යම් යම් ප්‍රදේශ ලබා දීමෙන් ප්‍රශියාව බලවත් වූ අතර ඉන් පසු යුරෝපා ජාතීන්ට ප්‍රශියාවෙන් ආරක්ෂා වීම සඳහා මාර්ග සෙවීමට සිදු වීම
  - මහා ජාතීන් විසින් කුඩා ජාතීන් නොසලකා හැරීම
  - මහා ජාතීන් තම අභිමතාර්ථ ඉටු කොට ගැනීම
  - ලිබරල්වාදී අදහස් යටපත් කිරීම
    ඔස්ට්‍රියාවේ මෙටර්නික් ලිබරල්වාදී අදහස් මර්දනය කිරීමට කටයුතු කිරීම
  - ජාතික හැඟීම් වර්ධනයට මඟ පෑදීම, ඉතාලියේ ජාතික හැඟීම් වර්ධනය වීම
  - යුරෝපයේ සාමය අවුරුදු 40 ක් පමණ ආරක්ෂා වීම
    (නැවත ජාත්‍යන්තර යුද්ධයක් ඇති වූයේ 1854 දී ක්‍රිමියන් යුද්ධයේ දී වීම)
  - පසුකාලීන ජාතීන් අතර ඇති වූ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා පූර්වාදර්ශයක් වීම
    1920 පිහිට වූ ජාතීන්ගේ සංගමයටත් 1945 පිහිටවූ එක්සත් ජාතීන්ගේ සංවිධානයටත් යුරෝපා සම්මේලන ක්‍රමය පූර්වාදර්ශයක් විය

- **සම්මේලන ක්‍රමය අසාර්ථක වීමට හේතු**
  - යුරෝපා බලවතුන් අතර එක්සත් කමක් නොතිබීම
  - රටවල් අතර ඇති වූ ප්‍රශ්නවලදී එංගලන්තය හා ප්‍රංශය එක් අදහසක සිටි අතර රුසියාව ඔස්ට්‍රියාව වැනි රටවල් එම අදහස්වලට විරුද්ධ වීම
  - එක් එක් රටවල පැවති ආණ්ඩුක්‍රම වෙනස් බැවින් එම ආණ්ඩු නොයෙක් ප්‍රශ්න සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති එකිනෙකට වෙනස් වීම
  - සම්මේලනවලට බොහෝ විට කැඳවනු ලැබුවේ බලවත් ජාතීන් පමණක් වීම
  - සම්මේලන ක්‍රමයේ අරමුණු නිශ්චිත හා පැහැදිලි නොවීම

*වියානා සමුළුව දක්වෙන සිතුවමක්*




*( source: https://www.britannica.com/event/Congress-of-Vienna)*

ඇගයීම 01

- **පහත එක් එක් ප්‍රශ්නය සඳහා නාම පද පහ බැගින් දී ඇත. ඒවායින් එකක් කුමන හේතුවක් නිසා හෝ අනෙක් ඒවා සමග නොගැළපේ. නොගැළපෙන නාමපදය තෝරා එහි අංකය තිත් ඉරමත ලියන්න**

1. 1. අයි-ලා-ෂැපෙල් 2. වෙරෝනා 3. ජෙනා 4. ලයිබැක් 5. ට්‍රොපෝව් (..............)
2. 1. කාසල්රී 2. මෙටර්නික් 3. ටැලිරැන්ඩ් 4. බිස්මාර්ක් 5. සාර් ඇලෙක්සැන්ඩර් (..............)
3. 1. එංගලන්තය 2. පෘතුගාලය 3. ප්‍රංශය 4. ඔස්ට්‍රියාව 5. ප්‍රශියාව (..............)

- **නොගැළපෙන ප්‍රකාශය තෝරා එහි අංකය තිත් ඉරමත ලියන්න**

4. 1815 වියානා සම්මේලනය
   1. යුරෝපා බලවතුන්ගේ නායකත්වයෙන් ආරම්භ විය
   2. මෙටර්නික් එහි නායකත්වය දැරී ය
   3. යුරෝපා සාමය ආරක්ෂා කිරීම එහි ප්‍රධාන අරමුණ විය
   4. මුහුදු කොල්ලකෑම් පිළිබඳ ව සාකච්ඡා විය
   5. ප්‍රංශ දේශ සීමා 1792 තිබූ සීමාවලට ගෙන එන ලදි (..............)

5. යුරෝපා සම්මේලන ක්‍රමය යටතේ පත් වන ලද සමුළු
   1. අයි-ලා - ෂැපෙල්
   2. ට්‍රොපෝව්
   3. ලයිබැක්
   4. බර්ලින්
   5. වෙරෝනා (..............)

- **අංක 06 සිට අංක 09 තෙක් ප්‍රශ්න සඳහා A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද, B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද, C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද, A හා D පමණක් නිවැරදි නම් අංක 4 ද, ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් අංක 5 ද වරහන් තුළ ලකුණු කරන්න**

6. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් වියනා සම්මෙලනය හා සම්බන්ධ ඒවා කවරේ ද?
   A - වියනා සමථය කෙරෙහි බලපෑ මූලික සංකල්පවලින් එකක් නම් නීත්‍යානුකූලවාදය පිළිබඳ මූල ධර්මය යි
   B - ප්‍රංශයේ දේශ සීමා 1792 තිබූ සීමාවට ගෙන එන ලදි
   C - සමුළුවේ නායකත්වය ප්‍රංශයට හිමි විය
   D - සමුළුවේ ප්‍රතිඵලයක් වශයෙන් ඔස්ට්‍රියාව බලවත් විය (.........)

7. පහත සඳහන් පුද්ගලයන් අතුරෙන් වියනා සම්මේලනයට සහභාගි වූවෝ කවරහු ද ?
   A- ටැලිරැන්ඩ් B- කාසල්රී C -17 වැනි ලුවී D- ලුවී නැපෝලියන් (...........)

8. පහත දැක්වෙන දෑ අතරින් වියානා සමථය අනුගමනය කළ ප්‍රතිපත්ති මොනවා ද ?
A - විප්ලවීය මූලධර්ම ක්‍රියාත්මක කිරීම
B - බල සමතුලිතතාව පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක කිරීම
C - යුරෝපයේ සාමය පවත්වා ගැනීම සඳහා සම්මේලන ක්‍රමය හඳුන්වා දීම
D - ජර්මනිය එක්සේසත් කිරීම (...........)

9. වියානා සම්මේලනයේ ප්‍රතිඵල මොනවා ද ?
A - ප්‍රශියාව කාර්මික අතින් බලසම්පන්න රටක් බවට පත් වීම
B - ස්විට්සර්ලන්තය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීම
C - ප්‍රංශයට ඇල්සේස් ලොරේන් ප්‍රදේශ හිමි වීම
D - නෙදර්ලන්තය හා බෙල්ජියම ඒකාබද්ධ වීම (...........)

**ඇගයීම 02**

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයන්න**

1. i. වියානා සම්මේලනයේ ප්‍රධාන පරමාර්ථ කවරේ ද? (ලකුණු 06)
ii. නූතන යුරෝපා ඉතිහාසයේ ලා වියානා සමථයේ ඇති වැදගත්කම නිදසුන් සහිත ව පරීක්ෂා කරන්න (ලකුණු 08)

2. පහත දැක්වෙන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් යුරෝපයට සාමය උදා කර දීමට 1815 වියානා සමථය කොතෙක් දුරට සමත් වී දැයි විමසන්න

i. වියානා සම්මේලනය විසින් විසඳිය යුතු වූ ප්‍රධාන ගැටලු
ii. සම්මේලනය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති
iii. සමථයේ සාර්ථකත්වය (ලකුණු 14)

3. " ප්‍රංශ විප්ලවය ඇතිවීමට පෙර යුරෝපයේ පැවති බොහෝ ලක්ෂණ යළි පිහිටුවීමට වියානා සම්මේලනය උත්සාහ කළේය."

i. වියානා සම්මේලනයේ වැදගත් භූමිකාවක් ඉටු කළ ඔස්ට්‍රියාවේ චාන්සලර්වරයා නම් කරන්න. (ලකුණු 01)
ii. වියානා සම්මේලනයට සහභාගි වූ තවත් රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
iii. වියානා සම්මේලනයේ ප්‍රධාන අරමුණු සැකෙවින් ලියා දක්වන්න. (ලකුණු 04)
iv. වියානා සම්මේලනයේ දී ගන්නා ලද තීරණ කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 07)

## 10. ලිබරල්වාදී සහ ජාතිකවාදී සංකල්පවල වර්ධනය

නිදහස හා දේශප්‍රේමය මුල් කරගනිමින් දහනව වැනි සියවසේ ලිබරල්වාදය හා ජාතිකවාදය යන බලවේග යුරෝපා දේශපාලන කටයුතු කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේ ය. කුඩා රාජ්‍යවලට කැඩී තිබූ යුරෝපා රටවල් කිහිපයක් මෙම සංකල්ප දෙකෙහි ආභාසයෙන් විශාල හා බලවත් රාජ්‍ය බවට පත් විය. ඉතාලිය හා ජර්මනිය මේ අතරින් ප්‍රධාන වේ. ලිබරල්වාදය හා ජාතිවාදය යන බලවේගවල වර්ධනය හා එම බලවේග ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක වූ ආකාරය කෙරෙහි මෙම ඒකකයේ දී අවධානය යොමු කරනු ලැබේ.

**නිපුණතාව** : • විවිධ දේශපාලන චින්තන ප්‍රායෝගික ලෙස ක්‍රියාවට පරිවර්තනය කළ ආකාරය පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම**: 10.1 ලිබරල්වාදී හා ජාතිකවාදී චින්තනවල වර්ධනය සහ ඒවා ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 25 යි

**ඉගෙනුම් පල** :
- දේශපාලන චින්තනවල වර්ධනයත් සමඟ විප්ලවීය බලවේග ඉස්මතු වූ ආකාරය විස්තර කරයි.
- ලිබරල්වාදී හා ජාතිකවාදී දේශපාලන චින්තන ප්‍රායෝගික ව භාවිත වූ ආකාරය පෙන්වා දෙයි.
- ඉතාලිය හා ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාර සිතියම් මඟින් පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

**10. ලිබරල්වාදී සහ ජාතිකවාදී සංකල්පවල වර්ධනය**

- **ලිබරල්වාදය**
  - දහනව වන සියවසේ යුරෝපයෙහි ක්‍රියාත්මක වූ ප්‍රධාන මතවාදයකි.
  - මහජන නියෝජිතයන්ගෙන් යුක්ත මණ්ඩලයක සහය ඇති ව සකස් වූ ව්‍යවස්ථානුකූල ආණ්ඩු ක්‍රමයක් මඟින් ජනතාවට සතුටුදායක පාලන ක්‍රමයක් ඇති කිරීම මෙහි දේශපාලන අරමුණ යි.
  - ආර්ථික ව්‍යාපාර රජයේ මැදිහත් වීමකින් තොර ව ක්‍රියාත්මක කෙරෙන නිදහස් ආර්ථික හා සමාජ රටාවක් ගොඩනැඟීම මෙම මතවාදයේ ප්‍රධාන ලක්ෂණයකි.

- **ජාතිකවාදය**
  - කිසියම් භූගෝලීය ප්‍රදේශයක් තුළ වෙසෙන්නා වූ ජන කොටස් සිය පොදු භාවය පදනම් කරගෙන ස්වකීය අනන්‍යතාව ගොඩනැඟීමේ දී ඔවුන් සියලු දෙනා ම එක ම ජාතිකත්වයක් තුළට ගැනීම අරමුණ වීම
  - වාර්ගික, භාෂාත්මක, ආගමික හා චාරිත්‍ර-වාරිත්‍රීය පොදු බව පොදු උරුමය ලෙස හැඳින්වේ. එකී පොදු හැඟීම නිසා ජනතාවගේ නිදහස වර්ධනය කරගැනීමට හැකි වීම

- **1815 න් පසු යුරෝපයේ ලිබරල්වාදී හා ජාතිකවාදී ව්‍යාපාරවල වර්ධනය**
  - ස්පාඤ්ඤයේ ජාතිකවාදී ලිබරල්වාදී බලවේගවල නැඟීම හා ඒවා මර්දනය කිරීම
  - රුසියාවේ ලිබරල්වාදී ඉල්ලීම් හා ඒවා මර්දනය කිරීම
  - 1820-21 ඉතාලියේ නේපල්ස් හා පීඩ්මොන්ට් ප්‍රදේශවල ඇති වූ කැරලි

- 1821 සිට 1829 තෙක් තුර්කි ආධිපත්‍යයෙන් නිදහස් වීම සඳහා ග්‍රීසිය නැගී සිටීම සහ 1829 ආද්‍රියානෝපල් ගිවිසුම මගින් ග්‍රීසියට නිදහස ලැබීම
- ග්‍රීසියට ස්වාධීනත්වය ලැබීම ජාතිකවාදය ලැබූ ජයග්‍රහණයක් වීම
- 1814 සිට 1848 තෙක් ප්‍රංශය තුළ දේශපාලන ස්ථාවරත්වයක් ඇති කර ගැනීමට දැරූ උත්සාහය සහ ඊට එල්ල වූ අභියෝග
- ඒ හා සමකාලීන ව අනෙකුත් යුරෝපා රටවල ජාතිකවාදී විප්ලව ඇති වීම (ඕලන්දය, බෙල්ජියම, ඉතාලිය, ජර්මනිය)
- මෙලෙස යුරෝපා සමාජයේ 1815 සිට 1848 තෙක් දක්නට ලැබුණ ප්‍රධාන ලක්ෂණයක් වූයේ ප්‍රතිගාමී රදලවාදී ආණ්ඩුක්‍රම නියෝජනය කරමින් පැවති තත්ත්වය රැක ගැනීමට අදහස් කළ කණ්ඩායමත්, මධ්‍යම පන්තිය නියෝජනය කරමින් පැරණි යුරෝපය වෙනස් කර ලිබරල් හා ජාතිකවාදී ප්‍රවණතා ප්‍රතිසංස්කරණ මඟින් ඉදිරියට ගෙන යාමට තැත් කළ කණ්ඩායමත් ගෙන ගිය දෑවැන්ත අරගලය යි.

- 1848 විප්ලව
  - 1848 වන විට යුරෝපය පුරා කැරලිකාර පසුබිමක් නිර්මාණය වීම
  - ප්‍රංශයේ ඇති වූ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ලුවී නැපෝලියන් බලයට පත් වීම
  - ඉතාලියේ ජාතිකවාදී, ලිබරල්වාදී ක්‍රියාමාර්ග
  - 1848 වර්ෂයේ ජර්මනියේ ක්‍රියාත්මක වූ ජාතිමාමක හා ලිබරල්වාදී බලවේග
  - ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය හැර යුරෝපයේ බොහෝ රටවල ජාතිකවාදී ලිබරල්වාදී ව්‍යාපාර අසාර්ථක වීම
  - බ්‍රිතාන්‍යය පමණක් විප්ලවකාරී ක්‍රියාමාර්ගවලින් තොර ව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම

- **ඉතාලිය එක්සත් කිරීම**
  - ඉතාලිය එක්සත් කිරීමට පෙර ඉතාලියේ පැවැති තත්ත්වය
  - ඉතාලියේ පැවැති දේශපාලන බෙදීම්
    * නේපල්ස් සහ සිසිලි ද්වීපත්, ස්පාඤ්ඤයේ බූර්බෝන් රාජවංශය යටතේ පාලනය වීම
    * රෝමය සහ මධ්‍යම ඉතාලිය පාප්තුමා යටතේ පාලනය වීම
    * පාර්මා, මොඩීනා සහ ටස්කනි, ඔස්ට්‍රියානු රජ පෙළපත් යටතේ පාලනය වීම
    * වෙනිස්, ලොම්බාඩි යන ප්‍රදේශ ඔස්ට්‍රියානු අධිරාජ්‍යය යටතේ පාලනය වීම
    * පීඩ්මොන්ට් හා සාර්ඩිනියා ඇතුළු ප්‍රදේශ ඉතාලි ජාතික සැවෝයි රජ පෙළපත යටතේ පැවතීම
  - නැපෝලියන්ගේ පාලනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉතාලි ජනතාව තුළ එක්සත් භාවය පිළිබඳ හැඟීමක් ඇති වීම
  - ජාතිකවාදී හැඟීම් වර්ධනය

- **ඉතාලිය එක්සත් කිරීමට දරන ලද ප්‍රයත්න හා ඊට සම්බන්ධ ව්‍යාපාර**

  ඉතාලියේ ජාතිකානුරාගය නැගීම
  - කාබොනාරි ව්‍යාපාරය
    * කාබොනාරි සංගමයේ මෙහෙයවීමෙන් ඔස්ට්‍රියානු ආධිපත්‍යයට විරුද්ධ ව නිදහස් සටන් ව්‍යාපාර ආරම්භ වීම
  - මැසිනිගේ තරුණ ඉතාලි ව්‍යාපාරය
  - ජියෝබර්ටිගේ නායකත්වය යටතේ නව ගුවෙල්ෆ් ව්‍යාපාරය ආරම්භ වීම
  - නව වැනි පියුස් පාප්තුමා ලිබරල්වාදී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීම
  - 1848 ඉතාලි විමුක්ති සටන
  - ප්‍රතිගාමිත්වය හිස එසවීම හා මේ ව්‍යාපාර අසාර්ථක වීම

- **ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයට දායක වුවෝ**
  - කවුන්ට් කැවුර් පීඩ්මොන්ට් රාජ්‍යයේ අගමැති තනතුරට පත් වීම
  - ඉතාලිය ආර්ථික අතින් සංවර්ධනය වීම
  - ලිබරල්වාදීන්ගේ සහය ඇති ව ඉතාලියේ ප්‍රතිසංස්කරණ සිදු කිරීම

  - ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ නායකත්වය පීඩ්මොන්ට් රාජ්‍යයට හිමි වීම
  - ක්‍රිමියානු යුද්ධයට සම්බන්ධ වීම
  - ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයට ප්‍රංශයේ හා බ්‍රිතාන්‍යයේ සහය ලබා ගැනීම
  - කවුන්ට කැවූර් හා ප්‍රංශයේ තුන්වැනි නැපෝලියන් ප්ලොම්බියර්ස් ගිවිසුම අස්සන් කිරීම

- ගැරිබෝල්ඩි
  - ඉතාලි වැසියන් තුළ ජාතික හැඟීම් වර්ධනය කිරීම
  - ගැරිබෝල්ඩිගේ රතු කමිස හමුදාව දකුණු ඉතාලියේ ප්‍රදේශ යටත්කොට පීඩ්මොන්ට් රජුට පැවරීම
    * රෝමය හැර පාප් රාජ්‍යයේ සියලු ප්‍රදේශ යටත් කර ගැනීම
    * 1866 වෙනීසිය ඈඳා ගැනීම
    * 1870 රෝමය ඈඳා ගැනීමෙන් ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරය සම්පූර්ණ වීම

**ජර්මනිය එක්සත් කිරීම**

- **ජර්මනිය එක්සත් වීමට පෙර පැවති දේශපාලන තත්ත්වය**
  - 1648 වෙස්ට්ෆේලියා ගිවිසුමේ ප්‍රතිඵලයක් වශයෙන් ජර්මනිය රාජ්‍ය ගණනාවකට වෙන් වී යාම
  - නැපෝලියන් බොනපාට් ජර්මන් ප්‍රදේශ ආක්‍රමණය කර රයින් සංගමය පිහිටු වීම
  - වියානා සමුළුවෙන් පසු නැපෝලියන්ගේ ප්‍රයත්නය බිඳ දැමීම
  - සොල්වරයින් සංගමය යටතේ ජර්මනියේ ආර්ථික එක්සත් භාවයක් ඇති වීම
  - ඔස්ට්‍රියාවේ චාන්සලර් මෙටර්නික් විසින් ලිබරල්වාදී අදහස් මර්දනය කිරීම
    උදාහරණ: කාල්ස්බාඩ් ආඥාව
  - 1830 හා 1848 කැරලි හා ඒවා අසාර්ථක වීම
  - 1848 ෆ්‍රැන්ක්පර්ට් පාර්ලිමේන්තුව හා 1848 විප්ලවය අසාර්ථක වීම


- **ජර්මනිය එක්සත් කිරීමෙහි ලා බිස්මාර්ක්ගේ දායකත්වය**

  - ඔටෝ ෆොන් බිස්මාර්ක් පිළිබඳ හැඳින්වීමක්
  - ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ නායකත්වය දැරීමට සුදුසු පරිදි ප්‍රසියාව ආර්ථික හා දේශපාලන වශයෙන් ශක්තිමත් කිරීමට ක්‍රියා කළ ආකාරය
  - බිස්මාක්ගේ රාජතන්ත්‍රික උපාය මාර්ගය වූ ''ලේ සහ යකඩ ප්‍රතිපත්තිය'' ප්‍රශියාවේ යුද හමුදාව ශක්තිමත් කිරීම
  - ෂෙල්ස්විග් හෝල්ස්ටයින් ප්‍රශ්නයේ දී ෂෙල්විග් ඈඳා ගැනීම
  - 1866 යුද්ධයෙන් ඔස්ට්‍රියාව පරාජයට පත් වීම
  - 1871 ප්‍රංශය පරාජය කිරීමෙන් ප්‍රශියාවේ නායකත්වය යටතේ එක්සත් ජර්මනිය බිහි වීම

ඉතාලිය එක්සත් කිරීම



ජර්මනිය එක්සත් කිරීම



ඇගයීම - 01

**නොගැළපෙන වචනය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

(1) 1. ජාතිකවාදය 2. කෝර්සිකාව 3. ස්පාඤ්ඤය 4. ග්‍රීසිය 5. රොඩේෂියාව
( ........... )

(2) 1. කාබොනාරී ව්‍යාපාරය 2. තරුණ ඉතාලි ව්‍යාපාරය 3. නව ගුවෙල්ප් ව්‍යාපාරය
4. දාස් කැපිටාල් ව්‍යාපාරය 5. ජාතිකවාදී ව්‍යාපාරය ( ........... )

(3) 1. ලුවී නැපෝලියන් 2. ඔටෝවෝන් ගැරිබෝල්ඩි 3. ජෝසෆ් මැසිනි
4. කැමිලෝ කැවූර් 5. ගුසෙප් ගැරිබෝල්ඩි

(4) 1. ලොම්බාර්ඩි 2. ටස්කනි 3. වයිමාර් 4. පීඩ්මොන්ට් 5. නේපල්ස් ( ........... )

(5) 1. ජර්මන් සංයුක්තය 2. රයින් සංගමය 3. සොල්වරයින් සංගමය 4. ගැස්ටියන් සම්මුතිය
5. ෆිලඩෙල්පියා සම්මුතිය ( ........... )

(6) **නොගැළපෙන යුගලය තෝරන්න**

1. මැසිනි - තරුණ ඉතාලිය
2. ගැරිබෝල්ඩි - රතු කමිස හමුදාව
3. සාර්ඩිනියාව - සැවෝයි රජ පෙළපත
4. කෙරන්ස්කි - රතු කමිස හමුදාව
5. සොල්වරයින් ගිවිසුම - ආර්ථික සංගමයකි ( ........... )

(7) **පහත x තීරුව y තීරුව හා ගැළපූ විට අනුපිළිවෙළ අනුව නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න**

| x | y |
|---|---|
| (1) මෙටර්නික් | A. ලිබරල් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම |
| (2) බිස්මාක් | B. දකුණු ඉතාලි ප්‍රදේශ අත්පත් කර ගැනීම |
| (3) නව වැනි පියුස් පාප්තුමා | C. එක්සත් ඉතාලියේ රජු ලෙස ඔටුනු පැලඳීම |
| (4) ගැරිබෝල්ඩි | D. ලේ සහ යකඩ ප්‍රතිපත්තිය |
| (5) වික්ටර් ඉමානුවෙල් | E. ලිබරල් අදහස් මර්දනය කිරීම |

1. EDABC 2. ACDBE 3. DECBA 4. ADBCE 5. EABDC ( ........... )

**මාතෘකාවට අදාළ ව නොගැළපෙන කරුණ තෝරා තිත් ඉර මත එහි අංකය සඳහන් කරන්න.**

(8) ඉතාලිය එක්සත් කිරීම

1. නැපෝලියන් බොනපාට්ගේ ඉතාලි ප්‍රතිපත්තිය ඉතාලි ජාතිමාමකත්වය අවධි කිරීමට වැදගත් සාධකයක් විය.
2. ඉතාලියේ තිබූ ඔස්ට්‍රියානු ආධිපත්‍යය හා බලපෑම ඉතාලිය එක්සත් කිරීමට තිබූ ප්‍රධාන බාධකයක් විය.
3. ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන නිර්මාපකයා කැවූර් ය.
4. සාර්ඩිනියා නායකත්වය යටතේ සෙල්වරීනය පිහිටුවනු ලැබී ය.
5. ඉතාලි එක්සත් බව 1870 දී සාක්ෂාත් කරගනු ලැබී ය.

( ........... )

(9) ජර්මනිය එක්සත් කිරීම
1. කවුන්ට් කැවූර් ප්ලොම්බියර්ස් ගිවිසුම අස්සන් කිරීම
2. බිස්මාක්ගේ රාජ්‍යතාන්ත්‍රික උපාය මාර්ග අනුගමනය කිරීම
3. ප්‍රසියාවේ නායකත්වයෙන් එක්සත් ජර්මනියක් බිහි කිරීම
4. ෂ්ලේස්විග් ඈඳා ගැනීම
5. සෙල්වරයින් සංගමය යටතේ ආර්ථික එක්සත් භාවයක් ඇති වීම ( ........... )

(10) ජර්මනිය එක්සත් කිරීමට පෙර
1. ජර්මනිය ප්‍රධාන ඒකක තුනකට බෙදී තිබීම
2. රයින් සංගමය පිහිටුවීම
3. සොල්වරයින් සංගමය යටතේ ආර්ථික එක්සත් බව ඇති වී
4. කාල්ස්බාඩ් ආඥාව
5. ෆ්‍රැන්ක්ෆර්ට් පාර්ලිමේන්තුව අසාර්ථක වීම ( ........... )

ඇගයීම - 02
**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. (i) ලිබරල්වාදය හා ජාතිකවාදය පැහැදිලි කරන්න. (ලකුණු 07)
(ii) යුරෝපය තුළ ලිබරල්වාදී හා ජාතිකවාදී ව්‍යාපාර වර්ධනය වූ අයුරු පැහැදිලි කරන්න (ලකුණු 07)

2. ''ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී ලිබරල්වාදී හා ජාතිකවාදී බලවේග ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක වීම දක්නට ලැබේ.'' මේ කියමන පරීක්ෂා කරන්න. (ලකුණු 14)

3. ''ජර්මනිය එක්සත් කළ හැක්කේ ලේ සහ යකඩ ප්‍රතිපත්තියකින් පමණක් බව බිස්මාක්ගේ විශ්වාසය විය''. ජර්මනිය එක්සත් කිරීමට බිස්මාර්ක් අනුගමනය කළ ක්‍රියාමාර්ගය මේ කියමන සමග කොතෙක් දුරට එකඟ වන්නේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 14)

ඇගයීම - 03

1. **පහත සඳහන් ස්ථාන යුරෝපා සිතියමක ලකුණු කරන්න.**
මිලාන්, ජිනෝවා, වෙනීසිය, බොලොඤ්ඤා, රෝමය, නේපල්ස්, ආද්‍රියාතික් මුහුද, සාර්ඩිනියා, කෝසිකා, සිසිලිය, ටයිරේනියන් මුහුද, රයින් ගඟ, එල්බ් ගඟ, ඩැනියුබ් ගඟ, පෝ ගඟ, විස්ටුලා ගඟ, බෝල්ටික් මුහුද, බෙල්ජියම, ලක්ෂම්බර්ග්, බැවේරියා, සයිලේෂියා, බර්ලින්, ඩැන්සිග්, බ්‍රැන්ඩන්බර්ග්

## 11. පළමුවෙනි ලෝක යුද්ධය

1871 දී ජර්මනිය එක්සත් වීමෙන් පසු එතෙක් යුරෝපයේ ප්‍රංශයට හිමි වී තිබූ ප්‍රධාන ස්ථානය අහිමි වී ජර්මනිය එම ස්ථානයට පත් විය. ඉන් පසු ජර්මනිය ක්‍රමයෙන් යුරෝපා ජාතීන් අතර ප්‍රමුඛස්ථානයට පත් විය. බලවත් රටවල් සමඟ මිත්‍ර සම්බන්ධතා තර කර ගනිමින් හැකි තාක් දුරට ප්‍රංශය යුරෝපයේ හුදෙකලා කිරීමේ ප්‍රතිපත්තියක් ජර්මනිය අනුගමනය කළේ ය. මේ කාලයේ දී ම ප්‍රංශය හා ජර්මනිය අතර තරගයක් ඇති විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් යුරෝපය ක්‍රමයෙන් පිල් දෙකකට බෙදී ගියේ ය. එම පිල් බෙදීමට අමතර ව දශක කිහිපයක් මුළුල්ලේ යුරෝපයේ ඇති වෙමින් පැවති විවිධ හේතු සාධක මුල් කොට ගනිමින් 1914 දී පළමු වැනි ලෝක සංග්‍රාමය ආරම්භ විය. අතිවිශාල මිනිස් ජීවිත සහ දේපළ ප්‍රමාණයක් විනාශ කරමින් ලොව පුරා ව්‍යාප්ත වුණු මෙම බිහිසුණු යුද්ධයට බලපෑ හේතු, යුද්ධයේ ප්‍රධාන අවස්ථා සහ එහි ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින්, යුද්ධයේ අතිබිහිසුණු බව හා සාමය රැක ගැනීමේ වැදගත්කම පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • බලය පිළිබඳ ව ඇති වන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැක ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 11.1 පළමුවෙනි ලෝක යුද්ධයේ විනාශකාරී බව පෙන්වා දෙයි

**කාලච්ඡේද** : **20යි.**

**ඉගෙනුම් පල** :
- ලෝක යුද්ධය සිදු වූ ආකාරය පැහැදිලි කරයි.
- ලෝක යුද්ධයේ ප්‍රතිඵල පෙන්වා දෙයි.
- ලෝක යුද්ධය හා සම්බන්ධ ස්ථාන, රටවල්, සිතියමක ලකුණු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

### 11.1 පළමු වැනි ලෝක යුද්ධය

- 1914 සිට 1919 තෙක් ලෝකය පුරා පැවති යුද්ධ මාලාව පළමු වැනි ලෝක යුද්ධය වශයෙන් හැඳින්වේ.

- **යුද්ධය ඇති වීමට බලපෑ ඓතිහාසික පසුබිම**

  - ආර්ථික හා සාංග්‍රාමික වශයෙන් ද නාවික බලයෙන් ද යුරෝපයේ අනෙක් සියලු රටවල් අබිබවා බ්‍රිතාන්‍යය ප්‍රබල ස්ථානයක පසුවීම
  - මෙතෙක් යුරෝපයේ බලවතා වී සිටි බ්‍රිතාන්‍යයත් මධ්‍යම යුරෝපයේ බලවතා ලෙස නැඟී එමින් සිටි ජර්මනියත් අතර පැවති මිත්‍ර සම්බන්ධතා පළුදු වෙමින් දෙරට අතර තරගකාරී තත්ත්වයක් මතු වීම(නාවික බලය සම්බන්ධ වේ)
  - යටත් විජිතකරණයේ ප්‍රධාන බලවතා වූ බ්‍රිතාන්‍යය අබිබවා එරට තරගකරුවා වූ ප්‍රංශය උතුරු, නැගෙනහිර හා බටහිර අප්‍රිකා ප්‍රදේශවලත් අග්නිදිග ආසියාවේත් විශාල ප්‍රදේශයක තම බලය තහවුරු කර ගැනීම
  - 20 වන සියවස වන විට ජපානය උතුරු පැසිපික් කලාපයේ බලවතා ලෙස නැඟී සිටිමින් ආසියාවේ ප්‍රදේශ රාශියක තම බලය පතුරුවා ගෙන සිටීම
  - බටහිර බලවතුන් මෙන් ම ජපානය හා රුසියාව ද චීනය කෙරෙහි අවධානය යොමු කරමින් නොසිටි අතර චීනය රුසියානු ජපාන හා බටහිර ජාතීන්ගේ බලපෑම්වලට නතු වීම
  - කෘෂිකාර්මික හා කාර්මික වශයෙන් සංවර්ධනය වෙමින් අමෙරිකා එක්සත් ජනපදය බටහිර අර්ධගෝලයේ බලවතා බවට පත් වීම

**පළමු වැනි ලෝක යුද්ධයට බලපෑ හේතු**

- **නව අධිරාජ්‍යවාදය**

  - ජර්මනිය, ඉතාලිය යන රටවල් යුරෝපයේ නව බලවතුන් ලෙස නැඟී සිටීම
  - කාර්මීකරණය නිසා ප්‍රධාන යුරෝපා රටවල ආර්ථික වර්ධනයක් ඇති වීම
  - පුළුල් වූ නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීම. මහා පරිමාණ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සහ අතිරික්ත මූලධනය ආයෝජනය කිරීම සඳහා වෙළෙඳ පොළවල් ලබාගැනීම නව අධිරාජ්‍ය වාදයේ අරමුණ වීම
  - ප්‍රංශය, බ්‍රිතාන්‍ය, පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ඉතාලිය බෙල්ජියම, ජර්මනිය ආදි රටවල් යටත් විජිත තරගයක නිරත වීම

- **අප්‍රිකාව සඳහා වූ තරගය**

  - 19 වන සියවස අග භාගය වන විට යුරෝපා ජාතීන් අප්‍රිකාව කෙරෙහි අවධානය යොමු කිරීම
  - අප්‍රිකාව සතු වටිනා ඛනිජ සම්පත් සූරාකෑම යුරෝපීයයන්ගේ අරමුණ වීම
  - බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ඕලන්දය, ස්පාඤ්ඤය, පෘතුගාලය, ඉතාලිය, බෙල්ජියම ආදි රටවල් අප්‍රිකා මහාද්වීපය බෙදා ගැනීම

- **බෝල්කන් ප්‍රශ්නය**

  - 19 වන සියවස අවසන් වන විට පරිහානියට පත්වෙමින් පැවති තුර්කි අධිරාජ්‍යයේ යටත් වැසියන් වූ ක්‍රිස්තු භක්තිකයන් තුර්කි අධිරාජ්‍යයට විරුද්ධ ව නැඟී සිටීම
  - රුසියාව තුර්කි අධිරාජ්‍යය බිඳදමා එම ප්‍රදේශවල නව ආධිපත්‍යය පැතිරවීමට අපේක්ෂා කිරීම
  - බ්‍රිතාන්‍යය, ප්‍රංශය වැනි යුරෝපා රටවල් ඊට විරුද්ධ ව තුර්කි අධිරාජ්‍යය තව දුරටත් ආරක්ෂා කොට ගැනීමට කටයුතු කිරීම
  - තුර්කි අධිරාජ්‍යය සතුව පැවති බොස්නියා-හර්සිගොවීනා ප්‍රදේශ ඔස්ට්‍රියාව විසින් ඈඳා ගැනීම
  - පළමු වැනි ලෝක යුද්ධයට ආසන්නතම හේතුව බෝල්කන් අර්බුදය මඟින් හටගැනීම - සරයේවෝ සිද්ධිය



*ෆර්ඩිනන්ඩ් යුවළ සරයේවෝ නුවර දී ඝාතනය කිරීමට මොහොතකට පෙර*
*(source:https://commons.wikimedia.org/wiki/File:The_Assassination_of_Archduke_Franz_Ferdinand,_June_1914)*

යුරෝපය දෙපිලකට බෙදීම

- ප්‍රංශය සතු ව පැවති ස්වාභාවික සම්පත් වලින් පොහොසත් ඇල්සාස්-ලොරේන් ප්‍රදේශ 1871 දී ජර්මනිය විසින් අල්ලා ගැනීම නිසා දෙරට අතර විරුද්ධත්වයක් හටගැනීම
- නව ජර්මන් අධිරාජ්‍යයේ ආරක්ෂාව සඳහා ප්‍රංශය හුදෙකලා කොට තැබීම අරමුණු කර ගෙන බිස්මාක් විසින් යුරෝපයේ මිත්‍ර සන්ධාන ක්‍රමය ආරම්භ කරනු ලැබීම
- බිස්මාක්ගෙන් පසු ජර්මන් විදේශ ප්‍රතිපත්තිය වෙනස් වී යාම
- යුරෝපයේ රටවල් එකිනෙකට විරුද්ධ බල කඳවුරු දෙකකට බෙදී යාම
- ප්‍රංශ - එංගලන්ත මිත්‍රත්වය හා ප්‍රංශ - රුසියානු මිත්‍රත්වය ජර්මනියට විරුද්ධ ව 1907 දී ඒකාබද්ධ වීම
- 1908 වන විට ජර්මනිය - ඔස්ට්‍රියාව හා ඉතාලිය සන්ධාන ගත වීම (අවසාන මොහොතේ ඉතාලිය ජර්මනියෙන් ඉවත් වී එංගලන්තය දෙසට හැරිණි.)
- බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව, ඉතාලිය සහ අමෙරිකා එක්සත් ජනපදය 'මිත්‍ර පිල' නමින් හා ජර්මනිය, ඔස්ට්‍රියාව, හංගේරියාව, තුර්කිය හා බල්ගේරියාව 'මධ්‍යම බලවතුන්ගේ පිල' නමින් හැඳින්වීම

- **යුද්ධයේ ප්‍රධාන අවස්ථා**

- 1914 ජූනි 28 වන දින ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා හා ඔහුගේ බිරිඳ ඉසබෙලා කුමරිය සරයේවෝහි දී සර්බියන් ජාතිකයකු විසින් ඝාතනය කිරීම නිසා සර්බියාවට විරුද්ධ ව ඔස්ට්‍රියාව යුද්ධ ප්‍රකාශ කිරිම
- රුසියාව සර්බියාවට ආධාර දීමට ඉදිරිපත් වීම නිසා ජර්මනිය රුසියාවට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කිරීම
- එංගලන්තය, ප්‍රංශය, ඉතාලිය ආදී රටවල් ඔස්ට්‍රියාවට එරෙහි ව පෙළ ගැසෙන්නට වූ අතර තුර්කිය, බල්ගේරියාව, හංගේරියාව ආදි රටවල් ඔස්ට්‍රියාවට පක්ෂ ව යුද්ධයට සහභාගි වීම.
- සටන් සිදු වූ පෙරමුණු:
  * බටහිර පෙරමුණ
  * නැගෙනහිර පෙරමුණ
  * අග්නිදිග යුරෝපීය පෙරමුණ
  * අප්‍රිකානු පෙරමුණ
  * නාවික සටන් (මුහුදු සටන්)
  * අමෙරිකා එක්සත් ජනපදය යුද්ධයට සහභාගි වීම



යුද්ධයේ අවස්ථාවක් *(sourse:http://spiritualpilgrim.net/03_World-War-One/02a_1914.htm)*

- **යුද්ධයේ ප්‍රතිඵල**

  - විශාල වශයෙන් දේපළ හා ජීවිත විනාශ වීම
  - ඒකාධිපති රාජාණ්ඩු බිඳවැටීම
    උදාහරණ: ඔස්ට්‍රියානු අධිරාජ්‍යය, හංගේරියානු අධිරජ්‍යය, තුර්කි අධිරාජ්‍යය
  - අමෙරිකාව ලෝක බලවතකු ලෙස නැඟී සිටීම

**වර්සායි ගිවිසුම**

- වරදකරුවා වශයෙන් සලකා ජර්මනියට වර්සායි ගිවිසුමෙන් දැඩි දඬුවම් පැමිණවීම
- ඇල්සාස් - ලොරේන් ප්‍රදේශ සහ සාර් නිම්නය ප්‍රංශයට ද ෂ්ලේස්විග් ප්‍රදේශය ඩෙන්මාර්කයට ද පවරා දීම
- ජර්මනිය සතු සියලු ම යටත් විජිත ජයග්‍රාහී පිලට ලබාදීම
- ජර්මනියේ යුද හමුදාව සෙබළුන් ලක්ෂයකට සීමා කිරීම සහ අනිවාර්ය යුද සේවය තහනම් කිරීම
- ජර්මනියේ නාවික ශක්තිය දුර්වල කොට යුද නැව්, සබ්මැරීන් ඉදි කිරීම සපුරා තහනම් කිරීම
- ජයග්‍රාහී පිල වෙත විශාල වන්දියක් ගෙවීමට ජර්මනියට නියම කිරීම




*සරුසාර ඇල්සාස් ලොරේන් ප්‍රදේශය* ***( source: https://destinationeuropeonline.com/blog/the-alsace-lorraine-region-is-a-wonderful-mix-of-french-and-german-culture-and-charm/)***

**යුරෝපා සිතියම වෙනස් කිරීම**

- තුර්කි අධිරාජ්‍යය යටතේ පැවති රාජ්‍ය කිහිපයක් එක් කොට යුගෝස්ලාවියාව නමින් නව රාජ්‍යයක් නිර්මාණය කිරීම
- මොරේවියාව, සුඩෙන්ටන්ලන්තය ආදි රාජ්‍ය එකතු කොට චෙකොස්ලෝවැකියාව නිර්මාණය කිරීම
- පෝලන්තයට ඩැන්සිග් වරාය සහ ඒ වෙත පිවිසීම සඳහා බිම් තීරුව ලබා දී නිදහස් රාජ්‍යයක් බවට පත් කිරීම. මේ නිසා නැගෙනහිර සහ බටහිර වශයෙන් ජර්මනිය දෙකඩ වීම
- රුමේනියාව, බල්ගේරියාව, නව රාජ්‍ය ලෙස බිහි වූ අතර තුර්කිය යුරෝපයෙන් ඉවතට තල්ලු වී යාම
- ෆින්ලන්තය, ලැට්වියාව ආදි රාජ්‍යවල ස්වාධීනත්වය පිළිගැනීම
- පැරණි රාජ්‍ය නාම වෙනුවට නව නම් යෙදවීම
  උදාහරණ : කොන්ස්තන්තිනෝපල් - ඉස්තාන්බූල්
  මෙසපොතේමියාව - ඉරාකය

## පළමු වැනි ලෝක යුද්ධයෙන් පසු යුරෝපය



- **ජාතීන්ගේ සංගමය පිහිටුවීම**

  - ලෝක සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා ජාතීන්ගේ සංගමය පිහිටුවා ගැනීම
  - පළමු වැනි ලෝක යුද්ධයෙන් පසු අමෙරිකානු ජනාධිපති වුඩ්රෝ විල්සන්ගේ සංකල්පයක් අනුව ජාතීන්ගේ සංගමය ආරම්භ වීම

  **ආරම්භය**
  - ජාතීන් අතර ආරවුල් සාකච්ඡා මඟින් සාමකාමී ව විසඳා ගැනීම
  - කුඩා රාජ්‍යයන්හි නිදහස හා ස්වෛරී භාවය ආරක්ෂා කර දීම
  - විශ්ව සාමූහිකත්වය මඟින් ලෝක සාමය ආරක්ෂා කොට ගැනීම
  - ජාතීන් අතර අවබෝධය හා සහයෝගීතාව වර්ධනය කිරීම
  - මානව වර්ගයාගේ සාමකාමී පැවැත්ම සඳහා අවශ්‍ය වෙනත් පියවර ගැනීම

- **ජාතීන්ගේ සංගමයේ යහපත් ලක්ෂණ**

  * ජගත් සංවිධාන සංකල්පය ඇති වීම
  * ජාත්‍යන්තර සංවිධාන ගොඩනැඟීම
    උදාහරණ: අධිකරණ, සෞඛ්‍ය, කම්කරු සංවිධාන
  - ජාත්‍යන්තර ගැටුම් නිරාකරණය කිරිම
    උදාහරණ: - 1921 ජර්මනිය හා නේපල්ස් අතර සයිලීෂියාව සම්බන්ධයෙන් ඇති වූ ගැටුම නිරාකරණය කිරීම
    - 1925 ග්‍රීසිය හා බල්ගේරියාව අතර ඇති වූ අර්බුදය නිරාකරණය කිරීම
    - 1926 මෝඩල් තෙල් බිම සම්බන්ධයෙන් ඉරාකය හා තුර්කිය අතර ඇති වූ අර්බුදය
  - මානව අයිතීන් තහවුරු කිරීම
    උදාහරණ:- සරණාගතයන් පුනරුත්ථාපනය කිරීම, වහල් වෙළෙඳාම හා මත් ද්‍රව්‍ය වෙළෙඳාම
    - තහනම් කිරිම
    - ලෙඩ රෝග මර්දනය කිරීම

- **ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට හේතු**

  - බලවත් ජාතීන් ඉවත් වීම. උදාහරණ: අමෙරිකා එක්සත් ජනපදය
  - පරාජිත ජාතීන් නොසලකා හැරීම.
    උදාහරණ: පළමු වැනි ලෝක යුද්ධයේ වරදකරුවා වූ ජර්මනියටත් රුසියාවටත් ජාතීන්ගේ සංගමයේ අසුන් නොලැබීම
  - මහා බලවතුන් අතර එකඟතාවක් නොමැති වීම
  - සංගමය සතු ජාත්‍යන්තර යුද හමුදාවක් නොතිබීම
  - නිරායුධ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු යැයි යෝජනා වුව ද ඒ සඳහා නිරායුධ කොමිසමක් පත් නොකිරීම
  - ලෝක සාමය පවත්වාගෙන යාමේ අරමුණ බිඳවැටීම
    උදාහරණ:
    * 1931 ජපානය මැංචූරියාව ආක්‍රමණය කිරීම
    * 1935 ඉතාලිය ඇබිසීනියාව ආක්‍රමණය කිරීම
    * 1938 දී ජර්මනිය, රයින්ලන්තය, චෙකොකස්ලෝවැකියාව ඈඳා ගැනීම වැනි අවස්ථාවල දී ජාතීන්ගේ සංගමය ඒවා වැළැක්වීමට අපොහොසත් වීම
    * 1933 - 1938 අතර කාලයේ ජර්මනිය, ඉතාලිය හා ජපානය ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම

ඇගයීම් - 01

**අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නාම පහ බැගින් දී ඇත. කවර හේතුවක් නිසා හෝ ඒවායින් එකක් නොගැළපේ. නොගැළපෙන නාමය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

01.) 1. ජර්මනිය 2. ඔස්ට්‍රියාව 3. එංගලන්තය 4. තුර්කිය 5. බල්ගේරියාව (........)

02.) 1. ලොයිඩ් ජෝර්ජ් 2. වින්සන්ට් චර්චිල් 3. ඕලැන්ඩෝ 4. ක්ලෙමන්සෝ 5. වුඩ්රෝ විල්සන් (........)

03.) 1. වර්සේල්ස් 2. සෙන්ට් ජර්මේන් 3. නියුලි 4. ෂෙල්ස්විග් 5. ලොසෑන් (........)

04.) x හා y තීරු නිවැරදි ව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | x | | y |
|---|---|---|---|
| 1. | යුගොස්ලාවියාව | A | වෝර්සෝ |
| 2. | චෙකොස්ලෝවැකියාව | B | බුකාරෙස්ට් |
| 3. | පෝලන්තය | C | බෙල්ග්‍රේඩ් |
| 4. | රුමේනියාව | D | සොෆියා |
| 5. | බල්ගේරියාව | E | ප්‍රාග් |

1) BACDE 2) EDCBA 3) CEABD 4) DECAB 5) EDACB (........)

05.) ජාතීන්ගේ සංගමය සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර තෝරන්න.
1. පළමු වැනි ලෝක යුද්ධයෙන් පසු සාමය ආරක්ෂා කර ගැනීම සඳහා පිහිටුවන ලදි
2. එය වුඩ්රෝ විල්සන්ගේ යෝජනාවක් මත පදනම් විය
3. ප්‍රංශය, එංගලන්තය, ඉතාලිය, රුසියාව සහ ජර්මනිය එහි ආරම්භක සාමාජිකයෝ වූහ
4. අනාගත ලෝක යුද්ධයක් වළක්වා ගැනීමට ජාතීන්ගේ සංගමය සමත් විය
5. ජාතීන්ගේ සංගමය ආරම්භ කිරීමට පුරෝගාමී වුව ද අමෙරිකාව එයට සහභාගි වූයේ නැත
(........)

ඇගයීම් - 02
**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

01. පළමු වැනි ලෝක යුද්ධයට හේතු වූ කරුණු සාකච්ඡා කරන්න. (ලකුණු 14)

02. පළමු වැනි ලෝක යුද්ධයේ ප්‍රතිඵල විස්තර කරන්න. (ලකුණු 14)

03. ''1919 වර්සායි ගිවිසුම පළි ගැනීමේ චේතනාව මුල් කොට ගෙන ඇති කරන ලද ප්‍රඥප්තියකි.''
i. පළමු වැනි ලෝක යුද්ධය ඇති වීමට බලපෑ ආසන්නතම හේතුව කුමක් ද? (ලකුණු 01)
ii. පළමු වැනි ලෝක යුද්ධයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහන් කරන්න. (ලකුණු 01)
iii. පළමු වැනි ලෝක යුද්ධයට බලපෑ හේතු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)
iv. වර්සායි ගිවිසුමේ වගන්ති පදනම් කොට ගෙන ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

04. ජාතීන්ගේ සංගමයේ සාර්ථක - අසාර්ථක භාවය සාකච්ඡා කරන්න. (ලකුණු 14)

ඇගයීම් - 03
01. පළමු වැනි ලෝක යුද්ධය හා සම්බන්ධ රටවල් සිතියමක ලකුණු කරන්න.

## 12. රුසියන් විප්ලවය

විසිවැනි සියවසේ මුල් දශක දෙක තුළ රුසියාවේ පැවති ඒකාධිපති වැඩවසම් සාර් පාලනයට එරෙහි ව ගොවි - කම්කරු පන්තිවල නැගී සිටීම හා අවසානයේ රුසියාව තුළ සමාජවාදී පාලන ක්‍රමයක් ඇති වීම රුසියානු විප්ලවය නමින් හැඳින්වේ. මෙම විප්ලවය මඟින් රුසියාවේ දේශපාලන ආර්ථික මෙන් ම සමාජීය අංශවල සිදු වූ පුළුල් වෙනස්කම්, එම වෙනස්කම් සෙසු රටවල් කරා ව්‍යාප්ත වූ ආකාරය මෙන් ම සමාජවාදය නව බලවේගයක් වශයෙන් ක්‍රියාත්මක වූ ආකාරය පෙන්වා දීම මෙම පාඩමේ මූලික අරමුණු වේ.

**නිපුණතාව** : • නූතන ලෝකය තුළ විවිධ දේශපාලන චින්තන ප්‍රායෝගික ලෙස ක්‍රියාවට පරිවර්තනය කළ ආකාරය පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම**: 12.1 රුසියානු විප්ලවය ලෝක බලවේගයක් වූ අයුරු පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :
- රුසියානු විප්ලවය විස්තර කරයි.
- විප්ලවයෙන් දිනාගත් සමාජවාදී සංකල්ප පැහැදිලි කරයි.
- සමාජවාදය ලෝක බලවේගයක් වූ ආකාරය පෙන්වා දෙයි.
- සමාජවාදය ව්‍යාප්ත වූ රටවල් සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

12.1 **රුසියානු විප්ලවය**
- **රුසියානු විප්ලවය හඳුන්වා දීම**
  - විප්ලවය අවස්ථා තුනක දී ක්‍රියාත්මක වීම
    * 1905 විප්ලවය
    * 1917 මාර්තු විප්ලවය
    * 1917 ඔක්තෝබර් විප්ලවය

- **රුසියානු විප්ලවයට බලපෑ හේතු**
  - බටහිර යුරෝපයේ එංගලන්තය, ප්‍රංශය ආදි රටවල් හා සසඳන කල රුසියාව සැම අංශයකින් ම පසුගාමී ව පැවතීම
  - 19 වන සියවසට පා තබන විට රුසියාව තුළ වෙනස්කම් රාශියක් සිදු වීම
    මහා පීටර්ගේ හා මහා කැතරින්ගේ පාලන අවධි
  - සමාජ සංස්කෘතික විෂමතාවලින් යුක්ත විශාල රාජ්‍යයක් පාලනය කිරීම අපහසු වීම නිසා සාර් පාලකයන් ඒකාධිපතිත්වයට යොමු වීම
  - ඒකාධිපති පාලකයන්ට පක්ෂපාත ගැති නිලධාරී පිරිසගේ පරිපාලන කටයුතු අතිශයින් දූෂිත වීම
  - ප්‍රවේණි දාසයන් මෙන් ම ගොවීන් ද බරපතළ ලෙස සමාජ අසාධාරණයට ලක් වීම
  - වෙළෙඳාම හා වාණිජ කටයුතු මුල් කරගෙන නගර රාශියක් වර්ධනය වීම හා විදේශ ආයෝජන වැඩි වීම
  - රටේ ආදායමෙන් විශාල ප්‍රමාණයක් ඉහළ නිලධාරීන්ගේ ප්‍රයෝජනයට යොදා ගැනීම
  - 19 වන සියවසේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාර - ප්‍රවේණිදාස විමුක්ති පනත
  - රුසියාව තුළ සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාර ක්‍රමයෙන් ශක්තිමත් වීම
  - සමාජවාදී චින්තනයේ වර්ධනය
  - සමාජවාදී පක්ෂවල වර්ධනය

**විප්ලවය ආසන්න සමයේ රුසියාවේ පැවති දේශපාලන, ආර්ථික හා සමාජ තත්ත්වය**

- **දේශපාලන**
  - දෙවන නිකලස් සාර් රජුගේ දූෂිත රාජාණ්ඩුව
  - 1905 රුසියානු - ජපන් යුද්ධයෙන් රුසියාව පරාජය වීම
  - 1905 මහා වැඩ වර්ජනය
  - 1906 සිට පත් කළ ඩූමාව අසාර්ථක වීම




*වැඩ වර්ජන* *(source; https://en.wikipedia.org/wiki/Russian_Revolution)*

- **ආර්ථික**
  - වැඩවසම් ආර්ථික ක්‍රමය දුර්වල වීම
  - ජනගහනය වැඩි වීම, විරැකියාව හා දිළිඳු බව වැඩි වීම
  - විදේශ ආයෝජන මඟින් ශ්‍රමය සූරා කෑම
  - ගොවි-කම්කරු හා මධ්‍යම පන්තිවල බහුතරය පීඩාවට පත් වීම
  - රුසියානු භාණ්ඩාගාරය පිරිහීම

- **සමාජීය**
  - ප්‍රබල මධ්‍යම පන්තියක් නොවීම
  - ආහාර අර්බුදය වර්ධනය වීම හා භාණ්ඩාගාරවල මිල ඉහළ යාම

- **විප්ලවය සිදු වූ ආකාරය**
  - 1917 මාර්තු විප්ලවය
  - කෙරෙන්ස්කිගේ මෙන්ෂෙවික් රජය අසාර්ථක වීම
  - 1917 ඔක්තෝබර් විප්ලවය
  - බොල්ෂෙවික්වරුන් බලයට පත් වීම හා සෝවියට් සමාජවාදී ආණ්ඩුව පිහිටුවීම



වීථිවලට බට රුසියානුවෝ



උද්ඝෝෂණ මර්දනය කිරීම

(source; https://en.wikipedia.org/wiki/Russian_Revolution)

- **විප්ලවයේ ජයග්‍රහණ හා එහි බලපෑම්**

  - ඒකාධිපති වැඩවසම් සාර් පාලනය බිඳ වැටීම
  - ලෙනින්ගේ මූලිකත්වයෙන් නව ආර්ථික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම
  - සාමාන්‍ය ජනතාවට ද පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව සැලසීම
  - ජෝශප් ස්ටාලින්ගේ පාලන අවධියේ සෝවියට් දේශය ප්‍රබල රටක් බවට පත් වීම
  - සමාජවාදී අදහස් හා පාලනය නැගෙනහිර යුරෝපයටත් සෙසු මහාද්වීපවලටත් පැතිරීම
    - * සමාජවාදී රටවල් - චීනය, කියුබාව, උතුරු කොරියාව, වියට්නාමය



*රජ පවුල* ( source **http://www.townandcountrymag.com/society/news/a3786/czar-nicholas-ii-exhumed/)**



*බලයට පත් ලෙනින්* ( *source:Phttps://www.britannica.com/event/Russian-Revolution-of-1917* )

ඇගයීම් 01

**අංක 01 සහ 02 ප්‍රශ්නවලට එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

1. රුසියානු විප්ලවය ඇති වීමට හේතු
   1. සාර් පාලකයන් ඒකාධිපති පාලනයක් ගෙනයාම
   2. පරිපාලන කටයුතු කළ නිලධාරීන් අතිශයින් දූෂිත වීම
   3. වැඩවසම් සමාජ ආර්ථික වැඩපිළිවෙළ තව දුරටත් ක්‍රියාත්මක වීම
   4. කාර්මික විප්ලවයේ බලපෑම් රට පුරා ක්‍රියාත්මක වීම
   5. සමාජවාදී චින්තනයේ වර්ධනයක් දක්නට ලැබීම ( ..................)

2. රුසියාව පාලනය කළ පාලකයන් වන්නේ
   1. පළමු වැනි ඇලෙක්සැන්ඩර් සාර්
   2. දෙවැනි ඇලෙක්සැන්ඩර් සාර්
   3. මහ පීටර් රජු
   4. හත් වැනි හෙන්රි රජු
   5. පළමුවෙනි නිකලස් රජු

(...............)

**අංක 3 හා 4 ප්‍රශ්නවලට පද යුගල එක බැගින් දී ඇත. ඒවා අතරින් එක් යුගලයක් නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.**

3. 1. දෙවෙනි ඇලෙක්සැන්ඩර් සාර් - ප්‍රවේණි දාසයන් නිදහස් කිරීම
   2. දෙවෙනි නිකලස් සාර් - ජපානය සමඟ කළ යුද්ධයෙන් පරාජය වීම
   3. කෙරෙන්ස්කි - මෙන්ෂෙවික් පක්ෂය
   4. වී.අයි. ලෙනින් - බොල්ෂෙවික් පක්ෂය
   5. ජෝසප් ස්ටාලින් - ට්‍රොට්ස්කි සමඟ ගැටුමෙන් පරාජයට පත් වීම (...............)

4. 1. රුසියානු යුද්ධය - 1905
   2. බෝල්ෂෙවික් විප්ලවය - 1917 ඔක්තෝබර්
   3. නිදහස සමානාත්මතාව හා සහෝදරත්වය - රුසියානු විප්ලවය
   4. වී. අයි. ලෙනින් මියයාම - 1924
   5. ජෝසප් ස්ටාලින් - පස් අවුරුදු සැලසුම්

(...............)

ඇගයීම් 02

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

(1) ''බෝල්ෂෙවික් විප්ලවය සමාජවාදී චින්තනයේ සුවිශේෂ ජයග්‍රහණයකි''

- i. බෝල්ෂෙවික් විප්ලවය ඇති වූ වර්ෂය සඳහන් කරන්න (ලකුණු 01)
- ii. මෙම විප්ලවයට නායකත්වය දුන් දෙදෙනෙකුගේ නම් ලියන්න (ලකුණු 02)
- iii. විප්ලව අවධියේ ජනතාවගේ ඉල්ලීම් වූයේ මොනවා ද ? (ලකුණු 03)
- iv. ඉහත සඳහන් ප්‍රකාශය බොල්ෂෙවික් විප්ලවයේ ප්‍රතිඵල ඇසුරින් සාකච්ඡා කරන්න (ලකුණු 08)

(2) i. 1917 බෝල්ෂෙවික් විප්ලවය ඇති වීමට තුඩු දුන් සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 06)
ii. එම විප්ලවයෙන් උද්ගත වූ ප්‍රතිඵල විග්‍රහ කරන්න. (ලකුණු 08)

**ඇගයීම් 03**

(1) ආදර්ශ ලෝක සිතියමක පහත සඳහන් සමාජවාදී රාජ්‍යයන් ලකුණු කර නම් කොට ඒවායින් කැමති රටවල් දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

| | |
|---|---|
| 1. රුසියාව | 5. කියුබාව |
| 2. පෝලන්තය | 6. චීනය |
| 3. හංගේරියාව | 7. වියට්නාමය |
| 4. බල්ගේරියාව | 8. උතුරු කොරියාව |

(නිවැරදි ව ලකුණු කිරීමට ලකුණු 01ක් හා කෙටි ඓතිහාසික සටහන්වලට ලකුණු 05ක් බැගිනි)

# 13. දෙවෙනි ලෝක යුද්ධය

පළමු වැනි ලෝක සංග්‍රාමය නිසා ලෝකයේ බොහෝ රටවලට බිහිසුණු විනාශයකට මුහුණ දීමට සිදු වූ අතර නැවත එවැනි විනාශකාරී යුද්ධයක් ඇතිවීම වැළැක් වීම පිණිස ලෝක නායකයන් එක් ව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළ නමුත්, වැඩි කලක් යාමට පෙර ජර්මනියේ නට්සි නායක ඇඩොල්ෆ් හිට්ලර්ගේ ක්‍රියාකලාපයේ ප්‍රතිඵලයක් වශයෙන් 1939 දී දෙවෙනි ලෝක සංග්‍රාමය ආරම්භ විය.

පළමු වැනි ලෝක යුද්ධය අවසානයේ ඇති කරන ලද වර්සායි ගිවිසුම මගින් ජර්මනියට පමුණුවන ලද දඬුවම් නිසා පසුකාලයේ හිට්ලර් වැනි නායකයකුට ජර්මනියේ බලයට පත්වීමේ අවස්ථාව ලැබිණි. 1933 දී ජර්මනියේ බලයට පත් වූ හිට්ලර් අතර ඔහු විසින් අනුගමනය කරන ලද ක්‍රියාකලාපයේ ප්‍රතිඵලයක් වශයෙන් 1939 සැප්තැම්බර් 01 දින දෙවන ලෝක යුද්ධය ආරම්භ විය. මේ හැරෙන්නට ලෝක සාමය ආරක්ෂා කිරීමේ අරමුණෙන් පිහිටුවන ලද ජාතීන්ගේ සංගමයේ දුර්වලතා මෙන් ම ඉතාලියේ මුසෝලිනි ගේ ක්‍රියාකලාපය හා ජපානය ගෙනගිය ආක්‍රමණශීලී ක්‍රියාකලාපය ද දෙවෙනි ලෝක යුද්ධය ඇති වීමට බොහෝ දුරට බලපෑවේ ය.

දෙවන ලෝක යුද්ධය මහාද්වීප කීපයක් පුරා පැතිරී ගිය අතර බ්‍රිතාන්‍යය යුද්ධයට සහභාගි වීමත් සමග බ්‍රිතාන්‍ය යටත් විජිත කරා ද යුද්ධය ව්‍යාප්ත විය. ජපානය, අමෙරිකා එක්සත් ජනපදය සතු පර්ල් වරායට පහරදීම නිසා අමෙරිකා එක්සත් ජනපදය ලෝක යුද්ධයට අවතීර්ණ විය. අමෙරිකා එක්සත් ජනපදය ජපානයේ හිරෝෂිමා නාගසාකි නගරවලට පරමාණු බෝම්බ හෙළීමත් සමග ජපානය පරාජය වූ අතර අති විශාල ජීවිත හා දේපොළ ප්‍රමාණයක් ලෝකයට අහිමි කරමින් දෙවන ලෝක යුද්ධය අවසන් විය.

මේ තත්ත්වය කෙරෙහි ලෝක බලවතුන්ගේ අවධානය යොමු වූ අතර 1945 දී ලෝක බලවතුන් එක් වී අමෙරිකා එක්සත් ජනපදයේ සැන් ෆ්‍රැන්සිස්කෝ නුවර දී සම්මත කොටගත් ප්‍රඥප්තියට අනුව ලෝක සාමය රැකීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සංගමය පිහිටුවනු ලැබී ය. විවිධ බාධා එල්ල වුව ද ලෝක සාමය රැකගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් මේ වන තෙක් ම වැදගත් සේවයක් සිදු වී තිබේ. දෙවෙනි ලෝක යුද්ධයට හේතු, යුද්ධයේ ස්වරූපය හා එහි ප්‍රතිඵල මෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය හා ඉන් සිදු වූ සේවය ආදිය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • බලය පිළිබඳ ව ඇතිවන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැක ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 13.1. දෙවෙනි ලෝක යුද්ධයේ විනාශකාරි බව පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 28 යි.

**ඉගෙනුම් පල** :
- දෙවෙනි ලෝක යුද්ධයේ ආරම්භය හා ව්‍යාප්තිය පැහැදිලි කරයි.
- දෙවෙනි ලෝක යුද්ධයේ ප්‍රතිඵල විග්‍රහ කරයි.
- දෙවෙනි ලෝක යුද්ධ සමය සහ පසුකාලයේ ලෝකය සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**13.1 දෙවෙනි ලෝක යුද්ධය**

1939 සැප්තැම්බර් 01 දින ඇඩොල්ෆ් හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීමෙන් දෙවන ලෝක යුද්ධය ආරම්භ විය.

**දෙවෙනි ලෝක යුද්ධය ඇති වීමට බලපෑ හේතු**

- ජර්මනියේ වෛමාර් සමූහාණ්ඩුවේ දුර්වලතා
    - දේශපාලන වශයෙන් ස්ථිර ආණ්ඩු පිහිටුවාගත නොහැකි වීම

- දේශපාලන අස්ථාවර භාවය
- ආර්ථික උද්ධමනය
- විරැකියාව
- ආහාර හිඟය
- ඒකාධිපතියකු බිහි වීමට සුදුසු පරිසරයක් සකස් වීම
- හිට්ලර් බලයට පත්වීම
- ජර්මනිය යළි ගොඩනැගීම

- **වර්සායි ගිවිසුමේ දුර්වලතා**
    - ජර්මනියට අසාධාරණ දැඩි දඬුවම් පැමිණවීම
    - ජර්මනියෙන් අසාධාරණ ලෙස වන්දි මුදල් අය කිරීම
    - ජර්මනිය සතු ව පැවති යටත් විජිත අහිමි කිරීම

- **ෆැසිස්ට් වාදයේ හා නට්සි වාදයේ නැගීම**
    - හිට්ලර් - මුසෙම්ලිනි මිත්‍රත්වය
    - ආර්ථික හා යුද්ධ කටයුතු පිළිබඳ සහයෝගය

- **ඉතාලියේ මුසෝලිනිගේ ක්‍රියාකලාපය**
    - මුසෝලිනී ඉතාලියේ බලයට පත් වීම
    - ෆැසිස්ට් පක්ෂය හැර අන් සියලු පක්ෂ තහනම් කිරීම
    - දැඩි පුවත්පත් වාරණය
    - අධ්‍යාපනය දැඩි ලෙස පාලනය කිරීම හා ෆැසිස්ට් ක්‍රමය ප්‍රචාරය කිරීමට අධ්‍යාපනය යොදා ගැනීම
    - වෘත්තීය සමිති ෆැසිස්ට් පාලනය යටතට ගැනීම
    - පාප් වහන්සේ සමඟ ගිවිසුමකට එළඹීම
    - ඇබිසීනියාව ආක්‍රමණය කිරීම

- **හිට්ලර්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්ති**
    - මයින් කාම්ෆ් (මගේ සටන) කෘතිය ප්‍රකාශයට පත් කිරීම
    - හිට්ලර් ජර්මනියේ චාන්සර්ලර් තනතුරට පත් වීම
    - ජනාධිපති හින්ඩන්බර්ග් මියයාමෙන් පසු හිට්ලර් ජර්මනියේ ජනාධිපති තනතුරට පත් වීම
    - විරුද්ධ වාදීන් විනාශ කිරීම - චරපුරුෂ සේවයක් ඇති කොට ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් මර්දනය කිරීම
    - සිවිල් අයිතිවාසිකම් අවලංගු කිරීම
    - අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය අහෝසි කිරීම
    - අධ්‍යාපන කටයුතු පාලනය තමා යටතට ගැනීම
    - යුදෙව්වන්ට දරුණු වධ හිංසා පැමිණවීම
    - වෘත්තීය සංගම් තහනම් කිරීම
    - ජර්මනියේ ආර්ථිකය නගා සිටුවීම
    - ප්‍රවාහණ කටයුතු දියුණු කිරීම
    - අනිවාර්ය යුද සේවය ආරම්භ කොට යුද හමුදාව ශක්තිමත් කිරීම
    - ජර්මනිය අවි ආයුධ අතින් සන්නද්ධ කිරීම
    - වර්සායි ගිවිසුමේ වගන්ති කඩ කරමින් දේශ සීමා පුළුල් කොට ගැනීම
    - රයින්ලන්තය ඈඳා ගැනීම
    - සුඩෙටන්ලන්තය ආපසු ලබා ගැනීම
    - චෙකොස්ලෝවැකියාව අල්ලා ගැනීම
    - ඔස්ට්‍රියාව අල්ලා ගැනීම



හිට්ලර් යටතේ ජර්මනියේ මාර්ග සංවර්ධන කටයුතු

*( Source: http://weimarandnazigermany.co.uk/autobahn/#.WmW0AYVOKUk )*



හිට්ලර් සමයේ යුද හමුදා අවශ්‍යතා සඳහා නිපදවන ලද වොක්ස්වගන් රථ

(*source: http://warfarehistorynetwork.com/daily/wwii/the-nazi-porsche-adolf-hitler-and-the-volkswagen-beetle/*)

- **ජපානය පෙරදිග බලවතකු ලෙස නැගී සිටීම**
  - විසිවැනි සියවසේ මුල් කාලය වන විට ජපානය ලෝකයේ ඉතා දියුණු රටක් බවට පත් වීම
  - ජපානයේ ඇතිවූ ශීඝ්‍ර ආර්ථික වර්ධනය
    - * ධනවාදී ආර්ථිකය
    - * කර්මාන්ත වර්ධනය
    - * තාක්ෂණික දියුණුව
  - ජපානය ආසියාවේ අධිරාජ්‍යයක් පිහිටුවා ගැනීමට උත්සාහ දැරීම
    - * උදාහරණ: කොරියාව සම්බන්ධ ව චීන ජපාන ගැටුම
    - * රුසියානු ජපාන යුද්ධය
    - * අමෙරිකාව සතු ආසියානු ප්‍රදේශ අල්ලා ගැනීම
  - ජපානයේ යුධ ජයග්‍රහණ හා ව්‍යාප්තිය වැළැක්වීමට අමෙරිකාව ඇතුළු යුරෝපා රටවල් කටයුතු කිරීම




*පර්ල් වරාය - ජපානය පහර දීමට පෙර*

***( Source:http://worldwar2headquarters.com/HTML/PearlHarbor/us-consequences.html)***



*ජපානය පර්ල් වරායට පහර දීම* ( source: ***https://www.britannica.com/event/Pearl-Harbor-attack)***

- **යුද්ධයේ ආරම්භය**
  - 1939 සැප්තැම්බර් 01 දින හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීම
  - එයට ප්‍රතිචාර වශයෙන් බ්‍රිතාන්‍යය හා ප්‍රංශය ජර්මනියට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කිරීම
- **යුද්ධයේ ව්‍යාප්තිය**
  - යුරෝපය තුළ කඳවුරු තුනක් බිහි වීම හා ඔවුනොවුන් අතර තිබූ සැකය
    - * ජර්මනිය හා ඉතාලිය
    - * බ්‍රිතාන්‍යය හා ප්‍රංශය
    - * රුසියාව
  - නට්සි - කොමියුනිස්ට් සාම ගිවිසුම
  - ජාතීන්ගේ සංගමයේ දුර්වලතා
  - ආසන්නතම හේතුව - හිට්ලර් විසින් පෝලන්තය ආක්‍රමණය කිරීම
  - ජපානය පර්ල් වරායට පහර දීමත් සමඟ අමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පක්ෂය ගනිමින් දෙවෙනි ලෝක යුද්ධයට සම්බන්ධ වීම
  - දෙවෙනි ලෝක යුද්ධයේ පස මිතුරු පාර්ශ්ව කරුවන්
    - * මිත්‍ර පක්ෂය - එංගලන්තය, ප්‍රංශය, රුසියාව, අමෙරිකා එක්සත් ජනපදය
    - * අක්ෂ පක්ෂය - ජර්මනිය, ඉතාලිය, ජපානය
  - යුරෝපයේ බලවතුන් පිල්වලට බෙදෙමින් යුද හමුදා තර කිරීම
  - යුද්ධයේ ප්‍රධාන පිල් සහ සටන් පෙරමුණු
  - හිට්ලර් නව යුද්ධ උපාය මාර්ග භාවිත කිරීම
  - ''බ්ලිට්ස්ක්‍රිග්'' ක්‍රමය හෙවත් ක්ෂණික ප්‍රහාර එල්ල කිරීම
  - අතිදියුණු යුද ටැංකි භාවිතය
  - ප්‍රහාරක අහස් යානා යොදා ගැනීම
  - කාර්යක්ෂම චරපුරුෂ සේවය
  - 1940 දී හිට්ලර්, නෝර්වේ - ස්වීඩන් ආක්‍රමණය කොට ජය ගැනීම
  - ඕලන්දය හා බෙල්ජියම සටන් කිරීම
  - ප්‍රංශය පරාජය කිරීම
  - බ්‍රිතාන්‍යයට එරෙහි සටන
  - බෝල්කන් ප්‍රදේශ යටත් කිරීම
  - සෝවියට් දේශය ආක්‍රමණය කිරීම
  - අමෙරිකා එක්සත් ජනපදය හා ජපානය යුද්ධයට අවතීර්ණ වීම



*හිට්ලර්ගේ යුද හමුදාව*

***(SOURCE: HTTP://WWW.ALAMY.COM/STOCK-PHOTO-NAZI-LEADER-ADOLF-HITLERS-ARMY-IN-1945-69276282.HTML)***

- **යුද්ධයේ අවසානය**
  - සෝවියට් හමුදා අතින් ජර්මන් හමුදා පරාජයට පත් වීම
  - බ්‍රිතාන්‍ය හා අමෙරිකා එක්සත් ජනපද හමුදා එක් ව කළ ප්‍රහාර හමුවේ ජර්මනිය පරාජයට පත් වීම
  - පරමාණු බෝම්බ නිසා අඩපණ වූ ජපානය පරාජය පිළිගැනීම

- **යුද්ධයේ ප්‍රතිඵල**
  - ලෝකයේ මෙතෙක් පැවති බිහිසුණු ම සංග්‍රාමය වූ නිසා ලෝකය පුරා මානව සම්පත් හා භෞතික සම්පත් දැවැන්ත ලෙස විනාශ වීම
  - පරමාණු බෝම්බවලින් හිරෝෂිමා හා නාගසාකි විනාශ වී ගිය අතර එහි ප්‍රතිඵල අනාගත පරම්පරාව අතර ද දැකිය හැකි වීම
  - ජර්මනිය විනාශයට පත් වීම
  - ජර්මනිය, නැගෙනහිර ජර්මනිය හා බටහිර ජර්මනිය යනුවෙන් දෙකඩ වීම
  - මෙතෙක් ලෝක බලවතුන් ලෙස සිටි එංගලන්තයට හා ප්‍රංශයට එම ස්ථානය අහිමි වීම
  - බ්‍රිතාන්‍ය - ප්‍රංශ අධිරාජ්‍ය බිඳවැටීම
  - අමෙරිකා එක්සත් ජනපදය සහ සෝවියට් රුසියාව සුපිරි බලවතුන් ලෙස නැගී සිටීම
  - අමෙරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයා ලෙස ඉදිරිපත් වීම
  - බ්‍රිතාන්‍යය, ප්‍රංශය, බෙල්ජියම, ඕලන්දය, බටහිර ජර්මනිය ආදි ධනවාදී අර්ථ ක්‍රම සහිත රටවල් අමෙරිකා එක්සත් ජනපදය සමඟ එක් කඳවුරකට එකතු වීම
  - සෝවියට් රුසියාව මුල් කොටගෙන කොමියුනිස්ට් බල කඳවුරක් බිහි වීම
  - පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, බල්ගේරියාව, යුගොස්ලාවියාව, නැගෙනහිර ජර්මනිය ආදි රටවල් එකී කොමියුනිස්ට් කඳවුරට අයත් වීම
  - පරාජිත රටවල් (විශේෂයෙන් බටහිර ජර්මනිය හා ජපානය) නඟා සිටුවීම සඳහා අමෙරිකා එක්සත් ජනපදය විසින් මාර්ෂල් සැලැස්ම හඳුන්වා දීම
  - බ්‍රිතාන්‍යය හා ප්‍රංශය සතු ව පැවති යටත් විජිතවලට නිදහස ලැබීම
  - ලෝක සාමය ආරක්ෂා කිරීම සහ ජාතීන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම



*යුද්ධයේ විනාශය*

***(Source: http://www.ncregister.com/blog/sbeale/can-the-hiroshima-bombing-be-morally-justified)***



*(Source: h ttps://www.defensemedianetwork.com/stories/operation-pied-piper-the-evacuation-of-english-children- during-world-war-ii/)*

යුද්ධයෙන් අසරණ වූවෝ




*( Source: https://singularthings.wordpress.com/tag/image-of-the-refugee/)*

ඇගයීම 01

- **පහත සඳහන් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවායින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

1. 1. ඇඩොල්ෆ් හිට්ලර් 2. බෙනිටෝ මුසෝලිනී 3. වික්ටෝරියෝ ඕර්ලැන්ඩෝ 4. වින්ස්ටන් චර්චිල් 4. ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (...........)

2. 1. ජර්මනිය 2. ඉතාලිය 3. ජපානය 4. හංගේරියාව 5.ප්‍රංශය (...........)

3. 1. ගෝරිං 2. ගොබෙල්ස් 3. වොන් මොල්ක් 4. ඩොනිට්ස් 5. රිබන්ත්‍රොප් (...........)

4. 1. රයින්ලන්තය 2. ඇබිසීනියාව 3. සුඩෙටන්ලන්තය 4. චෙකොස්ලෝවැකියාව 5. ඔස්ට්‍රියාව (...........)

5. 1. ප්‍රංශය 2. එංගලන්තය 3. රුසියාව 4. අමෙරිකා එක්සත් ජනපදය 5. ඉතාලිය (...........)

- **පහත සඳහන් එක් එක් ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එම කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

6. දෙවෙනි ලෝක යුද්ධය
   1. 1939 දී ආරම්භ විය
   2. යුද්ධය ඇති වීමට තුඩුදුන් ආසන්න හේතුව වූයේ ඔස්ට්‍රියාවේ ෆ්‍රැන්සිස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා ඝාතනය කරනු ලැබීම යි
   3. යුරෝපයේ ඒකාධිපති පාලන තන්ත්‍ර නැඟී ඒම නිසා යුද්ධය ඇතිවීම නොවැළැක්විය හැකිවිය
   4. ජපානය පරාජයට පත් වීමත් සමඟ යුද්ධය අවසාන විය
   5. යුද්ධයෙන් පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවනු ලැබී ය (...........)

7. දෙවෙනි ලෝක යුද්ධය
   1. 1939 දී ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමණය කරනු ලැබීම
   2. 1940 දී ඉතාලිය යුද්ධයට සම්බන්ධ වීම
   3. 1941 දී ජපානය පර්ල් වරායට පහර දීම
   4. 1945 දී ජපානය යුද්ධයෙන් ජය ගැනීම
   5. 1945 දී ජර්මනිය කොන්දේසි විරහිත ව යටත් වීම (...........)

8. දෙවෙනි ලෝක යුද්ධය ඇති වීම වළක්වා ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නය
   1. 1919 ජාතීන්ගේ සංගමය පිහිටුවීම
   2. 1925 ලොකාර්නෝ ගිවිසුම අස්සන් කිරීම
   3. 1932 නිරායුධ සම්මේලනය
   4. 1938 මියුනික් සමථය
   5. 1933 දී හිට්ලර් විසින් ජර්මනියේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම (...........)

ඇගයීම 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු ලියන්න**

1. දෙවෙනි ලෝක යුද්ධය ඇති වීමට තුඩුදුන් ප්‍රධාන සාධක විවේචනාත්මක ව විමසන්න.

(ලකුණු 14)

2. දෙවැනි ලෝක යුද්ධය ආරම්භ වීමේ මුල් බීජ පළමු වැනි ලෝක යුද්ධයේ ප්‍රතිඵලවල ගැබ් ව තිබිණි. සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

3. දෙවෙනි ලෝක යුද්ධයෙන් උද්ගත වූ ප්‍රතිඵල විවේචනාත්මක ව විමසන්න.

(ලකුණු 14)

4. දෙවෙනි ලෝක යුද්ධයට තුඩු දුන් හේතු පරීක්ෂා කරන්න.

(ලකුණු 14)

ඇගයීම 03

1. දෙවෙනි ලෝක යුද සමයේ මිත්‍ර පක්ෂයේ හා අක්ෂ පක්ෂයේ රටවල් ලෝක සිතියමක ලකුණු කරන්න

**නිපුණතා මට්ටම** : 13.2. ලෝක සාමය ඇතිකොට ගැනීම සඳහා සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම පරීක්ෂා කරයි.

**කාලච්ඡේද** : 07 යි.

**ඉගෙනුම් පල** :
- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු පැහැදිලි කරයි.
- දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක සාමය රැකගැනීමට ගත් ප්‍රයත්න පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**13.2 එක්සත් ජාතීන්ගේ සංවිධානය**

දෙවන ලෝක යුද්ධය අවසාන වීමෙන් පසු ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා පිහිටුවන ලද ජගත් සංවිධානය මෙනමින් හඳුන්වනු ලබේ.

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භය**
  - ජාතීන්ගේ සංගමයට වඩා ශක්තිමත් සංවිධානයක අවශ්‍යතාව මතුවීම
  - එකිනෙකාගේ නිදහසට හා සමානාත්මතාවට ගරු කරමින් ලෝක සාමයත්, ආරක්ෂාවත් සඳහා අන්තර්ජාතික සංවිධානයක් බිහිකළ යුතු බව තීරණය කිරීම
  - ක්‍රි.ව. 1941 අත්ලාන්තික් ප්‍රඥප්තිය
    - * යටත් වූවන්ට නිදහස ලබාදීම
    - * ස්වයං තීරණ අයිතිය ලබාදීම
    - * නිරායුධකරණය
  - ක්‍රි.ව. 1943 දී ටෙහෙරාන් නුවරට රැස්වූ ලෝක බලවතුන් (බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන් චර්චිල් අමෙරිකා එක්සත් ජනපද ජනාධිපති ෆ්‍රෑන්ක්ලින් රූස්වලේට්, සෝවියට් රුසියානු නායක ජෝශප් ස්ටාලින්) ලෝක සාමය උදෙසා අන්තර්ජාතික සංවිධානයක් පිහිටුවීමට තීරණය කිරීම
  - ක්‍රි.ව. 1945 දී සැන් ෆ්‍රැන්සිස්කෝ නගරයේ පැවැත් වූ සමුළුවකදී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම
  - ලෝකයේ බලවත් රටවල් පහක් ඇතුළු රටවල් 51ක් ප්‍රඥප්තියට අත්සන් තැබීම
  - ක්‍රි.ව. 1945 ඔක්තෝබර් 24 දින ප්‍රඥප්තිය නිල වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු**
  - ජාත්‍යන්තර සාමය, ආරක්ෂාව හා සහයෝගය පවත්වාගෙන යාම
  - වර්ණභේද, ලිංගබේද, භාෂා භේද, ආගම් භේද නොතකා මිනිස් අයිතිවාසිකම් වලට ගරුකරමින් ඒවා දිරි ගැන්වීමට කටයුතු කිරීම
  - ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම
  - ආර්ථික, සමාජීය හා සංස්කෘතික දියුණුව හා ශුභ සාධනය සඳහා කටයුතු කිරීම
  - මානව අයිතිවාසිකම් හා මූලික නිදහස තහවුරු කිරීමෙහිලා ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීම
  - මෙම පොදු අරමුණු සපුරා ගැනීම සඳහා ජාතීන්ගේ මූලස්ථානයක් ලෙස ක්‍රියා කිරීම

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය**
  - ප්‍රධාන ආයතන හයකින් සමන්විත වීම
  - මහා මණ්ඩලය
  - ආරක්ෂක මණ්ඩලය
  - භාරකාර මණ්ඩලය
  - ආර්ථික හා සමාජීය මණ්ඩලය
  - ජාත්‍යන්තර අධිකරණය
  - මහලේකම් කාර්යාල ය (සංයුතිය, අරමුණු, සාමාජික සංඛ්‍යාව, කාර්යභාරය හා වැදගත්කම

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතන**
  - දෙවන ලෝක යුද්ධයෙන් දුර්වල වූ රටවල ආර්ථික හා සාමාජික වර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඊට අනුබද්ධ ආයතන මඟින් විශාල සේවයක් සිදු කිරීම

    උදාහරණ : - ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
    - ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
    - එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO)
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ILO)
    - ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
    - එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)
  - මේ ආයතන පිළිබඳ ව පහත දැක්වෙන ශීර්ෂ යටතේ කරුණු රැස් කිරීම
    * සංයුතිය
    * අරමුණු
    * සාමාජික සංඛ්‍යාව
    * කාර්යභාරය හා වැදගත්කම

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වැදගත්කම**
  - ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා ප්‍රයත්න දැරීම

    උදාහරණ : - ඉන්දුනීසියාවට නිදහස ලබාදීම
    - අරාබි - ඊශ්‍රායල් ගැටුම
    - කොරියානු යුද්ධය
    - සූවස් අර්බුදය
    - හංගේරියාවේ නැඟී සිටීම
    - බෙල්ජියන් කොංගෝවේ සිවිල් යුද්ධය
    - සයිප්‍රස් අර්බුදය
    - කාශ්මීර් අර්බුදය
    - චෙකොස්ලොවැකියානු අර්බුදය
    - දකුණු අප්‍රිකාවේ වර්ණභේදවා දී ප්‍රතිපත්ති දෝෂ දර්ශනයට ලක් කිරීම
    - රොඩේෂියාවට විරුද්ධ ව ආර්ථික සම්බාධක පැනවීම
  - නිරායුධකරණ වැඩපිළිවෙළ
  - ජාතීන් අතර පවතින ප්‍රශ්න සාකච්ඡා මඟින් විසඳ ගැනීමේ ප්‍රයත්න
  - ජාත්‍යන්තර සහයෝගය හා අභිවෘද්ධිය උදෙසා දරන ලද ප්‍රයත්න හා ගනු ලබන ක්‍රියාමාර්ග
  - ජාත්‍යන්තර ව්‍යසනවල දී උපකාර කිරීම (ගංවතුර, සුළි සුළං, නායයාම්, සුනාමි)
  - අනාගත පරපුර යුද බියෙන් මුදවා ගැනීමේ ප්‍රයත්න
- **එක්සත් ජාතීන්ගේ සංවිධානය මුහුණ පා ඇති ගැටලු**
  - රටවල් බල කඳවුරුවලට බෙදී කටයුතු කිරීම
  - න්‍යෂ්ටික අවි පාලනය
  - මුදල් හිඟ වීම

ඇගයීම 01

- **පහත සඳහන් එක් එක් ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එම කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

1. එක්සත් ජාතීන්ගේ සංවිධානය
   1. දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු පිහිටුවනු ලැබී ය.
   2. එහි ප්‍රධාන අරමුණ අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම ය.
   3. මහලේකම් එහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ය.
   4. ආරක්ෂක මණ්ඩලය සාමාජික රටවල් සියල්ලේ ම නියෝජිතයන්ගෙන් සමන්විත වේ.
   5. නිත්‍ය සාමාජිකයන්ට නිෂේධ බලය හිමි වේ. (........)

2. එක්සත් ජාතීන්ගේ සංවිධානය
   1. දෙවෙනි ලෝක යුද්ධයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවනු ලැබී ය.
   2. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අරමුණ, අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම ය.
   3. මහසභාව සාමාජික රටවල සාමාජිකයන්ගෙන් සමන්විත වේ.
   4. මහ ලේකම් කාර්යාලය එම සංවිධානයේ පරිපාලන කාර්යාලය වේ.
   5. මහාලේකම් කාර්යාලය ජාත්‍යන්තර අධිකරණය යනුවෙන් ද හඳුන්වනු ලැබේ. (........)

ඇගයීම 02

1. i. එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමෙන් පසු ව ගත වූ මුල් දශක දෙක තුළ ලෝක සාමය ආරක්ෂා කිරීමෙහි ලා එම සංවිධානය අනුගමනය කළ ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

   (ලකුණු 07)

   ii. වර්තමාන ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 07)

2. i. 1965 තෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වූ ප්‍රධාන අන්තර්ජාතික අර්බුද විස්තර කරන්න (ලකුණු 07)

   ii. ඒවා විසඳීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය කෙතෙක් දුරට සමත් වී දැයි පරීක්ෂා කරන්න (ලකුණු 07)

# 14. දෙවෙනි ලෝක සංග්‍රාමයෙන් පසු ලෝකය

යුද්ධයට සහභාගි වූ සැම රටකට ම විශාල ව්‍යසනයක් අත්කොට දෙමින් හා ලොව පුරා බිහිසුණු ප්‍රතිඵල ඇති කරමින් දෙවෙනි ලෝක සංග්‍රාමය නිමා වූ අතර එතෙක් යුරෝපයේ බලවත් ව තිබූ ප්‍රංශය, එංගලන්තය වැනි රටවල් පසු පසට තල්ලු කරමින් අමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය ලෝක බලවතුන් ලෙස නැඟී සිටින්නට විය. අමෙරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාවක් හා ධනවාදී ආර්ථික රටාවක් අනුගමනය කළ අතර ප්‍රංශය, එංගලන්තය ආදි රටවල් මේ පිලට එක් වීමෙන් අමෙරිකා එක්සත් ජනපදයේ නායකත්වය යටතේ ධනවාදී කඳවුරක් බිහි විය. මාර්ෂල් සැලැස්ම ඉදිරිපත් කරමින් යුද්ධයෙන් විනාශ වූ බටහිර යුරෝපා රටවල් ආර්ථික වශයෙන් නඟා සිටුවීම සඳහා අමෙරිකා එක්සත් ජනපදය කටයුතු කළේ ය. සෝවියට් දේශය සමාජවාදී දේශපාලන හා ආර්ථික රටාවක් අනුගමනය කළ අතර පෝලන්තය, නැඟෙනහිර ජර්මනිය, චෙකොස්ලොවැකියාව, යුගොස්ලාවියාව, වැනි රටවල් සෝවියට් දේශයේ නායකත්වය පිළිගැනීමත් සමඟ යුරෝපයේ සමාජවාදී කඳවුරක් බිහි විය.

විසිවැනි සියවසේ දෙවෙනි භාගයේ මුල සිට අග වන තෙක් ලෝක ආධිපත්‍යය සඳහා මෙම කඳවුරු දෙක ඇති වූ අතර බල අරගලයක් ''සීතල යුද්ධය'' නමින් හැඳින්විණි. ධනවාදී කඳවුර නේටෝ සංවිධානයත් සමාජවාදී කඳවුර වෝර්සෝ ගිවිසුම් සංවිධානයත් පිහිටුවා ගනිමින් තම බලය තහවුරු කොට ගැනීමට කටයුතු කළේය. අවි ගැටුම් සීමා වී දශක දෙකක් පමණ කාලයක් තිස්සේ පැවති මෙම අරගලය අසූව දශකය අගභාගයේ දී සෝවියට් දේශය බිඳවැටීමත් සමග අවසන් වූ අතර අමෙරිකා එක්සත් ජනපදය ලෝක බලවතා බවට පත් විය.

අමෙරිකා එක්සත් ජනපදය සහ සෝවියට දේශය ලෝක බලවතුන් ලෙස නැඟී සිටි ආකාරයත් ඔවුන් දෙදෙනා අතර ඇති වූ ගැටීම් හා අවසානයේ සෝවියට් දේශය බිඳ වැටුණු ආකාරයත්, බල කඳවුරුවලට සම්බන්ධ නොවූ රටවල් එක් වී පිහිටුවාගත් නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයත් පිළිබඳ ව තොරතුරු අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • බලය පිළිබඳ ඇති වන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැක ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 14.1. බල කඳවුරු ගෝලීය දේශපාලනය කෙරෙහි ඇති කළ බලපෑම පැහැදිලි කරයි

**කාලච්ඡේද** : 18 යි.

**ඉගෙනුම් පල** :
- වර්තමාන දේශපාලන තත්ත්වයට බලපෑ හේතු පෙන්වා දෙයි.
- බල කඳවුරුවල දේශපාලන ආර්ථික හා සමාජ ප්‍රවණතා විග්‍රහ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න**

**14. දෙවෙනි ලෝක සංග්‍රාමයෙන් පසු ලෝකය**

- **ලෝකය බල කඳවුරුවලට බෙදී යාම**
  - දෙවන ලෝක යුද්ධයේ අවසානයත් සමඟ එතෙක් යුරෝපයේ ප්‍රබල ව සිටි ජාතීන් බලයෙන් තල්ලු වීම
  - ඉතාලිය, ජර්මනිය හා ජපානය ආර්ථික වශයෙන් හා යුද්ධමය වශයෙන් බිඳ වැටීම
  - සෝවියට් සංගමය හා අමෙරිකාව සමාජවාදය හා ධනවාදය මුල් කර ගනිමින් බල කඳවුරු දෙකක් ලෙස ඉදිරියට යාම
  - එතෙක් පෙරදිග යටත් විජිත අධිරාජ්‍යය පිහිටුවා ගෙන සිටි බ්‍රිතාන්‍යයට හා ප්‍රංශයට යටත් විජිත අහිමි වී යාම

- යටත් විජිත තත්වයෙන් මිදී ස්වාධීනත්වය ලැබූ බොහෝ රටවල් තම ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම සඳහා නොබැඳි ජාතීන් ලෙස කටයුතු කිරීම
- මෙම පසුබිම මත ලෝක නායකත්වයේ වෙනසක් නිර්මාණය වීම

- ධනවාදී බල කඳවුරේ වර්ධනය

    - සියවස් තුනක් පමණ වූ අමෙරිකා එක්සත් ජනපද ඉතිහාසය තුළ අමෙරිකා එක්සත් ජනපදය විදේශීය කටයුතුවලට ඍජු ව ම මැදිහත් වන්නේ දහනව වැනි සියවස අග සිට වීම
    - විසිවැනි සියවස වන විට ලෝක දේශපාලන කටයුතු යුරෝපයේ රටවල් මුල් කොට ගෙන සිදු වීම
    - පළමු වැනි ලෝක සංග්‍රාමයෙන් බ්‍රිතාන්‍යය, ප්‍රංශය හා අමෙරිකා එක්සත් ජනපදය යන බටහිර රටවල් අයත් වූ මිත්‍ර පක්ෂය ජය ගැනීමෙන් පසු අමෙරිකා එක්සත් ජනපදයේ ජාත්‍යන්තර ප්‍රතිරූපය වඩාත් ඉස්මතු වීම
    - පළමු වැනි ලෝක සංග්‍රාමයෙන් පසු ලෝක සාමය සුරක්ෂිත කොට ගැනීම සඳහා පිහිටුවා ගත් ජාතීන්ගේ සංගමය ගොඩනැඟීම සඳහා වූ යෝජනාව හා සැලැස්ම ඉදිරිපත් කළේ අමෙරිකා එක්සත් ජනපදය වීම
    - සෙනෙට් සභාව අමෙරිකා එක්සත් ජනපදය යුරෝපා කටයුතුවලට සම්බන්ධ වීම පිළිබඳ විරෝධය පළ කිරීම නිසා එරට ජාතීන්ගේ සංගමයට එකතු නොවීම
    - ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමෙන් පසු දෙවෙනි ලෝක යුද්ධය ආරම්භ විය. අමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පක්ෂය ගෙන යුද්ධයට සහභාගි වීම හා ජර්මනිය, ඉතාලිය හා ජපානය ප්‍රමුඛ අක්ෂ පක්ෂයේ නැඟී සිටීම මැඩ පැවැත්වීමට අමෙරිකා එක්සත් ජනපදය සමත් වීම
    - 1945 ජපානයේ හිරෝෂිමා හා නාගසාකි යන නගරවලට බෝම්බ හෙළීමෙන් දෙවන ලෝක යුද්ධය අවසන් කිරීම
    - ඒ සමඟ ම අමෙරිකා එක්සත් ජනපදය ජාත්‍යන්තර වශයෙන් ප්‍රබල තත්ත්වයකට පත්වීම
    - 1945 ජූනි මස සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර දී ජාතීන් පහකින් සමන්විත සමුළුව මඟින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම. එහි දී අමෙරිකා එක්සත් ජනපදය ඉතා තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කිරීම
    - 1945 ඔක්තෝබර් 24 වන දින සිට එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන අතර ප්‍රංශය බ්‍රිතාන්‍යය, සෝවියට් දේශය, චීනය හා අමෙරිකා එක්සත් ජනපදය යන රටවලට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය නියෝජිත තනතුර ලැබීම. එම රටවල් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය තුළ නිෂේධ බලය හිමි පංච මහා බලවතුන් බවට පත් වීම. එහි දී සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී රටවල කටයුතු සීමා කිරීමට අමෙරිකා එක්සත් ජනපදය පෙරමුණ ගැනීම
    - තාරකා යුද්ධ වැඩ සටහන් මඟින් සමාජවාදී කඳවුරට ප්‍රබල තර්ජනයක් එල්ල කිරීමට අමෙරිකා එක්සත් ජනපදය සමත් වීම.
    - අසූව දශකයේ රුසියාවේ සිදු වූ ග්ලාස්නොස්ට් හා පෙරෙස්ත්‍රොයිකා ප්‍රතිසංස්කරණවලින් පසු ව සෝවියට් දේශය බිඳ වැටුණු පසු අමෙරිකා එක්සත් ජනපදය ලෝක කටයුතුවල ප්‍රබලයා බවට පත් වීම

**අමෙරිකා එක්සත් ජනපදය ධනවාදී කඳවුරේ නායකත්වයට පත් වීම**

- සමාජවාදී කඳවුරට එරෙහි ව ධනවාදී කඳවුරේ නායකත්වය ගත්තේ අමෙරිකා එක්සත් ජනපදය යි.
- සමාජවාදී කඳවුර සමාජවාදී ආර්ථිකයත් කොමියුනිස්ට් පාලනයත් ව්‍යාප්ත කිරීමට උත්සාහ ගත් අතර ධනවාදී කඳවුර ධනවාදී ආර්ථික ප්‍රතිපත්ති හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ව්‍යාප්ත කිරීමට උත්සාහ ගැනීම
- ධනවාදී පිලේ නායකයා වශයෙන් ධනවාදී පිල ශක්තිමත් කිරීම සඳහා 1949 දී අමෙරිකා එක්සත්

ජනපදයේ මූලිකත්වයෙන් උතුරු අත්ලන්තික් ගිවිසුම් සංවිධානය (NATO) පිහිටුවා ගැනීම - පෘතුගාලය, ඉතාලිය, බටහිර ජර්මනිය, ග්‍රීසිය, නෙදර්ලන්තය ඇතුළු රටවල් 16ක් නේටෝ සංවිධානයට ඇතුළත් වූ අතර ඔවුන්ට එරෙහි ව උතුරු අමෙරිකාවේ හෝ යුරෝපයේ අවි ගැටුමක් ඇති වුවහොත් එය සියලු ම රටවලට එල්ල වූ ප්‍රහාරයක් ලෙස සැලකීමට ගිවිස ගැනීම

- ධනවාදී රටවලට සහාය දීම. උදාහරණ වශයෙන් 1948 උතුරු හා දකුණු කොරියාව වශයෙන් කොරියාව කොටස් දෙකකට බෙදුණු පසු ධනවාදයට නැඹුරු වූ දකුණු කොරියාව අමෙරිකා එක්සත් ජනපදය විසින් භාර ගැනීම. 1948 දී බර්ලිනය බෙදීගිය අතර එහි දී අමෙරිකා එක්සත් ජනපදය ධනවාදයට පක්ෂ වූ බටහිර බර්ලිනයේ පක්ෂය ගැනීම



*බර්ලින් තාප්පය*

***(Source : https://tammytourguide.wordpress.com/2014/11/05/the-berlin-wall-25th-anniversary-tour/)***

- සමාජවාදී රාජ්‍ය බිඳ දැමීමට අමෙරිකා එක්සත් ජනපදය කටයුතු කිරීම
  උදාහරණ: කියුබානු විප්ලව අවස්ථාවේ පලා ගිය හා පිටුවහල් කළ කියුබානු ජාතිකයන්ගෙන් සමන්විත හමුදාවක් අමෙරිකා එක්සත් ජනපදය විසින් ගොඩනගා පුහුණු කොට 1969 දී එම හමුදාව පිදෙල් කස්ත්‍රෝගේ හමුදාවට එරෙහි ව සටන් කිරීමට පෙලඹවීම. කියුබාවට සෝවියට් ආධාර ලැබීම නිසා අමෙරිකා එක්සත් ජනදයේ ප්‍රයත්නය අසාර්ථක වීම
- ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි වූයේ ය යන චෝදනාව මත මියන්මාර් (බුරුම) හමුදා රජය කෙරෙහි එක්සත් ජනපද රජය ප්‍රසාදයක් නොදැක්වුව ද ධනවාදය අගයන පකිස්ථානු හමුදා රජයට ආධාර දීම
- ජාත්‍යන්තර වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය නගා සිටුවීම සඳහා පියවර ගැනීම. ඒ අනුව බ්‍රිතාන්‍යය යටතේ පැවති යටත් විජිතවලට නිදහස ලබාදිය යුතුයි බව ඉල්ලා සිටීම



*නැගෙනහිර ජර්මනියේ සිට බටහිර ජර්මනියට යාමට බලා සිටින ලක්ෂ සංඛ්‍යාත පිරිසෙන් කොටසක්*
***(Source: http://edition.cnn.com/2014/01/16/world/europe/berlin-wall-secrets/index.html)***

- අප්‍රිකාවේ ඝානා, නයිජීරියා, කෙන්යා ඇතුළු බොහෝ රටවලට නිදහස ප්‍රදානය කිරීමට අමෙරිකා එක්සත් ජනපදයේ බලපෑම් හේතු වීම
- නිදහස ලබූ යටත් විජිත තම කඳවුරට එක් කොට ගැනීමට පියවර ගැනීම
- අලුතෙන් නිදහස් වන රටවල් තුළ සමාජවාදය ව්‍යාප්ත වීම වැළැක්වීමට පියවර ගැනීම
- ලතින් අමෙරිකානු රටවලට හා අලුතෙන් නිදහස ලැබූ ආසියා හා අප්‍රිකා රටවල කෘෂිකාර්මික, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවලට විශේෂඥ ආධාර ලබාදීම සඳහා මාර්ෂල් සැලැස්ම ක්‍රියාත්මක කිරීම
- ඇමෙරිකා එක්සත් ජනපදය තම ප්‍රතිපත්තිවලට එරෙහිවන බලවේග හඳුනා ගැනීමට හා ඒවා මර්දනය කිරීම මධ්‍යම රහස් ඔත්තු කාර්යාංශය (CIA) මඟින් සිදු කිරීම
- මෙසේ ධනවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රචලිත කිරීමේ කාර්යය ලෝක බලවතා ලෙස සැලකෙන අමෙරිකා එක්සත් ජනපදයට හිමි වීම

- **සමාජවාදී බල කඳවුරේ වර්ධනය**
  - දෙවන ලෝක යුද්ධයෙන් පසු සෝවියට් දේශය ලෝක බලවතකු වශයෙන් නැඟී ඒම
  - සෝවියට් දේශයේ නායකත්වය යටතේ සමාජවාදී රටවල් අතර එකමුතු කමක් ඇති වීම

- **සමාජවාදී බල කඳවුරේ වර්ධනයට හේතු**
  - දක්ෂ නායකයන් බිහි වීම. වී.අයි. ලෙනින්, ජෝශප් ස්ටාලින්, නිකිතා කෘෂෙෆ් වැනි ශූර පාලකයන් බලයට පත් වීම
  - සමාජවාදී පදනමක් යටතේ ආර්ථිකය ගොඩනඟා ගැනීම
  - පස් අවුරුදු සැලසුම් යටතේ සැලසුම් සහගත ආර්ථිකයක් ඇති කිරීම
  - නවීන තාක්ෂණයත් සමග කාර්මික හා කෘෂිකාර්මික අංශයේ දියුණුව



*ස්ටාලින් , ලෙනින්, සහ ට්‍රොට්ස්කි*

***Source: http://throughthelookingglass2488.blogspot.com/2016/10/lenin-trotsky-and-stalin-conscious.html***



*නවීන තාක්ෂණය සමඟ කෘෂිකාර්මික සංවර්ධනය*

***Source: https://en.wikipedia.org/wiki/Agriculture_in_the_Soviet_Union***

- 1953 දී බලයට පත්වූ කෘෂෙෆ් වඩාත් කාර්යක්ෂම ආර්ථිකයක් ගොඩනැංවීම සඳහා ප්‍රදේශීය ආර්ථික සංවිධාන පිහිටුවීම
  - විද්‍යාව හා තාක්ෂණය දියුණු කිරීමට කටයුතු කිරීම. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1961 දී රුසියානු ජාතික යූරි ගගාරින් ප්‍රථම වරට අභ්‍යවකාශය තරණය කිරීම
  - ක්‍රීඩා ආදි ක්ෂේත්‍රවල දියුණුවක් ඇතිවීම





The Huntsville Times

Man Enters Space

'So Close, Yet So Far,' Sighs Cape

U.S. Had Hoped For Own Launch

Hobbs Admits 1944

Soviet Officer Orbits Globe In 5-Ton Ship

Maximum Height Reached Reported As 188 Miles

VON BRAUN'S REACTION:

To Keep Up, U.S.A. Must Run Like Hell'

*යූරි ගගාරින් හා ඒ පිළිබඳ වාර්තා*

***(Source: https://en.wikipedia.org/wiki/Yuri_Gagarin***
***https://www.nasa.gov/mission_pages/shuttle/sts1/gagarin_anniversary.html)***

- සෝවියට් දේශයේ නායකත්වය යටතේ සමාජවාදී කඳවුර බලවත් වීම
- සෝවියට් දේශය අත් කරගත් දේශපාලන හා ආර්ථික ශක්තිය නිසා සමාජවාදී න්‍යායය ලොව පුරා ප්‍රචාරය කිරීමට ඔවුන්ගේ ධනය යෙදවීම
- පෝලන්තයේ නැගෙනහිර පළාත්, එස්ටෝනියා, ලැට්වියා, ලිතුවේනියා වැනි ප්‍රදේශ සෝවියට් සමූහාණ්ඩුවට ඈඳ ගැනීම
- නැගෙනහිර ජර්මනිය, රුමේනියාව, බල්ගේරියාව, හංගේරියාව, පින්ලන්තය වැනි රාජ්‍ය සෝවියට් සංගමයේ අධිකාරයට නතු වීම
- චීනයේ කොමියුනිස්ට් පරිසරයක් වර්ධනය වීම සහ චීන විප්ලවය මඟින් කොමියුනිස්ට්වාදය තව දුරටත් ව්‍යාප්ත වීම
- උතුරු කොරියාව, හංගේරියාව, පෝලන්තය, බල්ගේරියාව සහ නැගෙනහිර යුරෝපා කොමියුනිස්ට් රටවල් අතර නායකත්වය සෝවියට් දේශයට හිමි වීම
- සමාජවාදී ආධිපත්‍යයට විරුද්ධ ව අමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ගන්නා ලද ''නේටෝ'' සංවිධානයට ප්‍රතිචාරයක් වශයෙන් කොමියුනිස්ට් රටවල් 1955 දී වෝර්සෝ සම්මුතිය ඇති කර ගැනීම
- වෝර්සෝ සංවිධානයේ නායකත්වය සෝවියට් සමූහාණ්ඩුවට හිමි වීම
- සමාජවාදී පිලේ ආරක්ෂක කමිටු (K.G.B.) නම් රහස් ඔත්තු සේවාවක් පවත්වා ගෙන යාම
- ධනවාදී කඳවුරේ යුද රහස් ලබාගෙන ඒවාට ප්‍රතිවාදී ලෙස සමාජවාදී ක්‍රමය ව්‍යාප්ත කිරීම මෙම ඔත්තු සේවාවේ අරමුණ යි.
- සමාජවාදී රටවල් අතර ආර්ථික වශයෙන් ද යුද්ධමය වශයෙන් ද සංස්කෘතික වශයෙන් ද සමීප සබඳතා පැවතීම

- **නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය**
  - දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ බිහි වූ සමාජවාදී හා ධනවාදී යන බල කඳවුරු දෙකෙන් එකකට වත් අයත් නොවූ ජාතීන් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය නොබැඳි (Non Alignment) ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ
  - දෙවෙනි ලෝක සංග්‍රාමයෙන් පසු බටහිර අධිරාජ්‍යවාදයෙන් නිදහස ලැබූ තුන්වැනි ලෝකයේ රටවල් ලෙස සැලකෙන ආසියාවේ හා අප්‍රිකාවේ බොහෝ රටවල් නොබැඳි ව්‍යාපාරයේ සාමාජිකයන් වීම

- අමෙරිකානු හා සෝවියට් කඳවුරු දෙකෙහි නායකයන් නව නිදහස් රාජ්‍ය හැකි තරම් තම පිලට එක්කොට ගැනීමට උත්සාහ දරද්දී දිගු කලක් අධිරාජ්‍ය වාදයට හසු ව සිට නිදහස ලැබූ ජාතීන්ට අවශ්‍ය වූයේ තම නිදහස රැකගෙන කිසි දු බලවතකුට හිස නොනමන ස්වාධීන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ය. ඒ අනුව නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය බිහි වීම
- නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ නිර්මාතෘවරුන් ලෙස ඉන්දියාවේ ප්‍රථම අගමැති ජවහර්ලාල් නේරු, ඉන්දුනීසියානු ජනාධිපති සුකර්ණෝ, ඊජිප්තු ජනාධිපති අබ්දුල් ගමාල් නසාර්, යුගොස්ලෝවියානු ජනාධිපති මාෂල් ටිටෝ සහ ඝානාවේ ක්වාමේ නිකෘමා කටයුතු කිරීම




*නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ නිර්මාතෘවරු*

***(Source: http://youspeakindia.org/2017/04/03/relevance-of-the-non-aligned-movement-in-the-21st-century)***

- **නොබැඳි ජාතීන්ගේ ප්‍රතිපත්ති**
  - බල කඳවුරුවලට ගැති නොවී තම රටවල සුභසිද්ධියට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
  - නිදහස, ආරක්ෂාව, සාමය සහ සහයෝගීතාව පදනම් කොට ගත් ප්‍රතිපත්තියක් ඇති කොට ගැනීම
  - යුද ගිවිසුම්වලට විරෝධය දැක්වීම
  - අධිරාජ්‍යවාදය ප්‍රතික්ෂේප කිරීම
  - සාමය වෙනුවෙන් පෙනී සිටීම
  - නොබැඳි ව්‍යාපාරය ලෝකයේ බලවත් ම සාම ව්‍යාපාරවලින් එකක් වීම
  - 1945 දී ජවහර්ලාල් නේරු ඉදිරිපත් කළ පංචශීල ප්‍රතිපත්තිය නොබැඳි ව්‍යාපාරයේ පදනම වීම මීට පෙර චෞ එන් ලායි විසින් ද මෙම අදහස් ප්‍රකාශ කොට තිබීම

- **පංචශීල ප්‍රතිපත්තිය**
  - සාමකාමී සහජීවනය
  - අන්‍යොන්‍ය සුබ සිද්ධිය හා සමානාත්මතාව
  - එකිනෙකාගේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි නොගැසීම
  - එකිනෙකාට විරුද්ධ ව ආක්‍රමණය නොකිරීම

- එකිනෙකාගේ භෞමික අඛණ්ඩතාවට හා ස්වෛරී භාවයට ගරු කිරීම



*නොබැඳි ජාතීන්ගේ ආරම්භක සැසිය*
***(Source: http://kappajrgamer.blogspot.com/2015/04/asian-african-conference.html)***

- 1955 ඉන්දුනීසියාවේ බැංඩුංහි දී පවත්වන ලද සම්මේලනය නොබැඳි ජාතීන්ගේ ආරම්භක සැසිය වීම
- එම සම්මේලනයට අනුව අප්‍රිකානු - ආසියානු ජාතීහු තම මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම
- ප්‍රථම නොබැඳි ජාතීන්ගේ සමුළුව 1961 දී යුගොස්ලාවියාවේ බෙල්ග්‍රේඩ් නගරයේ දී යුගෝස්ලාවියානු නායක මාර්ෂල් ටිටෝ ගේ මූලිකත්වයෙන් පැවැත්වීම
- ආරම්භක සැසියේ දී ආසියානු ජාතිකයන් 23 දෙනකු් හා අප්‍රිකානු ජාතිකයන් 07 දෙනකු සහ එක් යුරෝපීයයකු සහභාගිවීම හා දිනෙන් දින වැඩි වූ එහි සාමාජිකත්වය වර්තමානය වන විට 118ක් වීම
- නොබැඳි ජාතීන්ගේ සමුළුව වසර තුනකට හෝ හතරකට හෝ වරක් පැවැත්වීම
- නොබැඳි ජාතින්ගේ පස් වන සමුළුව 1976 දී කොළඹ පැවැත්වීම
- එම සමුළුව ලෝකයේ දුප්පත් ජාතීන් හා පොහොසත් ජාතීන් අතර පරතරය අඩු කරන නව ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් අවධාරණය යොමු කර කිබීම
- වර්තමානය වනවිට ලෝකයේ බලකඳවුරු දෙකක් නොමැති බැවින් මෙහි සාමාජික රටවල් අතර සහයෝගිතාව රැකගැනීම එම සංවිධානයේ ප්‍රධාන අරමුණ වීම
- ත්‍රස්තවාදයට එරෙහි ව කටයුතු කිරීම හා මත්ද්‍රව්‍ය විරෝධය එහි අනෙක් අරමුණු අතර වීම

ඇගයීම 01

**අංක 01සිට 02 දක්වා A තීරුවේ සඳහන් රටවල් B තීරුවේ සඳහන් නායකයන් හා ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

1.

| A | B |
|---|---|
| 1. යුගෝස්ලාවියාව | A සුකර්ණෝ |
| 2. මිසරය | B ජවහර්ලාල් නේරු |
| 3. ඉන්දියාව | C මාර්ෂල් ටිටෝ |
| 4. ඉන්දුනීසියාව | D නිකිතා කෘෂෙෆ් |
| 5. රුසියාව | E අබ්දුල් ගමාල් නසාර් |

1. EBCAD 2. BDCAE 3. CEBAD 4. DECBA 5. ADBCE (............)

2.

| A | B |
|---|---|
| 1. අමෙරිකාව | A පිදෙල් කස්ත්‍රෝ |
| 2. වියට්නාමය | B බෝරිස් යෙල්ට්සිං |
| 3. කාම්බෝජය | C හෝ - චි - මිං |
| 4. රුසියාව | D ටෘමන් |
| 5. කියුබාව | E සිහනුක් කුමරු |

1. BAEDC 2. ABCDE 3. BCDEA 4. CDBAE 5. DCEBA (............)

**නොගැළපෙන නාමය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

3. 1. බල්ගේරියාව 2. හංගේරියාව 3. ප්‍රංශය 4. සෝවියට් දේශය 5. පෝලන්තය (............)

4. 1. අමෙරිකා එක්සත් ජනපදය 2. පෘතුගාලය 3. නෙදර්ලන්තය 4. චෙකොස්ලොවැකියාව 5. ඉතාලිය (............)

5. නොබැඳි ජාතීන්ගේ පස්වැනි සමුළුව පැවැත්වූයේ,
1. යුගොස්ලෝවියාවේ ය. 2. ලංකාවේ ය. 3. ඉන්දියාවේ ය. 4. ඊජිප්තුවේ ය. 5. බුරුමයේ ය.
(............)

6. නේටෝ සංවිධානය පිහිටුවීමේ අරමුණ කුමක් ද?
1. කොමියුනිස්ට් මතවාදය ව්‍යාප්ත කිරීම
2. නැගෙනහිර යුරෝපයේ සමාජවාදී කඳවුරේ ආරක්ෂාව
3. බටහිර යුරෝපයේ ධනවාදී රටවල ආරක්ෂාව
4. ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම
5. සමාජවාදය පදනම් කොටගත් ආර්ථිකයක් ගොඩනැංවීම (............)

7. නේටෝ සංවිධානයට අයත් රටවලින් එල්ල විය හැකි යුද්ධමය තර්ජනවලට මුහුණ දීම සඳහා කොමියුනිස්ට් රටවල් එක් ව පිහිටුවාගත් යුද්ධමය සංවිධානය කුමක් ද?

1. මධ්‍යම ගිවිසුම් සංවිධානය
2. වෝර්සෝ ගිවිසුම් සංවිධානය
3. මධ්‍යම රහස් ඔත්තු සංවිධානය
4. ජාතික ආරක්ෂක කමිටුව
5. යුනෙස්කෝ සංවිධානය

(............)

**ඇගයීම 02**

1. විසිවැනි සියවසේ ආරම්භයේ සිට අමෙරිකා එක්සත් ජනපදය ලෝක බලවතකු ලෙස නැඟී සිටි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 14)

2. 1980 දශකය තෙක් සෝවියට් දේශය ලෝක බලවතකු ලෙස නැඟී සිටි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

3. රුසියාව ලෝක බලවතෙකු ලෙස නැඟී ඒමේ ලා මඟ පෑදූ ලෙනින්, ට්‍රොට්ස්කි, ස්ටාලින් හා නිකිතා කෘෂෙෆ් යන අය ගේ දායකත්වය ප්‍රමාණ කරන්න. (ලකුණු 14)

4. i. නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය යනු කුමක් දැයි විස්තර කරන්න (ලකුණු 07)

ii. නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ අරමුණු පැහැදිලි කරන්න (ලකුණු 07)

**නිපුණතා මට්ටම** : 14.2 නිරවි යුද සමයේ බල කඳවුරු අතර ගැටුම් විග්‍රහ කරයි

**කාලච්ඡේද** : 07යි.

**ඉගෙනුම් පල** :
- නිරවි යුද්ධය පැහැදිලි කරයි
- තම පිල ශක්තිමත් කොට ගැනීම සඳහා බලකඳවුරුවල ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි
- ලෝකයේ රටවල් බල කඳවුරුවලට බෙදී ගිය ආකාරය පැහැදිලි කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**


**14.2 නිරවි යුද්ධය**

- සීතල යුද්ධය තුෂ්ණී යුද්ධය නමින් ද හැඳින්වීම
- දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ලෝකය බලකඳවුරු දෙකකට බෙදී අවි ආයුධ භාවිත නොකොට වුව ද තම කඳවුර ජයග්‍රාහී කොට ගැනීම සඳහා විවිධ උපක්‍රම යොදා ගනිමින් ගෙනගිය සටන හෙවත් අරගලය නිරවි යුද්ධය නමින් හැඳින්වීම
- දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු දශක හතරක් පමණ යන තුරු මෙම කඳවුරු අතර බල අරගලය පැවතීම
- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීම මත අවි ගැටුම්වලින් තොර අවධියක් උදා වීම
- බල කඳවුරු දෙක අතර සාමයක් මෙන් ම යුද්ධයක් ද ඇති නොවීම
- මත ගැටුම්
- අමෙරිකා එක්සත් ජනපදය ධනවාදී කඳවුරේ නායකයා ලෙස තම කණ්ඩායම ශක්තිමත් කොට ගැනීම සඳහා උතුරු අත්ලාන්තික් සංවිධානය (නේටෝ) පිහිටුවා ගැනීම
- නේටෝ සංවිධානයට ප්‍රතිචාර ලෙස සමාජවාදී කඳවුර වෝර්සෝ සංවිධානය පිහිටුවීම
- නේටෝ සංවිධානයේ නායකත්වය අමෙරිකා එක්සත් ජනපදයටත් වෝර්සෝ සංවිධානයේ නායකත්වය සෝවියට් සමූහාණ්ඩුවටත් හිමි වීම
- සෝවියට් දේශය අමෙරිකා එක්සත් ජනපදය කෙරෙහි අවිශ්වාසයෙන් කියුබාව තුළ මිසයිල රැඳවීම. ඊට ප්‍රතිචාර ලෙස අමෙරිකා එක්සත් ජනපදය සෝවියට් දේශය ඉලක්ක කොට තුර්කියේ මිසයිල රැඳවීම

  උදාහරණ :
  - සෝවියට් රුසියානු ආධාර ලැබූ කියුබාව 1969 දී සමාජවාදී රාජ්‍යයක් බවට පත් වීම
  - කොරියාව තුළ අමෙරිකාව අනුගමනය කළ ක්‍රියාකලාපය නිසා දකුණු කොරියාව ධනවාදී කඳවුරට නැඹුරු වීම. උතුරු කොරියාව සමාජවාදී පෙරමුණට එක් වීම
  - හංගේරියානු අර්බුදය
  - චෙකොස්ලෝවැකියාවේ රුසියානු මැදිහත් වීම
  - වියට්නාම යුද්ධය
  - මැදපෙරදිග ප්‍රශ්නවලට මැදිහත් වීම

- බල කඳවුරු බිඳීයාම
  - 1985න් පසු සෝවියට් දේශයේ ආර්ථික ප්‍රතිසංස්කරණ (පෙරෙස්ත්‍රොයිකා) ක්‍රියාත්මක කිරීම හා සෝවියට් සමූහාණ්ඩුව බිඳවැටීම
  - මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමහර රාජ්‍ය කොටස් ස්වාධීන වූ රාජ්‍ය බවට පත් වීම
    උදාහරණ : කසකස්ථානය, යුක්රේනය, උස්බෙකිස්ථානය
  - රුසියාව බෙලෝරුසියාව සමග එකතු වී රුසියානු පෙඩරල් සමූහාණ්ඩුව පිහිටුවා ගැනීම
  - බලකඳවුරු දෙකේ බල තරඟය සෝවියට් දේශය බිඳවැටීමත් සමඟ අවසන් වීම

- වෝර්සෝ සංවිධානය විසුරුවා හැරීම
- දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ප්‍රධාන බලකඳවුරු දෙක අතර ඇති වීමට ගිය අවි ගැටුම් නිරාකරණයකිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වීම





*අමෙරිකා එක්සත් ජනපදයේ හා කියුබාවේ පිහිටීම*

**Source :https://rarehistoricalphotos.com/cuban-missile-crisis-in-pictures-1962/**




*කියුබාවේ සිට අමෙරිකාවට ප්‍රහාර එල්ල කිරීමට රුසියාව සූදානම් ව සිටි ආකාරය*




සෝවියට් දේශය හා තුර්කියේ පිහිටීම



ධනවාදී කඳවුර කවර ඕනෑම අවස්ථාවක වුව දප්‍රහාරයකට සූදානම් ව සිටි ආකාරය

*(Source: https://en.wikipedia.org/wiki/Soviet_territorial_claims_against_Turkey*

http://apjjf.org/-Stephen-F.-Cohen/2283/article.html)

ඇගයීම් 01

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

1. තුෂ්ණී යුද්ධය හා සම්බන්ධ නොවන ගැටුම් මොනවා ද?
   1. උතුරු කොරියා - දකුණු කොරියා 2.අමෙරිකා එක්සත් ජනපදය - කියුබාව
   3 .චීනය- ඉන්දියාව 4. උතුරු වියට්නාමය - දකුණු වියට්නාමය
   5. අරාබිය - ඊස්රායලය (..............)

2 සෝවියට් රුසියාව බිඳ වැටීම නිසා ඇති වූ ප්‍රතිඵල අතුරෙන් ලෝකයට වඩාත් ම අහිතකර බලපෑම වූයේ,
   1. වෝර්සෝ සංවිධානය විසුරුවා හැරීම යි . 2. සමාජවාදී කඳවුරු බිඳවැටීම යි.
   3. සමාජවාදී රටවලට ආධාර නොලැබී යාම යි. 4. ලෝක බල තුලනය අහෝසි වීම යි.
   5. චීනය බලවත් වීම යි.
   (..............)


3. තුෂ්ණී යුද සමයේ,
   1. බල කඳවුරු අතර අවි ගැටුම් වර්ධනය විය.
   2. ලෝක සාමය උදා විය.
   3. නොබැඳි ජාතීන්ගේ බලපෑම වර්ධනය විය.
   4. බල කඳවුරු අතර යුද්ධයක් හෝ සාමයක් හෝ ඇති නොවී ය.
   5. මත ගැටුම් අවි ගැටුම් බවට පත් විය. (..............)

ඇගයීම් 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු ලියන්න**

1. නිරවි යුධ සමයේ ලෝක සාමයක් හෝ යුද්ධයක් ඇති නොවී ය.
   i. නිරවි යුද්ධය යනු කුමක් ද?
   ii. නිරවි යුද සමයේ ලෝක සාමයක් හෝ යුද්ධයක් හෝ ඇති නොවීමට හේතු පැහැදිලි කරන්න
   (ලකුණු 14)

2. i. ධනවාදී කඳවුර ශක්තිමත් කර ගැනීමට අමෙරිකා එක්සත් ජනපදය ගත් ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න
   (ලකුණු 07)
   ii. සමාජවාදී කඳවුර ශක්තිමත් කිරීමට සෝවියට් දේශය ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරන්න
   (ලකුණු 07)


නූතන ලෝක ඉතිහාසය

## 8. අන්තර් ලෝක යුද්ධ සමය

පළමු වෙනි ලෝක යුද්ධය අවසානයේ සිට දෙවෙනි ලෝක යුද්ධයේ ආරම්භය තෙක් කාලය තුළ ලෝකයේ විවිධ වෙනස්කම් රාශියක් සිදු විය. 1929 දී අමෙරිකා එක්සත් ජනපදයේ ආර්ථික අර්බුදයක් ඇති වූ අතර එය අමෙරිකාවට පමණක් නොව ලෝකයේ බොහෝ රටවල් කෙරෙහි අහිතකර ලෙස බලපෑවේ ය. මේ කාලයේ දේශපාලන සංකල්පයක් ලෙස ඉතාලියේ ෆැසිස්ට් වාදය නැඟී ආ අතර, ජර්මනියේ බිහි වූ නට්සිවාදයේ වර්ධනයට ද මෙම ආර්ථික අර්බුදය බලපෑවේ ය. මේ කාලය තුළ ආසියාතික රටක් වූ ජපානය ද ලෝක බලවතකු ලෙස නැඟී සිටියේ ය. අන්තර් ලෝක යුද්ධ සමය තුළ විවිධ රටවල් විසින් අනුගමනය කරන ලද ක්‍රියාකලාපයන්ගේ ප්‍රතිඵල වශයෙන් ලෝක සාමය ආරක්ෂා කිරීමේ අරමුණෙන් පිහිටුවන ලද ජාතීන්ගේ සංගමය ක්‍රමයෙන් අසාර්ථක වීම ද මෙකල දක්නට ලැබුණු තවත් ලක්ෂණයකි.

1929 ඇති වූ මහා ආර්ථික පරිහානිය සහ එමඟින් යුරෝපයට ඇති වූ බලපෑම්, එම කාලය තුළ යුරෝපා රටවල ඇති වූ වෙනස් වීම්, ෆැසිස්ට්වාදී හා නට්සිවාදී බලවේගවල ස්වරූපය සහ ඒවා ලෝක ඉතිහාසය කෙරෙහි ඇතිකළ බලපෑම, ජපානය පළවෙනි ලෝක සංග්‍රාමයෙන් පසු නැඟී ආ ආකාරය මෙන් ම ජාතීන්ගේ සංගමයේ අසාර්ථක භාවයට හේතු වූ කරුණු ආදිය පිළිබඳ ව තොරතුරු විග්‍රහ කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව:** • ගැටලුකාරී තත්ත්වයන් මඟන් නිර්මාණය වන නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම:** 8.1. පළමු ලෝක යුද්ධයෙන් පසු පැනනැඟුණ නව ප්‍රවණතා විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 20

**ඉගෙනුම් පල :**
- අන්තර් ලෝක යුද්ධ සමය පැහැදිලි කරයි.
- ගැටලුකාරී තත්ත්ව ඔස්සේ මතුවන නව ප්‍රවණතාවල බලපෑම පෙන්වා දෙයි.
- ගැටලුකාරී තත්ත්ව ඔස්සේ මතුවන නව ප්‍රවණතාවල බලපෑම විමර්ශනය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**අන්තර් ලෝක යුද්ධ සමය**
- ප්‍රථම ලෝක යුද්ධය අවසාන වූ 1919 සිට දෙවෙනි ලෝක සංග්‍රාමය ආරම්භ වූ 1939 තෙක් කාලය අන්තර් ලෝක යුද්ධ සමය ලෙස සැලකේ.

- ලෝක ආර්ථික අර්බුදය
  - 1929 සිට 1933 පමණ දක්වා කාලය තුළ ආර්ථික අර්බුදය පැවතීම
  - අමෙරිකාවේ ඇති වූ ආර්ථික අර්බුදය
  - 1929 ඔක්තෝබර් මාසයේ දී ව්‍යාපාර (කොටස්) වෙළෙඳපොළේ ඇති වූ තියුණු තරගය නිසා අසාධාරණ අන්දමින් කොටස් මිල අධික ලෙස ඉහළ ගොස් හදිසියේ ම කොටස් වෙළෙඳ පොළ කඩා වැටීම
  - නිව්යෝර්ක් නුවර මුදල් හිමියන් අතර බලවත් වියවුල් තත්ත්වයක් පැන නැඟීම නිසා එතැන් පටන් අමෙරිකාවේ පැවති සමෘද්ධිමය පරියානියට පත් වීම

- අමෙරිකාවේ කර්මාන්ත හා වෙළෙඳාම පරිහානියට පත්වීම හා එම පරිහානිය මුළු ලොවට ම බලපෑම
    * ලොව පුරා වෙළෙඳාම හා බඩු මිල පහත වැටීම
    * ගොවි නිෂ්පාදනවල මිල සීඝ්‍රයෙන් පහත වැටීම
    * කර්මාන්ත ශාලා ආදිය වසා දැමීම නිසා දරුණු රැකියා හිඟයක් ඇති වීම
    * කාර්මික රටවලට මෙන් ම කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය හා ලෝක වෙළෙඳ පොළට ආහාර සැපයූ කෘෂිකාර්මික රටවලටත් පහර වැදීම
- ලෝකයේ රටවල් අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධතාව නිසා ආර්ථික පරිහානිය ලොව පුරා ව්‍යාප්ත වීම
- අමෙරිකානු බැංකු බංකොලොත් භාවයට පත් වීම
- මිල මුදල් හිඟවීම නිසා අමෙරිකාවේ භාණ්ඩ හුවමාරු කිරීමේ සහ සේවා හුවමාරු කිරීමේ ක්‍රමය නැවත ඇති වීම
- සුළු ඉඩම් හිමි කුඩා ගොවි බිම් වගා කළ ගොවීන්ගේ තත්ත්වයට ඉඩම් හිමි මධ්‍යම පාන්තික ගොවීන්, ඇද වැටීම
- අමෙරිකාවේ ඇති වූ ආර්ථික පරිහානිය නිසා අමෙරිකාවෙන් ණය ආධාර ලැබූ රටවලට ණය දීම අමෙරිකාව විසින් නවතනු ලැබීම
- අමෙරිකාවෙන් ණය ආධාර ලැබූ රටවල් කෙරෙහි මෙය ඉතා අහිතකර ලෙස බලපෑම

**අන්තර් යුද්ධ සමයේ යුරෝපා රටවල ස්වභාවය හා ආර්ථික පරිහානිය එම රටවලට ඇති කළ බලපෑම්**

- **ඉතාලිය**
    - පළවැනි ලෝක සංග්‍රාමයෙන් පසු ඉතාලියට ප්‍රශ්න රැසකට මුහුණ දීමට සිදු වීම.(දිළිඳුකම, විරැකියාව, ආහාර හිඟකම, ලෙඩ රෝග පැතිරීම)
    - කැරලි, වැඩවර්ජන, කුමන්ත්‍රණ ආදී සිද්ධි සුලභ වීම
    - රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ඉතාලි පාර්ලිමේන්තුව අපොහොසත් වීම
    - 1920 - 22 අතර කාලය වන විට ඉතාලිය බරපතළ වියවුල්කාරී තත්ත්වයකට පත් ව තිබූ අතර එය ප්‍රයෝජනයට ගෙන ෆැසිස්ට් පක්ෂයේ නායකයා වූ බෙනීටෝ මුසෝලිනී ඉතාලියේ බලයට පත් වීම
    - මුසෝලිනී යටතේ ඉතාලිය සීඝ්‍ර සංවර්ධනයක් කරා ගමන් කිරීම
    - 1929 මහා ආර්ථික පරිහානිය සමඟ සංවර්ධනය වී තිබූ ඉතාලි ආර්ථිකය කඩා වැටීම
    - මුසෝලිනීගේ නායකත්වය යටතේ 1935 පමණ වන විට නැවත ඉතාලියේ අභ්‍යන්තර තත්ත්වය යහපත් වීම
    - 1935 දී ඉතාලිය ඇබිසීනියාව අල්ලා ගැනීම
    - 1939 දී ඉතාලිය ඇල්බේනියාව අල්ලා ගැනීම

- **ප්‍රංශය**
    - අග්‍රාමාත්‍ය පොයින් කෙයාර් හා විදේශාමාත්‍ය බ්‍රයන්ඩ් යටතේ 1929 වන විට ප්‍රංශයේ ආර්ථිකය සැලකිය යුතු ලෙස සංවර්ධනය වී තිබීම
    - එහෙත් 1929 මහා ආර්ථික පරිහානිය ප්‍රංශය කෙරෙහි අහිතකර ලෙස බලපෑම. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1932 මැතිවරණයෙන් ප්‍රංශයේ වාමාංශික රජයක් බලයට පත් වීම
    - ඔවුන් ආර්ථික ප්‍රශ්න විසඳීමට සමත් නොවීම
    - මෙයින් පසු වාමාංශික හා දක්ෂිණාංශික හවුල් ආණ්ඩුවක් ගොඩනැගීම හා ඔවුන්ට ද ආර්ථික ප්‍රශ්න විසඳීමට අසමත් වීම
    - දේශපාලන වශයෙන් ප්‍රංශයේ අවුල් සහගත තත්ත්වයක් ඇති වීම
    - 1935 වන විට වාමාංශික සමාජවාදී සංවිධානයක් මඟින් බිහි කරන ලද මහජන පෙරමුණ

ප්‍රංශයේ බලයට පත් වීම (ලියොන් බ්ලූම් අගමැති ලෙස පත් වීම)

- වාමාංශික රජය විසින් සමාජවාදී වැඩ පිළිවෙළක් ඉදිරි පත් කළ ද ප්‍රංශයේ ආර්ථික, පාලන සංවිධාන අවුල් වීම
- දෙවෙනි ලෝක යුද්ධය ආසන්න වන විට ප්‍රංශ දේශපාලනය ඉතා දුර්වල තත්ත්වයක පැවතීම

- **එංගලන්තය**
  - පළවැනි ලෝක යුද්ධයෙන් පසු එංගලන්තය තරමක නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම
  - ආර්ථික පරිහානියේ ප්‍රතිඵලයක් වශයෙන් අමෙරිකානු ණය ආධාර අහිමි වීම නිසා බ්‍රිතාන්‍යයට ද ආර්ථික පරිහානිය අහිතකර ලෙස බලපෑම
  - මේ නිසා බ්‍රිතාන්‍ය දේශපාලනය අවුල් වී යාම
  - 1931 දී රජුගේ මැදිහත් වීමෙන් ජාතික ආණ්ඩුවක් පිහිටුවීම
  - (වෙළෙඳ පරිහානියෙන් මිදීම සඳහා) දරදඬු ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා 1933 වන විට ආර්ථික පරිහානියෙන් මිදීමට බ්‍රිතාන්‍යයට හැකි වීම
  - 1935න් පමණ පසු බ්‍රිතාන්‍යය යුරෝපා දේශපාලනය ගැන උනන්දු වන්නට වීම
  - ජර්මනියේ යුද්ධායුධ ව්‍යාපාරයෙන්, විශේෂයෙන් නාවික හා ගුවන් හමුදා විශාල කිරීමෙන් තැතිගත් බ්‍රිතාන්‍යය ජාත්‍යන්තර හවුල් සංවිධානයකට බැඳීමටත් තම යුද්ධ බලය තහවුරු කොට ගැනීමටත් කටයුතු කිරීම

- **ජර්මනිය**
  - පළවැනි ලෝක යුද්ධයෙන් පසු ජර්මනිය ඉතා දරුණු උද්ධමන තත්ත්වයකට ගොදුරු වී සිටීම
  - අමෙරිකානු ණය ආධාර නිසා ජර්මනියේ ආර්ථික තත්ත්වය යහපත් අතට හැරීම
  - 1923 පමණ වනවිට ජනාධිපති ට්‍රෙස්මාන්ගේ උත්සාහය නිසා ජර්මනියේ සීඝ්‍ර ආර්ථික දියුණුවක් ඇති වීම
  - එහෙත් 1929 අමෙරිකාවේ ඇති වූ ආර්ථික පරිහානිය අමෙරිකාවට ණය ගැති ව තිබූ යුරෝපා රටවල ද පැතිරයාමේ ප්‍රතිඵලයක් වශයෙන් ජර්මනියට බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ පෑමට සිදු වීම
  - අමෙරිකාව ජර්මනියට ණය ආධාර දීම නතර කිරීම
  - ජර්මනියේ රැකියා හිඟය උග්‍ර වීම, ආහාර හිඟය, වැඩවර්ජන ආදි සමාජ- ආර්ථික අර්බුද පැන නැගුණ අතර ඒවා විසඳීමට මධ්‍යම රජය අපොහොසත් වීම
  - රාජ්‍යය සතු අද්විතීය සර්වාධිපති බලය
  - මූලික අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම
  - පුරවැසියන් සතු අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම හා පුරවැසියන් සතු වගකීම් අවධාරණය කිරීම
  - රාජ්‍යය හා පාලකයා වෙත ජනතාව නිරතුරු ව පක්ෂපාතීත්වයක් දැක්වීම

- **ෆැසිස්ට්වාදයේ නැගීම**

  - පළවැනි ලෝක යුද්ධය අවසානයේ ඉතාලියේ බලාපොරොත්තු ඉටු නොවීම
  - ඉතාලිය දේශපාලන, ආර්ථික, සමාජික යන සැම අංශයකින් ම ඉතා දුර්වල තත්ත්වකයට පත් වීම
  - එම ගැටලු විසඳීමට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ආපොහොසත් වීම
  - 1922 දී බෙනීටෝ මුසෝලිනී ෆැසිස්ට් බලය පිහිටුවීම
  - තුන්වනි වික්ටර් ඉමැනුවෙල් රජුගේ ආරාධනයෙන් ඉතාලියේ අගමැති පදවියට පත් මුසෝලිනී ඉතාලියේ ඒකාධිපති පාලනයක් පිහිටුවීම
  - යුද සේවය අනිවාර්ය කිරීම
  - ඉතාලිය ආර්ථික අතින් නංවාලීම



*මුසෝලිනී සාමාන්‍ය ජනතාව අතර*

***(Source: https://www.understandingitaly.com/people/mussolini.html)***

- **ජර්මනියේ නට්සිවාදයේ නැගීම**

  - 1919 දී ඇඩොල්ෆ් හිට්ලර් නට්සි පක්ෂය ආරම්භ කිරීම
  - ආඥාදායක පාලනයක් වීම
  - අන්ත ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටීම
  - ජර්මන් ජාතිකයන් ලොව ශ්‍රේෂ්ඨතම ජාතිය බව පැවසීම
  - ජර්මන් ජාතිකයන් පිරිසිදු ආර්යයන්ගෙන් පැවත එන්නන් ලෙස සැලකීම
  - පළමුවැනි ලෝක යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් විසිරගිය ජර්මානුවන් නැවත ඒකරාශි කිරීම හිට්ලර්ගේ අරමුණ වීම
  - ජර්මනියට බලහත්කාරයෙන් ඇතුළත් වූ පිරිසක් සේ සලකා යුදෙව්වන් විනාශ කොට දැමීම
  - 1929 ඇති වූ ආර්ථික පරිහානිය නිසා ජර්මනිය පීඩාවට පත් වූ අතර එතෙක් ජනතාව අතර පිළිකුලට ලක් වී සිටි නට්සි පක්ෂය සීඝ්‍රයෙන් ජනතා ප්‍රසාදය ලැබූ පක්ෂයක් බවට පත් වීම

- දේශපාලන හා ආර්ථික වශයෙන් ශක්තිමත් රාජ්‍යයක් බිහි කිරීමට එවක පැවති ප්‍රජාතන්ත්‍රවාදී (වෛමාර් සමූහාණ්ඩුව) ආණ්ඩුව අපොහොසත් වීම නට්සි පක්ෂයේ හා හිට්ලර්ගේ වර්ධනයට හේතු වීම)

**ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම**

- **ජාතීන්ගේ සංගමයේ ආරම්භය**
  - 1919 වර්සායි ගිවිසුමේ වගන්තියක් අනුව (ජාතීන් අතර ඇති වූ ආරවුල් සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීම) හා ලෝක සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර සංවිධානයක් පිහිටුවා ගැනීමේ අරමුණෙන් ජාතීන්ගේ සංගමය පිහිටුවීම
  - ජාතීන් අතර ඇතිවන ආරවුල් සාමකාමී ව විසඳා ගැනීම මඟින් අනාගතයේ යුද්ධ ඇතිවීම වැළැක්වීම ජාතීන්ගේ සංගමයේ අරමුණ වීම
  - ජාත්‍යන්තර අවබෝධය හා සහයෝගය වර්ධනය කොට ගැනීමත් කුඩා රාජ්‍යවල නිදහස සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමත් ජාතීන්ගේ සංගමයේ තවත් අපේක්ෂාවක් වීම

- **ජාතීන්ගේ සංගමයේ ක්‍රියාකාරිත්වය**
  - 1919 සිට 1939 තෙක් ක්‍රියාත්මක ව පැවැතීම. එසේ වුවත් 1929 ආර්ථික පරිහානියෙන් පසු ව එහි පරිහානිය ආරම්භ වීම
  - 1929 පමණ තෙක් කාලය තුළ ලෝකය මුහුණ දුන් ප්‍රධාන ප්‍රශ්න රැසක් විසඳා ගැනීමට ජාතීන්ගේ සංගමයට හැකි වීම

- **ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට හේතු**
  - ජාතීන් අතර පැවති ඇතැම් ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට මුල දී සමත් වුව ද පසුව ගැටලු විසඳගැනීමට අපොහොසත් වීම
  - ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළ අමෙරිකා එක්සත් ජනපදය අමෙරිකානු සෙනේට් සභාවේ තීරණය මත ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය නොගැනීම
  - පළවැනි ලෝක සංග්‍රාමයේ වරදකරුවා වූ ජර්මනියට මුල දී ජාතීන්ගේ සංගමයේ අසුනක් හිමි නොවීම (පරාජිත ජාතීන් නොසලකා හැරීම)
  - රුසියාව ජාතීන්ගේ සංගමයෙන් ඉවත් ව සිටීම
  - මහා බලවතුන් අතර එකමුතු බවක් නොවීම, සංගමයේ ව්‍යවස්ථාවට අනුව යම් ප්‍රශ්නයක් පිළිබඳ තීරණ ගැනීමේ විධායක මණ්ඩලයේ සියලු දෙනා එකඟ විය යුතු වුවත් මහා බලවතුන් අතර බොහෝ විට ඒකමතික බවක් දක්නට නොවීම. බ්‍රිතාන්‍ය බොහෝවිට බාහිර ප්‍රශ්නවලට සම්බන්ධ වීමට අකමැත්තෙන් ජාතීන්ගේ සංගමයෙන් ඈත් ව සිටීම
  - තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා සංගමයට නිත්‍ය යුද හමුදාවක් නොතිබීම. මේ නිසා සාමාජික රටවල් ආක්‍රමණික කටයුතුවල නිරත වීම වැළැක්වීමට සංගමය අපොහොසත් වීම
  - ඒකාබද්ධ යුද හමුදාවක් ගොඩනැගීමට යෝජනා වී තිබුණ ද බ්‍රිතාන්‍යයෙන් එල්ල වූ විරෝධය නිසා එය ක්‍රියාත්මක නොකිරීම
  - නිරායුධ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු යයි යෝජනා වුව ද ඒ සඳහා නිරායුධ කොමිසමක් පත් නොකිරීම
  - ආරම්භ කරන ලද විශ්ව සාමූහිකත්වය ක්‍රියාත්මක කිරීම අසීරු ප්‍රයත්නයක් වීම
  - ලෝක සාමය පවත්වාගෙන යාමේ අරමුණු බිඳ වැටීම

    උදාහරණ: * 1931 දී ජපානය විසින් මැංචූරියාව ආක්‍රමණය කරන ලද අවස්ථාවේ ජපානය මැංචූරියාවෙන් ඉවත් විය යුතු යයි ජාතීන්ගේ සංගමය නියෝග කළ ද ජපානය එම නියෝගය ප්‍රතික්ෂේප කොට ජාතීන්ගේ සංගමයෙන් ඉල්ලා අස් වීම. ජපානය ආක්‍රමණික කටයුතුවලින් ඉවත් කිරීමට සංගමය අපොහොසත් වීම

* ජර්මනිය ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම
* 1935 ඉතාලිය විසින් ඇබිනීසියාව ආක්‍රමණය කරනු ලැබීම වැළැක්වීමට ජාතීන්ගේ සංගමය අපොහොසත් වීම
* ජර්මනිය වර්සායි ගිවිසුමේ වගන්ති කඩ කොට යළි ආයුධ සන්නද්ධ වීම ආරම්භ කළත් ජාතීන්ගේ සංගමය නිහඬ ව සිටීම
* 1936 දී හිට්ලර් රයින්ලන්ත ප්‍රදේශ අල්ලා ගනිද්දී ජාතීන්ගේ සංගමයට එය වැළැක්වීමට නොහැකි වීම
* 1938 දී ජර්මනිය ඔස්ට්‍රියාව ආක්‍රමණය කිරීම හා චෙකොස්ලොවැකියාවේ ජර්මන්වරුන් බහුතරය ජීවත් වූ සුඩෙටන්ලන්තය අල්ලා ගැනීමට එරෙහි ව කටයුතු කිරීමට ශක්තියක් ජාතීන්ගේ සංගමයට නොවීම
* 1939 දී මුළු චෙකොස්ලොවැකියාව ම අල්ලා ගනිද්දී ඊට එරෙහි ව යාමට ජාතීන්ගේ සංගමය අපොහොසත් වීම
* ලෝක ආර්ථික පරිහානියෙන් පසු ව ජාතීන්ගේ සංගමයේ පරිහානිය ආරම්භ වීම
* දෙවැනි ලෝක යුද්ධය ආරම්භ වන විට ජාතීන්ගේ සංගමය අක්‍රිය ව පැවතීම

ඇගයීම 01

1. පැසිස්ට්වාදී සංවිධානයක් ඉතාලියේ ක්‍රියාත්මක කළ නායකයා කවරෙක් ද?
   1. ඇඩොල්ෆ් හිට්ලර් 2. බෙනීටෝ මුසෝලිනී 3. ජෝශප් මැසිනි
   4. ගැරිබෝල්ඩි 5. නැපෝලියන් බොනපාට් (...............)

2. ආයුධ සන්නද්ධ ප්‍රචණ්ඩත්වය මූලික ලක්ෂණයක් ලෙස දක්නට ඇත්තේ කවර මතවාද දෙක සම්බන්ධයෙන් ද?
   1. ෆැසිස්ට්වාදය හා ලිබරල්වාදය 2. මාක්ස්වාදය හා ලිබරල්වාදය
   3. ලිබරල්වාදය හා කොමියුනිස්ට්වාදය 4. නට්සිවාදය හා මාක්ස්වාදය
   5. නට්සිවාදය හා ෆැසිස්ට්වාදය (...............)

3. **පහත A හා B තීරු නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරන්න**

| A | B |
|---|---|
| 1. වින්ස්ටන් චර්චිල් | A ඉතාලිය |
| 2. චාල්ස් ඩිගෝල් | B රුසියාව |
| 3. හින්ඩන්බර්ග් | C එංගලන්තය |
| 4. ජෝශප් ස්ටාලින් | D ප්‍රංශය |
| 5. බෙනීටෝ මුසෝලිනී | E ජර්මනිය |

(1) ABCDE (2) CDEBA (3) DEBAC (4) EBACD (5) BACDE
(...............)

4.

| A | B |
|---|---|
| 1. 1922 | A හිට්ලර් ජර්මනියේ චාන්සලර් තනතුරට පත්වීම |
| 2. 1929 | B හිට්ලර් ජර්මන් සුඩෙටන්ලන්තය අල්ලා ගැනීම |
| 3. 1933 | C ඉතාලියේ මුසෝලිනි බලයට පත් වීම |
| 4. 1936 | D ලෝක ආර්ථික පරිහානිය |
| 5. 1938 | E හිට්ලර් රයින්ලන්ත ප්‍රදේශ ඈඳා ගැනීම |

(1) DAEBC (2) AEBCD (3) EBCDA (4) CDAEB (5) BCDAE
(...............)

- **පහත ප්‍රශ්න සඳහා මාතෘකාවකට අදාළ ව කරුණු පහ බැගින් දක්වා ඇත. ඒවායින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරන්න**

5. **ඉතාලියේ ෆැසිස්ට් වාදය**
   1. වයිමාර් සමූහාණ්ඩුවේ දුර්වලතා ඉතාලියේ ෆැසිස්ට්වාදයේ නැගී ඒමට මඟ පෑදී ය.
   2. බෙනීටෝ මුසෝලිනී ඉතාලියේ ෆැසිස්ට්වාදයේ නායකයා විය.
   3. 1922 දී ඔහු ඉතාලියේ බලය අත් කොට ගත්තේ ය.
   4. ඔහු පාප් වහන්සේ සමඟ එකඟතාවක් ඇතිකොට ගත්තේ ය.
   5. ෆැසිස්ට් ඉතාලිය 1935 දී ඉතියෝපියාව ආක්‍රමණය කළේ ය.

(...............)

**6. ජර්මනියේ නාසිවාදයේ නැගීම**
1. හිට්ලර්ගේ දක්ෂ නායකත්වය
2. මධ්‍යම පන්තිය හා ධනවතුන් නාසි පක්ෂයට සහයෝගය දැක්වීම
3. වෛමාර් සමූහාණ්ඩුවේ අනුග්‍රහය ලැබීම
4. ජර්මනියට බලපෑ ආර්ථික පරිහානිය
5. හිට්ලර්ට පමණක් දෙවෙනි වූ සහායකයන් පිරිසක් සිටීම (...............)

**7. අන්තර් ලෝක යුද්ධ සමය තුළ සාමය සඳහා දරන ලද ප්‍රයත්න**
1. 1919 දී ජාතීන්ගේ සංගමය පිහිටුවීම
2. 1925 ලොකාර්නෝ ගිවිසුම
3. 1932 නිරායුධ සම්මේලනය
4. 1933 හිට්ලර් විසින් ජර්මනියේ ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවනු ලැබීම
5. 1938 මියුනික් එකඟතාව (...............)

**8. ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු**
1. අමෙරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය නොගැනීම
2. මහා බලවතුන් අතර ඒකමතික බවක් නොවීම
3. රුසියාවට ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය නොලැබීම
4. ඉතාලිය 1935 දී ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම
5. ජාතීන්ගේ සංගමය සතු යුද හමුදාවක් නොවීම (...............)

**9. ජාතීන්ගේ සංගමය අරමුණු බිඳවැටුණු අවස්ථා**
1. 1931 ජපානය විසින් මැංචූරියාව ආක්‍රමණය කිරීම
2. 1935 ඉතාලිය ඇබිසීනියාව ආක්‍රමණය කිරීම
3. 1956 දී එංගලන්තය හා ප්‍රංශය එක් වී ඊජිප්තුව ආක්‍රමණය කිරීම
4. වර්සෙල්ස් ගිවිසුමේ වගන්ති කඩකරමින් ජර්මනිය යළි ආයුධ සන්නද්ධ වීම
5. 1939 දී හිට්ලර් මුළු චෙකොස්ලොවැකියාව ම ඇඳා ගැනීම (...............)

**10. ජාතීන්ගේ සංගමය පිහිටුවීමට මුල් වූ අමෙරිකානු ජනාධිපති වරයා කවරෙක් ද?**
1. තෝමස් ජෙෆර්සන් 2. ඇන්ඩෲ ජැක්සන් 3. තියඩෝර් රූස්වෙල්ට්
4. වුඩ්රෝ විල්සන් 3. හැරී ට෴මන්

(...............)

ඇගයීම 02

1. i. 1929 ලෝක ආර්ථික අර්බුදය කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 02)
ii. ලෝක ආර්ථික අර්බුදය අමෙරිකා එක්සත් ජනපදයට බලපෑ ආකාරය විස්තර කරන්න (ලකුණු 06)
iii. මෙම ආර්ථික අර්බුදය යුරෝපයේ අනෙකුත් රටවල් කෙරෙහි ඇති කළ බලපෑම කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 06)

2. ඉතාලියේ පැසිස්ට්වාදය හා ජර්මනියේ නට්සිවාදය නැගී ඒමට තුඩු දුන් සාධක තුලනාත්මක ව සාකච්ඡා කරන්න (ලකුණු 14)

3. ''ජාතීන්ගේ සංගමය ලෝකයට ස්ථිර සාමයක් ගෙන ඒමට අසමත් විය.''

i. ජාතීන්ගේ සංගමය පිහිටුවීමට යෝජනා කරන ලද ගිවිසුම නම් කරන්න (ලකුණු 01)

ii. ජාතීන්ගේ සංගමයේ ස්ථිර සාමාජිකයන් දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 02)

iii.ජාතීන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු මොනවා ද? (ලකුණු 03)

iv. ජාතීන්ගේ සංගමය දෙවෙනි ලෝක යුද්ධය ඇතිවීම වැළැක්වීමට අසමත් වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න (ලකුණු 08)

4.''දශක කීපයකට හෝ ලෝක සාමය ආරක්ෂා කිරීමට ජාතීන්ගේ සංගමයට හැකි විය''

i. ජාතීන්ගේ සංගමයේ ආරම්භක සාමාජිකයන් තිදෙනෙකු නම් කරන්න (ලකුණු 03)

ii. ජාතීන්ගේ සංගමයේ ව්‍යූහය කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 03)

iii.ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා ජාතීන්ගේ සංගමය ගත් ප්‍රයත්න ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න්න

(ලකුණු 08)

# 9. දෙවෙනි ලෝක යුද්ධය

පළවැනි ලෝක සංග්‍රාමය නිසා ලෝකයේ බොහෝ රටවලට බිහිසුණු විනාශයකට මුහුණ දීමට සිදු වූ අතර නැවත එවැනි විනාශකාරී යුද්ධයක් ඇති වීම වැළැක්වීම පිණිස ලෝක නායකයන් එක් ව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළ නමුත්, වැඩි කලක් යාමට පෙර ජර්මනියේ නට්සි නායක අඩොල්ෆ් හිට්ලර්ගේ ක්‍රියාකලාපයේ ප්‍රතිඵලයක් වශයෙන් 1939 දී දෙවෙනි ලෝක සංග්‍රාමය ආරම්භ විය.

පළවැනි ලෝක යුද්ධය අවසානයේ ඇති කරන ලද වර්සෙල්ස් ගිවිසුම මඟින් ජර්මනියට පමුණුවන ලද දඬුවම් නිසා පසුකාලයේ හිට්ලර් වැනි නායකයකුට ජර්මනියේ බලයට පත් වීමේ අවස්ථාව ලැබිණි. හිට්ලර් 1933 දී ජර්මනියේ බලයට පත් වූ අතර ඔහු විසින් අනුගමනය කරන ලද ක්‍රියාකලාපයේ ප්‍රතිඵලයක් වශයෙන් 1939 සැප්තැම්බර් 01 දින දෙවන ලෝක යුද්ධය ආරම්භ විය. මේ හැරෙන්නට ලෝක සාමය ආරක්ෂා කිරීමේ අරමුණෙන් පිහිටුවන ලද ජාතීන්ගේ සංගමයේ දුර්වලතා මෙන් ම ඉතාලියේ මුසෝලිනි ගේ ක්‍රියාකලාපය හා ජපානය ගෙනගිය ආක්‍රමණශීලී ක්‍රියාකලාප ද දෙවෙනි ලෝක යුද්ධය ඇති වීමට බොහෝ දුරට බලපෑවේ ය.

දෙවන ලෝක යුද්ධය මහාද්වීප කීපයක් පුරා පැතිරී ගිය අතර බ්‍රිතාන්‍යය යුද්ධයට සහභාගී වීමත් සමඟ බ්‍රිතාන්‍ය යටත් විජිත කරා ද යුද්ධය ව්‍යාප්ත විය. ජපාන අමෙරිකා එක්සත් ජනපදය සතු පර්ල් වරායට පහරදීම නිසා අමෙරිකා එක්සත් ජනපදය ලෝක යුද්ධයට අවතීර්ණ විය. අමෙරිකා එක්සත් ජනපදය ජපානයේ හිරෝෂිමා නාගසාකි නගරවලට පරමාණු හෙළීමත් සමඟ ජපානය පරාජය වූ අතර අතිවිශාල ජීවිත හා දේපොළ ප්‍රමාණයක් ලෝකයට අහිමි කරමින් දෙවන ලෝක යුද්ධය අවසන් විය.

මේ තත්ත්වය කෙරෙහි ලෝක බලවතුන්ගේ අවධානය යොමු වූ අතර 1945 දී ලෝක බලවතුන් එක් වී අමෙරිකා එක්සත් ජනපදයේ සැන් ෆ්‍රැන්සිස්කෝ නුවර දී සම්මත කොටගත් ප්‍රඥප්තියට අනුව ලෝක සාමය රැකීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සංගමය පිහිටුවනු ලැබී ය. විවිධ බාධා එල්ල වුව ද ලෝක සාමය රැකගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් මේ දක්වා ම වැදගත් සේවයක් සිදු වී තිබේ. දෙවෙනි ලෝක යුද්ධයට හේතු, යුද්ධයේ ස්වරූපය හා එහි ප්‍රතිඵල මෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය හා ඉන් සිදු වූ සේවය ආදිය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • බලය පිළිබඳ ඇතිවන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැක ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 9.1. දෙවෙනි ලෝක යුද්ධයේ විනාශකාරී බව පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 28 යි.

**ඉගෙනුම් පල** :
- දෙවෙනි ලෝක යුද්ධයේ ආරම්භය හා ව්‍යාප්තිය පැහැදිලි කරයි.
- දෙවෙනි ලෝක යුද්ධයේ ප්‍රතිඵල විග්‍රහ කරයි.
- දෙවෙනි ලෝක යුද්ධ සමය සහ පසුකාලයේ ලෝකය සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න**

**9.1 දෙවෙනි ලෝක යුද්ධය**

1939 සැප්තැම්බර් 01 දින ඇඩොල්ෆ් හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීමෙන් දෙවන ලෝක යුද්ධය ආරම්භ විය.

**දෙවෙනි ලෝක යුද්ධය ඇති වීමට බලපෑ හේතු**

- ජර්මනියේ වෛමාර් සමූහාණ්ඩුවේ දුර්වලතා
  - දේශපාලන වශයෙන් ස්ථිර ආණ්ඩු පිහිටුවාගත නොහැකි වීම
- දේශපාලන අස්ථාවර භාවය
  - ආර්ථික උද්ධමනය
  - විරැකියාව
  - ආහාර හිඟය
  - ඒකාධිපතියකු බිහි වීමට සුදුසු පරිසරයක් සකස් වීම
  - හිට්ලර් බලයට පත් වීම
  - ජර්මනිය යළි ගොඩනැගීම

- **වර්සෙල්ස් ගිවිසුමේ දුර්වලතා**
  - ජර්මනියට අසාධාරණ දැඩි දඬුවම් පැමිණවීම
  - ජර්මනියෙන් අසාධාරණ ලෙස වන්දි මුදල් අයකිරීම
  - ජර්මනිය සතුව පැවති යටත් විජිත අහිමි වීම

- **ෆැසිස්ට් වාදයේ හා නට්සි වාදයේ නැගීම**
  - හිට්ලර් මුසෝලිනි මිත්‍රත්වය
  - ආර්ථික හා යුද්ධ කටයුතු පිළිබඳ සහයෝග

- **හිට්ලර්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්ති**
  - මයින් කාම්ප් (මගේ සටන) කෘතිය ප්‍රකාශයට පත්කිරීම
  - හිට්ලර් ජර්මනියේ චාන්සලර් තනතුරට පත් වීම
  - ජනාධිපති හින්ඩන්බර්ග් මියයාමෙන් පසු හිට්ලර් ජර්මනියේ ජනාධිපති තනතුරට පත්වීම
  - විරුද්ධ වාදීන් විනාශ කිරීම - චරපුරුෂ සේවයක් ඇති කොට ප්‍රතිවරුද්ධ කණ්ඩායම් මර්දනය කිරීම
  - සිවිල් අයිතිවාසිකම් අවලංගු කිරීම
  - අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය අහෝසි කිරීම
  - අධ්‍යාපන කටයුතු පාලනය තමා යටතට ගැනීම
  - යුදෙව්වන්ට දරුණු වද හිංසා පැමිණවීම
  - වෘත්තීය සංගම් තහනම් කිරීම
  - ජර්මනියේ ආර්ථිකය නඟා සිටුවීම
  - ප්‍රවාහණ කටයුතු දියුණු කිරීම
  - ෆැසිස්ට් පක්ෂය හැර අන් සියලු පක්ෂ තහනම් කිරීම
  - අනිවාර්ය යුද සේවය ආරම්භ කොට යුද හමුදාව ශක්තිමත් කිරීම
  - ජර්මනිය අවිආයුධ අතින් සන්නද්ධ කිරීම
  - දැඩි පුවත්පත් වාරණය
  - අධ්‍යාපනය දැඩි ලෙස පාලනය කිරීම හා ෆැසිස්ට් ක්‍රමය හුවාදැක්වීමට අධ්‍යාපනය යොදා ගැනීම
  - වෘත්තීය සමිති ෆැසිස්ට් පාලනය යටතට ගැනීම
  - පාප් වහන්සේ සමඟ ගිවිසුමකට එළඹීම
  - ඇබිසීනියාව ආක්‍රමණය කිරීම
  - වර්සෙල්ස් ගිවිසුමේ වගන්ති කඩකරමින් දේශ සීමා පුළුල් කොට ගැනීම
  - රයින් ලන්ත ප්‍රදේශ ඈඳා ගැනීම
  - සුඩෙටන්ලන්තය ආපසු ලබා ගැනීම



*හිට්ලර් යටතේ ජර්මනියේ මාර්ග සංවර්ධන කටයුතු*

***( Source: http://weimarandnazigermany.co.uk/autobahn/#.WmW0AYVOKUk )***



*හිට්ලර් සමයේ යුද හමුදා අවශ්‍යතා සඳහා නිපදවන ලද වොක්ස්වගන් රථ*

**(*source: http://warfarehistorynetwork.com)***

- ජපානය පෙරදිග බලවතෙකු ලෙස නැඟී සිටීම
  - විසිවැනි සියවසේ මුල් කාලය වන විට ජපානය ලෝකයේ ඉතා දියුණු රටක් බවට පත්වීම
  - ජපානයේ ඇතිවූ සීඝ්‍ර ආර්ථික වර්ධනය
    * ධනවාදී ආර්ථිකය
    * කර්මාන්ත වර්ධනය
    * තාක්ෂණික දියුණුව
  - ජපානය ආසියාවේ අධිරාජ්‍යයන් පිහිටුවා ගැනීමට උත්සාහ දැරීම
    * උදාහරණ: කොරියාව සම්බන්ධ ව චීන ජපන් ගැටුම
    * රුසියන් ජපන් යුද්ධය
    * අමෙරිකාව සතු ආසියානු ප්‍රදේශ අල්ලා ගැනීම
  - ජපානයේ යුද්ධ ජයග්‍රහණ හා ව්‍යාප්ති වැළැක්වීමට අමෙරිකාව ඇතුළු යුරෝපා රටවල් ( කටයුතු කිරීම



*පර්ල් වරාය - ජපානය විසින් පහර දීමට පෙර*

***( Source:http://worldwar2headquarters.com/HTML/PearlHarbor/us-consequences.html)***




*ජපානය විසින් පර්ල් වරායට පහරදීම*

( source: ***https://www.britannica.com/event/Pearl-Harbor-attack)***

- **යුද්ධයේ ආරම්භය**
  - 1939 සැප්තැම්බර් 01 දින හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීම
  - එයට ප්‍රතිචාර වශයෙන් බ්‍රිතාන්‍යය හා ප්‍රංශය ජර්මනියට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කිරීම
- **යුද්ධයේ ව්‍යාප්තිය**
  - යුරෝපය තුළ කඳවුරු තුනක් බිහි වීම හා ඔවුනොවුන් අතර තිබූ සැකය
    * ජර්මනිය හා ඉතාලිය
    * බ්‍රිතාන්‍යය හා ප්‍රංශය
    * රුසියාව
  - නට්සි - කොමියුනිස්ට් සාම ගිවිසුම
  - ජාතීන්ගේ සංගමයේ දුර්වලතා
  - ආසන්නතම හේතුව - හිට්ලර් විසින් පෝලන්තය ආක්‍රමණය කිරීම
  - ජපානය පර්ල් වරායට පහරදීමත් සමඟ අමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පක්ෂය ගනිමින් දෙවෙනි ලෝක යුද්ධයට සම්බන්ධ වීම
  - දෙවෙනි ලෝක යුද්ධයේ පස මිතුරු පාර්ශ්ව කරුවෝ
    * මිත්‍ර පක්ෂය - එංගලන්තය, ප්‍රංශය, රුසියාව, අමෙරිකා එක්සත් ජනපදය
    * අක්ෂ පක්ෂය - ජර්මනිය, ඉතාලිය, ජපානය
  - යුරෝපයේ බලවතුන් පිල්වලට බෙදෙමින් යුද හමුදා තර කිරීම
  - යුද්ධයේ ප්‍රධාන පිල් සහ සටන් පෙරමුණු
  - හිට්ලර් නව යුද්ධ උපාය මාර්ග භාවිත කිරීම
  - ''බ්ලිට්ස්ක්‍රිග්'' ක්‍රමය හෙවත් ක්ෂණික ප්‍රහාර එල්ල කිරීම
  - අතිදියුණු යුද ටැංකි භාවිතය
  - ප්‍රහාරක අහස් යානා යොදා ගැනීම
  - කාර්යක්ෂම චරපුරුෂ සේවය
  - 1940 දී හිට්ලර්, නෝර්වේ - ස්වීඩන් ආක්‍රමණය කොට ජය ගැනීම
  - ඕලන්දය හා බෙල්ජියම සටන් කිරීම
  - ප්‍රංශය පරාජය කිරීම
  - බ්‍රිතාන්‍යයට එරෙහි සටන
  - බෝල්කන් ප්‍රදේශ යටත් කිරීම
  - සෝවියට් දේශය ආක්‍රමණය කිරීම
  - අමෙරිකා එක්සත් ජනපදය හා ජපානය යුද්ධයට අවතීර්ණ වීම

*හිට්ලර්ගේ යුද හමුදාව*

*(SOURCE: HTTP://WWW.ALAMY.COM/STOCK-PHOTO-NAZI-LEADER-ADOLF-HITLERS-ARMY-IN-1945-69276282.HTML)*



- **යුද්ධයේ අවසානය**
  - සෝවියට් හමුදා අතින් ජර්මන් හමුදා පරාජයට පත් වීම
  - බ්‍රිතාන්‍ය හා අමෙරිකා එක්සත් ජනපද හමුදා එක් ව කළ ප්‍රහාර හමුවේ ජර්මනිය පරාජයට පත් වීම
  - පරමාණු බෝම්බ නිසා අඩපණ වූ ජපානය පරාජය පිළිගැනීම

- **යුද්ධයේ ප්‍රතිඵල**
  - ලෝකයේ මෙතෙක් පැවති බිහිසුණු ම සංග්‍රාමය වීම, ලෝකය පුරා මානව සම්පත් හා භෞතික සම්පත් දැවැන්ත ලෙස විනාශ වීම
  - පරමාණු බෝම්බවලින් හිරෝෂිමා හා නාගසාකි විනාශ වී ගිය අතර එහි ප්‍රතිඵල අනාගත පරම්පරාව අතර ද දැකිය හැකි වීම
  - ජර්මනිය විනාශයට පත් වීම
  - ජර්මනිය, නැගෙනහිර ජර්මනිය හා බටහිර ජර්මනිය යනුවෙන් දෙකඩ වීම
  - මෙතෙක් ලෝක බලවතුන් ලෙස සිටි එංගලන්තයට හා ප්‍රංශයට එම ස්ථානය අහිමි වීම
  - බ්‍රිතාන්‍ය - ප්‍රංශ අධිරාජ්‍යය බිඳවැටීම
  - අමෙරිකා එක්සත් ජනපදය සහ සෝවියට් රුසියාව සුපිරි බලවතුන් ලෙස නැඟී සිටීම
  - අමෙරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයා ලෙස ඉදිරිපත් වීම
  - බ්‍රිතාන්‍යය, ප්‍රංශය, බෙල්ජියම, ඕලන්දය, බටහිර ජර්මනිය ආදි ධනවාදී අර්ථ ක්‍රම සහිත රටවල් අමෙරිකා එක්සත් ජනපදය සමඟ එක් කඳවුරකට එකතු වීම
  - සෝවියට් රුසියාව මුල් කොටගෙන කොමියුනිස්ට් බල කඳවුරක් බිහි වීම
  - පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, බල්ගේරියාව, යුගොස්ලාවියාව, නැගෙනහිර ජර්මනිය ආදි රටවල් එකී කොමියුනිස්ට් කඳවුරට අයත් වීම
  - පරාජිත රටවල් (විශේෂයෙන් බටහිර ජර්මනිය හා ජපානය) නගා සිටුවීම සඳහා අමෙරිකා එක්සත් ජනපදය විසින් මාර්ෂල් සැලැස්ම හඳුන්වා දෙනු ලැබීම
  - බ්‍රිතාන්‍යය හා ප්‍රංශය සතුව පැවති යටත් විජිතවලට නිදහස ලැබීම
  - ලෝක සාමය ආරක්ෂා කිරීම සහ ජාතීන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම



*යුද්ධයේ විනාශය*

***(Source: http://www.ncregister.com/blog/sbeale/can-the-hiroshima-bombing-be-morally-justified)***



යුද්ධයෙන් අසරණ වූවෝ

***(Source: h ttps://www.defensemedianetwork.com)***




***(Source: https://singularthings.wordpress.com/tag/image-of-the-refugee/)***

ඇගයීම 01

- **පහත සඳහන් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවායින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

1. 1. ඇඩොල්ෆ් හිට්ලර් 2. බෙනිටෝ මුසෝලිනී 3. වික්ටෝරියෝ ඕර්ලැන්ඩෝ 4. වින්ස්ටන් චර්චිල් 4. ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (...........)

2. 1. ජර්මනිය 2. ඉතාලිය 3. ජපානය 4. හංගේරියාව 5.ප්‍රංශය (...........)

3. 1. ගෝරිං 2. ගොබෙල්ස් 3. වොන් මොල්ක් 4. ඩොනිට්ස් 5. රිබන්ත්‍රොප් (...........)

4. 1. රයින්ලන්තය 2. ඇබිසීනියාව 3. සුඩෙටන්ලන්තය 4. චෙකොස්ලෝවැකියාව 5. ඔස්ට්‍රියාව (...........)

5. 1. ප්‍රංශය 2. එංගලන්තය 3. රුසියාව 4. අමෙරිකා එකසත් ජනපදය 5. ඉතාලිය (...........)

- **පහත සඳහන් එක් එක් ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එම කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

6. දෙවෙනි ලෝක යුද්ධය
   1. 1939 දී ආරම්භ විය
   2. යුද්ධය ඇති වීමට තුඩුදුන් ආසන්න හේතුව වූයේ ඔස්ට්‍රියාවේ ෆ්‍රැන්සිස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා ඝාතනය කරනු ලැබීම යි
   3. යුරෝපයේ ඒකාධිපති පාලන තන්ත්‍ර නැඟී ඒම නිසා යුද්ධය ඇතිවීම නොවැළැක්විය හැකි විය
   4. ජපානය පරාජයට පත්වීමත් සමග යුද්ධය අවසාන විය
   5. යුද්ධයෙන් පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවනු ලැබී ය (...........)

7. දෙවෙනි ලෝක යුද්ධය
   1. 1939 දී ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමණය කරනු ලැබීම
   2. 1940 දී ඉතාලිය යුද්ධයට සම්බන්ධ වීම
   3. 1941 දී ජපානය පර්ල් වරායට පහර දීම
   4. 1945 දී ජපානය යුද්ධයෙන් ජය ගැනීම
   5. 1945 දී ජර්මනිය කොන්දේසි විරහිත ව යටත් වීම (...........)

8. දෙවෙනි ලෝක යුද්ධය ඇති වීම වළක්වා ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නය
   1. 1919 ජාතීන්ගේ සංගමය පිහිටුවීම
   2. 1925 ලොකාර්නෝ ගිවිසුම අස්සන් කිරීම
   3. 1932 නිරායුධ සම්මේලනය
   4. 1938 මියුනික් සමථය
   5. 1933 දී හිට්ලර් විසින් ජර්මනියේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම (...........)

ඇගයීම 02
**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු ලියන්න**

1. දෙවෙනි ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක විවේචනාත්මක ව විමසන්න
(ලකුණු 14)

2. දෙවෙනි ලෝක යුද්ධය ආරම්භ වීමේ මුල් බීජ පළවැනි ලෝක යුද්ධයේ ප්‍රතිඵලවල ගැබ් ව තිබිණි. සාකච්ඡා කරන්න
(ලකුණු 14)

3. දෙවෙනි ලෝක යුද්ධයෙන් උද්ගත වූ ප්‍රතිඵල විවේචනාත්මක ව විමසන්න
(ලකුණු 14)

4. දෙවෙනි ලෝක යුද්ධයට තුඩු දුන් හේතු පරීක්ෂා කරන්න
(ලකුණු 14)

ඇගයීම 03

1. දෙවෙනි ලෝක යුද සමයේ මිත්‍ර පක්ෂයේ හා අක්ෂ පක්ෂයේ රටවල් ලෝක සිතියමක ලකුණු කරන්න

**නිපුණතා මට්ටම** : 9.2. ලෝක සාමය ඇති කොට ගැනීම සඳහා සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම පරීක්ෂා කරයි.

**කාලච්ඡේද** : 07 යි.

**ඉගෙනුම් පල** :
- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු පැහැදිලි කරයි.
- දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක සාමය රැකගැනීමට ගත් ප්‍රයත්න පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**9.2 එක්සත් ජාතීන්ගේ සංවිධානය**

දෙවන ලෝක යුද්ධය අවසාන වීමෙන් පසු ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා පිහිටුවන ලද ජගත් සංවිධානය මෙනමින් හඳුන්වනු ලබේ.

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භය**
  - ජාතීන්ගේ සංගමයට වඩා ශක්තිමත් සංවිධානයක අවශ්‍යතාව මතු වීම
  - එකිනෙකාගේ නිදහසට හා සමානාත්මතාවට ගරු කරමින් ලෝක සාමයත්, ආරක්ෂාවත් සඳහා අන්තර්ජාතික සංවිධානයක් බිහි කළ යුතු බව තීරණය කිරීම
  - ක්‍රි.ව. 1941 අත්ලාන්තික් ප්‍රඥප්තිය
    - * යටත් වූවන්ට නිදහස ලබාදීම
    - * ස්වයං තීරණ අයිතිය ලබාදීම
    - * නිරායුධකරණය
  - ක්‍රි.ව. 1943 දී ටෙහෙරාන් නුවරට රැස්වූ ලෝක බලවතුන් (බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන් චර්චිල් අමෙරිකා එක්සත් ජනපද ජනාධිපති ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට්, සෝවියට් රුසියානු නායක ජෝශෆ් ස්ටාලින්) ලෝක සාමය උදෙසා අන්තර්ජාතික සංවිධානයක් පිහිටුවීමට තීරණය කිරීම
  - ක්‍රි.ව. 1945 දී සැන් ෆ්‍රැන්සිස්කෝ නගරයේ පැවැත් වූ සමුළුවක දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම
  - ලෝකයේ බලවත් රටවල් පහක් ඇතුළු රටවල් 51ක් ප්‍රඥප්තියට අස්සන් තැබීම
  - ක්‍රි.ව. 1945 ඔක්තෝබර් 24 දින ප්‍රඥප්තිය නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු**
  - ජාත්‍යන්තර සාමය, ආරක්ෂාව හා සහයෝගය පවත්වාගෙන යාම
  - වර්ණභේද, ලිංගබේද, භාෂා භේද, ආගම් භේද නොතකා මිනිස් අයිතිවාසිකම්වලට ගරුකරමින් ඒවා දිරි ගැන්වීමට කටයුතු කිරීම
  - ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම
  - ආර්ථික, සමාජීය හා සංස්කෘතික දියුණුව හා ශුභසාධනය සඳහා කටයුතු කිරීම
  - මානව අයිතිවාසිකම් හා මූලික නිදහස තහවුරු කිරීමෙහි ලා ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීම
  - මෙම පොදු අරමුණු සපුරා ගැනීම සඳහා ජාතීන්ගේ මූලස්ථානයක් ලෙස ක්‍රියා කිරීම

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යූහය**
  - ප්‍රධාන ආයතන හයකින් සමන්විත වීම
  - මහා මණ්ඩලය
  - ආරක්ෂක මණ්ඩලය
  - භාරකාර මණ්ඩලය
  - ආර්ථික හා සාමාජීය මණ්ඩලය
  - ජාත්‍යන්තර අධිකරණය
  - මහලේකම් කාර්යාලය (සංයුතිය, අරමුණු, සාමාජික සංඛ්‍යාව, කාර්යභාරය හා වැදගත්කම

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතන**
  - දෙවන ලෝක යුද්ධයෙන් දුර්වල වූ රටවල ආර්ථික හා සාමාජික වර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඊට අනුබද්ධ ආයතන මඟින් විශාල සේවයක් සිදු කිරීම

    උදාහරණ : - ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
    - ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
    - එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO)
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ILO)
    - ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
    - එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)
  - මේ ආයතන පිළිබඳ පහත දක්වෙන ශීර්ෂ යටතේ කරුණු රැස් කිරීම
    * සංයුතිය
    * අරමුණු
    * සාමාජික සංඛ්‍යාව
    * කාර්යභාරය හා වැදගත්කම

- **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වැදගත්කම**
  - ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා ප්‍රයත්න දැරීම

    උදාහරණ : - ඉන්දුනීසියාවට නිදහස ලබාදීම
    - අරාබි - ඊස්රායල් ගැටුම
    - කොරියන් යුද්ධය
    - සූවස් අර්බුදය
    - හංගේරියාවේ නැඟී සිටීම
    - බෙල්ජියන් කොංගෝවේ සිවිල් යුද්ධය
    - සයිප්‍රස් අර්බුදය
    - කාශ්මීර් අර්බුදය
    - චෙකොස්ලොවැකියානු අර්බුදය
    - දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී ප්‍රතිපත්ති දෝෂ දර්ශනයට ලක් කිරීම
    - රොඩේෂියාවට විරුද්ධ ව ආර්ථික සම්බාධක පැනවීම
  - නිරායුධකරණ වැඩපිළිවෙළ
  - ජාතීන් අතර පවතින ප්‍රශ්න සාකච්ඡා මඟින් විසඳ ගැනීමේ ප්‍රයත්න
  - ජාත්‍යන්තර සහයෝගය හා අභිවෘද්ධිය උදෙසා දරන ලද ප්‍රයත්න හා ගනු ලබන ක්‍රියාමාර්ග
  - ජාත්‍යන්තර ව්‍යසන වලදී උපකාර කිරීම (ගංවතුර, සුළි සුළං, නායයාම්, සුනාමි)
  - අනාගත පරපුර යුද බියෙන් මුදවා ගැනීමේ ප්‍රයත්න

- **එක්සත් ජාතීන්ගේ සංවිධානය මුහුණ පා ඇති ගැටලු**
  - රටවල් බල කඳවුරුවලට බෙදී කටයුතු කිරීම
  - න්‍යෂ්ටික අවි පාලනය
  - මුදල් හිඟ වීම

ඇගයීම 01

- **පහත සඳහන් එක් එක් ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එම කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

1. එක්සත් ජාතීන්ගේ සංවිධානය
   1. දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු පිහිටුවනු ලැබී ය.
   2. එහි ප්‍රධාන අරමුණ අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම ය.
   3. මහලේකම් එහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ය.
   4. ආරක්ෂක මණ්ඩලය සාමාජික රටවල් සියල්ලෝ ම නියෝජිතයන්ගෙන් සමන්විත වේ.
   5. නිත්‍ය සාමාජිකයන්ට නිශේධ බලය හිමි වේ. (........)

2. එක්සත් ජාතීන්ගේ සංවිධානය
   1. දෙවෙනි ලෝක යුද්ධයේ ඍජු ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවනු ලැබී ය.
   2. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අරමුණ, අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම ය.
   3. මහසභාව සාමාජික රටවල සාමාජිකයන්ගෙන් සමන්විත වේ.
   4. මහ ලේකම් කාර්යාලය එම සංවිධානයේ පරිපාලන කාර්යාලය වේ.
   5. මහාලේකම් කාර්යාලය ජාත්‍යන්තර අධිකරණය යනුවෙන් ද හඳුන්වනු ලැබේ. (........)

ඇගයීම 02

1. i. එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමෙන් පසුව ගත වූ මුල් දශක දෙක තුළ ලෝක සාමය ආරක්ෂා කිරීමෙහිලා එම සංවිධානය අනුගමනය කළ ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න

   (ලකුණු 07)

   ii. වර්තමාන ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න (ලකුණු 07)

2. i. 1965 තෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වූ ප්‍රධාන අන්තර්ජාතික අර්බුද විස්තර කරන්න (ලකුණු 07)

   ii. ඒවා විසඳීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය කෙතෙක් දුරට සමත් වී දැයි පරීක්ෂා කරන්න (ලකුණු 07)

## 10. යටත්විජිතහරණය

15 වැනි සියවසේ සිට යුරෝපා ජාතීන් පෙරදිග සමග සම්බන්ධතා පැවැත්වීමේ අරමුණ ඇති ව ආරම්භ කළ දේශ ගවේෂණවල ප්‍රතිඵල වශයෙන් නව මුහුදු මාර්ග, සාගර, රටවල් සහ මහාද්වීප හඳුනා ගැනීමට ඔවුන්ට අවස්ථාව සැලසිණි. පසු කාලයේ දී, මෙසේ හඳුනාගනු ලැබූ ප්‍රදේශ හා රටවල් අවි බලයෙන් යටත්කොට ගැනීමට යුරෝපා ජාතීහු කටයුතු කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආසියා, අප්‍රිකා හා අමෙරිකා මහාද්වීපවල යටත් විජිත පිහිටුවා ගැනීමට ඔවුහු සමත් වූහ.

සියවස් ගණනාවක් යුරෝපීයයන් යටතේ පැවති මෙම යටත් විජිත එම අධිරාජ්‍යවාදී පාලනයන්ගෙන් නිදහස් වීම සඳහා ගෙනගිය උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් 20 වැනි සියවසේ දී ආසියා, අප්‍රිකා රටවල නිදහස් සටන් ව්‍යාපාර ඉස්මතු වන්නට විය. එම යටත් විජිතවල ක්‍රියාත්මක වූ අධිරාජ්‍ය විරෝධී සටන් ව්‍යාපාර පිළිබඳ ව අධ්‍යයනය කොට ඒවා ලෝක දේශපාලනය කෙරෙහි බල පෑ ආකාරය පිළිබඳ ව විමසා බැලීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • ස්වාධීන ව සිටීමේ අගය වටහාගෙන ජාතික අනන්‍යතාව රැකගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 10.1 ස්වාධීනත්වය දිනා ගැනීම සඳහා ආසියාවේ හා අප්‍රිකාවේ රටවල් ක්‍රියා කළ ආකාරය විමසා බලයි.

**කාලච්ඡේද** : 40

**ඉගෙනුම් පල** :
- ආසියා-අප්‍රිකා මහාද්වීපවල පැවති බටහිර යටත්විජිත සිතියමක ලකුණු කරයි.
- ආසියා-අප්‍රිකා රටවල් නිදහස ලබා ගැනීම සඳහා ගෙනගිය අරගල විස්තර කරයි.

ස්වකීයරටවලස්වාධීනත්වය සාක්ෂාත් කර ගැනීමට උරදුන් නායකයන්ට ගෞරව කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**ආසියාවේ සටන් ව්‍යාපාර**
- දකුණු ආසියාව - ඉන්දියාව - බුරුමය - ශ්‍රී ලංකාව
- අග්නිදිග ආසියාව - පිලිපීනය - තායිලන්තය - මලයාව - ඉන්දුනීසියාව

- **ඉන්දියාව**
  - ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශ ස්වාධීන දේශීය කුමාරවරුන්ගේ පාලනය යටතේ පැවති අතර එහි විශාල ප්‍රමාණයක් බ්‍රිතාන්‍යයන් යටතට පත් වීමෙන් පසු ව පාලනය කළ වෙළෙඳ සමාගමේ පාලනයට එරෙහි ව වරින්වර එම ප්‍රදේශවල කැරලි ඇති වීම
  - 1806, 1844, 1849, 1850, 1852 යන වර්ෂවල දී සමාගම ට එරෙහි ව කැරලි ඇති වූ අතර ඒවා මර්දනය කිරීම
  - 1857 සිපොයි කැරැල්ල -
    - සිපොයි කැරැල්ලට බලපෑ හේතු
      - * දේශපාලන, අගමික, සමාජීය හා සාංග්‍රාමික හේතු බලපෑම
    - කැරැල්ලේ නායකයෝ
      - * නානා සහීබ්, තාන්තියා තෝපී, ලක්ෂ්මී බායි
  - බ්‍රිතාන්‍යයන් විසින් කැරැල්ල දරුණු ලෙස මර්දනය කරනු ලැබීම
  - 1857 කැරැල්ලෙන් පසු වෙළෙඳ සමාගම යටතේ පැවති සියලු ම ඉන්දියානු ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටතට පත් කිරීම

- 1857 කැරැල්ල නිසා ඉන්දියානුවන් තුළ නිදහස පිළිබඳ හැඟීම් වර්ධනය වීම
- නිදහස පතා ඉන්දියානුවන් විවිධ ප්‍රදේශතවල අරගල දියත් කිරීම
- සන්නද්ධ අරගල මඟින් නිදහස දිනාගත නොහැකි ව වටහාගත් ඉන්දියානු නායකයන් 19 වන සියවස මැද හරියේ සිට සාමකාමී මාර්ගවලින් නිදහස ලබා ගැනිම කෙරෙහි යොමු වීම
- 1876 දී සුරේන්ද්‍රනාත් බැනර්ජි විසින් ''කල්කටාවේ ඉන්දියානු සංගමය'' පිහිටුවීම
- ඇලන් ඔක්ටේවියන් හියුම් විසින් ''ඉන්දියානු ජාතික එකමුතුව'' ආරම්භ කිරීම
- 1885 ඉන්දියානු ජාතික සංගමය බිහි වීම
- ඉන්දියානු ජාතික සංගමයේ නායකත්වය, රැඩිකල් මතධාරීන් හා මධ්‍යස්ථ මතධාරීන් ලෙස දෙපිලකට බෙදීම
- විසිවැනි සියවස මුල මධ්‍යස්ථ මතධාරීන්ගේ ක්‍රියාකාරිත්වය
- සටන්කාමී නායකයන් ජයග්‍රහණ කීපයක් දිනා ගැනීම
- නිදහස් සටන් ව්‍යාපාරයට පොදු ජන පදනමක් දැමීම
- උගතුන්, කම්කරුවන්, ගොවීන් වැනි පිරිස් නිදහස් සටන් ව්‍යාපාරයට එකතු කොට ගැනීම
- ඩොමීනියන් තත්ත්වයේ නිදහස නොව පූර්ණ නිදහස සඳහා අරගල කිරීම
- විදේශීය භාණ්ඩ පරිහරණය කිරීම ප්‍රතික්ෂේප කිරීම
- වැඩවර්ජනවලින් බ්‍රිතාන්‍ය ආර්ථිකය දුර්වල කිරීම
- පුවත්පත් මඟින් ජාතිකානුරාගය ඇති කිරීම



දණ්ඩි පා ගමන

***Source: https://www.tes.com/lessons/-NohKMluo1Xi_w/ghandi-s-salt-march-1930***

- **ජාතික කොංග්‍රසයේ නායකත්වයට මහත්මා ගාන්ධි පත් වීම**
  - මහත්මා ගාන්ධි විසින් සහයෝගිතා වර්ජන, සිවිල් නීති කැඩීම සහ ඉන්දියාවෙන් පිට ව යනු වැනි ‍යාපාර මඟින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව අසීරුවට පත් කිරීම
  - දණ්ඩි පා ගමනේ දී ගාන්ධි ඇතුළු දහස් ගණනක් සිරභාරයට ගැනීම
  - මෙම ව්‍යාපාර නිසා ජාතික ව්‍යාපාරය තුළ පොදුජන සහභාගිත්වය වර්ධනය වීම
  - අවිහිංසාවාදී ව්‍යාපාර මඟින් ගාන්ධි ජනප්‍රිය වීම.
  - 1935 ඉන්දියානු ආණ්ඩුක්‍රම පනත මඟින් සන්ධීය රාජ්‍යයක් බිහි කිරීම සඳහා පියවර ගෙන තිබීම
  - ජාතික කොංග්‍රසය, පනත පිළිබඳ සෑහීමකට පත් නොවීම
  - බ්‍රිතාන්‍යයන්ගේ බලපෑම් මත බිහිවූ මුස්ලිම් ලීගය වෙන ම රටක් ලබා ගැනීමට ක්‍රියා කිරීම හා ඉන්දියාව දෙකඩ වීමේ උවදුරකට මුහුණ පෑම
  - මොහමඩ් අලි ජින්නා වෙන් ම රාජ්‍යයක් (පාකිස්ථානය) බිහිකිරීමේලා නායකත්වය ගෙන කටයුතු කිරීම
  - ඉන්දියාව පුරා ජාතිභේදවාදී කැරලි ඇති වීම
  - මවුන්ට්බැටන් සාමිවරයා විසින් ඉදිරිපත් කරන ලද දේශපාලන විසඳුම අනුව ඉන්දියාව දෙකඩ වීම
  - 1947 දී ඉන්දියාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම. එතැන් සිට ඉන්දියාව පරමාධිකාරී බලය සහිත ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් බවට පත් වීම
  - වෙන ම රටක් ලෙස පාකිස්ථානය බිහි වීම



මහත්මා ගාන්ධි

*(Source* ***http://www.historydiscussion.net/essay/essay-on-indias-struggle-for-independence/2099)***

- බුරුමය
  - බ්‍රිතාන්‍යයන් විසින් බුරුමය ඈඳා ගැනීම අවස්ථා කිහිපයකින් සිදු වීම
  - 1824 දී පළවැනි බ්‍රිතාන්‍ය බුරුම යුද්ධය ඇති වීම
  - බුරුම පාලකයා බ්‍රිතාන්‍ය වෙළෙඳුන්ට හිරිහැර කිරීම නිසා 1852 දී දෙවන බ්‍රිතාන්‍ය - බුරුම යුද්ධය ඇති වීම
  - පහළ බුරුමය (පේගු ප්‍රදේශය) බ්‍රිතාන්‍යයන්ට පවරා ගැනීම - තුන් වන බ්‍රිතාන්‍ය - බුරුම යුද්ධය 1885 දී ඇති වීම
  - මෙම සටනින් පසු 1886 ජනවාරි පළවැනි දින නිකුත් කරන ලද ප්‍රකාශයක් මඟින් බුරුමය, බ්‍රිතාන්‍ය ඉන්දියානු අධිරාජ්‍යයට ඈඳා ගැනීම
  - බුරුම දේශය පාලනය කිරීම සඳහා බ්‍රිතාන්‍යය යුද්ධ ආණ්ඩුකාරවරයකු පත් කිරීම
  - 1935 බුරුමය ඉන්දියාවෙන් වෙන් කිරීම

- දෙවෙනි ලෝක යුද්ධ සමයේ ජපන් ආධාර ලබා අවුංසාංගේ නායකත්වයෙන් ජාතිකානුරාගී කණ්ඩායම් බිහි වීම
- ජපානයේ ආධාර ලබාගෙන බ්‍රිතාන්‍යයන් බුරුමයෙන් පලවා හැරීමට කටයුතු කිරීම
- දෙවෙනි ලෝක යුද්ධ සමයේ ජපානය විසින් බුරුමය ජය ගැනීම සහ අවුංසාං හට යුද කටයුතු පිළිබඳ ඇමති ධුරය පිරිනැමීම
- දෙවෙනි ලෝක යුද්ධයෙන් ජපානය පරාජය වීමත් සමඟ නැවත බුරුමය බ්‍රිතාන්‍යය යටතට පත්වීම
- 1948 බුරුමයට නිදහස ලැබීම සහ සමූහාණ්ඩුවක් බවට පත් වීම



*බ්‍රිතාන්‍ය හමුදා බුරුමයේ*

***source :https://en.wikipedia.org/wiki/British_rule_in_Burma***

- ශ්‍රී ලංකාව
  - ශ්‍රී ලංකා ඉතිහාසය කොටසෙහි ඇතුළත් ජාතික ව්‍යාපාරය යටතේ අන්තර්ගත වේ.

අග්නිදිග ආසියාව

- පිලිපීනය
  - ප්‍රථම වරට ලෝකය වටා යාත්‍රා කළැයි සැලකෙන පර්ඩිනන්ඩ් මැගලන් විසින් පිලිපීනය යටත් කොට ගැනීම නිසා පිලිපීනය ස්පාඤ්ඤ යටත් විජිතයක් බවට පත් වීම
  - 1898 ස්පාඤ්ඤ - අමෙරිකානු යුද්ධයෙන් පසු ව අමෙරිකා එක්සත් ජනපදය ස්පාඤ්ඤ පාලනය යටතේ පැවති පිලිපීන දූපත් සිය ආධිපත්‍යය යටතට ගැනීම
  - පිලිපීනය තුළ විදේශ පාලනයට එරෙහි ව විරෝධතා පැනනැඟීම
  - නිදහස ලබා ගැනීමට සුදුසු තත්ත්වයකට පැමිණෙන තෙක් පිලිපීනය අමෙරිකානු පාලනය යටතේ පැවතීම
  - 1934 සම්මත කළ පිලිපීන නිදහස් පනත මඟින් ස්වයං පාලන බලතල ලැබීම
  - එම පනත අනුව පිලිපීනය පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍යයක් බවට පත් වීම
  - එහි ප්‍රථම ජනාධිපති ලෙස මනුවෙල් ක්වෙසොන් පත් වීම
  - දෙවෙනි ලෝක යුද්ධ සමයේ ජපානය විසින් පිලිපීනය යටත් කොට ගැනීම
  - අමෙරිකානු සෙන්පති මැක් ආතර් විසින් පිලිපීනය ජපන් ආධිපත්‍යයෙන් මුදවා ගැනීම
  - 1946 ජූලි 04 වන දින පිලිපීනයට නිදහස ලැබීම සහ පිලිපීනය තුළ සමූහාණ්ඩුවක් පිහිටුවීම

- තායිලන්තය
  - මොංකුට් හා චූලාලොංකෝරන් යන පාලකයන් අනුගමනය කළ නවීකරණ ක්‍රියාමාර්ග
  - දහනවවැනි සියවස අග භාගයේ දී ප්‍රංශ හා බ්‍රිතාන්‍ය බලපෑමට ගොදුරු වීම
  - දෙවෙනි ලෝක යුද්ධ සමයේදී ජපානය විසින් තායිලන්තය යටත් කොට ගැනීම
  - යුද්ධයෙන් පසු ව තායිලන්තය නිදහස් රාජ්‍යයක් බවට පත් වීම
  - 1946 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබීම
  - අසල්වැසි චීනය හා වියට්නාමය කොමියුනිස්ට් රටවල් වූ බැවින් තායිලන්තය අමෙරිකා එක්සත් ජනපදයට නැඹුරු වීම

- මලයාව
  - මලයාව මැලේ, චීන, ඉන්දියානු හා මුස්ලිම් ජනතාව විසින් ජනාවාස කර තිබීම
  - මලයාව ටින් හා රබර් සුලභ රටක් වීම නිසා බ්‍රිතාන්‍යයන් සිය වාණිජ බලය මලයාව තුළ ව්‍යාප්ත කිරීම
  - දෙවෙනි ලෝක යුද්ධ සමයේ ජපානය විසින් මලයාව යටත් කොටගනු ලැබුව ද යුද්ධය අවසාන වීමෙන් පසු බ්‍රිතාන්‍යයන් විසින් නැවතත් එම ප්‍රදේශ අත්පත් කොට ගනු ලැබීම
  - 1946 දී මලයාව හා සිංගප්පූරුව වෙන් කොට ඒවාට ස්වයංපාලන බලතල ලබාදීම
  - 1948 දී කොමියුනිස්ට්වාදී චීන ජාතිකයන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධ ව සටන් කිරීම
  - තුන්කු අබ්දුල් රහ්මාන් මලයාවේ මැතිවරණය ජය ගැනීම හා 1957 දී එරට අගමැති තනතුරට පත් වීම
  - සිංගප්පූරුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වාදීම
  - එම ව්‍යවස්ථාව යටතේ පවත්වන ලද මැතිවරණයෙන් ලී කුවාන් යූ අගමැති තනතුරට පත් වීම
  - මලයාව බෙදා වෙන්කිරීම ගැන අසතුටට පත් තුන්කු අබ්දූල් රහ්මාන් බ්‍රිතාන්‍ය යටත් විජිත ඒකාබද්ධ කොට සංයුක්තයක් පිහිටුවන ලෙසට යෝජනා කිරීම
  - ඒ අනුව බ්‍රිතාන්‍යයන් යටතේ පැවති මලයාව, සිංගප්පූරුව, උතුරු බෝර්නියෝ හා සරවක් යන

ප්‍රදේශ එකතු කොට 1963 දී මලයා සංයුක්තය ගොඩනැංවීම
- 1965 දී සිංගප්පූරුව ස්වාධීන රාජ්‍යයක් බවට පත් වීම




*සිංගප්පූරු නිර්මාතෘ ලී කුවාන් යූ මහතා* ***(Source: https://www.wsj.com)***

- **ඉන්දුනීසියාව**
  - ලන්දේසි යටත් විජිතයක් ව පැවතීම
  - දෙවන ලෝක යුද්ධයෙන් පසු ජපානයේ ද සහාය ඇති ව නිදහස ප්‍රකාශ කොට ජනාධිපති වරයකු පත් කොට ගැනීම
  - සුකර්ණෝ ජනාධිපති ලෙස පත් වීම
  - එම ප්‍රදේශ ආපසු ලබාගැනීමට ලන්දේසීන් කටයුතු කිරීම
  - ඉන්දුනීසියානු ජනතාව ඊට විරුද්ධ වීම
  - ගැටුම් සමථයකට පත් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය හමුවට ඉදිරිපත් කිරීම හා ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය කණ්ඩායමක් යෙදවීම
  - ඉන්දුනීසියාවට ලන්දේසි කිරීටය යටතේ ඩොමීනියන් තත්ත්වය ලබාදීමට ලන්දේසීහු සූදානම් වුවත් ඉන්දුනීසියාව ඊට අකමැති වීම
  - 1949 දෙසැම්බර් 27 වන දින ඉන්දුනීසියාව තම ස්වාධීනත්වය දිනා ගැනීම
  - ඉන්දුනීසියානු සමූහාණ්ඩුව පිහිටුවීම
  - නිව්ගිනියාවේ බටහිර ප්‍රදේශ ලන්දේසීන් යටතේ තබාගත් බැවින් දශක දෙකක් පමණ කාලයක් තිස්සේ ලන්දේසීන් හා ඉන්දුනීසියානුවන් අතර මතභේද හා ගැටුම් ඇති වීම
  - 1963 ලන්දේසීන් එම ප්‍රදේශය ද ඉන්දුනීසියාවට පවරා දීම

- **අප්‍රිකාව**
  - විශාලත්වය අතින් ලෝකයේ දෙවන ස්ථානය අප්‍රිකා මහාද්වීපයට හිමි වීම
  - දියමන්ති, රත්‍රන්, තඹ, යකඩ වැනි ඛනිජ සම්පත්වලින් පොහොසත් මහාද්වීපයක් වීම
  - 15 වැනි සියවස අග භාගයේ දි පෘතුගීසීන් විසින් අප්‍රිකාවේ ප්‍රදේශ කීපයක් යටත් කොට ගැනීම

- පසු ව ක්‍රමයෙන් යුරෝපා ජාතීන් අප්‍රිකාවේ යටත් විජිත ඇති කොට ගැනීමේ තරගයක නිරත වීම
- පෘතුගීසි, ස්පාඤ්ඤ, ලන්දේසි, බ්‍රිතාන්‍ය, ප්‍රංශ, බෙල්ජියම්, ඉතාලි සහ ජර්මන් ජාතිකයන් විසින් අප්‍රිකානු ප්‍රදේශ යටත් කොට ගැනීම
- යුරෝපා ජාතීන් විසින් මුළු අප්‍රිකා මහාද්වීපය ම වාගේ තම ආධිපත්‍යය යටතට පත් කොට ගැනීම. (ඉතියෝපියාව හා ලයිබීරියාව හැර)



*තම උපන් බිමේ දී යුරෝපයේ යටත් වැසියන් වූ අප්‍රිකානුවෝ*

***(Source: http://exhibitions.nypl.org/africanaage/essay-colonization-of-africa.html)***

**උතුරු අප්‍රිකාව**

- **ටියුනීසියාව**

  - ප්‍රංශයට යටත් ව පැවති ප්‍රදේශයකි
  - 1881 දී එම රාජ්‍යය ප්‍රංශයේ ආරක්ෂිත රාජ්‍යයක් බවට පත් වීම
  - 1922 දී ටියුනීසියාවට උපදේශක මණ්ඩලයක ස්වරූපය දරූ දේශපාලන ප්‍රදානයක් ලැබීම
  - ස්වදේශීය ජනතාව එයට විරුද්ධ ව හබීබ් බෝර්ගිබාගේ නායකත්වය යටතේ උද්ඝෝෂණය කිරීම
  - උද්ඝෝෂණ දරුණු වන විට ප්‍රංශ රජය විසින් බෝර්ගිබා රටින් පිටුවහල් කිරීම හා ඔහුගේ දේශපාලන පක්ෂය ද තහනම් කිරීම
  - දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු 1952 දී එක්සත් ජාතීන්ගේ මැදිහත් වීම ඔස්සේ ද්වි පාක්ෂික සාකච්ඡා ඇරඹීම
  - 1954 දී ටියුනීසියානු ජාතිහිතෛෂීන් සහ ප්‍රංශ අගමැති පියරේ මෙන්ඩෙස් ප්‍රාන්ස් අතර සාකච්ඡා ආරම්භ වීම
  - 1955 දී ටියුනීසියාවට ස්වයං බලතල ලබාදීම
  - 1956 දී ප්‍රංශය ටියුනීසියාවට නිදහස ප්‍රදානය කළ නමුත් බිසාර්ටේ නම් නාවික මධ්‍යස්ථානය තව දුරටත් ප්‍රංශය අත තබා ගැනීම

- ටියුනීසියාවේ නව ජනාධිපති හබීබ් බෝර්ගිබා එම නාවික මධ්‍යස්ථානය ලබා ගැනීම සඳහා සාකච්ඡා ආරම්භ කළත් එය අසාර්ථක වීම
- මේ නිසා ම බෝර්ගිබා යළි සන්නද්ධ අරගලයක් ආරම්භ කිරීම
- තම රටට වන්දි දෙතොත් එම ප්‍රදේශයෙන් ඉවත් වී යාමට ප්‍රංශය කැමැත්ත ප්‍රකාශ කිරීම
- 1963 දී ප්‍රංශය බියර්ටේ ප්‍රදේශය නිදහස් කොට ගැනීමෙන් ටියුනීසියාවේ නිදහස තහවුරු

- **මොරොක්කෝව**
  - බ්‍රිතාන්‍ය හා ජර්මනිය සමඟ ඇති කොට ගත් දරුණු අරගලයකින් පසු 1912 දී ප්‍රංශය, මොරොක්කෝව සිය ආරක්ෂිත රාජ්‍යයක් බවට පත් කොට ගැනීම
  - මොරොක්කෝවේ උතුරු ප්‍රදේශයේ බිම් තීරුවක් ස්පාඤ්ඤය සතු ව පැවතීම
  - දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ව ජාත්‍යනුරාගී හැඟීම් උතුරු අප්‍රිකාව පුරා පැතිරී යාම
  - ඉස්ටික්ලල් නම් ජාති හිතෛෂී පක්ෂයට සුල්තාන්වරයාගේ පූර්ණ සහයෝගය ලබා දීම
  - 1952 දී ඇති වූ වැඩ වර්ජන හා දේශපාලන විරෝධතා
  - ප්‍රංශ බලධාරීන් පීඩාකාරී පාලනය තරමක් ලිහිල් කළ අතර ජාතිහිතෛෂීන්ට සහාය දක් වූ සුල්තාන්වරයා රටින් පිටුවහල් කිරීම
  - ප්‍රංශ පාලකයන් විසින් දුර්වල පුද්ගලයකු (සුල්තාන්වරයාගේ මාමා කෙනෙකු) නව පාලකයා ලෙස පත් කිරීම
  - රට තුළ ප්‍රංශ විරෝධී හැඟීම් බලවත් වීම
  - බලයෙන් පහ කරන ලද බෙන් යුසුප් නම් සුල්තාන් වරයා එක්සත් ජාතීන්ගේ මැදිහත් වීමෙන් පසු 1953 දී නැවත බලයේ පිහිටුවීම
  - 1956 දී ප්‍රංශය මොරොක්කෝවට නිදහස ප්‍රදානය කිරීම
  - ස්පාඤ්ඤ පාලක ජෙනරාල් ෆ්‍රැන්කෝ සමඟ ඇති කොටගත් සම්මුතියකට අනුව මොරොක්කෝවේ ස්පාඤ්ඤය සතු ව පැවති ප්‍රදේශවලට ද නිදහස හිමි වීම

- ඇල්ජීරියාව
  - 1870 - 1914 අතර කාලයේ ප්‍රංශ පුරවැසියන් විශාල වශයෙන් ඇල්ජීරියාවේ පදිංචි වීම
  - ප්‍රංශය සතු ව පැවති ඇල්ජීරියාවේ සිටි ස්වදේශික මුස්ලිම්වරුන්ට යම් ප්‍රමාණයක ස්වයං පාලන බලතල ලබාදීම
  - ඉන් සෑහීමකට පත් නොවූ ඔවුන් 1954 දී ප්‍රංශයට විරුද්ධ ව කැරලි ගැසීම
  - මේ නිසා පාලනය අකාර්යක්ෂම වීම
  - ඇල්ජීරියාවේ ප්‍රංශ ජාතිකයන් ස්වදේශිකයින්ට නිදහස දීමට විරුද්ධ වීම
  - ප්‍රංශ පාලනයට විරුද්ධ ව පුළුල් ජාතික ව්‍යාපාරයක් ඇති වීම
  - කැරලි මැඩලීම සඳහා ප්‍රංශ බලධාරීන් විශාල හමුදාවක් නවතා තැබීම
  - ඇල්ජීරියාවට නිදහස දෙතැයි බිය වූ ප්‍රංශ ජනපදවාසීන් සහ ප්‍රංශ හමුදාවේ කොටසක් ද ප්‍රංශ රජයට විරුද්ධ ව කැරලි ගැසීම
  - මේ නිසා ඇල්ජීරියාවට නිදහස ලබා ගැනීමට නොහැකි වීම
  - 1958 දී අගමැති තනතුරට පත් චාල්ස් ඩි යෝල් ප්‍රංශ ජාතිකයන්ට සමාන තත්ත්වයක් ඇජීරියානු ජාතිකයින්ට ද ලබාදීමට පොරොන්දු වීම
  - 1957 දී ඇලජීරියාවේ නිදහස පිළිබඳ ප්‍රශ්නයට එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වීම
  - 1962 දී අල්ජීරියාව ප්‍රංශ ආධිපත්‍යයෙන් නිදහස ලබා ගැනීම හා ඇජීරියාව සමූහාණ්ඩුවක් බවට පත්වීම
  - බෙන් බෙල්ලා අල්ජීරියානු සමූහාණ්ඩුවේ ජනාධිපති ලෙස පත් කරනු ලැබීම

බටහිර අප්‍රිකාව

- 19 වැනි සියවසේ දී බ්‍රිතාන්‍යය, ප්‍රංශය සහ ජර්මනිය විසින් බටහිර අප්‍රිකාව බෙදා ගැනීම

- සානාව
  - ගෝල්ඩ් කෝස්ට් හෙවත් රන් වෙරළ වර්තමානයේ සානාව නමින් හැඳින්වීම
  - මෙම ප්‍රදේශය බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීම
  - 1951 වන විට මෙම ප්‍රදේශයට එක්තරා ප්‍රමාණයකට ස්වයං පාලන බලතල ලැබී තිබීම
  - ඉන් සෑහීමකට පත් නොවූ ජාති හිතෛෂීන් ක්වාමේ න්ක්‍රෲමාගේ නායකත්වයෙන් නැඟී සිටීම
  - 1957 බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වීම
  - 1957 දී පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය ලැබීම



*හබීබ් බෝර්ගිබාගේ නායකත්වය යටතේ ටියුනීසියාව නිදහස ලැබූ දා ගන්නා ලද ඡායාරූපයක්*

***(Source: https://en.wikipedia.org/wiki/Habib_Bourguiba)***

- නයිජීරියාව
  - 1960 දී බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබීම
  - 1961 දී සියරාලියොන් සහ 1975 දී නැම්බියාව නිදහස ලබා ගැනීම

- මධ්‍යම අප්‍රිකාව
  - 1953 දී බ්‍රිතාන්‍යයන් විසින් දකුණු රොඩේෂියාව, උතුරු රොඩේෂියාව සහ නියාසාලන්තය යන අප්‍රිකානු ප්‍රදේශ තුනෙන් සමන්විත අප්‍රිකානු සංයුක්තය පිහිටුවීම
  - මෙම ප්‍රදේශ සුදු ජාතිකයන් විසින් පාලනය කරනු ලැබීම
  - දේශපාලන බලතල අහිමි වූ ස්වදේශික ජනතාව ඊට අචාර්ය හේස්ටිංග්ස් බණ්ඩාගේ නායකත්වය යටතේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව කැරලි ගැසීම
  - එම ප්‍රදේශවලට ස්වයං පාලන බලතල දෙන ලෙස බ්‍රිතාන්‍යයන්ට බල කිරීම
  - 1964 දී නියාසාලන්තයට නිදහස ලැබීම
  - පසු ව එය මලාවි නමින් හැඳින්වීම
  - ඛනිජ සම්පත්වලින් පොහොසත් උතුරු රොඩේෂියාවට නිදහස ලබාදීමට සුදු ජාතික පදිංචි කරුවන් විරුද්ධ වීම
  - කෙනත් කවුන්ඩාගේ නායකත්වයෙන් ජාති හිතෛෂින් නිදහස් ව්‍යාපාරය මෙහෙයවීම
  - 1964 දී උතුරු රොඩේෂියාවට නිදහස ලැබීම සහ එය සැම්බියාව නමින් හැඳින්වීම
  - 1953 දී පිහිටුවන ලද අප්‍රිකානු සංයුක්තය බිඳ වැටුණු අතර දකුණු රොඩේෂියාව තනි වීම
  - බ්‍රිතාන්‍යයන් විසින් එම යටත් විජිතයට යම් ප්‍රමාණයක ස්වයං පාලන බලතල ලබා දීම
  - දකුණු රොඩේෂියාවේ සිටි බහුතර කළු ජාතිකයන්ට ආණ්ඩු බලය අහිමි වීම
  - බ්‍රිතාන්‍ය රජය එරටට නිදහස දීමට සූදානම් වූ නමුත් සුළුතරය වූ සුදු ජාතීන් ඊට විරුද්ධ වීම
  - අගමැති ඉයන් ස්මිත් එහි නායකත්වය ගැනීම
  - ඉයන් ස්මිත් ඒක පාක්ෂික ව 1965 දී රොඩේෂියාවේ නිදහස ප්‍රකාශයට පත්කිරීම
  - බ්‍රිතාන්‍යය ඇතුළු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සෙසු රටවල් එයට විරුද්ධත්වය පළකිරීම හා එරටට විරුද්ධ ව ආර්ථික සම්බාධක පැනවීම
  - ස්වදේශීය ජනතාවගෙන් එල්ල වූ විරෝධය, ඔවුන් අතර නොයෙකුත් සංවිධාන ඇති වීම සහ ගරිල්ලා ව්‍යාපාරයක් ඇති වීම
  - 1980 ස්වාධීන සිම්බාබ්වේ රාජ්‍යය බිහි වීම

- කොංගෝව
  - කොංගෝව බෙල්ජියමේ යටත් විජිතයක් වීම
  - 1908 දී බෙල්ජියමේ ලියෝපෝල්ඩ් රජු කොංගෝව පාලනය කිරීමේ බලය බෙල්ජියන් පාර්ලිමේන්තුවට පැවරීම
  - කොංගෝවේ ස්වදේශීය ජනතාවට ස්වයං පාලන බලතල ලබාදීමට බෙල්ජියම අකමැති වීම
  - 1960 දී බෙල්ජියම කොංගෝවට නිදහස ප්‍රදානය කිරීම
  - පැට්‍රිස් ලුමුම්බා අගමැති ලෙස පත් වීම
  - රට තුළ අවුල් සහගත හා ගැටුම්කාරී තත්ත්වයක් ඇති වීම (ගෝත්‍රික ගැටුම් හා හමුදා කුමන්ත්‍රණ)
  - එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වීම

නැගෙනහිර අප්‍රිකාව

- කෙන්යාව
  - 1885 පමණ සිට සුදු ජාතිකයන් කෙන්යාව පාලනය කිරීම
  - 1895 දී බ්‍රිතාන්‍යය කෙන්යාව සිය ආරක්ෂිත රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම. එය නැගෙනහිර අප්‍රිකාව ලෙස නම් කිරීම
  - සුදු ජාතික පදිංචිකරුවන්ගේ විරුද්ධත්වය නිසා කෙන්යාවේ ස්වදේශීය ජනතාවට නිදහස ප්‍රදානය කිරීමට බ්‍රිතාන්‍යයන් අකමැති වීම

- ස්වදේශීය ජාතිකයන් නිදහස පතා ජෝමෝ කෙන්යාටාගේ නායකත්වයෙන් මාවු මාවු නමින් රහස් සංවිධානයක් පිහිටුවා ගැනීම
- බ්‍රිතාන්‍යයන් විසින් ජෝමෝ කෙන්යාටා බන්ධනාගාර ගත කිරීම
- කෙන්යාවේ අප්‍රිකානු ජාතික සංගමය මගින් කෙන්යාවට නිදහස පතා ගෙන යන ලද අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් කෙන්යාව නිදහස දිනා ගැනීමට සමත් වීම



*ජෝමෝ කෙන්යාටා*

***https://www.joburgpost.co.za/2017/02/17/the-greatest-african-leaders-jomo-kenyatta/***

- 1963 දී බ්‍රිතාන්‍යය කෙන්යාවට නිදහස ප්‍රදානය කළ අතර බන්ධනාගාරයෙන් නිදහස් කෙරුණුජෝමෝ කෙන්යාටා නිදහස් කෙන්යාවේ ප්‍රථම අගමැති බවට පත්වීම

- ටැන්සානියාව
  - ජර්මන් නැගෙනහිර අප්‍රිකාව නමින් හැඳින්වුනු මෙම ප්‍රදේශය 1890 ගණන් වලදී ජර්මනිය යටතට පත්වීම
  - පළමුවෙනි ලෝක යුද්ධයෙන් පසු මෙම ප්‍රදේශය (ටැන්ගනයිකා) බ්‍රිතාන්‍යයන් විසින් පාලනය කරන භාරකාර ප්‍රදේශයක් බවට පත් වීම
  - ජූලියස් නියරේරේගේ නායකත්වය යටතේ පිහිටුවාගනු ලැබූ ටැන්ගනයිකා අප්‍රිකානු ජාතික සංගමය මඟින් ජාතික නිදහස් සටන් ව්‍යාපාරය මෙහෙය වීම
  - 1961 දී බ්‍රිතාන්‍යය එම රාජ්‍යයට නිදහස ප්‍රදානය කිරීම
  - නීග්‍රෝවරුන් බහුතරයක් වාසය කළ සැන්සිබාර් රාජ්‍යය 19 වැනි සියවසේ අග කාලය තෙක් අරාබිවරුන් විසින් පාලනය කිරීම




*1957 බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වීම සඳහා නිකුත් කළ සමරු මුද්දරයක්*

*(source: https://www.bing.com)*



*ක්වාමේ න්කෘමා*

*(source: https://en.wikipedia.org)*

- බ්‍රිතාන්‍යයන් විසින් එම ප්‍රදේශය අත්පත් කොට ගැනීමත් සමග එහි අරාබි බලය අවසන් වීම
- 1963 දී බ්‍රිතාන්‍යයන් විසින් සැන්සිබාර් රාජ්‍යයට නිදහස ප්‍රදානය කිරීම
- අරාබි ජාතික සුළුතරය විසින් අප්‍රිකානු ජාතික බහුතරය පාලනය කරනු ලබන ආණ්ඩුවක් බිහි වීම
- කුමන්ත්‍රණයක් මගින් බලය උදුරාගත් අප්‍රිකානුවන් සුල්තාන්වරයා බලයෙන් පහ කොට ඔබීඩ් කරුමේගිනායකත්වය යටතේ විප්ලවකාරී පාලන මණ්ඩලයක් පිහිටුවා ගැනීම
- ඔහු ජුලියස් නියරේරේ සමග සම්මුතියකට එළඹීම
- එහි ප්‍රතිඵලයක් වශයෙන් 1964 දී ටැන්ගනයිකා හා සැන්සිබාර් රාජ්‍ය එක්සත් වීම
- නව රාජ්‍යය ටැන්සානියාව නමින් හඳුන්වනු ලැබීම

- **සෝමාලියාව**
  - සෝමාලිලන්තයේ කොටසක් බ්‍රිතාන්‍යයේ සහ ඉතිරි කොටස ඉතාලියේ යටත් විජිතයක් ලෙස පැවතීම
  - දෙවැනි ලෝක යුද්ධ සමයේ දී බ්‍රිතාන්‍යය විසින් ඉතාලි සෝමාලිලන්තය ඇඳා ගැනීම
  - යුද්ධයෙන් පසු බ්‍රිතාන්‍යය එම ප්‍රදේශ නැවත ඉතාලියට පැවරීම
  - 1960 ජූලි පළවැනි දින ඉතාලි සෝමාලිලන්තයට නිදහස ලැබීම
  - බ්‍රිතාන්‍ය සෝමාලිලන්තය තව දුරටත් බ්‍රිතාන්‍ය ආරක්ෂිත රාජ්‍යයක් ලෙස පැවතීම
  - බ්‍රිතාන්‍ය සෝමාලිලන්තයේ සිටි ජාති හිතෛෂීන් නිදහස ලැබූ සෝමාලිලන්තයට එක් වීමට කැමති වීම
  - මැතිවරණයෙන් පසු බ්‍රිතාන්‍යය එම ප්‍රදේශ දෙක එක් කිරීමට එකඟ වීම
  - එක්සත් සෝමාලිලන්තය - සෝමාලියාව නමින් හැඳින්වීම
  - සෝමාලිලන්තයට නිදහස ලැබීම

- **මැඩගස්කරය**
  - ප්‍රංශ යටත් විජිතයක් වශයෙන් පැවතීම
  - දෙවෙනි ලෝක යුද්ධ සමයේයුද්ධමය අතින් ඇති වැදගත්කම නිසා බ්‍රිතාන්‍යයන් විසින් මැඩගස්කරය යටත් කිරීම
  - පසු ව බ්‍රිතාන්‍යයන් විසින් එම ප්‍රදේශය ප්‍රංශයට භාර දෙනු ලැබීම
  - නිදහස පතා ජාතික නායකයන් විසින් කැරලි ඇති කළ අතර ප්‍රංශය ඒවා දැඩි ලෙස මර්දනය කිරීම
  - මධ්‍යස්ථ මතධාරී ජාති හිතෛෂියකු වූ පිලිබර්ට් ක්සිරනානා විසින් සංවිධානය කරන ලද මධ්‍යස්ථ දේශපාලන සංවිධානය ඊළඟට පවත්වන ලද මැතිවරණයෙන් විශාල ආසන සංඛ්‍යාවක් ලැබ ජයග්‍රහණය කිරීම
  - 1960 ජූනි මාසයේ දී ප්‍රංශය මැඩගස්කරයට නිදහස ප්‍රදානය කිරීම
  - 1960 දී ක්සිරනානා ජනාධිපති වශයෙන් තෝරා ගැනීම
  - මැඩගස්කරය මැලගසි සමූහාණ්ඩුව බවට පත් වීම

*https://en.wikipedia.org/wiki/Battle_of_Madagascar*



*දෙවැනි ලෝක යුද සමයේ මැඩගස්කරය*

ඇගයීම 01

**පහත ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයට A,B,C,D යනුවෙන් ප්‍රතිචාර හතරක් දක්වා ඇත. ඒවායින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාර හෝ ප්‍රතිචාරය හෝ තෝරන්න.**

A හා B පමණක් නිවැරදි නම් ( 1 ) ද
B හා C පමණක් නිවැරදි නම් ( 2 ) ද
Cහා D පමණක් නිවැරදි නම් ( 3 ) ද
A හා B පමණක් නිවැරදි නම් ( 4 )
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ( 5 ) ද වරහන් තුළ සඳහන් කරන්න.

1. පහත සඳහන් ප්‍රකාශ අතරින් ආසියාවේ යටත්විජිතවාදය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

A - පිලිපීනය පෙරදිග බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ ප්‍රධාන මධ්‍යස්ථානය විය.
B - ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ පෙරදිග මූලස්ථානය පිහිටා තිබුනේ බතාවියේ ය.
C - ඉන්දියාවේ ඉංග්‍රීසි බලය පිහිටුවීමේ ලා කර්ණාට සටන්වලින් ලැබූ ජයග්‍රහණය තීරණාත්මක විය.
D - 19 වැනි සියවසේ දී බුරුමය ප්‍රංශ ආධිපත්‍යයට යටත් විය.

(........................)

2. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ කුමක් ද?

A - 1946 දී පිලිපීනයට නිදහස ලැබුණු අතර එරට ජනතාව සමූහාණ්ඩු ව්‍යවස්ථාවට කැමති විය.
B - 1957 දී පවත්වන ලද මැතිවරණයෙන් ජය ගත් තුන්කු අබ්දුල් රහ්මාන් මලයාවේ අගමැති තනතුරට පත් විය.
C - ප්‍රංශය විසින් අල්ලාගෙන සිටි ඉන්දු චීනයේ ප්‍රදේශ නිදහස් කර ගැනීම සඳහා හෝචිමිංගේ නායකත්වයෙන් ජාතික ව්‍යාපාරයක් ආරම්භ විය.
D - දෙවෙනි ලෝක යුද්ධ සමයේ දී ඉංග්‍රීසින් විසින් තායිලන්තය අල්ලා ගන්නා ල දී.

(........................)

3. පහත සඳහන් නම් අතරින් ඉන්දියානු ජාතික කොංග්‍රසයේ සටන්කාමී නායකයන් කවුරුන් ද?

A - බාල් ගංගාධාර් තිලක්
B - ගෝඛලේ ක්‍රිෂ්ණ
C - සුරේන්ද්‍රනාත් බැනර්ජි
D - බිපින් චන්ද්‍රපෝල්

(........................)

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න**

4. ඉන්දියානු ජාතික කොංග්‍රසයේ දක්නට ලැබුණු ප්‍රධානතම දුර්වලතාවය කුමක් ද?

1. ඉන්දියානු ජාතික කොංග්‍රසය තළ වෛද්‍ය, ඉංජිනේරු, නීතීඥ, ගුරු හා මහාචාර්යවරුන් විද්වතුන් නියෝජනය නොවීම
2. ඉන්දියානු ජාතික කොංග්‍රසය විසින් වාර්ෂික ව ප්‍රධාන නගරවල සමුළු නොපැවත් වීම.
3. ඉන්දියාවේ සැම ප්‍රදේශයකින් ම පාහේ නියෝජිතයන් ඊට ඇතුළත් කර නොගැනීම.
4. ඉන්දියානු ජාතික කොංග්‍රසය තුළ පොදුජන නියෝජනයක් නොවූ බැවින් එහි නායකයින් හා ජනතාව අතර දුරස්ථ බවක් ඇති වීම.
5. රටේ මහජන මතය සංවිධානය කිරීමට කටයුතු නොකිරීම (.....................)

5. ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ පියා ලෙස හඳුන්වන්නේ පහත සඳහන් නම් අතරින් කවු ද?
1. මහත්මා ගාන්ධි 2. මොතිලාල් නේරු 3. එස්. එස්. දාස්
4. සුරේන්ද්‍රනාත් බැනර්ජි 5. සුභාෂ් චන්ද්‍රබෝස් (.....................)

**A හා B තීරු නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.**

6.

| A | B |
|---|---|
| 1. හබීබ් බෝර්ගිබා | A - මොරොක්කෝව |
| 2. බෙන් යූසුෆ් | B - ඝානාව |
| 3. බෙන් බෙල්ලා | C - ටියුනීසියාව |
| 4. ක්වාමේ න්ක්රුමා | D - කොංගෝව |
| 5. පැට්‍රිස් ලුමුම්බා | E - ඇල්ජීරියාව |

1. AEBDC 2. CEABD 3. EBDCA 4. BDCAE 5. DCAEB (.....................)

7.

| A | B |
|---|---|
| 1. ටැන්සානියාව | A - ජෝමෝ කෙන්යාටා |
| 2. සැම්බියාව | B - ජෝශප් මොබුටු |
| 3. උගන්ඩාව | C - කෙනත් කවුන්ඩා |
| 4. කෙන්යාව | D - ජූලියස් නියරේරේ |
| 5. කොංගෝව | E - මිල්ටන් ඔබෙටො |

1. CEABD 2. EABDC 3. ABDCE 4. BDCAE 5. DCEAB (.....................)

8.

| A | B |
|---|---|
| 1. හේස්ටිංග්ස් බණ්ඩා | A - නිදහස් මැඩගස්කරයේ ජනාධිපති තනතුරට පත් වීම |
| 2. සුභාෂ් චන්ද්‍රබෝස් | B - 1959 දී රොඩේෂියානු බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධ ව කැරලි ගැසීම |
| 3. ත්සිරනානා | C - බුරුම ජාතිකානුරාග ව්‍යාපාරයේ නායකත්වය ගෙන කටයුතු කිරීම |
| 4. කෙන්යාව | D - 1925 දී සුන්-යත්-සෙන් ගෙන් පසු බලයට පත්වීම |
| 5. කොංගෝව | E - බ්‍රිතාන්‍යයන්ගේ සැකයට භාජනය වූ බරවින් ඉන්දියා ව අත්හැර පලායන අතර ගුවන් අනතුරකින් මියයාම |

1. EADCB 2. ADCBE 3. BEADC 4. DCBEA 5. CBEAD (.....................)

**පහත සඳහන් ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු කිහිපයක් දක්වා ඇත. ඒවායින් එකක් මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරන්න.**

**9.** යුරෝපා යටත්විජිත නිදහස ලැබීම ,
1. 1955 දී ප්‍රංශය විසින් ටියුනීසියාවට නිදහස පදධානය කරන ලදි.
2. පළමුවැනි ලෝක යුද්ධයෙන් පසු ජර්මනියට යටත් වූ ටෝගෝ කැමරන් වැනි යටත්විජිත ජර්මනියට අහිමි විය.
3. 1965දී ඉයන් ස්මිත් ඒකපාක්ෂික ව රොඩේෂියාවේ නිදහස ප්‍රකාශයට පත් කළේ ය.
4. අලිජින්නාගේ නායකත්වය යටතේ 1947 අගෝස්තු 14 දින පකිස්ථානය උපත ලැබී ය.
5. ජාතික කොංග්‍රසයේ ආධාර ඇති ව 1920දී පමණ මෝතිලාල් නේරු හා සී. ආර්. දාස් වැනි අය සහයෝගිතා වර්ජන ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. (.....................)

10. ආසියාවේ යටත්විජිතහරණය,

1. 1946දී නිදහස ලැබීමෙන් පසු ජනාධිපති රාමන් මැග්සේසේ යටතේ පිලිපීනයේ ශක්තිමත් ආණ්ඩුවක් ගොඩනැගිණි.
2. 1957දී ලී-ක්වාන්-යූ මලයාවේ අගමැති තනතුරට පත් විය.
3. උ-නූ නිදහස් බුරුම සමූහාණ්ඩුවේ ප්‍රථම අගමැති තනතුරට පත් වූ අතර ඔහුට කොමියුනිස්ට් වාදීන්ගේ හා ත්‍රස්තවාදීන්ගේ තර්ජනවලට මුහුණ දීමට සිදු විය.
4. ප්‍රංශ පාලනය යටතේ පැවති රූකඩ රාජ්‍යය බිඳදමූ හෝචිමිං වියට්නාම නිදහස් සමූහාණ්ඩුව ගොඩනැගීය
5. ජාතික හැඟීම් පුබුදුවාලීම සඳහා ලෝකමාන්‍ය බාල් ගංගාධාර් තිලක් කේශරී නමින් පුවත්පතක් ප්‍රකාශයට පත් කළේ ය.

(......................)

**ඇගයීම 02**

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයන්න**

1. i. අප්‍රිකාවේ යටත්විජිත පිහිටුවා ගත් යුරෝපා ජාතීන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. එම එක් එක් ජාතීන් විසින් අප්‍රිකාවේ පිහිටුවා ගන්නා ලද යටත්විජිතය බැගින් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. යුරෝපා ජාතීන්ගෙන් නිදහස ලබා ගැනීම සඳහා සටන් කළ අප්‍රිකානු යටත්විජිත අතරින් දෙකක් තෝරා ඒවා තම නිදහස් ව්‍යාපාරය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග සැකෙවින් දක්වන්න. (ලකුණු 08)

2. ඉන්දියාවේ නිදහස් සටන් ව්‍යාපාරයෙහි ලා මහත්මා ගාන්ධිතුමන්ගේ දායකත්වය එතුමන් විසින් අනුගමනය කරන ලද පහත සඳහන් ක්‍රියා මාර්ග ඇසුරින් සාකච්ඡා කරන්න

i. සහයෝගිතා වර්ජන ව්‍යාපාරය

ii. සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය

iii. ඉන්දියාවෙන් පිට ව යනු ව්‍යාපාරය (ලකුණු 14)

**ඇගයීම 03**

1. යුරෝපා ජාතීන් විසින් අප්‍රිකාවේ පිහිටුවා ගන්නා ලද යටත්විජිත අප්‍රිකානු සිතියමක ලකුණු කරන්න.
2. ආසියාවේ සිතියමක එක එක් යුරෝපා ජාතීන් විසින් පිහිටුවා ගන්නා ලද යටත්විජිත ලකුණු කර නම් කරන්න.

## 11. ලෝකය බල කඳවුරුවලට බෙදීයාම

දෙවෙනි ලෝක සංග්‍රාමයෙන් පසු යුරෝපයේ එතෙක් බලවත් ව සිටි බ්‍රිතාන්‍යය, ප්‍රංශය වැනි රටවල් පසුපසට තල්ලු වී ගොස් අමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව මුල් කොටගෙන ලෝකය බලකඳවුරු දෙකකට බෙදෙන්නට විය. අමෙරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාවක් හා ධනවාදී ආර්ථික රටාවක් අනුගමනය කළ අතර බ්‍රිතාන්‍යය ප්‍රංශය වැනි රටවල් එම පිලට එක් වීමෙන් අමෙරිකා එක්සත් ජනපදයේ නායකත්වය යටතේ ධනවාදී කඳවුරක් බිහි විය. සෝවියට් දේශය සමාජවාදී ආර්ථික රටාවක් අනුගමනය කළ අතර පෝලන්තය, නැගෙනහිර ජර්මනිය, චෙකොස්ලොවැකියාව, යුගොස්ලාවියාව වැනි රටවල් සෝවියට් දේශයේ නායකත්වය පිළිගැනීම නිසා සෝවියට් දේශයේ නායකත්වයෙන් සමාජවාදී කඳවුර බිහිවිය. මේ අතර මේ යුගයේ ධනවාදී පිලට හෝ සමාජවාදී පිලට සම්බන්ධ නොවූ රටවල් එක්වී නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය නමින් සංවිධානයක් ද පිහිටුවා ගැනිණි.

ධනවාදී කඳවුර නේටෝ සංවිධානයත් සමාජවාදී කඳවුරු වෝර්සෝ ගිවිසුම් සංවිධානයත් පිහිටුවා ගනිමින් තම බලය තහවුරු කොට ගැනීමට කටයුතු කළේය. විසිවෙනි සියවස දෙවන භාගයේ මුල සිට ලෝක ආධිපත්‍යය සඳහා මෙම ධනවාදී හා සමාජවාදී කඳවුරු දෙක අතර බල අරගලයක් ඇති වූ අතර එය ''තුෂ්ණී යුද්ධය'' නමින් හැඳින්වේ. දශක තුනක පමණ කාලයක් තිස්සේ අවි ගැටුම්වලින් තොර ව පැවති මෙම අරගලය 80 දශකයේ අග භාගයේ දී සෝවියට් දේශයේ බිඳවැටීමත් සමඟ අවසන් වූ අතර අමෙරිකා එක්සත් ජනපදය ලෝක බලවතා බවට පත් විය.

ලෝක බලවතුන් අතර ඇති වූ තුෂ්ණී යුද්ධය හා එය අවසානයේ සෝවියට් දේශය බිඳවැටීම පිළිබඳ වත් නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය පිළිබඳවත් අධ්‍යයනය කිරීම මෙම ඒකකයේ අපේක්ෂාව යි.

**නිපුණතාව** : • වර්තමාන ලෝක ප්‍රවණතා සහ එහි බලපෑම පිළිබඳ අවබෝධයකින් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 11.1 වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක දේශපාලන බලවේග පිළිබඳ ව පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 30 යි.

**ඉගෙනුම් පල** :
- ලෝකය බල කඳවුරුවලට බෙදීගිය ආකාරය පැහැදිලි කරයි
- සෝවියට් දේශය බිඳවැටීම සමඟ ඇති වූ තත්ත්වය විග්‍රහ කරයි
- ලෝකයේ බල කඳවුරු හා ඊට අයත් රටවල් සිතියමක ලකුණු කරයි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**
**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

- **තුෂ්ණී යුද්ධය**
  - සීතල යුද්ධය, නිරවි යුද්ධය නමින්ද හැඳින්වීම
  - දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ලෝකය බල කඳවුරු දෙකකට බෙදී අවි ආයුධ භාවිතයෙන් තොර ව තම කඳවුර ජයග්‍රහණය කොට ගැනීම සඳහා විවිධ උපක්‍රම යොදාගනිමින් ගෙනගිය සටන හෙවත් අරගලය තුෂ්ණී යුද්ධය නමින් හැඳින්වීම
  - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීම නිසා අවි ගැටුම්වලින් බොහෝ දුරට තොර අවධියක් උදාවීම
  - බල කඳවුරු දෙක අතර සාමයක් මෙන් ම යුද්ධයක් ද ඇති නොවීම
  - ධනවාදී කඳවුරේ නායකයා ලෙස අමෙරිකා එක්සත් ජනපදය තම කණ්ඩායම ශක්තිමත් කොට ගැනීම සඳහා උතුරු අත්ලන්තික් (නේටෝ) සංවිධානය පිහිටුවා ගැනීම

- නේටෝ සංවිධානයට ප්‍රතිචාර ලෙස සමාජවාදී කඳවුර වෝර්සෝ ගිවිසුම් සංවිධානය පිහිටුවීම අවි ගැටුම් එක්සත් ජාතීන්ගේ සාම හමුදාව යැවීම නිසා වැළකීම.
- කොරියාව තුළ අමෙරිකාව අනුගමනය කළ ක්‍රියාකලාපය නිසා දකුණු කොරියාව ධනවාදී කඳවුරට නැඹුරු වීම. උතුරු කොරියාව සමාජවාදී පෙරමුණට එකතු වීම.
- හංගේරියානු අර්බුදය
- චෙකොස්ලෝවැකියාවේ රුසියානු මැදිහත් වීම
- වියට්නාම් යුද්ධය
- මැදපෙරදිග ප්‍රශ්නවලට මැදිහත් වීම
- එක්සත් ජාතීන්ගේ අවිපාලනය හා නිරායුධකරණ ගිවිසුම් නිසා එම අවි භාවිතයට තිබූ අවස්ථාව වළක්වන ලදි. ඒ තුළින් අවි ගැටුම් වැළැක්විණි

  උදාහරණ:
  - 1959 අස්සන් කළ ඇන්ටාක්ටික් සම්මුතිය මඟින් න්‍යෂ්ටික කටයුතු සඳහා ඇන්ටාක්ටිකාව යොදා නොගැනීමට බලවතුන් එකඟ කොට ගැනීම
  - 1963 අස්සන් කරන ලද අභ්‍යවකාශයේ හෝ පොළොවේ මතුපිට හෝ ජලය යට හෝ වායුගෝලයේ හෝ න්‍යෂ්ටික අවි රඳවා තැබීම පිළිබඳ සම්මුතිය මඟින් එම අවි භාවිතය තහනම් කිරීම
  - 1974 සෝල්ට් 1 හා සෝල්ට් 2 ගිවිසුම් (Strategic Arms Limitation Talk) මඟින් ද අවි භාවිතය සීමා කිරීම

- **නොබැඳි ජාතීහු**
  - දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ බිහි වූ සමාජවාදී හා ධනවාදී යන බලකඳවුරු දෙකෙන් එකකට වත් යටත් නොවූ ජාතීන් එක් වී පිහිටුවා ගත් ලද ව්‍යාපාරය නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය ලෙස හැඳින්වීම
  - දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු බටහිර අධිරාජ්‍යවාදයෙන් නිදහස ලැබූ තුන් වන ලෝකයේ රටවල් ලෙස සැලකෙන ආසියාවේ හා අප්‍රිකාවේ බොහෝ රටවල් නොබැඳි ව්‍යාපාරයේ සාමාජිකයන් වීම
  - ධනවාදී හා සමාජවාදී කඳවුරු දෙකෙහි නායකයන් නව නිදහස් රාජ්‍ය හැකි තරම් තම පිලට එක් කොට ගැනීමට උත්සාහ දරන විට දිගු කලක් අධිරාජ්‍ය වාදයට ගොදුරු වී සිට නිදහස ලැබූ ජාතීන්ට අවශ්‍ය වූයේ තම නිදහස රැකගෙන සුපිරි බලවතකුට හිස නොනමා ස්වාධීන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ය. ඒ මඟින් නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය බිහි වීම
  - නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ නිර්මාතෘවරුන් ලෙස නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැති ජවහර්ලාල් නේරු, ඉන්දුනීසියානු ජනාධිපති සුකර්ණෝ, ඊජිප්තු ජනාධිපති අබ්දුල් ගමාල් නසාර්, යුගොස්ලාවියානු ජනාධිපති මාෂල් ටිටෝ සහ ඝානාවේ අගමැති ක්වාමේ නික්‍රෲමා යන අය කටයුතු කිරීම

- **නොබැඳි ජාතීන්ගේ ප්‍රතිපත්ති**
  - බලකඳවුරු වලට ගැති නොවී තම රටවල සුභසිද්ධියට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
  - නිදහස, ආරක්ෂාව, සාමය සහ සහයෝගීතාව පදනම් කොට ගත් ප්‍රතිපත්තියක් ඇති කොට ගැනීම
  - යුද ගිවිසුම්වලට විරෝධය දැක්වීම
  - අධිරාජ්‍යවාදය ප්‍රතික්ෂේප කිරීම
  - සාමය වෙනුවෙන් පෙනී සිටීම
  - නොබැඳි ව්‍යාපාරය ලෝකයේ බලවත් ම සාම ව්‍යාපාරවලින් එකක් වීම
  - 1954 දී ජවහල්ලාල් නේරු විසින් ඉදිරිපත් කරන ලද පංචශීල ප්‍රතිපත්තිය නොබැඳි ව්‍යාපාරයේ පදනම වීම. මීට පෙර චෞ එන් ලායි විසින්ද මෙම අදහස් ප්‍රකාශ කොට තිබීම

- **පංචශීල ප්‍රතිපත්තිය**
  - සාමකාමී සහජීවනය
  - අන්‍යෝන්‍ය සුභ සිද්ධිය හා සමානාත්මතාව ඉදිරියට ක්‍රියාත්මක කිරීම
  - එකිනෙකාගේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි නොගැසීම
  - එකිනෙකාට එරෙහිව ආක්‍රමණය නොකිරීම
  - එකිනෙකාගේ භෞමික අඛණ්ඩතාවට හා ස්වෛරී භාවයට ගරු කිරීම
  - 1955 දී ඉන්දුනීසියාවේ බැංඩුංහි දී නොබැඳි ජාතීන්ගේ සම්මේලනයේ ආරම්භක සැසිය පැවැත්වීම
  - එම සම්මේලනයට අනුව අප්‍රිකානු - ආසියානු ජාතීන් තම මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීම
  - ප්‍රථම නොබැඳි ජාතීන්ගේ සමුළුව 1961 දී යුගොස්ලාවියාවේ බෙල්ග්‍රේඩ් නගරයේ දී යුගොස්ලාවියානු නායක මාර්ෂල් ටිටෝගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම
  - ආරම්භක සැසියේ දී ආසියානු ජාතිකයන් 23 දෙනෙකු හා අප්‍රිකානු ජාතිකයන් 07 දෙනෙක් සහභාගි වූ අතර දිනෙන් දින වැඩි වූ සාමාජිකත්වය වර්තමානය වන විට 118ක් වී තිබීම
  - නොබැඳි ජාතීන්ගේ සමුළුව වසර 3කට හෝ 4කට හෝ වරක් පැවැත්වීම
  - 1976 දී නොබැඳි ජාතීන්ගේ 5 වැනි සමුළුව කොළඹ දී පැවැත්වීම
  - එම සමුළුව ලෝකයේ දුප්පත් ජාතීන් හා පොහොසත් ජාතීන් අතර පරතරය අඩු කර නව ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්තියක් පිළිබඳ ව අවධාරණය කිරීම
  - වර්තමාන ලෝකයේ බල කඳවුරු දෙකක් නොමැති බැවින් මෙහි සාමාජික රටවල් අතර සහයෝගිතාව ඇතිකරගැනීම ප්‍රධාන අරමුණ වීම
  - ත්‍රස්තවාදයට එරෙහි ව කටයුතු කිරීම හා මත් ද්‍රව්‍ය විරෝධය

- **සෝවියට් දේශය බිඳවැටීම නිසා ඇති වූ ප්‍රතිඵල (ජාත්‍යන්තර වශයෙන්)**
  - ආසියා -යුරෝපා මහාද්වීපවල විශාල බිම් ප්‍රදේශයක ව්‍යාප්ත ව පැවති සෝවියට් රුසියාව මුල දී දැඩි පාලන ක්‍රමයක් යටතේ පැවතීම
  - පසු කාලයේ එතරම් විශාල භූමි ප්‍රදේශයක් පාලනය කිරීම අපහසු වීම
  - සුදුසු දේශපාලන යාන්ත්‍රණයක් පැවතිය ද කාර්මික හා කෘෂිකාර්මික යන දෙඅංශ ම දුර්වල වීම
  - මේ නිසා නව දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට සිදු වීම
  - 1980 දශකය අග භාගය වන විට රුසියානු ජනාධිපති මිහායල් ගොර්බචොෆ් විසින් 'පෙරස්ත්‍රොයිකා' (ආර්ථික ප්‍රතිව්‍යුහකරණය) සහ 'ග්ලස්නොට්ස්' (විවෘත භාවය)නම් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම

- **එම ප්‍රතිසංස්කරණවලට තුඩු දුන් හේතු**
  - නිලධාරිවාදය හා පාලන ක්‍රමයේ පැවති අඩුපාඩු
  - සමාජවාදී ආර්ථික ප්‍රතිපත්ති නිසා තරගකාරී නිෂ්පාදන බිහි නොවීම
  - නව නිෂ්පාදන බිහි නොවීම හා තරඟකාරී මිල ගණන් නොතිබීම
  - වෙළෙඳපොළ අවශ්‍යතා හඳුනා නොගෙන නිෂ්පාදන සිදුකිරීම
  - අවශ්‍ය ප්‍රමාණයටත් වඩා දෛනික නිෂ්පාදන සිදු කොට ගබඩා කොට තැබීම
  - එම නිෂ්පාදන ක්‍රියාවලියේ දී සිදු වන පාඩු රජයට විඳ ගැනීමට සිදු වීම
  - අධික යුද වියදම
  - සමාජවාදය ව්‍යාප්ත කිරීමට කළ අධික වියදම
  - නිදහස් ආර්ථිකය පිළිබඳ නව පරපුර තුළ තිබූ අපේක්ෂා
  - අමෙරිකා එක්සත් ජනපද රහස් ඔත්තු සේවා ක්‍රියාකාරිත්වය
  - මිහායිල් ගෝර්බචෝෆ් හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිසංස්කරණ සෝවියට් දේශයේ බිඳවැටීමට හේතු වීම

- ගෝර්බචෝෆ්ගේ අනුගාමිකයා වූ බොරිස් යෙල්ට්සිං එම ආර්ථික ප්‍රතිපත්ති තව දුරටත් ඉදිරියට ගෙනයාම

- **සෝවියට් දේශය බිඳවැටීම නිසා ඇති වූ ප්‍රතිඵල (ජාත්‍යන්තර වශයෙන්)**
    - සමාජවාදී බලකඳවුර බිඳ වැටීම
    - ධනවාදී කඳවුරේ නායකත්වය දැරූ එක්සත් ජනපදය නිතරගයෙන් ලෝක කටයුතුවල නායකත්වයට පත් වීම
    - සමාජවාදී ක්‍රමය ව්‍යාප්ත වීමට තිබූ ඉඩ ප්‍රස්තා අවම වීම
    - න්‍යෂ්ටික තාක්ෂණය වෙනත් රටවලට ලබා දීම
      උදාහරණ: ඉන්දියාව, ඉරානය, උතුරු කොරියාව
    - සීතල යුද්ධය හෙවත් බල කඳවුරු දෙකේ බල තරගය අවසාන වීම
    - අවි තරගය අහෝසි වීමට මඟ පෑදීම
    - වෝර්සෝ සංවිධානය විසුරුවා හැරීම

- **ජාතික වශයෙන් ඇති වූ ප්‍රතිඵල**
    - සමාජවාදී පාලනය වෙනුවට බහු පක්ෂ ක්‍රමයක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් රුසියාවේ ස්ථාපිත වීම
    - රුසියාව සමාජවාදී ක්‍රමයෙන් ඉවත් ව නිදහස් ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරන රටක් බවට පත් වීම
    - රාජ්‍ය ව්‍යවසායන් වෙනුවට පෞද්ගලික ව්‍යවසායන් ඇති වීම
    - ආනයන අපනයන සීමා අහෝසි වීම
    - එක්වරම ආනයන ගලා ඒම නිසා උද්ධමනය සීඝ්‍රයෙන් ඉහළ යාම
    - විදේශ ණය ලබා ගැනීම
    - උස්බෙකිස්ථානය, බෙලෝ රුසියාව, ලිතුවේනියාව ආදී ප්‍රාන්ත රාජ්‍ය ස්වාධීන රාජ්‍යයන් බවට පත්වීම
    - පසුව රුසියාව, බෙලෝ රුසියාව සහ තවත් රාජ්‍යයන් කීපයක් සමඟ එකතු වී රුසියානු ෆෙඩරල් සමූහාණ්ඩුව පිහිටුවා ගැනීම
    - යුගොස්ලාවියාව, පෝලන්තය වැනි රටවල් නැවත කොටස්වලට බෙදී යාම
    - නැගෙනහිර යුරෝපා රටවල් බොහෝමයක් සමාජවාදී ක්‍රමයෙන් ඉවත් ව ධනවාදී ආර්ථික ක්‍රමයට හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට එකතු වීම
    - ලෝකය තුළ සමාජවාදී අදහස් ව්‍යාප්ත වීම සීමා වීම
    - ලෝකයේ පැවති බල කඳවුරු දෙකේ බලතරගය සෝවියට් දේශය බිඳ වැටීමත් සමඟ අවසන් වීම

ඇගයීම 1

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන් තුල ලියන්න**

1. මිහායිල් ගොර්බචොෆ්ගේ පාලන කාලයේ සිදු වූ දේශපාලනික සිද්ධියක් වන්නේ,
   1. අමෙරිකාවේ ආර්ථික පරිහානිය
   2. බෝල්ෂෙවික් විප්ලවය
   3. චීනයේ කොමියුනිස්ට් පාලනය බිඳ වැටීම
   4. සෝවියට් දේශය බිඳ වැටීම
   5. ජපානයේ රාජාණ්ඩු බිඳ වැටීම (................)

2. ධනවාදී හා කොමියුනිස්ට් පාලන ක්‍රම පවතින රටවල් අතර පැවති බලතරගය හඳුන්වන්නේ,
   1. ඔපෙක් අර්බුදය
   2. න්‍යෂ්ටික අර්බුදය
   3. තුෂ්ණී යුද්ධය
   4. ගල්ෆ් අර්බුදය
   5. තුන්වෙනි ලෝක සංග්‍රාමය (................)

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපා ඇත. ඒ අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. නොගැළපෙන කරුණ තෝරන්න**

3. දෙවෙනි ලෝක සංග්‍රාමයෙන් පසු සෝවියට් දේශය
   1. ජෝශප් ස්ටාලින් නව ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේ ය
   2. නිකිතා කෘෂෙෆ්, ස්ටාලින් හා ඔහුගේ ක්‍රමෝපායයන් හෙලා දුටුවේ ය
   3. මිහායිල් ගොර්බචොෆ් ග්ලාස්නොස්ට් හෙවත් විවෘතභාවය නම් ප්‍රතිපත්තිය ආරම්භ කළේ ය
   4. ගොර්බචොෆ් පෙරස්ත්‍රොයිකා හෙවත් ආර්ථික ප්‍රතිව්‍යුහකරණය නම් ප්‍රතිපත්තියද ප්‍රකාශයට පත් කළේය
   5. ගොර්බචොෆ් අනුගමනය කළ ප්‍රතිපත්ති නිරවි යුද්ධය ලිහිල් වීමට තුඩුදුන්නේ ය

   (................)

4. නිරවි යුද්ධය
   1. අමෙරිකා එක්සත් ජනපදයේ නායකත්වය යටතේ බටහිර බලවතුන් හා සෝවියට් දේශය ප්‍රධාන කොටගත් නැගෙනහිර යුරෝපා රටවල් අතර පැවති දේශපාලන හා රාජ්‍යතාන්ත්‍රික ගැටුම නිරවි යුද්ධය ලෙස හඳුන්වනු ලැබේ.
   2. වුඩ්රෝ විල්සන් විසින් කරුණු දාහතර ප්‍රකාශයට පත්කරනු ලැබීම නිරවි යුද්ධයේ ආරම්භය සලකුණු කරයි.
   3. අමෙරිකා එක්සත් ජනපදයේ නායකත්වය යටතේ 1949 දී උතුරු අත්ලන්තික් ගිවිසුම් සංවිධානය ඇතිකොට ගන්නා ලදි.
   4. 1955 දී සෝවියට් දේශයේ නායකත්වයෙන් යුත් වොර්සෝ ගිවිසුම් සංවිධානය ඇති කොට ගන්නා ලදි.
   5. ගොර්බචොෆ්ගේ පාලන සමයේ මුල් වසරවල දී කඳවුරු දෙක අතර පැවති ගැටුම තුනී විය.

   (................)

5. සෝවියට් දේශය බිඳ වැටීම නිසා ඇති වූ ප්‍රතිඵල
   1. වෝර්සෝ සංවිධානය විසුරුවා හැරීම
   2. සමාජවාදී බල කඳවුර ශක්තිමත් වීම
   3. ධනවාදී කඳවුරේ නායකත්වය දරූ අමෙරිකා එක්සත් ජනපදය නිතරගයෙන් ලෝක කටයුතුවල නායකත්වයට පත් වීම
   4. සීතල යුද්ධය අවසාන වීම
   5. ලෝක බල තුලනය අහෝසි වීම (................)

6. 1961 සැප්තැම්බර් 01 වන දින යුගොස්ලාවියාවේ බෙල්ග්‍රේඩ් නුවර දී පැවැති නොබැඳි ජාතීන්ගේ ප්‍රථම සැසිවාරයට සහභාගී වූ රටවල් අන්තගත නිවැරදි පිළිතුර තෝරන්න
   1. ශ්‍රී ලංකාව, ජපානය, ඉන්දියාව, ප්‍රංශය හා පාකිස්ථානය
   2. තායිලන්තය, ඉන්දියාව, ජර්මනිය, ඉන්දුනීසියාව හා මහාබ්‍රිතාන්‍යය
   3. ශ්‍රී ලංකාව, ඉන්දියාව, යුගොස්ලාවියාව, ඊජිප්තුව හා ඉන්දුනීසියාව
   4. ඊජිප්තුව, ශ්‍රී ලංකාව, යුගොස්ලාවියාව, පාකිස්ථානය හා චීනය
   5. ඊජිප්තුව, ප්‍රංශය, ඉන්දියාව, ඕස්ට්‍රියාව හා ජර්මනිය (................)

ඇගයීම 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතරූ සපයන්න**

1. දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ බලවත් රටවල් කඳවුරු දෙකකට බෙදී ගිය ආකාරය විස්තර කරන්න. (ලකුණු 14)

2. දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු අමෙරිකා එක්සත් ජනපදය සහ සෝවියට් දේශය සුපිරි බලවතුන් ලෙස නැගී ඒම ලෝක දේශපාලනය කෙරෙහි බලපෑ ආකාරය පරීක්ෂා කරන්න.

   (ලකුණු 14)

3. 1. ''තුෂ්ණී යුද්ධය'' යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)
   2. 1986 දක්වා එය ලෝක දේශපාලනය කෙරෙහි බලපෑ ආකාරය පරීක්ෂා කරන්න.

   (ලකුණු 09)

4. ''ජාතීන්ගේ ස්වාධීනතාව ආරක්ෂා කොට ගැනීමේ, සමාජ - ආර්ථික සුභසිද්ධිය අධාර කොට ගැනීමේ හා ජාතීන් අතර මිත්‍රත්වය හා සාමකාමී සහජීවනය සුරක්ෂිත කොට ගැනීමේ අපේක්ෂාවෙන් නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගන්නා ලදී''

   1. නොබැඳි ජාතීන්ගේ සමුළුව ප්‍රථම වරට රැස්වූයේ කවදා කවර ස්ථානයකදී ද? (ලකුණු 02)
   2. එහි ආරම්භක සාමාජික රටවල් 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
   3. නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ ආරම්භක සාමාජිකයන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
   4. නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

5. 1. මිහායිල් ගොර්බචොෆ්ගේ ආර්ථික ප්‍රතිසංස්කරණවලට බලපෑ හේතු විස්තර කරන්න

   (ලකුණු 07)

   2. සෝවියට් දේශය බිඳවැටීම නිසා ඇති වූ ප්‍රතිඵල සාකච්ඡා කරන්න (ලකුණු 07)

# 12. විසි වැනි සියවසේ ආසියාතික රටවල නැගීම

සමාන සංස්කෘතික සහ සාමාජීය ලක්ෂණ දැකිය හැකි චීනය සහ ජපානය එකිනෙකට සමීප ව පිහිටා ඇති නැගෙනහිර ආසියාතික රටවල් දෙකකි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් ව සිටි ඉන්දියාව හෝ ලංකාව හෝ මෙන් කිසියම් බටහිර අධිරාජ්‍යයකට ඍජු ව යටත් ව නොපැවති එම රාජ්‍ය ඔවුන් වෙත එල්ල වී තිබූ විවිධාකාර වූ අධිරාජ්‍යවාදී බලපෑම්වලින් මිදී විසිවැනි සියවසේ දී බලවත් රාජ්‍යයන් ලෙස නැගී සිටියේ ය.

අවස්ථා දෙකක දී ආර්ථික බිඳවැටීමක් ඇති වී යළි ආර්ථික වර්ධනයක් අත්පත් කර ගෙන වර්තමානයේ දී ද ආර්ථික වශයෙන් ලොව බලවත් ම රටක් වන ජපානය කදිම ආදර්ශයක් ලෙස ආර්ථික විශ්ලේෂකයෝ අගය කරති. බටහිර රටවලින් බැහැර ව ඉහළ ම ආර්ථික සංවර්ධනයක් ලබාගත් මුල් ම රාජ්‍යය වන්නේ ද ජපානය යි. දෙවැනි ලෝක යුද්ධයේ දී ලොව ප්‍රථම පරමාණු බෝම්බ ප්‍රහාරයෙන් විනාශ වී ගිය ද ජපානය තාක්ෂණික, ආර්ථික හා සමාජීය යන සැම ක්ෂේත්‍රයකින් ම ඉතා කෙටි කලක් තුළ ලොව ප්‍රමුඛ ස්ථානයකට පත් වීමට සමත් විය.

නැපෝලියන් බොනපාට් වරක් "චීනය යෝධයෙක්, ඔහු නිඳි, ඔහුට නිඳන්න ඉඩ හරින්න, ඔහු අවදි වුවහොත් මුළු මහත් ලෝකය ම හොල්ලනවා ඇති" කියා ප්‍රකාශ කර තිබේ. මේ කියමන වර්තමානයේ දී ප්‍රත්‍යක්ෂ වී ඇත්තේ චීනය අනාගත ලෝක බලවතා බවට ඉතා සීඝ්‍රයෙන් පත් වෙමින් සිටින බැවිනි. චීන ජනාධිපති ක්ෂින් ජින් - පින් විසින් හඳුන්වා දෙන ලද "එක තීරයක් - එක මාවතක්" (වන් බෙල්ට් - වන් රෝඩ්) සංකල්පය ද මේ වන විට යථාර්ථයක් බවට පත් වනුයේ එම ඉදිරිගමනට මහත් පිටුවහලක් සපයමිනි. මධ්‍යකාලීන යුරෝපයේ පැවති "සේද මාවත" අනුව යමින් චීනය නැවතත් යුරෝපය හා ආසියාව සමඟ ගොඩබිම් හා මුහුදු මාර්ගයෙන් සම්බන්ධ කිරීම එම සංකල්පයේ අභිලාෂය යි.

ඉහතින් ද සඳහන් කළ පරිදි එම රටවල නැඟී සිටී ම කුඩා ආසියාතික රාජ්‍යයක් වූ ශ්‍රී ලංකාවට ද මහඟු ආදර්ශයකි. එනම් චීනය හා ජපානය විසි වන සියවසේ දී නැඟී සිටීම සඳහා අනුගමනය කළ දේශපාලන, ආර්ථික, සාමාජීය ප්‍රතිපත්ති හා දේශීය, විදේශීය වශයෙන් උත්පන්න වූ විවිධ අභියෝගයන් සඳහා දක්වන ලද ප්‍රතිචාර විග්‍රහ කිරීම මඟින් ලබා ගත හැකි පූර්වාදර්ශයන් පැහැදිලි කිරීම මෙම විෂය ඒකකයේ අරමුණ වේ.

**නිපුණතාව** : • විවිධ අභියෝග හමුවේ රටවල් ප්‍රගමනය වූ ආකාරය ආදර්ශයට ගෙන අභිවෘද්ධිය සඳහා කටයුතු කරයි.

**නිපුණතා මට්ටම:** 12.1 විසිවැනි සියවසේ සීඝ්‍ර දියුණුවක් අත් කරගත් ආසියාතික රටවල් පිළිබඳ ව විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 20 යි.

**ඉගෙනුම් පල:**

- ජපානය හා චීනය ලෝකයේ දියුණු රටවල් බවට පත් වූ ආකාරය පැහැදිලි කරයි.
- ජපානයෙන් හා චීනයෙන් උකහා ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.

**ජපානයේ නැඟීම**

විසිවැනි සියවස තුළ ජපානයේ නැඟීම පහත සඳහන් අවධි දෙක ඔස්සේ සාකච්ඡා කිරීමට පෙර එසේ දියුණුවීමට අඩිතාලම දැමූ පූර්ව ලෝක සංග්‍රාමය ජපානයේ වර්ධනය පිළිබඳ කෙටියෙන් අවධානය කළ යුතු ය.

**දෙවැනි ලෝක යුද්ධයට පෙර ජපානයේ වර්ධනය**

- **ටොකුගාවා අවධිය**

- ජපානය නූතන රාජ්‍යයක් බවට ප්‍රවිෂ්ට වීම සඳහා අවශ්‍ය පසුබිම සකස් වූයේ මෙම යුගයේ දී වීම.
- ක්‍රි.ව. 1603 සිට 1868 තෙක් අවධිය ජපන ඉතිහාසයේ තොකුගාවා යුගය වශයෙන් සැලකේ. පාලන බලතල ටොකුගාවා ෂෙටිගුන්වරුන් සතු වූ අතර අධිරාජයාට නාමික උත්තරීතර බලයක් හිමිවිය. මෙම යුගය තුළ පැවති කෘෂිකාර්මික හා කාර්මික දියුණුව මෙන්ම දීර්ඝ කාලීන ආභ්‍යන්තරික සාමය ද දේශපාලන ඒකාබද්ධතාව ද රටේ සංවර්ධනයට ප්‍රබල සාධක වීම
- දේශපාලන ඒකාබද්ධතාව තහවුරු කිරීම සඳහා විදේශ සම්බන්ධතා සම්පූර්ණයෙන් ම තහනම් කිරීම

  උදාහරණ:
  - ක්‍රි.ව.1636 දී විදේශිකයන් ජපානයට පැමිණීම ද, ජපන් ජාතිකයන් විදේශවලට යාම ද තහනම් කිරීම
  - විදේශ වෙළඳාමට යෝග්‍ය වන ආකාරයේ නැව් තැනීම තහනම් කිරීම

- ජපානය ටොකුගාවා අවධියේ අනුගමනය කළ හුදකලාව සිටීමේ මෙම ප්‍රතිපත්තිය නිසා යුද අරගලවලින් තොර රටක් වීම
- ජපාන සමුරායි නම් වංශාධිපතිවරුන් අධ්‍යාපනය කෙරෙහි යොමු කරවීම
- මේ නිසා සමුරායි පන්තිය පරිපාලන කටයුතු හා උපදේශන කටයුතු සඳහා යොමු වීම
- මෙම ප්‍රතිපත්තිවල ප්‍රතිඵල වශයෙන් ජපානය මධ්‍යතන යුගයේ ලෝක බලවේගයක් බවට පත් වීම හා විසි වැනි සියවස වන විට දියුණු රටක් බවට පත් වීම
- මාර්ග පද්ධතිය හා ජල මාර්ග ඔස්සේ ජපානයේ සියලු ප්‍රදේශවල ප්‍රවාහණ පහසුකම් දියුණු කිරීම නිසා නිෂ්පාදිත භාණ්ඩ හා කෘෂිකාර්මික නිෂ්පාදන සීඝ්‍ර ලෙස හුවමාරු වීම, මුදල් භාවිතය ඉහළ යාම මඟින් ධනවාදී අර්ථ ක්‍රමයක් වර්ධනය වීම
- සමාජයේ පහළ ස්තරයක සිටි වෙළෙන්දෝ ධනය එකතු කොට ගෙන සමස්ත ආර්ථිකය කෙරෙහි බලපෑම් කළ හැකි පිරිසක් බවට පත් වීම
- රටේ මධ්‍යම ප්‍රදේශයේ නගර වර්ධනය වීම
- 18 වැනි සියවස අවසන් වනවිට ටෝකියෝව එකල ලොව පැවති විශාලතම නගරය බවට පත් වීම
- සන්නිවේදන ජාල පුළුල් වීම, අධ්‍යාපන තත්ත්වය සීඝ්‍ර වෙනසකට භාජනය වීම
- බටහිර ජාතීන්ට වඩා ජපානය තාක්ෂණික ඥානය අතින් පහළ මට්ටමක සිටීම
- විදේශ වෙළෙඳාම, වෙළෙඳ නැව් තැනීම හා නව වෙළෙඳ පොළවල් සොයා ගැනීම වැනි අරමුණු ඉටු කර ගැනීමට ජපානයේ හුදෙකලා භාවය නැති කළ යුතු බව බහුතර මතය වීම

- 19 වන සියවස ආරම්භයේ සිට ජපානය බටහිර ලෝකයට විවෘත වීම
- ජපානයේ දොරටු බාහිර ලෝකයට විවෘත කිරීම නිසා තොකුගාවා වරුන්ට පාලන බලතල අත්හැරීමට ද සිදු වීම

- **මෙයිජි අවධිය**
  - ක්‍රි. ව. 1868 සිට ක්‍රි.ව. 1912 තෙක් අවධිය ජපන් ඉතිහාසයේ මෙයිජි අවධිය වශයෙන් සැලකේ
  - ජපානයේ 122 වන අධිරාජයා වූ මෙයිජි නූතන ජපානයේ නිර්මාතෘවරයා වශයෙන් ගෞරවාදරයට පත් වන අතර ඔහු යටතේ ජපානය බටහිර අධිරාජ්‍යවාදී බලවතුන්ට සමාන කළ හැකි නූතන ජාතික රාජ්‍යයක් බවට පත් වීම
  - ජපන් ජාතිකයන් තුළ පැවති ජාතිකත්වය පිළිබඳ හැඟීම ඊට බෙහෙවින් බලපෑම

- **මෙයිජි පාලන සමයේ දේශපාලන, ආර්ථික හා සමාජීය වෙනස් වීම්**
  - මෙයිජි පාලනය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් හඳුන්වා දීම
  - ගොවින් කැමති ආකාරයට වගා කිරීමටත්, අස්වැන්න විකිණීමටත් අවසර ලබා දීම සහ ගොවින්ට ඉඩම් විකිණීම තහනම් කරමින් පනවා තිබූ නීති ඉවත් කිරීම
  - ජනතාවට තමන්ගේ කැමැත්ත පරිදි වාණිජ හා කාර්මික කටයුතුවල නියැලීමටත් අවසර දීම
  - බටහිර තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම
  - බටහිර රටවලින් උපදේශකයන් විශාල වශයෙන් ගෙන්වා අධ්‍යාපනය, පතල් කර්මාන්තය, බැංකු, නීති, හමුදා කටයුතු සහ ප්‍රවාහණ වැනි ක්ෂේත්‍ර බටහිර විශේෂඥ දැනුමින් සංවිධානය කිරීම
  - දක්ෂ සහ බුද්ධිමත් සිසුන් තෝරාගෙන ඔවුන් බටහිර රටවලට යවා විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම ලබා දීම



*මෙයිජි අධිරාජයා* *(source:https://en.wikipedia.org/wiki/Meiji_period)*

- 1882 දී ජපන් මහ බැංකුව පිහිටුවීම
- බැංකු ආරම්භ කිරීමේ නීති ලිහිල් කිරීම නිසා වාණිජ බැංකු රැසක් ද ආරම්භ වීම
- කාර්මික අංශය දියුණු කිරීම සඳහා පුද්ගලික අංශයට ආධාර ලබාදීම
- "මිට්සුයි" සිමෙන්ති සමාගම හා "මිට්ෂුබිෂි" මොටර් රථ සමාගම වැනි දැවැන්ත සමාගම් ආරම්භ වීම
- නිෂ්පාදන අංශයේ ප්‍රසාරණයත් සමඟ විදේශ වෙළඳාම ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව මතුවීම ජපන් ජාතිකයන්ට සෘජුවම විදේශ වෙළඳාමෙහි යෙදීමට හැකිවන අයුරින් තමන්ගේ ඒජන්සි ආයතන පිහිටුවා ගැනීමට ආධාර දීම

- **මෙයිජි පාලනය යටතේ ජපානයේ ව්‍යාප්තිය**
  - බ්‍රිතාන්‍ය ක්‍රමය අනුව නාවික හමුදාවක් ද ජර්මන් ක්‍රමය අනුව පාබල හමුදාවක් ද ගොඩ නැඟීම, මඟින් ජපානයට වෙනත් ප්‍රදේශ ආක්‍රමණය කොට ඇඳා ගැනීමට හැකි වීම
  - ජපානයේ ඇති වූ කර්මාන්ත වර්ධනය නිෂ්පාදන වේගය අනුව එක් පරම්පරාවක් තුළ විශාල භාණ්ඩ අතිරික්තයක් වීම
  - සෙසු අධිරාජ්‍යවාදීන් කළ පරිදි යටත් විජිත පිහිටුවීමේ අවශ්‍යතාව ද මතු වීම
  - ආසියාවේ අධිරාජ්‍යයක් ගොඩනැඟීමට කටයුතු කිරීම

- **පළමුවන ලෝක යුද්ධය හා ජපානය**
  - ආසියාවේ අධිරාජය්‍ය ගොඩනැඟීමේ අපේක්ෂාවෙන් ජපානය බ්‍රිතාන්‍යයේ පක්ෂයට එකතු වී පළමු වැනි ලෝක යුද්ධයට සහභාගි වීම
  - එහිදී ජර්මන් නාවික හමුදාවට පහර දී ජපානය ලැබූ ජයග්‍රහණය එම රට තම ඉතිහාසයේ ලෝක බලවතකුගේ තත්ත්වය මනා ව පෙන්නුම් කළ අවස්ථාවක් විම
  - කලින් ජර්මනියට අයිති ව පැවති තිබූ චීන ප්‍රදේශ ඇතුළු තවත් දිවයින් කීපයක් ද ජපානයට පවරා දෙනු ලැබීම නිසා පළමු වැනි ලෝක යුද්ධයෙන් පසු ව ලෝක බලවතෙකුගේ තත්ත්වයට පත් වූ ජපානයේ කීර්තිය ඉහළ මට්ටමකට වර්ධනය වීම
  - ඊට අමතර ව ආසියා, අප්‍රිකා රටවලට යුද අවි හා උපකරණ විකිණීමෙන් අතිවිශාල ආදායමක් උපයාගත් ජපානයේ ආර්ථික වර්ධනය වේගයෙන් ඉහළ යාම

- **දෙවෙනි ලෝක යුද්ධය හා ජපානය යටත් වීම**
  - දෙවෙනි ලෝක යුද්ධයට ඇමරිකා එක්සත් ජනපදය මිත්‍ර පක්ෂයට ද ජපානය අක්ෂ පක්ෂයට ද සම්බන්ධ වී ප්‍රතිවිරුද්ධ පාර්ශ්වවලින් යුද්ධයට සහභාගි වීම
  - දෙවන ලෝක යුද්ධ අවස්ථාවේ දී, අමෙරිකාව තම නාවුක හමුදා මූලස්ථානය ෆැසිපික් සාගරයේ පර්ල් වරාය වෙත ගෙන යාම
  - ජපානය පර්ල් වරායට පහර දීම
  - එපරිද්දෙන් ලෝක යුද්ධයට අවතීර්ණ වූ ජපානය මුල් මාස තුනේ දී අමෙරිකානුවන් සතු ව පැවති ගුවාම් බල කඳවුර, තායිලන්තය, මලයාසියාව, සිංගප්පූරුව මෙන් ම බ්‍රිතාන්‍යයට හා ඕලන්දයට යටත් ව තිබූ පෙරදිග ඉන්දියා දූපත් යටත් කොට ගෙන ඕස්ට්‍රේලියාවට ද පහර දීම

- ජපානයේ ඉදිරි ගමන මැඩලීමට අමෙරිකා එක්සත් ජනපදයේ ඩග්ලස් මැක් ආතර් සෙනෙවියාගේ නායකත්වය යටතේ අමෙරිකානු ගුවන් හා නාවික හමුදා සමත් වීම

- 1945 පෙබරවාරි මාසයේ දී අමෙරිකානු හමුදා විසින් ජපානය වට කර ජපානයට යටත් වන ලෙස අණ කිරීම

- ජපන් රජය යටත් වීම ප්‍රතික්ෂේප කිරීම

- අමෙරිකාව විසින් 1945 අගෝස්තු 06 ජපානයේ හිරෝෂිමා නගරයට ද, 1945 අගෝස්තු 09 වැනි දින නාගසාකි නගරයට ද පරමාණු බෝම්බ හෙළා විනාශ කිරීම

- අගෝස්තු 14 දින මධ්‍යම රාත්‍රියේ ජපානය යටත් වීම ප්‍රකාශ කිරීම

- හිරෝෂිමාවට හෙළන ලද පරමාණු බෝම්බයෙන් ලක්ෂයක් පමණ මියගිය අතර, නගරය සම්පූර්ණයෙන් විනාශ වීම

- යුද්ධයේ ප්‍රතිඵල වශයෙන් නිසා 1945 වන විට නිෂ්පාදනය 60% තෙක් පහත වැටීම හා යුද්ධයේ ප්‍රතිඵල වශයෙන් යටිතල පහසුකම්, වරායවල්, ගමනාගමනය, පාලම්, ප්‍රධාන ගොඩනැගිලි සියල්ල ම 25%කට අධික ප්‍රමාණයක් විනාශයට පත් වීම, ආර්ථික විනාශය නිසා ඉහළ උද්ධමනයක්

  මෙන් ම රැකියා වියුක්තියක් ද ඇති වීම



*පරමාණු බෝම්බයෙන් විනාශ වූ හිරෝෂිමා නගරය*

***https://www.theatlantic.com/photo/2016/05/hiroshima-before-and-after-the-atomic-bomb-ing/482526/***

**දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ජපානයේ අභිවර්ධනය**

- යටත් වීම පිළිබඳ ගිවිසුම 1945 සැප්තැම්බර් මස 02 වන දා මිසොරි නම් ඇමරිකානු යුද්ධ නෞකාවේදී අස්සන් කිරීම
- ඉන් පසු වර්ෂ හයමාරක් පමණ යනතුරු (1952) ඇමරිකානුවන් යටතේ සිටීමට ජපානයට සිදු වීම
- පරාජයෙන් හා යටත්වීමෙන් පසුව ජයග්‍රාහකයන් කෙරෙහි විරෝධයක් දක්වනු ඇතැයි බලාපොරොත්තු වුව ද එය එසේ නොවීම




*යටත් වීම පිළිබඳ ගිවිසුම 1945 සැප්තාම්බර් මස 02 වන දා මිසොරි නම් අමෙරිකානු යුද්ධ නෞකාවේදී අස්සන් කිරීම*

*(source:https://www.pri.org/stories)*

**විදේශික ආධිපත්‍යය යටතේ සම්පාදනය කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

- මැක් ආතර් සෙනෙවියාගේ අධීක්ෂණය යටතේ සම්පාදනය නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1947 මැයි 03 දින සිට ක්‍රියාත්මක කරනු ලැබීම
- ඒ අනුව ජපානයේ ස්වාධිපත්‍යය ජනතාව වෙත පැවරීම
- පරමාධිපති බලයක් අධිරාජයාට කිසි දා හිමි නොවීම
- රාජ්‍ය බලය හා වගකීම් "ඩයට්" නමින් හැඳින්වෙන පාර්ලිමේන්තුව වෙත පැවරීම
- සියලු විධායක බලතල අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය සතු වීම
- නවවැනි වගන්තිය මගින් ජපානය වෙනත් රටක් සමඟ යුද්ධයකට යාමට ඇති අයිතිය අහිමි වීම
- අමෙරිකානුවන් බටහිර ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් ජපානයට පවරා දී රාජ පරම්පරාව අහෝසි නොකොට ඔවුන්ගේ බලතල කප්පාදු කිරීම

- කෙසේ නමුත් වැඩිකල් නොගොස් ජපානය ආර්ථික වශයෙන් සුපිරි බලවතකු වීම
- ජපානයේ මෙම ආර්ථික නැගිසිටීම ක්‍රි. ව. 1960 වන විට පැහැදැලි ව දක්නට ලැබිණි. ආර්ථික වර්ධන වේගය 12% වැඩි වූ අතර, ඒක පුද්ගල ආදායම බටහිර මට්ටමට ගෙන ඒමටත් හැකි වීම
- ක්‍රි. ව. 1964 දී ඔලිම්පික් උලෙළට ජපානයේ තෝකියෝ නගරය සත්කාරකත්වය ලබා දීමෙන් මෙම ආර්ථික සෞභාග්‍ය ලෝකයට මනා ව පෙන්නුම් කිරීම




*1964 දී ජපානයේ තෝකියෝ නගරයේ පැවැත් වූ ඔලිම්පික් උලෙළේ ඡායාරූපයක්*

*(source: https://www.japantimes.co.)*

**ජපානයේ ආර්ථික වර්ධනයට බලපෑ හේතු**

- දෝෂාරෝපණයෙන් තොර ව ක්‍රියා කිරීම
- පෞද්ගලික දියුණුවට වඩා තම දේශයේ දියුණුවට කටයුතු කිරීම
- අමෙරිකාවෙන් හා බටහිර යුරෝපයෙන් දියුණු තාක්ෂණික ක්‍රම සිය රටට ගෙන්වා ගැනීම
- රට තාක්ෂණික වශයෙන් දියුණු කිරීමට ප්‍රමුඛතාව ලබා දීම
- රට තුළ සමාජීය ගැටුම්, වැඩ වර්ජන හෝ වෙනත් කම්කරු ආරවුල් නොමැති ව කටයුතු කිරීමට උනන්දු වීම
- ලෝක යුද්ධයෙන් පරාජයට පත් වීම නිසා ඇති වූ අවමානය ඉක්මනින් අහෝසි කර ගැනීමට පැවති අපේක්ෂාව

- විදේශ සම්බන්ධතා

  - ජපානයේ විදේශ ප්‍රතිපත්තියේ මූලික පරමාර්ථය වන්නේ ලෝක සාමය හා මිනිස් වර්ගයාගේ ශුභසාධනයට සහභාගි වීම
  - දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ව නව ව්‍යවස්ථාවක් හඳුන්වා දුන්න ද ජපානය කෙරෙහි මිත්‍ර බලවතුන්ගේ බලපෑම අඛණ්ඩ ව ක්‍රියාත්මක වීම
  - 1951 දී ජපානය හා අමෙරිකා එක්සත් ජනපදය ආරක්ෂක සහයෝගිතා ගිවිසුම
  - 1952 දී ජපානය චීනය සමඟ සාම ගිවිසුම
  - 1956 වන විට ජපානය හා සෝවියට් සංගමය සමඟ සබඳතා යථා තත්ත්වයට පත් වීම
  - 1956 දී ජපානය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ක්‍රියාකාරී සාමාජිකයකු වීම
  - ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකානු රටවල් සමඟ ආර්ථික සහයෝගිතාව රැකෙන පරිදි කටයුතු කිරීම
  - දිළිඳු රටවලට තාක්ෂණික ඥානය ලබා දීම සඳහා පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම 1966 වන විට රටවල් 18ක එවැනි පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කර තිබිණි.

- ආර්ථික සංවර්ධනය

  - යුද්ධයෙන් විනාශ වී ගිය ජපානයට අමෙරිකාවේ මාර්ෂල් සැලැස්ම යටතේ ආධාර ලැබීම
  - 1945-52 කාලයේ හිමි වූ ආධාර ප්‍රමාණයේ වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 1.9 කි. එම ආධාරයන්ගෙන් 59%ක් ආහාර සඳහා ද, 15% කාර්මික අමුද්‍රව්‍ය සඳහා ද, 12% ප්‍රවාහණ උපකරණ සඳහා ද හිමි විය.
  - ජපානයේ අගමැති වශයෙන් ක්‍රියා කළ ෂිගෙරු යෝෂිඩ (1946 - 47 සහ 1948-54) ගේ රජය ආර්ථික සැලසුම් මනා ලෙස ක්‍රියාත්මක කිරීම
  - ජපානයේ කාර්මිකකරණයට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ විදුලි බලය යි. 1955 වන විට රටේ අවශ්‍යතාවෙන් 70%ක් ජල විදුලියෙන් ලබා ගැනිණි. 1968 වන විට ලෝකයේ වැඩි ම ගෘහස්ථ විදුලි පරිභෝජනය පැවති රට වූයේ ජපානය යි. 1962 දී තාප බලය ද 1965 දී පරමාණු බල ශක්තිය ද යොදා ගෙන විදුලිය නිපදවන ලදි.
  - 1981 වන විට න්‍යෂ්ටික බලාගාර සංඛ්‍යාව 21ක් විය. එම න්‍යෂ්ටික බලාගාරවලට ජාතික විදුලිබල අවශ්‍යතාවෙන් 30%ක් සැපයීමට හැකි වන බවට 1985 දී ඇස්තමේන්තු කර තිබිණි.

- ජපානයේ කාර්මික සංවර්ධනයට බලපෑ හේතු

  - ජපන් ශ්‍රමිකයන්ගේ දැඩි කැප වීම හා විනයානුකූල භාවය
  - ශ්‍රම ඵලදායිතාවේ වර්ධනය
  - නවීන තාක්ෂණය යොදා ගැනීම
  - නවීන විද්‍යාත්මක කර්මාන්ත උදෙසා පුහුණු ශ්‍රමිකයන් හා තාක්ෂණික විශේෂඥයන් බිහි කිරීමේ අරමුණින් අධ්‍යාපන ක්‍රමය සකස් කිරීම

- තාක්ෂණික ක්ෂේත්‍රයේ නව සොයා ගැනීම් කෙරෙහි සුවිශේෂ උනන්දුවක් දැක් වීම
- ප්‍රවාහණ සේවා කාර්යක්ෂම කිරීම
- ලොව පුරා වෙළඳ ප්‍රදර්ශනාගාර ඉදි කිරීම

- **ජපානයේ ප්‍රකට කර්මාන්ත**
  - 1956 සිට ලොව ප්‍රමුඛ නැව් නිෂ්පාදකයා බවට පත් වීම
  - 1960 දශකය වන විට ලෝකයේ මල නොබැඳෙන වානේ නිෂ්පාදනය කරන රටවල් අතරින් තෙවන ස්ථානය හිමිකර ගැනීම් (ජපානයේ දේශීය වශයෙන් ඇති යපස් සම්පත ස්වල්ප වීම මෙහි ඇති සුවිශේෂ තත්ත්වය යි)
  - 1960 දශකය වන විට නෝකඉදෝ නම් ලොව සීඝ්‍රගාමී දුම්රිය එන්ජිම නිපදවා ආර්ජන්ටිනාව, රුසියාව, සෞදි අරාබිය යන රටවලට අලෙවි කිරීම
  - 1966 වන විට ලොව දෙවන විශාල ම මෝටර් රථ නිපදවන රට බවට පත් වීම
  - 1970 දශකය වන විට ජපානයේ නිෂ්පාදිත රූපවාහිනී යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර, ශීතකරණ, කැමරා භාණ්ඩ, විද්‍යුත් මැනුම් උපකරණ, සන්නිවේදන උපකරණ, පරිගණක ලොව හැම රටක ම දැකිය හැකි වීම

- **සමාජීය තත්ත්වය**
  - කාර්මිකරණයට නැඹුරු වීම නිසා බොහෝ පිරිස් නගර කරා පැමිණීම හා 1960 දශකය වන විට ජපානය නාගරිකත්වය සුලභ වූ රටක් බවට පත් වීම
  - ජපානයේ නිවාසවලට නව උපකරණ එක්වීම නිසා ගේ දොර වැඩ අඩු වී ජපන් කාන්තාවට නිදහස ලැබීම
  - ජපන් කාන්තාවන් නිෂ්පාදන කටයුතුවලට එකතු වීම
  - දිළිඳු නීති, ළමා සුභසාධන නීති, රැකියාවල නියුක්ත අයගේ සෞඛ්‍ය රක්ෂණ නීති, පොදු ජන සෞඛ්‍ය රක්ෂණ නීති, සුභ සාධන හා විශ්‍රාම රක්ෂණ නීති, මාතෘ හා දාරක රක්ෂණ නීති, වයස්ගත අයගේ සුභසාධන නීති වැනි නීති රැසක් 1950 දශකය වන විට හඳුන්වා දීම

**චීනයේ නැඟීම**

විසි වන සියවස තුළ චීනයේ නැඟීම පහත සඳහන් අවධි දෙක ඔස්සේ සාකච්ඡා කළ හැකි ය.

- මහජන චීන සමුහාණ්ඩුව පිහිටුවීමට පෙර අවධිය
- මහජන චීන සමුහාණ්ඩුව පිහිටුවීමෙන් පසු අවධිය වශයෙනි

- **මහජන චීන සමුහාණ්ඩුව පිහිටු වීමට පෙර අවධිය**

- චීනයේ අවසන් රාජවංශය වූයේ චිං පෙළපත යි.
- අධිරාජ්‍යවාදීන්ගේ තර්ජන හා ආභ්‍යන්තරික වශයෙන් ඇති වූ පරිහානිය නිසා චිං (මැන්චු) පෙළපතෙහි බලය 1840න් පසු පිරිහීම
- දීර්ඝ කාලීන දේශපාලන වියවුල්වලින් පසු ව 1911 දී චිං රාජවංශය බලයෙන් පහ වීම

- **යුවාන් ෂි කායි ගේ සමූහාණ්ඩු පාලනය**

  - චිං පෙළපත බලයෙන් පහ වීමෙන් පසු රටේ දේශපාලන එක්සත්කම ආරක්ෂා කර ගැනීම සඳහා සුන් යත්-සෙන්ගේ සහයෝගය මත චීන සමූහාණ්ඩුවේ පළමු ජනාධිපති වශයෙන් චීනයේ  බලවත් සාංග්‍රාමික ප්‍රභූ පවුලකට අයත් යුවාන් ෂි-කායි තෝරා ගැනීම

  - ඔහු 1913 වන විට සමූහාණ්ඩුවේ සියලු බලතල තමන් අතට පත් කර ගනිමින් ඒකාධිපතියකු සේ ක්‍රියා කිරීම

  - මෙසේ යුවාන් ෂි කායි 1911 විප්ලවයෙහි බලාපොරොත්තු පාවා දෙනු දුටු ප්‍රගතිශීලි දේශප්‍රේමීන් සුන් යත්-සෙන්ගේ නායකත්වයෙන්  1913 දී කැරැල්ලක් ඇති කිරීම

  - කැරැල්ල අසාර්ථක වීම

  - චීනය මිත්‍ර පිලට එකතු වී පළමු වැනි ලෝක යුද්ධයට සම්බන්ධ වීම

  - 1916 ජුනි 06 දින යුවාන් ෂි-කායි මියයාම හා ඒ වන විට ආණ්ඩුවක් ලෙස හැඳින්විය හැකි අන්දමේ කිසිදු පාලනයක් නොමැති ව රට භේද භින්න වී පැවතීම

- **ආචාර්ය සුන් යත් -සෙන්**

  - wdpd¾h i=ka ;a-fika 1912 දී ක්වෝමිංටාන් පක්ෂය (ජාතික පක්ෂය) පිහිටු වීම

  - ඔහු පළමු ලෝක යුද්ධය අවසානයේ චීනයට නැවත පැමිණීම

  - 1917 රුසියානු විප්ලවයෙන් පසු කැන්ටන් ප්‍රදේශයේ බලය පිහිටුවාගෙන සිටි සුන් යත්-සෙන්ට රුසියානු ආධාර ලැබීම

  - 1925 වන විට  සුන් යත්-සෙන්ගේ නායකත්වය යටතේ වූ කැන්ටනය ප්‍රබල රාජ්‍යයක් වීම

  - එහෙත් කැන්ටන් රජය නීත්‍යානුකූල රජයක් ලෙස නොපිළිගැනීම හා පීකිං රජය චීනයේ නීත්‍යානුකූල  රජය ලෙස පිළිගැනීම

**චීන ජාතික ආණ්ඩුව**

- චීනයේ නැන් කිං නගරය මූලස්ථානය කොට ගෙන 1928 සිට 1937 තෙක් චීනය තුළ ක්‍රියාත්මක වූ ආණ්ඩුව චීන ජාතිකවාදී පක්ෂයේ (ක්වෝමිංටාන් පක්ෂයේ) තනි පාලන බලය මත පිහිටා තිබිණි.

- සිය සැලැස්ම සම්පූර්ණ වීමට පෙර  1925 දී සුන් යත්-සෙන් මරණයට පත් වීම
- චියැං කායි-ෂෙක් ( 1888-1975) බලයට පත් වීම

- ඔහු සුන් යත්-සෙන් යටතේ වූ ආණ්ඩුවේ ප්‍රධාන හමුදා අණ දෙන නිලධාරියා වශයෙන් කටයුතු කොට තිබිණි. මොස්කව්හිදී ද පුහුණුව ලබා සිටි ඔහු දේශපාලන දැනුමෙන් ද පිරිපුන් අයකු වීම

- මේ වන විට කැන්ටන් රජය උතුරු දිග බලය පිහිටුවා ගෙන සිටි නායකයන්ට අභියෝග කිරීමට තරම් ශක්තිමත් වීම

- ඒ අනුව 1926 දී චියැං කායි-ෂෙක් භටයන් 50000සෙනක-ගෙන් යුතු හමුදා  සේනාංකයක් ගෙන ප්‍රධාන මාර්ග තුනක් ඔස්සේ ඓතිහාසික උතුරු යුද මෙහෙයුම් ආරම්භ කිරීම

- කෙටි කලකින් චියං-කායි- ෂෙක් ජයග්‍රහණය කිරීම
- 1927 දී නැන් කිං නගරය අල්ලා ගත් චියැං කායි-ෂෙක් කොමියුනිස්ට් විරෝධී කුමන්ත්‍රණයක් ආරම්භ කිරීම
- විශාල ජන සංහාරයක් සිදු වීම
- මේ අතර තුර 1928 ඔක්තොම්බර් මාසයේ දී බෙයි ජිං (පීකිං) නගරය ද චියැං කායි-ෂෙක්ගේ හමුදා යටතට පත්වීම
- ඔහු නැන් කිං නගරය කේන්ද්‍ර කොට ගෙන චීන සමූහාණ්ඩුවේ ජාතික රාජ්‍ය ප්‍රකාශයට පත් කිරීම
- 1928 නොවැම්බර් මස අමෙරිකාව විසින් චීනයේ නිල ආණ්ඩුව වශයෙන් ජාතික ආණ්ඩුවේ නීත්‍යනුකූලභාවය පිළිගනු ලැබීම
- දෙසැම්බර් මාසයේ දී ප්‍රංශය හා බ්‍රිතාන්‍ය ද එය පිළිගැනීම

**චියැං කායි-ෂෙක්ගේ කොමියුනිස්ට් විරෝධී ක්‍රියාකලාපය**

- චියැං කායි-ෂෙක්ගේ නායකත්වයෙන් යුතු ජාතික පක්ෂයේ කොමියුනිස්ට් විරෝධී ක්‍රියාකලාපය ඉවසා සිටිය නොහැකි වූ චීන කොමියුනිස්ට් පක්ෂය මේ නිසා 1927 අගෝස්තු පළමුවැනි දා ජාතික පක්ෂ පාලනයට විරුද්ධ ව ආයුධ සන්නද්ධ අරගලයක් දියත් කිරීම
- "1927 විප්ලවය" නමින් හැඳින්වෙන මෙයට සෝවියට් දේශයේ අනුමතිය ද ලැබීම
- ඉතා සුළු කාලයක් ඇතුළත විප්ලවකාරීන් මර්දනය කිරීමට ජාතික පක්ෂ ආණ්ඩුවට හැකි වීම
- විප්ලවය අසාර්ථක වීමෙන් පසු ව චියැං කායි-ෂෙක්ගේ නැන් කිං පාලනයට එරෙහි ව කියැංසි පළාතේ සෝවියට් ආකාරයේ විකල්ප රජයක් පිහිටුවා ගැනීමට කොමියුනිස්ට්වාදීන් සමත් වීම
- ගොවි ජනතාව ද සන්නද්ධ කරමින් "රතු හමුදාවක්" ගොඩ නැංවීමට' මාඕ-සේ-තුං සමත් වීම

**දීර්ඝ පා ගමන**

- මාඕ-සේ-තුං යටතේ කියැංසි පළාතේ පැවති සමාජවාදී පාලන බිඳ දැමීමට චියැං කායි-ෂෙක් 1930 සිට අවස්ථා ගණනාවක දී ආක්‍රමණ මෙහෙයවීම
- වසරක් පමණ පැවති එම සටන්වල ප්‍රතිඵල වශයෙන් රතු හමුදාවට දරා ගත නොහැකි අලාභ විඳීමට සිදුවීම
- තව දුරටත් කියැංග්සි ප්‍රදේශයේ ස්වකීය බලය පවත්වා ගැනීම දුෂ්කර බව තේරුම් ගත් මාඕ-සේ තුං ප්‍රමුඛ කොමියුනිස්ට් නායකයෝ එම ප්‍රදේශය අතහැර ඊට වඩා ආරක්ෂා සහිත වූ උතුරු චීනයේ ෂන් ෂී ප්‍රදේශයේ යොනාන්වලට පසු බැසීම
- 1934 ඔක්තොම්බර් මාසයේ ඇරඹූ එම ගමන කොමියුනිස්ට් ඉතිහාසයේ හැඳින්වෙනුයේ ' මහා ප්‍රයාණය' හෙවත් 'දිගු පා ගමන' (Long March) යනුවෙනි.
- රතු හමුදාවේ මේ පාගමන සැබවින්ම කොමියුනිස්ට්වරුන් ලැබූ විශාල ජයග්‍රහණයක් වීම

- කොමියුනිස්ට් පක්ෂයට චීනයේ විමුක්තිය සඳහා විශාල කාර්යයක් කළ හැකි බව ජනතාව තේරුම් ගැනීම
- පා ගමන නිසා මාඕ-සේ-තුං චීන කොමියුනිස්ට් පක්ෂයේ අසහාය නායකයා බවට පත් වීම
- 1931 සිට ම නැඟී එමින් සිටි ජපාන අධිරාජ්‍යය බලය චීනය ස්වකීය ග්‍රහණයට නතු කර ගැනීමට උත්සාහ ගැනීම
- 1937 ජූලි 07 වන දින ජපානය, චීනය සම්පූර්ණයෙන් ම යටත් කිරීමේ පරමාර්ථයෙන් පීකිං නුවර අසල මාර්කෝ පෝලෝ පාලම පිහිටි ස්ථානයේ දී දැඩි ප්‍රහාරයක් ආරම්භ කිරීම
- 1937 දී මේ නිසා කොමියුනිස්ට්වරුන් හා ක්වෝමිංටාන්වරුන් අතර ජපන් අධිරාජයවාදයට විරුද්ධ ව එක්සත් පෙරමුණක් ගොඩනැංවිය හැකි වුවත් වැඩි කලක් එම එක්සත් බව නොවීම
- දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ එම එක්සත් කම සම්පූර්ණයෙන් බිඳ වැටීම
- ජපනුන් අල්ලා ගෙන තිබූ ප්‍රදේශ ලබා ගැනීම සඳහා දෙපක්ෂය අතර උග්‍ර සටන් ඇති වීම හා එහි දී චීනයේ බොහෝ ප්‍රධාන නගර චියැං කායි-ෂෙක්ට නැවත ලබාගත හැකි වූ අතර කොමියුනිස්ට්වරුන් රට අභ්‍යන්තරයේ ගම්බද ප්‍රදේශවල ස්වකීය බලය පිහිටු වීම



*මාඕ-සේ-තුං*
*(https://www.bing.com)*



චියැං කායි-ෂෙක්
*(http://totalwar-ar.wikia.com)*



*ආචාර්ය සුන් යත්-සෙන්*
*(https://www.bing.com)*

**චීන විප්ලවය (1949)**

- දෙවෙනි ලෝක යුද්ධය අවසානයේ ලෝකයේ බොහෝ රටවලට සාමය ළඟා කරගත හැකි වුව ද චීනයේ තත්ත්වය ඊට හාත්පසින් ම වෙනස් වීම
- ජාතිකවාදීන් සහ කොමියුනිස්ට්වාදීන් අනතුර ව වසර හතරක් (1945-49) තිස්සේ බල අරගලයක යෙදී සිටීම
- මාඕ සේ තුං විසින් මෙහෙයවන ලද කොමියුනිස්ට්වරුන්ට සෝවියට් සංගමයේ ආර්ථික හා යුද්ධ ආධාර හිමි වීම
- චියැං කායි-ෂෙක් විසින් මෙහෙයවන ලද කොමිංටාන්වරුන්ට (ජාතිකවාදීන්ට) ඇමරිකා එක්සත් ජනපදයේ ආධාර සහ සහයෝගය හිමි වීම
- එම සිවිල් යුද්ධයේ පළමු අවධියේ දී චියැං කායි-ෂෙක්ට තම හමුදා ශක්තිය උපයෝගී කර ගනිමින් කොමියුනිස්ට්වරුන් පරාජයට පත් කළ හැකි වීම
- 1947 දෙවන භාගයේ සිට සංවිධානය වූ කොමියුනිස්ට්වරුන් කෝමිංටාන්වරුන්ට එරෙහි ව සාර්ථක ප්‍රහාර එල්ල කිරීම

- 1949 අගෝස්තු මාසයේ දී කොමියුනිස්ට්වරුන් ජාතිකවාදීන්ගේ අගනුවර වූ නැං කිං අල්ලා ගැනීම
- මෙම ගැටුම්වල අවසන් ප්‍රතිඵලය ලෙස මාඕ-සේ-තුංගේ නායකත්වයෙන් යුත් කොමියුනිස්ට්වරුන්ට ජය ගැනීම
- 1949 ඔක්තොම්බර් මස පළමු දින චීන මහජන සමූහාණ්ඩුව ප්‍රකාශයට පත් කිරීම සහ අගනුවර පීකිං (බෙයි-ජිං) ලෙස නම් කිරීම
- චියැං කායි-ෂෙක් තම සහායකයින් සමඟ තායිවානයට (පෝමෝසාව) පලා ගොස් (1949 දෙසැම්බර්) අමෙරිකා එක්සත් ජනපදයේ ආධාර ඇති ව එහි බලය පිහිටුවා ගැනීම



***1949 ඔක්තොම්බර් 1 වැනි දින මාඕ-සේ-තුං විසින් චීන ජනරජයේ උපත ලොවට ප්‍රකාශ කරමින්***

*(source: https://www.bing.com/images)*

- **මහජන චීන සමුහාණ්ඩුව පිහිටුවීමෙන් පසු අවධිය**
    - චීන මහජන සමූහාණ්ඩුව පිහිටු වීමෙන් පසු ආර්ථික, සමාජීය හා සංස්කෘතික ප්‍රතිසංස්කරණ රැසක් ක්‍රියාත්මක වීම
    - රාජ්‍ය බලයට එරෙහි වන්නන් සඳහා නීත්‍යානුකූල ව ම දඬුවම් පැනවීමේ හැකියාව ඇති අණපනත් ගෙන ඒමට පියවර ගැනීම
    - සුන්-යත්-සෙන් අගය කළ කොමියුනිස්ට්වරුන් ඔහුගේ වැන්දඹුවට චීන මහජන සමූහාණ්ඩුවේ උපසභාපති පදවිය පිරිනැමීම
    - ඉඩම් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම

- 1950 පෙබරවාරි 14 දින අස්සන් කළ චීන- සෝවියට් මිත්‍ර ගිවිසුමෙන් දෙරට අතර සම්බන්ධතා තහවුරු වීම
- 1954 දී මහජන චීන සමුහාණ්ඩුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් වීම
- එම ව්‍යවස්ථාව සෝවියට් දේශයේ ව්‍යවස්ථාවට සමාන වීම
- 1953 සිට 1957 තෙක් පළමු පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම
- ඒකාබද්ධ සාමූහික ගොවිපළ ක්‍රමය මෙම සැලසුම්වල වැදගත් ලක්ෂණයක් වීම

- **මහා ඉදිරි පිම්ම**

- 1957 දී චීන සමාජයේ විශාල පරිවර්තනයක් ඇති කිරීම සඳහා "මහා ඉදිරි පිම්ම" (Great Leap Forward) නම් වැඩ සටහන හඳුන්වා දීම
- විශේෂයෙන් ස්වාභාවික විපත් නිසා මහා ඉදිරි පිම්ම අසාර්ථක වීම
- මේ නිසා මාඕ-සේ-තුංගේ දේශපාලන තත්ත්වය තරමක් දුර්වල වීම නිසා 1959 දී සභාපති පදවිය අතහැර දමා පසු පෙළ නායකත්වය පමණක් තබා ගනිමින් පක්ෂය තුළ බලය තහවුරු කර ගැනීමටත්. හමුදාවේ සහය ලබා ගැනීමටත් කටයුතු කිරීම

- **සංස්කෘතික විප්ලවය**

- නූතන චීන ඉතිහාසයේ මහත් ආන්දෝලනයක් ඇති කළ සංස්කෘතික විප්ලවය යනුවෙන් හැඳින්වෙන සංසිද්ධිය 1966-76 කාල වකවානුවේ ඉස්මතු වීම
- කොමියුනිස්ට් විරෝධී සතුරන්ට ක්‍රියාත්මක වීමට නොහැකි අයුරින් විප්ලවයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් චීනයේ ධනවාදී පන්තියට එරෙහි ව කටයුතු කිරීම එහි අරමුණ වීම
- චීන රතු හමුදාව හා මාඕට පක්ෂපාත පිරිස් මේ විප්ලවයේ මූලිකත්වය ගෙන ක්‍රියා කිරීම
- සංස්කෘතික විප්ලවයට දැඩි විරෝධතා එල්ල වන විට මාඕ-සේ-තුං තරුණ පෙළ දෙසට හැරී "විප්ලවය ඉගෙන ගන්න, විප්ලව කිරීමෙන් විප්ලවය ඉගෙන ගන්න" යයි මාඕ-සේ-තුං ප්‍රකාශ කිරීම
- මේ විප්ලවය නිසා විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වසා දැමීම
- රට තුළ ආර්ථික හා සිවිල් අර්බුධයක් ඇති විම හා කර්මාන්තශාලාවල වැඩ වර්ජන, ප්‍රවාහණය අඩපණ වීම සිදුවීම
- චීනය රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් තනි වීම හා කොමියුනිස්ට් රටවල් පවා චීනය සමග තනාපති සබඳතා අත්හැරීම
- සිවුවසරකින් පසු මාඕ සිය ප්‍රතිවාදීන් මෙල්ල කොට රට සාමකාමී තත්ත්වයකට පත් කිරීම

- සංස්කෘතික විප්ලවයේ ප්‍රධාන උපදේශකයා වූ ලින්-පියා-ඕ, මාඕ ගෙන් පසු පක්ෂයේ නායක තනතුරට නම් කොට සිටි නමුත් ඔහු සංස්කෘතික විප්ලවයේ චූදිතයකු බවට පත් වීම සහ ඔහු සෝවියට් දේශයට පලා යමින් සිටිය දී ගුවන් අනතුරකින් මිය යාම

- **සංස්කෘතික විප්ලවයේ ප්‍රතිඵල**

  - සියවස් ගණනාවක් තිස්සේ ස්ථාවර ව පැවති චීන ජන සමාජය සංස්කෘතික විප්ලවයෙන් පසු වෙනස් වීම

  - සීඝ්‍රයෙන් වැඩි වන ජන සංඛ්‍යාව පාලනය කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

  - කෘෂිකාර්මික හා කර්මාන්ත ක්ෂේත්‍රවල සීඝ්‍ර සංවර්ධනයක් ඇති වීම

  - ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වීම

  - කාන්තාවන්, පිරිමින් හා සමාන ස්ථානයක් හිමි වීම

  - නවීන ලෝකයට ගැළපෙන ආකාරයෙන් අධ්‍යාපන ක්‍රමයේ විශාල වෙනස්කම් සිදු කිරීම
  - දේශිය ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නඟන අතරතුර ලොව අනෙක් රාජ්‍යයන් සමඟ වාණිජ හා වෙනත් සම්බන්ධතා ඇති කර ගැනීම

  - 1972 දී අමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති රිචඩ් නික්සන්, චීනයේ සංචාරයක යෙදී අස්සන් කළ සහයෝගීතා ගිවිසුමෙන් පසු චීනය හා බටහිර සමඟ දැඩි සම්බන්ධතාවකට මඟ විවර වීම

  - චීන අක්ෂර මාලාව ඉතා සංකීර්ණ වූ බැවින් පහසුවෙන් භාවිත කළ හැකි අක්ෂර මාලාවක් සකසා ගැනීම

  - 1971 දී චීනයට එක්සත් ජතීන්ගේ සංවිධානයේ අසුනක් හිමි වූ අතර එහි ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය ද ලැබීම

  - ඩෙන්ෂියා ඕ පින් ජනාධිපතිගේ නායකත්වය යටතේ පෞද්ගලික ව්‍යවසායකයන්ට ද ක්‍රියාත්මක වීමට ඉඩ දී චීනය ලෝකයට විවෘත කිරීම

  - සැම ක්ෂේත්‍රයක ම වර්ධනයක් ඇති කරගත් චීනය වර්තමානයේ ලෝක බලවතකු බවට පත් වීම

  - 2008 වර්ෂයේ බෙයි-ජිං ඔලිම්පික් උලෙළේ සත්කාරකත්වය දරමින් ඔවුන් උදා කර ගෙන ඇති එම ආර්ථික හා තාක්ෂණික දියුණුව මනා ව ලොවට ම පෙන්නුම් කිරීම

ඇගයීම - **01**

ඇගයීම

- **පහත ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයට නම් පහ බැගින් දී ඇත. ඒවායින් එකක් කවර හෝ හේතුවක් නිසා නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

1.) 1. පීකිං 2. නැං කිං 3. යොනාන් 4. කැන්ටන් 5. ඊඩෝ

^..............)

2.) 1. චෞ එන් ලායි 2. මත්සුහිතෝ 3. යොෂිහිතෝ 4. හිරොහිතෝ 5. අකිහිතෝ (...............)

- **අංක 03 ප්‍රශ්නය සඳහා නාම සමූහයක් X සහ Y තීරුවල දී ඇත. X තීරුවේ දක්වා ඇති නාම Y තීරුවේ ඇති ඒවා සමග කිසියම් ආකාරකට ගැළපේ. එහෙත් මෙහි දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. X තීරුව Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගය අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න.**

| | X | Y |
|---|---|---|
| 3.) | (i) පෝර්මෝසා | A. ටෝකියෝ |
| | (ii) ඊඩෝ | B. බෙයි ජිං |
| | (iii) පීකිං | C. තායිවානය |
| | (iv)ගුවන් ට්‍රොව් | D කැන්ටන් |
| | (v) නිපොන් | E. ජපානය |

1) CABDE 2) ABCDE 3) CABED 4) CAEDB 5) ACBDE (..................)

4.) මෙයිජි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර තෝරන්න

1. 'ඩයට්' යනුවෙන් හැඳින්වූ ද්වි මණ්ඩල පාර්ලිමේන්තුවක් පිහිටු වීම
2. මුදල් කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට සීමිත බලයක් හිමි වීම
3. මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්ති ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
4. ඉඩම් හිමි ධනවත් පුද්ගලයන්ට පමණක් ඡන්ද බලය හිමි වීම

5.) අධිරාජයාගේ බලතල සීමා කිරීම (..................)

5.) චීනයේ කොමියුනිස්ට් පක්ෂය සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර තෝරන්න.

1. 1921 දී ආරම්භ විය.
2. මාඕ-සේ-තුංගේ නායකත්වයෙන් මහජන චීන සමුහාණ්ඩුව 1948 දී පිහිටු විය.
3. 1934 දී දීර්ඝ පා ගමන සංවිධානය කළේය.
4. ක්වෝමින්ටාන්වරුන් හා නිරතුවම ගැටුම් ඇති විය.

5.) ගොවි ජනතාවගෙන් විශාල සහයෝගයක් හිමිවුණි. (......)

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

6.) "මෙයිජි ප්‍රතිෂ්ඨාපනය නූතන ජපන් ඉතිහාසයේ සන්ධිස්ථානයකි"

(i) මෙයිජි ප්‍රතිෂ්ඨාපනය යනු කුමක්දැයි සැකවින් දක්වන්න. (ලකුණු 02)

(ii) මෙයිජි පාලනය යටතේ ඇති කළ දේශපාලන ප්‍රතිංස්කරණ විග්‍රහ කරන්න. (ලකුණු 04)

(ii) මෙයිජි පාලනය යටතේ ජපානය ලෝක බලවතෙකුගේ තත්ත්වයට පත් වූ අකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 08)

7.) ආචාර්ය සුන්-යත්-සෙන් චීන විප්ලවයේ පියා වශයෙන් හැඳින්වීම කෙතෙක් දුරට යුක්ති සහගතවේ ද යන්න විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 14)

08.) ආදර්ශ ලෝක සිතියමේ පහත සඳහන් ස්ථාන/රටවල් ලකුණු කර ඒවායින් ඕනෑම දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න

| | |
|---|---|
| i. හිරෝෂිමා | v. කැන්ටන් |
| ii. නාගසාකි | vi. පර්ල් වරාය |
| iii. තෝකියෝ | vii. කොරියාව |
| iv. තායිවානය | viii. හොකයිදො දූපත |

(නිවැරදි ව ලකුණු කිරීමට 1 ලකුණ බැගින්)

# ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය

## ශ්‍රී ලංකාව


1. මහාවංසය - හික්කඩුවේ සුමංගල හිමි
2. ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය I කාණ්ඩය, පළමුවන වෙළුම, හේම් චන්ද්‍ර රාය
3. ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය I කාණ්ඩය, දෙවන වෙළුම
4. අනුරාධපුර යුගය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
5. ශ්‍රී ලංකාවේ ඉතිහාසය - දෙවන කොටස, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
6. ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තෙවන කොටස, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
7. ශ්‍රී ලංකාවේ ඉතිහාසය - සිව්වන කොටස, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
8. පුලතිසි වංශය - සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය
9. ඉතිහාසය අත්පොත - මහාචාර්ය මංගල ඉලංගසිංහ
10. ඉතිහාසය යනු කුමක්ද - ඊ.එච්. කාර්, පරිවර්තනය - චරිතා විජේරත්න
11. ඉතිහාසය ඉගැන්වීම - විමලා රත්නායක
12. බ්‍රෝහියර් දුටු ශ්‍රී ලංකාව
13. දීප වංසය - කිරිඇල්ලේ ඥාණවිමල හිමි
14. මහාවංස ටීකාව - අකුරැටියේ අමරවංස හිමි
15. සංශිප්ත ලංකා ඉතිහාසය - ඇස්.බී. හෙට්ටිආරච්චි
16. ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය - ඇස්.බී. හෙට්ටිආරච්චි
17. පුරාතන ශ්‍රී ලංකාවේ සමාජ ඉතිහාසය - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
18. රාජ්‍යත්වය, රාජ්‍ය සහ ආගම - හඟුරන්කෙත ධීරානන්ද හිමි
19. රජරට ශිෂ්ටාචාරය හා නිරිත දිග රාජධානි - ඉන්ද්‍ර කිර්ති සිරිවීර
20. ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය - ඉන්ද්‍ර කිර්ති සිරිවීර
21. ලක්දිව සෙල්ලිපි - කොත්මලේ අමරවංශ
22. පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තර ය ( සිංහල පරිවර්තනය)
23. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය හා ජාතික ව්‍යාපාරය - එම්.යූ. ද සිල්වා
24. සිංහල සමාජ සංවිධානය, රැල්ෆ් පීරිස්
25. ලංකාව පෘතුගීසි යුගය කාණ්ඩ 1, පොල් ඊ පීරිස්, අභය හේවාවසම් (පරිවර්තනය)
26. යාපනයේ ඓතිහාසික අරුමය, අයි.ඩී.එම් විජේබණ්ඩාර
27. ඩොයිලිගේ දිනපොත, අනුවාදනය ධර්ම ශ්‍රී ගුණපාල
28. එදා හෙළදිව, ඩේවිඩ් කරුණාරත්න
29. Continuities and transformatrons - Senaka Bandaranayaka
30. Pre Historic Sri Lanka - Prof'. Shiran Daraniyagala
31. Daraniyagala Filicitaion Volume - I
32. University of Ceylon History of Ceylon Vol. II
33. University of Ceylon History of Ceylon Vol. III, K.M. De Silva
34. Ceylon Under the British Rule, L.A. Mills
35. Jaffna kingdom, Prof. S.Pathmanadan
36. Kandian Kingdom, Prof. Lona devaraja

### ඉන්දියාව


1. ඉන්දියාවේ ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2. ඉතිහාස ධාරා - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. අසිරිමත් ඉන්දියාව - බෂාම්
4. ඉන්දියාවේ ඉතිහාසය - රෙමිලා තාපර්
5. ආන්ධ්‍ර සාතවාහන අධිරාජ්‍යයේ ඉතිහාසය - හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, ගොඩගේ 2015
6. ඉන්දියාවේ බෞද්ධ කලාශිල්ප - ටී. බස්නායක, ගොඩගේ, 2014
7. ඉන්දු නිම්න අධිරාජ්‍යය - මංගල ඉලංගසිංහ, ගොඩගේ 2003
8. දකුණු ඉන්දියා ඉතිහාසය - නීලකණ්ඨ ශාස්ත්‍රී
9. දකුණු ඉන්දීයාවේ ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
10. India's Ancient Past - R.S.Sharma, Oxferd - New Delli, 2005
11. Early India - A Consists History - D.N Jha, Manohar, New Delli, 2005


### යුරෝපය හා නූතන ලෝකය


1. ලෝක ඉතිහාසය - බී.වී. රාවෝ, පරිවර්තනය මාලනී ඇදගම, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2. යුරෝපයේ ඉතිහාසය (ක්‍රි.ව. 1500 -1950 දක්වා) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. පැරණි ලෝක ශිෂ්ටාචාර -අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2016
4. ආසියාව හා බටහිර ආධිපත්‍ය, පනික්කාර්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2005
5. අග්නිදිග ආසියාව
6. 19 වන සහ 20 වන ශතවර්ශවල යුරෝපය - ඊ. ලිප්සන්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
7. www history.com.uk
8. www history.com/news/history
9. http llen.wikipedia.org
10. http llen.wikipedia.org/wiki/Ancient Greek religion
11. www.religionfacts.com/Greek religion
12. www.history.co.uk/shows/ancient../5 thiná - the romans gave us
13. http: llen.wikipedia.org/wiki/Legacy - of - the Roman Empire